Perviz N., Hindu Art in its Social Setting, Asian Education Service, New Delhi, 1979

Scanned with CamScanner

CamScanner

# සොළොස්මස්ථාන සංකල්පයේ ඓතිහාසික වර්ධනය පිළිබඳ අධ්‍යයනයක්

දමිත් රණගල[1]

## හැඳින්වීම

වර්තමාන බෞද්ධ ජන සමාජය තුළ ද බුදුන් වහන්සේ ගේ පාද ස්පර්ශයෙන් පාරිශුද්ධත්වයට පත් පූජනීය ස්ථාන රාශියක් ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල පිහිටා ඇති බව පිළිගැනීමයි. එම ස්ථාන පොදුවේ සොළොස්මස්ථාන, සොළොස්මහතැන් යනුවෙන් ව්‍යවහාර වේ. "මහියංගණං නාගදීපං කල්‍යාණං පදලාංඡනං දිවාගුහං දීඝවාපී චේතියං ච මුතිංගණං ....." වන්දනා ගාථාවෙන් මහියංගනය, නාගදීපය, කැලණිය, ශ්‍රී පාදස්ථානය, දිවාගුහාව, දීඝවාපිය, මුතියංගණය, තිස්ස මහා විහාරය, ජය ශ්‍රී මහා බෝධිය, මිරිසවැටිය, රුවන්වැලි මහා සෑය, ථූපාරාමය, අභයගිරිය, ජේතවනය, සේල චෛත්‍යය සහ කතරගම කිරිවෙහෙර යන පූජනීය ස්ථාන 16 වර්තමානයේ දී සොළොස්මස්ථානය වශයෙන් සම්මත ව ඇති බව අනාවරණය වේ. සොළොස්මස්ථානය පිළිබඳ බෞද්ධ ජන සමාජය තුළ පවතින එකී සම්මතයේ ඓතිහාසික වර්ධනය මූලාශ්‍රය ඇසුරින් විග්‍රහ කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් අපේක්ෂිත ය.

## ක්‍රමවේදය

පුස්තකාල හා ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් ලබාගත් තොරතුරු පර්යේෂණයේ දී මූලිකව භාවිත කෙරුණි. මහාවංසය, දීපවංසය, වංසත්ථප්පකාසිනිය, පූජාවලිය, රාජාවලිය, ධාතුවංසය, රාජරත්නාකරය වැනි ප්‍රාථමික මූලාශ්‍රය කෙරෙහි එහි

1 සහය කථිකාචාර්ය, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

Scanned with CamScanner
CamScanner

දී සුවිශේෂී අවධානයක් යොමු විය. කරගම්පිටිය සුබෝධාරාමය, රිදීවිහාරය, දෙගල්දොරුව, දෙවනගල පුරාවිද්‍යාත්මක ස්ථානවල ක්ෂේත්‍ර අධ්‍යයනයක් ද සිදුකරන ලදී. එලෙස පුස්තකාල හා ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් රැස්කරගත් ප්‍රාථමික හා ද්විතීයක දත්ත තුලනාත්මකව විග්‍රහ කිරීමෙන් පර්යේෂණය සිදුකරන ලදි.

**සාකච්ඡාව හා ප්‍රතිඵල**

මහියංගණය, නාගදීපය, කැලණිය, ශ්‍රී පාදස්ථානය, සමනල කන්ද පාමුල දිවා විහරණය කළ ස්ථානය, දීඝවාපි දාගැබ පිහිටුවන ස්ථානය සහ පශ්චාත් කාලීන ව මහාථූපය, මහාබෝධිය, ථූපාරාම දාගැබ, ශිලා දාගැබ පිහිටුවන ස්ථානය වශයෙන් බුදුන් වහන්සේ සමවත් සුවයෙන් වැඩ සිට පූජනීයත්වයට පත් කළ ස්ථාන 10ක් පිළිබඳව මහාවංසයේ දැක්වේ. (මහාවංසය 1963: 1, 35-82) එම ස්ථාන 10 වර්තමානයේ සොළොස්මස්ථානය වශයෙන් සලකනු ලබන ස්ථාන 16 අතරට අයත් වන නමුත් මහාවංසයේ කවර තැනක හෝ සොළොස්මස්ථනයක් පිළිබඳ ව අදහසක් ඉදිරිපත් වී නොමැත. මහාවංස ටීකාව වන වංසත්ථප්පකාසිනියේ ද මෙම ස්ථාන 10 පිළිබඳව සඳහන්ව ඇත. (වංසත්ථප්පකාසිනි 1994: 76-78) දීඝවාපි දාගැබ පිහිටුවන ස්ථානයට වැඩම කිරීම පිළිබඳව සඳහන් කිරීමේ දී යෙදී ඇති "**ඨානගාරව පත්තියා**" යන්නට මහාවංස ටීකාකරු දක්වන අර්ථ විවරණයෙන් එම ස්ථානවලට වැඩම කිරීමේ අභිලාෂය වූයේ එම ස්ථාන සම්‍යග්දෘෂ්ටික දේව මනුෂ්‍ය ගණයා විසින් එළඹිය යුතු ගරු කළ යුතු පිදිය යුතු ස්ථානයන් බවට පත් කොට, එම ස්ථාන පිළිබඳ ගෞරවය ඇති කිරීම බව පැහැදිලි වේ. (එම: 77) මහාවංසයේ මොග්ගල්ලාන සංස්කරණයේ (කාම්බෝජ මහාවංසයේ) මහාවංසය ගාථා 84කින් විස්තර කරන පළමු පරිච්ඡේදය ගාථා 721කින් දීර්ඝ ව විස්තර කර ඇතත් බුදුන් වහන්සේ සමවත් සුවයෙන් වැඩ උන් ස්ථාන පිළිබඳ අතිරේක තොරතුරක් අනාවරණය නොවේ. (මහාවංසය මොග්ගල්ලාන සංස්. 2008: 1, 473-721)

දීපවංසයේ මහියංගණය, නාගදීපය, කැලණිය, දීඝවාපිය, ශ්‍රී මහා බෝධිය යන ස්ථාන 5 පමණක් නාමික ව සඳහන් කර මහමෙව්නා උයනේ සමවත් සුවයෙන් ගත කළ බව දැක්වේ.

Scanned with CamScanner
CamScanner

(දීපවංසය 1959: 2, 59-61) මහාවංසයේ සඳහන් ශ්‍රී පාදස්ථානයට හා දිවාගුහාවට වැඩම කිරීම හෝ එහි සඳහන් මහාථූපය, ථූපාරාමය, ශිලා දාගැබ පිහිටුවන තැන් පිළිබඳව දීපවංසයේ සඳහන් නො වේ.

ධාතුවංසයේ මහියංගණය, නාගදීපය, කැලණිය, ශ්‍රී පාදස්ථානය, දිවා විහරණය කළ ස්ථානය, දීඝවාපි දාගැබ බඳනා ස්ථානය, රුවන්වැලි සෑය බඳනා ස්ථානය, ථූපාරාම දාගැබ බඳනා ස්ථානය, මිරිසවැටිය විහාර භූමිය, කතරගම දාගැබ බඳනා ස්ථානය, තිස්ස මහා වෙහෙර, නාග මහා විහාරය සහ සේරුවිල දාගැබ බඳනා ස්ථානය වශයෙන් බුදුන් වහන්සේ සමවත් සුවයෙන් ගත කළ ස්ථාන 13ක් පිළිබඳ ව දැක්වේ. (ධාතුවංසය 2012: 380-387) එහි මහාවංසයේ සඳහන් මහාබෝධිය සහ ශිලා දාගැබ පිළිබඳ ව සඳහන් නො වන අතර මහාවංසයේ සඳහන් නො වන මිරිසවැටිය, කතරගම, තිස්ස මහා වෙහර, නාග මහා විහාරය සහ සේරුවිල දාගැබ පිළිබඳව දැක්වේ. ධාතුවංස ලැයිස්තුවේ සඳහන් මෙම ස්ථාන අතරින් නාග මහා විහාරය සහ සේරුවිල දාගැබ වර්තමාන සොළොස්මස්ථාන ලැයිස්තුවට අයත් නොවේ.

පූජාවලියේ මහියංගණය, නාගදීපය, කැලණිය, ශ්‍රී පාදස්ථානය, දිවා විහරණය කළ ස්ථානය, දකුණු මහ සෑය, ශ්‍රී මහාබෝධිය, ලෝවාමහාපාය, පිරිත්ලාගෙය, දන්තාදර නම් පොකුණ, ථූපාරාමය, රුවන්මැලි මහසෑය, මිහින්තලයේ මහසල සෑය, රුහුණේ දිගානකා පිහිටි තැන් යයි ස්ථාන 14ක් සමවත් සුවයෙන් වැඩ සිට පූජනීයත්වයට පත්කළ බව දැක්වේ. (පූජාවලිය 1997: 756) මෙම ලැයිස්තුවේ එන දකුණු මහ සෑය, මිහින්තලේ මහසල සෑය, ලෝවාමහාපාය, පිරිත්ලාගෙය, දන්තාදර නම් පොකුණ වර්තමාන සොළොස්මස්ථාන ලැයිස්තුවට අයත් නො වේ.

රාජරත්නාකරයේ ලංකාද්වීපයේ වූ දකුණු දළදා වහන්සේය, අකු ධාතුන් වහන්සේ ය, ලලාට ධාතුන් වහන්සේය, ග්‍රීවා ධාතුන් වහන්සේ ඇතුළු වූ ශාරීරික ධාතු හා දක්ෂිණ ශ්‍රී මහා බෝධීන් වහන්සේ ද අයත් සොළොස් මහා ස්ථානයක් පිළිබඳ ව සඳහන් වේ. (රාජරත්නාකරය 1995: 54) දකුණු දළදාව, අකු ධාතුව, ලලාට ධාතුව, ග්‍රීවා ධාතුව පිළිවෙළින් සෝමාවතිය, ථූපාරාමය, සේරුවාවිල සහ මහියංගණය දාගැබ්හි නිධන් ව ඇතැයි සඳහන්

CS CamScanner

වේ. (සෙනෙවිරත්න 1998: 224., මහාවංසය: 1, 37., ධාතුවංසය 2012: 392) මේ නිසා රාජරත්නාකරයේ සොළොස් මහා තැන් වශයෙන් ස්ථාන 16ක් පිළිබඳ ව සඳහන් කළත් සෝමාවතිය, ථූපාරාමය, සේරුවාවිල, මහියංගණය දාගැබ් සහ ශ්‍රී මහා බෝධිය පමණක් හඳුන්වා දීමට උත්සහ දරා ඇති බව අනාවරණය කර ගත හැකිය. මෙම ලැයිස්තුවේ එන සෝමාවතිය සහ සේරුවාවිල දාගැබ් ද වර්තමාන සොළොස්මස්ථාන ලැයිස්තුවට අයත් නො වේ.

රාජාවලියේ බුදුන් වහන්සේ තුන්වන වරට ලක්දිවට වැඩම කොට ඇසළ මස පුර පසළොස්වක දින උත්‍රපල නැකතින් සොළොස්මස්ථානයේ මොහොතක් මොහොතක් කල් සොළොස් තැනක වැඩ සිට ජේතවනාරාමයට වැඩි බව සඳහන් වේ. (රාජාවලිය 1997: 169) එහි මහියංගණය, කැලණිය හා සමන්තකූට පර්වතයේ ශ්‍රී පාද පද්මය පමණක් නාමික ව හඳුනාගත හැකිය.

සාහිත්‍ය මූලාශ්‍රයන්හි සඳහන් ඉහත තොරතුරු අනුව කාලානුරූපව සොළොස්මස්ථානය පිළිබඳ සංකල්පය වර්ධනය වූ අකාරය හඳුනාගත හැකිය. එහි දී සොළොස්මස්ථානය වශයෙන් වන්දනයට පත් වූ ස්ථාන ද කලින් කලට වෙනස් වූ ආකාරය ද අනාවරණය වේ.

## නිගමනය

අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි රාජධානි සමයට අයත් මහාවංසය, වංසත්ථප්පකාසිනිය, දීපවංසය, ධාතුවංසය, පූජාවලිය ආදි සාහිත්‍ය මූලාශ්‍රයවල බුදුන් වහන්සේ සමවත් සුවයෙන් වැඩ සිට පූජනීයත්වයට පත් කළ ස්ථාන 16ක් (සොළොස්මස්ථානයක්) පිළිබඳ සඳහන් නො වන බව හඳුනාගත හැකිය.

සොළොස්මස්ථානයක් පිළිබඳ ව ප්‍රථමයෙන් තොරතුරු දැකිය හැක්කේ රාජරත්නාකරය, රාජාවලිය වැනි උඩරට රාජධානි සමයේ මුල් වකවාණුවට අයත් සාහිත්‍ය මූලාශ්‍රයවල ය. මෙම මූලාශ්‍රය ද්විත්වයෙත් සොළොස්මස්ථානයක් පිළිබඳ අදහසක් ඉදිරිපත් වුවත් ස්ථාන 16ම නාමික ව දක්වා නොමැති අතර දක්වා ඇති ස්ථාන නාම ද එකිනෙකට වෙනස්ය. ඒ අනුව උඩරට රාජධානි සමයේ මුල් වකවානුව වන විට බුදුන් වහන්සේ සමවත්

Scanned with CamScanner

CamScanner

සුවයෙන් වැඩ සිට පූජනීයත්වයට පත් කළ සොළොස්මස්ථානයක් පිළිබඳ ව පිළිගැනීමක් පැවතියත්, ඊට අයත් ස්ථාන 16 පිළිබඳ පොදු සම්මතයක් නො වූ බව පැහැදිලි ය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජදවස වන විට සොළොස්මස්ථානය පිළිබඳ පොදු ජන හැඟීම් තවදුරටත් වර්ධනය විය. එම රජ දවස ලක්දිවට වැඩම කළ උපාලි මහතෙරුන් ප්‍රමුඛ දූත පිරිස ද ලක්දිව ඇමතින් සමග මහියංගණය ආදි සොළොස්මස්ථාන වන්දනා කරන ලද බවටත්, (මහාවංසය: 100, 123-129) එම රජුගේ අනුග්‍රහයෙන් ප්‍රතිසංස්කරණය කරන ලද රිදී විහාරයේ බිත්ති ඇතුළත ද මහියංගණය දාගැබ ආදි සොළොස් මහා තැන් සිතුවම් කරවූ බවටත් මහාවංසයේ එන ප්‍රවෘත්තීන්ගෙන් එකී කරුණ තහවුරු වේ. (එම: 100, 255-264)

උඩරට විහාර සිතුවම්වල (රිදී විහාරය, දෙගල්දොරුව, කරගම්පිටිය සුබෝධාරාමය) සහ දෙවනගල ගල් පර්වතයේ කොටා ඇති කැටයම් තලයේ සොළොස්මස්ථානය නිරූපණය කර ඇත්තේ සොළොස්මස්ථානය වන්දනා කරන ගාථාවේ අනු පිළිවෙළ අනුගමනය කරමිනි. ඒ අනුව පිළිවෙළින් මහියංගණය, නාගදීපය, කැලණිය, ශ්‍රී පාදස්ථානය, දිවා ගුහාව, දීඝවාපිය, මුතියංගණය, තිස්ස මහා විහාරය, ජය ශ්‍රී මහා බෝධිය, මිරිසවැටිය, රුවන්වැලි මහා සෑය, ථූපාරාමය, අභයගිරිය, ජේතවනය, සේල චෛත්‍යය සහ කතරගම නිරූපණය කර ඇත. මෙම සිතුවම් මෙන් ම වන්දනා ගාථා බොහොමයක් සකස් වූයේ වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගේ ශාසනික පුනර්ජීවන කටයුතුවලින් පසු ව ය. බුදුන් පළමුවෙන් වැඩම කළ මහියංගණය, දෙවනුව වැඩම කළ නාගදීපය, තෙවනු ව වැඩම කළ කැලණිය, ශ්‍රී පාදස්ථානය, දිවාගුහාව සහ දීඝවාපිය හැරුණු කළ සෙසු ස්ථානයන්ට බුදුන් වහන්සේ වැඩම කළ අනු පිළිවෙළක් කිසිඳු සාහිත්‍ය මූලාශ්‍රයක පැහැදිලිව සඳහන් නො වේ. සොළොස්මස්ථානය වන්දනා කරන ගාථාව සකස් කිරීමේ දී පූර්වෝක්ත සෙසු ස්ථානවල පිළිවෙළ උච්චාරණයේ පහසුව ද සලකා පශ්චාත් කාලීනව සකසාගත් බව සිතිය හැකි ය.

ඒ අනුව වර්තමාන ජන සමාජය තුළ සම්මත ව පවතින සොළොස්මස්ථාන ලැයිස්තුව උඩරට රාජධානි සමයේ කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේ දී හෝ ඔහුගේ ශාසනික පුනර්ජීවන

Scanned with CamScanner
CS CamScanner

කටයුතු තුළින් ඊට ආසන්න වකවානුවක දී සකස් වූ බව නිගමනය කළ හැකිය. බුදුන් වහන්සේ සමවත් සුවයෙන් වැඩ සිට පූජනීයත්වයට පත් කළ ස්ථාන වශයෙන් එහි දී මහියංගණය, නාගදීපය, කැලණිය, ශ්‍රී පාදස්ථානය, දිවාගුහාව, ශ්‍රී මහා බෝධිය හා දීඝවාපිය දාගැබ පිහිටි ස්ථාන අනාවරණය විය.

**ප්‍රමුඛ පදඃ උඩරට රාජධානිය, කීර්ති ශ්‍රී රාජසිංහ, මහාවංසය, සොළොස්මස්ථානය**

## ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය

1. දිසානායක ජී. ආර්., 2010, සිරිලක වැඳිය යුතු පුදබිම් සොළොස්මස්ථානය, තරංජි ප්‍රින්ට්ස්, නාවින්න.
2. දීපවංසය, 1959, කිරිඇල්ලේ ඥාණවිමල හිමි (සංස්), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.
3. පූජාවලිය, 1997, කිරම විමලජෝති හිමි (සංස්), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
4. මහාවංසය, 1963, හික්කඩුවේ සුමංගල හිමි, බටුවන්තුඩාව (සංස්), රත්නකාර පොත් සමාගම, කොළඹ.
5. මහාවංසය මොග්ගල්ලාන සංස්කරණය, 2008, අරුණ තලගල (සංස්), සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.
6. රාජරත්නාකරය, 1995, කරුණාදාස රූපසිංහ (සංස්),ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
7. රාජාවලිය, 1997, ඒ. වී. සුරවීර (සංස්), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.
8. වංසත්ථප්පකාසිනී මහාවංස ටීකාව, 1994, අකුරටියේ අමරවංස හිමි, හේමචන්ද්‍ර දිසානායක (සංස්), විද්‍යාලංකාර මුද්‍රණාලය, කැලණිය.
9. සිංහල ධාතුවංසය, 2012, එම්. ඩබ්. විජේරත්න (සංස්), ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

CS Scanned with CamScanner

CS CamScanner

# රජරට ශිෂ්ටාචාර සමයේ ආරාම ආශ්‍රිත මූල්‍ය සම්පත් කළමනාකරණය

නීලියා නයනතාරා හේවාගම[1], ඕ.පී.එස්.ඒ. රුවන්තිකා[2], පී.කේ. විදානපතිරණ[3]

## හැඳින්වීම

මානව සමාජය සීමිත අවශ්‍යතාවයන් සහිතව ප්‍රභවය වූ අතර, විකාශනය වීමේ දී ක්‍රමයෙන් එම අවශ්‍යතාවයන් සංකීර්ණ අවශ්‍යතාවයන් බවට පත් විණි. මුදල් භාවිත කිරීම යන ලක්ෂණය ද එලෙස ක්‍රමානුකූල ව විකාශනය වී සංකීර්ණත්වයට පත් වූ මිනිස් අවශ්‍යතාවයකි. ආදිතම සමාජය භාණ්ඩ හුවමාරු කිරීම තුළින් ගනුදෙනු සිදු කළේය. එකී අවධිය ක්‍රමයෙන් පසුකළ මිනිසා ඉන් පසුව වටිනාකම් ආරෝපණය කර ද්‍රව්‍ය හුවමාරු කිරීමේ අවධියකට ප්‍රවිෂ්ට විණි. අනතුරු ව නෛසර්ගික වටිනාකමක් සහිත මාධ්‍යයක් ලෙස කාසි භාවිතය ප්‍රචලිත වේ. කාසි භාවිත කිරීම ප්‍රචලිත වීමත් සමඟ ඒවා නිසි පරිදි කළමනාකරණය කිරීමේ ගැටලුව ඉස්මතු විණි. ඒ අනුව මූල්‍ය සම්පත් භාවිත කරන පරිපාලන, ආර්ථික, ආගමික ස්ථානවල මූල්‍ය සම්පත් කළමනාකරණය කිරීම ද අනිවාර්ය අංගයක් විය.

රජරට ශිෂ්ටාචාර සමයේ දී රාජ්‍ය අනුග්‍රහය මත ශ්‍රී ලංකාව පුරාම නගර හා ග්‍රාම ආශ්‍රිතව වෙහෙර විහාර රැසක් ඉදිවුණි. මෙම වෙහෙර විහාර ඉදිකිරීම් පමණක් නො ව ඒවායේ පැවැත්ම උදෙසා

1 ගෞරව ශාස්ත්‍රවේදී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

2 තාවකාලික සහකාර කථිකාචාර්ය, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

3 තාවකාලික සහකාර කථිකාචාර්ය, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

Scanned with CamScanner

CamScanner

ද රාජ්‍ය අනුග්‍රහය සේම, සුළු නිලධාරින්, ප්‍රාදේශීය නායකයන් ආදීන්ගේ අනුග්‍රහයක් ලැබුණු බව පෙනේ. මිහින්තලය, සිතුල්පව්ව, රජගල, රිටිගල, අභයගිරි ආදී වෙහෙර විහාරවල භික්ෂූන් වහන්සේලා ඉතා විශාල ප්‍රමාණයක් වැඩ වාසය කර ඇත. අභයගිරි විහාරය තුළ භික්ෂූන් වහන්සේලා පන්දහසක් පමණ වැඩ සිටි බව පාහියන් වාර්තාවේ සඳහන් වේ. එබැවින් මේ සා විශාල මානව සම්පතක් නිසි පරිදි කළමනාකරණය කිරීමට අදාළ ව නිශ්චිත යැපීම් ක්‍රමයක් ද තිබිය යුතු ය. ඒ අනුව රජරට ශිෂ්ටාචාර සමයේ වෙහෙර විහාර ආශ්‍රිතව මූල්‍ය සම්පත් කළමනාකරණය සිදු වූයේ කෙසේ ද යන්න සොයා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ.

## ක්‍රමවේදය

අනුරාධපුර හා පොළොන්නරු යුගයේ විහාර ආරාම පරිපාලනය පිළිබඳ සඳහන්වන සෙල්ලිපි මෙහි දී අධ්‍යයනය කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

පැරණි ශ්‍රී ලංකාවේ වෙහෙර විහාර නඩත්තු කිරීම සඳහා ආදායම් ලැබුණු ක්‍රම කිහිපයකි. ගම් බිම් සහ කෙත් වතු පූජා කිරීම්, වැව් හා ඇළ දොළ, වී ආදි ධාන්‍ය වර්ග හෝ මුදල් බැංකු වැනි ආයතනවල තැන්පත් කිරීමෙන් ලැබුණු පොළිය, දඩ මුදල් හා බදු මුදල්, දාස දාසියන්ගේ නඩත්තුව සඳහා ලැබුණ ගම් බිම්, මිල මුදල් හා ඔවුන් නිදහස් කර ගැනීමෙන් ලැබුණු මුදල් ආදිය වේ. මෙම මුදල් නිසි ලෙස කළමනාකරණය කිරීම සඳහා නිලධාරි මණ්ඩලයක් සිටි බවට සාධක අභයගිරි සංස්කෘත ලිපිය, මිහින්තලා පුවරු ලිපිය ආදි ශිලා ලිපිවලින් හෙළි වේ. එහි සඳහන් පරිදි විහාරය තුළ අය වැය ගණන් තබා ගැනීමටත්, පාලන කටයුතු පවත්වාගෙන යාමටත් පාලක සභාවක් සිටියේ ය. නකාබලව හිමි (නිකාය භාර වූ ප්‍රධාන භික්ෂුව), නියම් ජෙට (අධිකරණ කටයුතු භාර නිලධාරි), පසක්කැමි (අය වැය ලියා තබන නිලධාරි), අය කැමි (ආදායම් පාලන නිලධාරි), පිරිවහනුකැමි (විනය ආරක්ෂක නිලධාර), වෙහෙර් ලෙයා (පරිපාලන ලේකම්) එම සභාවට අයත් ය.

Scanned with CamScanner

CamScanner

එසේ ම වෙහෙර විහාර ආශ්‍රිත ගිණුම් කටයුතුවලට අදාළව අය වැය ගණන් තැබූ බවට අභයගිරි කපාරාරාම ලිපියේ සඳහන් වී ඇත. මූල්‍ය කළමනාකරණයේ ඉතාමත් දියුණු ලක්ෂණයක් ලෙසින් හැඳින්විය හැකි එහි සඳහන් පරිදි විහාරයට ආදායම් ලැබෙන ස්ථාන වූ අභයගිරි ස්තූපය, මහසල පිළිම ගෙය, දාන ශාලාව, බෝධි සරය, රත්නප්‍රාසාදය ආදී ස්ථානවල අය වැය සටහන් තැබීම් කළ යුතුය. මෙම අය වැය සටහන් ඇතුළත් පඤ්චිකා පුස්තකය නම් පොතක් පවත්වාගෙන ගිය බව ද එහි සඳහන් වේ. එම පුස්තකය තුළ දෛනිකව විහාරයේ අභ්‍යන්තරයේ හා බාහිර ආදායම් වියදම් ගණන් තබා එය පෙට්ටියක බහා කාර්මික ප්‍රධානීන්ගේ සහ කාර්මිකයන්ගේ අත්සනින් සීල් තබා ධාතු ගෘහයේ තැන්පත් කළ යුතු විය. දෛනික ව හා මාසිකව ද මෙම ගිණුම් වාර්තා සකස් කොට පාලක සභාව වෙත ඉදිරිපත් කළ යුතු විය. එබැවින් වංචා දූෂණයට ඉඩක් නො තබා නිසි ලෙස මූල්‍ය කටයුතු කළමනාකරණය සිදු වූ බව පෙනේ.

අභයගිරි සංස්කෘතික ලිපියේ ලහසිකා, හුණාල හා සුනග්‍රාම යන ආශ්‍රමවල වාසය කළ භික්ෂූන් එම ආශ්‍රමවලට අයත් ග්‍රාමයන්වල ආදායම් එකතු කළ යුතු බව සඳහන් කර ඇත. වප් මාසයේ අටවක දිනට ප්‍රථම ව විහාරයේ නිලධාරීන් අයවැය ඉදිරිපත් කළ යුතු යැයි කළුදියපොකුණ ශිලා ලේඛනයේ සඳහන් වේ. අදාළ අය වැය විස්තර ඉදිරිපත් කිරීමට අසමත් වූ නිලධාරීන්ට රැකියාව මෙන්ම නඩත්තු ඉඩම් භුක්ති විඳීමේ අයිතිය ද අහෝසි වන බව මිහින්තලා පුවරු ලිපියේ සඳහන් වේ. එම නිසා මූල්‍ය කටයුතු පරිපාලනය සඳහා පත්කරනු ලැබූ නිලධාරීන් අදාළ කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමටත් ඒවා ඉදිරිපත් කිරීමටත් නෛතික ව බැඳී සිටි බව පෙනේ.

මිහින්තලා පුවරු ලිපියේ චෛතියගිරි විහාර සේවකයින්ට වැටුප් හා දීමනා ලබා දුන් ආකාරය පිළිබඳ ව ද සවිස්තරාත්මකව සඳහන් වේ. එහි සඳහන් තනතුරු අතරින් ඉහළ ම වැටුපක් ලැබී ඇත්තේ නිකාය භාර භික්ෂුවට හා අධිකරණ කටයුතු භාර නිලධාරියාට ය. නකා බලව හිමි හෙවත් නිකාය භාර භික්ෂුව තනතුරට අදාළ ව මුදලින් රන් කළං 15 යි අක 4 බැගින් ද, ඉඩ කඩම් ලෙස කිරිය 05ක් හා ද්‍රව්‍ය වශයෙන් හාල් නැලියක් ද ලැබී

Scanned with CamScanner

CamScanner

ඇත. නියම් ජෙට හෙවත් අධිකරණ කටයුතු භාර නිලධාරියාට මුදලින් රන් කළං 15ක් ද, කිරිය 05ක් හා හාල් නැලියක් ද ලැබී තිබේ. එම තොරතුරු ඇසුරින් චේතියගිරි විහාරය පාලනය කිරීමට සිටි පාලක සභාව හා ඒ ඒ අංශයන්ට අනුයුක්ත කරන ලද සේවක මණ්ඩලයක් පිළිබඳව ද සාධක මෙන්ම ඔවුන්ට සිය සේවයට අදාළව නිසි වැටුපක් ද ලැබුණු බව පෙනේ.

**සාරාංශය**


රජරට ශිෂ්ටාචාර සමයේ පරිපාලන ක්ෂේත්‍රය තුළ සේ ම ආගමික ක්ෂේත්‍රය තුළ නූතනයේ සේම විධිමත් ගිණුම්කරණ ක්‍රියාවලියක් පැවති බව සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලින් පෙනේ. මෙම අවධියේ මිහින්තලය, අභයගිරිය, සිතුල්පව්ව ආදී වෙහෙර විහාර මූලික කරගත් විහාර ආරාම පද්ධතිය තුළ භික්ෂූන් වහන්සේලා විශාල ප්‍රමාණයක් වැඩ වාසය කර ඇත. උන්වහන්සේලා ඇතුළු වෙහෙර විහාර දේපළ පරිපාලනය හා නඩත්තුව සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබී තිබේ. එලෙස ලැබෙන ආදායම් නිසි පරිදි කළමනාකරණය කිරීමට නිළධාරීන් පන්තියක් ක්‍රියාත්මක වූ බව මිහින්තලා පුවරු ලිපිය ආදියෙන් හෙළි වේ. ආදායම් වියදම් සටහන් කිරීම, ඒවා දෛනික ව පවත්වාගෙන යාම, මාසිකව හා වසර අවසානයේ පාලක සභාවට ඉදිරිපත් කිරීම, ගිණුම් වාර්තාවල අක්‍රමිකතාවයක් වේ නම් ඒවා විභාග කිරීමටත් ක්‍රියා කර ඇත. එම කටයුතු භාරව ක්‍රියාකරන ලද අදාළ නිලධාරි මණ්ඩලයේ සේවය අගය කරනු වස් මුදලින් හා ඉඩකඩම්වලින් හා ද්‍රව්‍යවලින් වැටුපක් ගෙවූ බව මිහින්තලා පුවරු ලිපිය ආදි ශිලා ලේඛනවලින් තහවුරු වේ. මේ අයුරින් වර්තමානයේ සිදුවන මූල්‍ය කළමනාකරණයේ මූලිකාංග රජරට සමයේ ද ක්‍රියාත්මක වූ බව අනාවරණය වේ. එබැවින් රජරට ශිෂ්ටාචාර සමයේ වෙහෙර විහාර ආශ්‍රිතව විධිමත් මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වූ බව තහවුරු කර ගත හැකිය.



ප්‍රමුඛ පද :- රජරට, ආරාම, කළමනාකරණය. ගිනුම්කරණය, සෙල්ලිපි


Scanned with CamScanner

CamScanner

## ආශ්‍රිත ග්‍රන්ථ


1. Wikramasinghe, D.Z, 1904 - 1912, Epigraphia Zeylanica, Vol I, Government of Ceylon
2. Wikramasinghe, D.Z, 1904 - 1912, Epigraphia Zeylanica, Vol I, Government of Ceylon, 92 p
3. Wikramasinghe, D.Z, 1904 - 1912, Epigraphia Zeylanica, Vol I, Government of Ceylon, 1 p
4. Codrington, H.W & Paranavithana, S. , 1929, Epigraphia Zeylanica, Vol III, Government of Ceylon


Scanned with CamScanner

CamScanner

# බුද්ධවචනය හැදෑරීමෙහි ලා ප්‍රමාණයක් වශයෙන් අටුවා සම්ප්‍රදාය යොදා ගැනීම

දිලාන් පංචන ජයසිංහ[1]

**පර්යේෂණ ගැටලුව :**

බුද්ධවචනය හැදෑරීමෙහි ලා ප්‍රමාණයක් වශයෙන් අටුවා සම්ප්‍රදාය යොදා ගත හැකි ද?

**හැඳින්වීම හා පර්යේෂණ අරමුණ :**

ත්‍රිපිටකාගත ධර්ම කාරණා සඳහා අර්ථ පැහැදිලි කිරීම් වශයෙන් හෙවත් බුද්ධවචනයට සවිස්තර විවරණයන් සැපැයීම් වශයෙන් පිළියෙල කරන ලද ත්‍රිපිටකයෙන් වියුක්ත නැතහොත් ත්‍රිපිටකයට බාහිර සාහිත්‍යයක් වශයෙන් අට්ඨකථා සාහිත්‍යය හඳුනා ගත හැකි ය. පෙළෙහි ගම්භීරාර්ථ තේරුම් යන පරිදි අර්ථ දීම ම අට්ඨකථාවලින් අපේක්ෂා කොට තිබේ. අර්ථ කීම අරමුණු කොට ගෙන ම අට්ඨකථා බිහි වූ බව එනම්, අර්ථකථා අට්ඨකථා වූ බව "අත්ථො කථීයති එතායාති අත්ථකථා, සායෙව අට්ඨකථා, ථ-කාරස්ස ඨ-කාරං කත්වා" යන ටීකාපාඨයෙන් පෙනේ. සඞ්ඛිත්ත හා විත්ථාර යන පදවලින් සියලු බුද්ධ දේශනාව ද්විප්‍රකාර බව පෙන්වයි. සඞ්ඛිත්ත යනු සාරාංශය දැක්වීම යි. විත්ථාර යනු එකී සාරාංශය විභජනය කිරීම යි. අර්ථකථා අවැසි වූයේ එකී සංක්ෂිප්ත දේශනා සඳහා ය. එහෙත් විස්තාර වශයෙන් පැවැත්වුණු දේශනා සඳහා ද අර්ථකථන අවශ්‍යය වූ බැවින් බුදුවරුන්ගේ සියලු දේශනාවන් සංක්ෂිප්ත වන බවත්, විස්තරාර්ථ වශයෙන් දෙසූ කිසිදු දහමක් නැති බවත් දැක්වේ. සියලු බුද්ධ

1 සහාය කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

CamScanner

දේශනාව සඳහා අර්ථකථන සැපැයීමේ අවශ්‍යතාව එයින් උද්ගත විය. ඒ සඳහා වූ වැඩපිළිවෙල ආරම්භ වූයේ බුද්ධකාලයේ දී ම, බුදුරදුන් වෙතින් ම ය. "**සම්මාසම්බුද්ධෙනෙව තිණ්ණං පිටකානං අත්ථවණ්ණනාක්කමොපි භාසිතොති දට්ඨබ්බං. තත්ථ තත්ථ භගවතා පවත්තිතා පකිණ්ණකදෙසනායෙව හි අට්ඨකථා.**" බුදුරජාණන් වහන්සේ ඒ ඒ ස්ථානවල දී කරන ලද විස්තරාර්ථකථන සහිත වූ **ප්‍රකීර්ණක දේශනාව** ම අට්ඨකථා ස්වරූපය ගත් බව සාරත්ථදීපනීය කියයි. මෙකී පර්යේෂණ පත්‍රිකාවේ අපේක්ෂාව එකී පාලි අට්ඨකථා සම්ප්‍රදාය බුද්ධවචනය හැදෑරීමෙහි ලා ප්‍රමාණයක් වශයෙන් යොදා ගත හැකි දැ'යි පිරියෙසුම් කිරීම යි.

**පර්යේෂණ විධික්‍රමය :**

ප්‍රාථමික හා ද්විතියික තෘතියික මූලාශ්‍රය මඟින් ලබාගන්නා දත්ත විශ්ලේෂණය කිරීමෙන් අදාළ ප්‍රස්තුතය පිළිබඳ අධ්‍යයනය කිරීම.

**සාකච්ඡාව :**

ග්‍රාහකයා ස්වකීය අනුභූතියෙහි එල්බගත් දෘෂ්ටියෙහි පිහිටා නානාප්‍රකාරයෙන් දේශනාව ග්‍රහණය කරගත් අවස්ථා ද වේ. ඒ අතරින් ඇතැමෙක් බුදු දහමේ ස්වරූපය අසා එහි දොස් දුටහ. බුදුන් වහන්සේ වෙතින් ම ඇසූ ධර්මය විපරීත ලෙස මෙනෙහි කිරීමේ ප්‍රතිඵලයකි, ඒ. අනුබෝධ යන පදයට අනුව බුදු දහම වූ කලි අවිපරීත සාක්ෂාත්කරණයක ප්‍රතිඵලයකි. ඒ හැර මෙය චින්තනයක ප්‍රතිඵලයක් හැටියට ප්‍රභව වූවක් ලෙස හෝ බුද්ධිවාදයක් හැටියට හෝ දර්ශනයක් හැටියට හෝ කේවලත්වයෙන් ගැනීම පටහැනි වේ. එබැවින් දුරවබෝධ ධර්ම කරුණු සඳහා ශ්‍රාවකයෝ සැම විට බුදුරජාණන් වහන්සේ වෙතින් ම අර්ථ විවරණ අපේක්ෂා කළහ. සංක්ෂිප්ත දේශනා සඳහා තමාගේ ඥාණය මෙහෙයවා වටහා ගැනීම ප්‍රතික්ෂේප කළහ. එබැවින් සැකෙවින් දෙසන ධර්මයට දීර්ඝ විවරණ සැපැයීමට බුදුරජාණන් වහන්සේට සිදු විය. ධර්මයේ සැබෑ හිමිකරුවා (**ධම්මස්සාමි**) බුදුරජාණන් වහන්සේ ම වූ හෙයිනි. සූක්ෂ්ම අර්ථ පැහැරට විදහා පෑමෙහි (**අත්ථස්ස නින්නෙතා**) අග්‍ර වූ කුසලතාව බුදුන් වහන්සේ වෙත ම විය. බුදුරදුන් වෙතින් විවරණය ලැබීමට සුදුසු වැදගත් කරුණු **කථාමූල** යනුවෙන් හැඳින්විණ.

Scanned with CamScanner
CamScanner

**ධම්මකාය, බ්‍රහ්මකාය, ධම්මභූත, බ්‍රහ්මභූත** යනු තථාගතයන්ට නම් ය. බුද්ධශ්‍රාවකයා හැඳින්වීමට **මේ පද නො යෙදෙන අතර, ඒ සඳහා භගවතො'ම්හි පුත්තො, ඔරසා මුඛතො ජාතො, ධම්මජො, ධම්මනිම්මිතො, ධම්මදායාදො** ආදි පද උචිත බව භාග්‍යවතුන් වහන්සේ විසින් ම පෙන්වා දී තිබේ.

නමුත්, ධර්මය සඳහා විවරණ සැමවිට බුදුරජාණන් වහන්සේ වෙතින් ම අපේක්ෂා කළ බවක් නො පෙනේ. ඇතැම් විට ශ්‍රාවකයන් වහන්සේලා එක්රැස් ව බුදුන් වහන්සේ විසින් සැකෙවින් තබන ලද මාතෘකා ගෙන ඒවායෙහි දුර්ගම ස්ථාන සුගම කරගැනීම පිණිස කළ දීර්ඝ සාකච්ඡා පෙළෙහි වේ. එම සාකච්ඡාවල දී පැනනඟින සැකමුසු ස්ථාන **(කඞ්ඛාධානීයෙසු ධම්මේසු)** සඳහා අර්ථවිවරණ සපයා ගැනීමට ධර්ම-විනය සම්බන්ධයෙන් තීක්ෂ්ණ ප්‍රඥා ඇති වෙනත් ශ්‍රාවකයන් වහන්සේලා කරා එළැඹුණහ. මෙම සාකච්ඡාවල විශේෂ ලක්ෂණයක් වූයේ ඒවායෙහි දී ලබාගන්නා විවරණ බුදුරජාණන් වහන්සේ වෙත ගෙන ගොස් නැවත ඉදිරිපත් කිරීම යි. එවැනි අවස්ථා හඳුන්වනු ලැබූයේ දහම් කථා නමැති තුටු පඬුරු **කථාපාභත** (නැතහොත් දීර්ඝ සාකච්ඡාවකට උචිත වූ ධර්ම කරුණු පිළිබඳ මාතෘකා) යනුවෙනි. එසේ ඉදිරිපත් කිරීමේ දී ද අදාළ විවරණ අදාළ ශ්‍රාවකයාගේ ම වචනවලින් ගෙනහැර පෑම **(එතෙහි පදෙහි එතෙහි බ්‍යඤ්ජනෙහි)** ප්‍රකට ලක්ෂණයක් විය. නිගමන කීපයක් ඇත්නම් ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි ප්‍රකාශ කිරීම ද සිරිත විය. නිවැරදි ධර්මවිනිශ්චයට බුදුරජාණන් වහන්සේ ද එකඟත්වය පළ කළහ; ඊට අනුමැතිය දුන්හ. මේ ආකාරයෙන් කිසියම් එක් ධර්මකරුණක් පිළිබඳ අර්ථවිවරණ කීපයක් ඉදිරිපත් වූ හා ඒවාට බුදුන් වහන්සේගේ අනුමැතිය හිමි වූ අවස්ථා නො අඩු ව හඳුනා ගත හැකි ය. තව ද, බුදුන් වහන්සේ කෙටියෙන් දේශනා කරන ලද ධර්ම කරුණු විස්තරාර්ථ සහිත ව දේශනා කිරීමේ සමත් භික්ෂූන් අතර අග්‍රස්ථානය **මහාකච්චායන** හිමියන් වෙත පිරිනැමීම ද ධර්මය සඳහා ශ්‍රාවක අර්ථකථන බුදුන් වහන්සේ අවශ්‍යයෙන් ම අපේක්ෂා කළ බවට සාධකයකි. එහෙත්, ධර්මය සඳහා අර්ථවිවරණ සැමවිට පැවිදි ශ්‍රාවකයින් වෙතින් ම අපේක්ෂා කළ බවක් ද නො පෙනේ. විටෙක භික්ෂූන් වහන්සේලා ධර්මය උගත් ගිහි විද්වතුන්ගෙන් ද ධර්මාර්ථ විවරණ බලාපොරොත්තු

Scanned with CamScanner

CS CamScanner

නො වූවා ම නො වේ. බුද්ධවචනය සම්බන්ධයෙන් පෘථුල පරිචයක් ඇත්තෙකුට සිය බුද්ධිය මෙහෙයවා අර්ථකථන සම්පාදනයට අවසර දෙන ලදි. කොටින් ම අනුමාන බුද්ධියෙහි **(ධම්මන්වය, අනුමාන, නයග්ගාහ)** ආධාරයෙන් බුදුරදුන් වෙතින් පෙර නො අසන ලද ධර්ම කරුණකට පවා ධර්මයට අනුගත ව ම අරුත් සැපැයීමේ සමත්හු එකල ගිහි-පැදදි දෙපක්ෂයේ ම සිටියහ. කණෙහි පළඳින මිණිකොඩොලක් සොලවන්නාක් මෙන් සමස්ත ත්‍රිපිටකය පහසුවෙන් සම්මර්ශනය කිරීමෙහි සමත් චිත්ත ගෘහපති ඒ අතරින් කෙනෙකි. ඒ අතර මෙසේ බුද්ධකාලයේ දී ම ප්‍රභව වූ අර්ථකථන සම්ප්‍රදාය දෙකක් හඳුනා ගත හැකි අතර, ඒවා,

- **බුදුන් වහන්සේට අයත් අර්ථකථන සම්ප්‍රදාය**
- **ශ්‍රාවකයන්ට අයත් අර්ථකථන සම්ප්‍රදාය**

වශයෙන් නම් කළ හැකි ය. සූත්‍රපිටකයේ විවිධ ස්ථානවල පශ්චාත්තන අට්ඨකථාවල මූලබීජ දක්නා ලැබේ. ධම්මපදපාළියේ බ්‍රාහ්මණ - සමණ - පබ්බජිත යන වචන සඳහා සපයා ඇති අර්ථකථන, සුත්තනිපාතයේ බ්‍රාහ්මණ - සමණ - නහාතක - කුසල - පණ්ඩිත - මුනි වැනි වචන සඳහා සපයා ඇති නිර්වචන කිසියම් පදයක් උදෙසා සංකල්පීය අර්ථකථන සැපැයීමට පූර්වාදර්ශ සපයා තිබේ. ප්‍රහේලිකාවක ස්වරූපයෙන් ඉදිරිපත් වන මජ්ඣිමනිකායේ වම්මික සූත්‍රාවසානයෙහි දැක්වෙන විවරණය අට්ඨකථාවල පඤ්හකම්ම ක්‍රියාවලිය සඳහා මූලබීජ සපයා ඇතැයි සිතිය හැකි ය. සඞ්ඛිත්ත දේශනා විත්ථාර වශයෙන් විභජනය කෙරෙන විභඞ්ග නමින් හැඳින්වෙන සූත්‍ර දේශනාවන්හි අර්ථවිශ්ලේෂණ බොහෝ සෙයින් දැකිය හැකි ය. විශේෂයෙන් සැරියුත් තෙරුන්වහන්සේගේ දේශනාවක් වන **සච්චවිභඞ්ග සූත්‍රය** මූලික බුද්ධ දේශනාවක් වන **ධම්මචක්කප්පවත්තන සූත්‍ර** දේශනාව ප්‍රශ්නෝත්තර ක්‍රමය හා පර්යාය වචන මඟින් විභජනය කරන විස්තරාර්ථකථනයකි. **මහාවේදල්ල** හා **චුල්ලවේදල්ල** සූත්‍ර සංවාද ස්වරූපයෙන් ගැඹුරු ධර්ම කරුණු රැසක් විවරණය කෙරෙන සූත්‍ර දේශනාවෝ ය. මහාකොට්ඨිත තෙරුන්වහන්සේ විසින් සැරියුත් තෙරුන්වහන්සේගෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් ඉදිරිපත් වන මහාවේදල්ල සූත්‍රාන්තයෙහි විඤ්ඤාණ වැනි පද

Scanned with CamScanner

CamScanner

සඳහා ඉදිරිපත් කෙරෙන අර්ථවිවරණය වැදගත් වෙයි. චූල්ලවේදල්ල සූත්‍රාන්තයේ දී විසාඛ ගෘහපතියා සක්කාය, සක්කායසමුදය, සක්කායනිරොධ, සක්කාය නිරොධගාමිණී පටිපදා, සක්කායදිට්ඨි, අට්ඨංගික මග්ග, සමාධි, සංඛාර ආදි ධර්මපද සමූහයක් ධම්මදින්නා තෙරණිය වෙත ඉදිරිපත් කරමින් ඒ සඳහා අර්ථ විවරණ ලබා ගනී. ධර්මකථික භික්ෂුණීන් අතර අග්‍රස්ථානය ලද්දේ ද, ධම්මදින්නා තෙරණිය යි. ධර්මකථිකත්වය වනාහි මනා අභිධර්මපරිචයෙහි ලත් උත්තමඵලයෙකි. බුදුරජාණන් වහන්සේ විසාඛට වදාළේ තෙරණියගේ අර්ථවිග්‍රහය සර්වාකාරයෙන් නිවැරදි බව යි. එබැවින් බුද්ධකාලයේ දී ම භික්ෂුණීන් වහන්සේලා ද බුද්ධවචනය සඳහා අර්ථකථන සැපැයූ බව පැහැදිලි ය. දීර්ඝ විවරණය, විශ්ලේෂණය වැනි අරුත් දෙන, අර්ථය විස්තර වශයෙන් සම්පූර්ණයෙන් ප්‍රකාශ කෙරෙන නිද්දෙස ග්‍රන්ථවල උද්දෙස, නිද්දෙස, පටිනිද්දෙස හා නිගමන යන ක්‍රම ද මුල්කාලීන ව ම අර්ථවිශ්ලේෂණය සඳහා පැවැති අවශ්‍යතාව ප්‍රකට කරයි. මහානිද්දෙසපාළිය සුත්තනිපාතයේ අට්ඨකවග්ගයත්, චූල්ලනිද්දෙසපාළිය සුත්තනිපාතයේ ම පාරායණවග්ගය හා ඛග්ගවිසාණසුත්තයත් යථෝක්ත ක්‍රමයෙන් නිද්දේස කෙරෙන්නකි. විටෙක එහි එන පදානුපදික විග්‍රහයන් පශ්චාත්තන පාලි අට්ඨකථාවල දිස්වන විවරණයන් ද ඉක්මවා සිටී. නිද්දෙස ග්‍රන්ථ මෙන් බුද්දකනිකායේ ම අවශේෂ ග්‍රන්ථයක් වන පටිසම්භිදාගමග්ගය පරම දාර්ශනික මෙන් ම ශ්‍රාවක අසාධාරණ ඤාණ විශේෂ පිළිබඳ ව ද ආභිධම්මික විශ්ලේෂණයකි; මුළුමනින් ම ඤානවිභාගයකි. නිද්දේසවල හා පටිසම්භිදාමග්ගයේ පැනෙන විශ්ලේෂී ස්වරූපය නිසා ම දීඝභාණකයෝ ඒවා අභිධර්මසමුච්ච වශයෙන් සප්‍රමාණික ව සැලකූ බව සුමඞ්ගලවිලාසිනියෙහි දැක්වේ. සුත්තවිභඞ්ගයෙහි (පාරාජිකපාළි හා පාචිත්තියපාළි) පාරිභාෂික වචන සඳහා විවරණ සපයන පදභාජනීය කොටස ද තරමක අට්ඨකථා ලක්ෂණවලින් යුතු වෙයි. ඒ ඒ ශික්ෂාපදයෙහි අවසානයට මෙම පදභාජනිය වර්ණනාව සම්බන්ධ වෙයි. මේ පදානුපදික විවරණය පර්යායවචනවලින් ද සමන්විත වීම විශේෂ වෙයි. එකී වාචික විග්‍රහයන් පමණක් නො ව, ඒ ඒ ශික්ෂාපදය පැනැවීමට හේතු වූ නිදානය දැක්වීම ද සලකා බැලිය යුතු ය. මාතිකා නමින් හැඳින්වෙන ගැඹුරු කෙටි ධර්ම පර්යායක් පදනම් කොට ගෙන සංස්ලේෂණ හා විශ්ලේෂණ නය අනුව ගොඩනැගී

CS CamScanner

ඇති අභිධර්ම පිටකය ද අට්ඨකථා ලක්ෂණවලින් ගහණ වූවකි. ධම්මසඞ්ගණිප්‍රකරණයෙහි අට්ඨකථා කාණ්ඩ යනුවෙන් වෙන ම කාණ්ඩයක් වෙන් කොට තිබීම ද වෙසෙසා දැක්විය යුතු ය. නවාඞ්ගසත්ථුසාසනයට කරන ලද අර්ථවිවරණයක් වූ නෙත්තිප්පකරණය ද, පිටක ග්‍රන්ථ තේරුම් ගැනීමට මාර්ගයක් ලෙස රචනා වූ පේටකෝපදේසය ද යන පශ්චාත්තන ත්‍රිපිටක ග්‍රන්ථ (මේවා සියම් බුරුම රටවල ප්‍රාමාණික බුද්දක ග්‍රන්ථ ලෙස සැලකේ.) භාෂා විශ්ලේෂණය හා අර්ථවිශ්ලේෂණය කැටි වූ ග්‍රන්ථද්වයයකි. මේ අනුව ධර්මපද වෙන වෙන ම ගෙන ඒවායේ අර්ථයට සමාන අර්ථ ඇති පර්යාය පද යෙදීමත්, ප්‍රස්තුත ධර්මපදයේ ප්‍රභේද දැක්වීමත්, නිදර්ශන කථා ඉදිරිපත් කිරීමත්, පද විග්‍රහයත්, සමකාලීන ඉතිහාස තොරතුරු දැක්වීමත් ත්‍රිපිටකයෙහි අට්ඨකථා ලක්ෂණ වශයෙන් හඳුනා ගත හැකි ය.

ඉහත කී දැයින් පෙළෙහි අටුවා ලකුණු දතුවා විනා පෙළ අටුවා ගණෙහි බැහීමට කාරණා නැත්තේ යි. "**පෙළ නම් වාචනාමග්ග කොටැ තබන ලදු**" නමුදු ඒ සියලු ම පෙළෙහි එන අර්ථකථන ක්‍රම අට්ඨකථා සම්පාදනයෙහි ආවශ්‍යකතාව අප වෙත ගෙනෙන්නේ යි. අටුවායෙහි කිසි තැනෙක අර්ථ දැක්වීමෙන් නො නැවතී අර්ථොද්ධාරය ද කරන ලද්දේ යි. එසේ ම අවැසි තෙන නිරුක්ති පදවිභාග හා ලක්ෂණ රසාදිය ද හෙළි කරන ලද්දේ යි.

> "**යායත්ථං අභිවණ්ණෙන්ති - බ්‍යඤ්ජනත්ථං පදානුගං**
> **නිදානවත්ථු සම්බන්ධං - එසා අට්ඨකථා මතා**"

යනුවෙන් අටුවා යනු කුමක් දැ'යි විස්තර කෙරේ. එනම්, **බ්‍යඤ්ජනාර්ථය, පදගතාර්ථය, නිදානය, වස්තුව ය, පූර්වාපර සම්බන්ධය** යන අඞ්ග පසෙන් යමෙක් යමක අර්ථ වර්ණනය කෙරෙද්ද, එය අට්ඨකථා යනුවෙන් සඳහන් වේ. මේ අනුව අර්ථකථා තුළින් උද්දීප්ත පෙළැඹවීම අට්ඨකථා බිහි වීමෙහි අවශ්‍යතාව නිර්මාණය කළේ ය. (**අත්ථප්පකාසනත්ථං සාසනපරියෙට්ඨිභාවතො**)

මූලික දේශනාවන් අනුක්‍රමයෙන් ව්‍යාප්ත වීමේ දී විවිධ මිත්‍යා මතිභ්‍රම ඊට එක්වීමේ අවදානම ශාසනභාරධාරී සම්මුඛ ශ්‍රාවකයන් වහන්සේලා දැන සිටියහ. නමුත්, පාලි ත්‍රිපිටකයේ අන්තර්ගතය සම්බන්ධයෙන් ඊට ම ආවේණික වූ ස්ථාවර අර්ථකථන සම්ප්‍රදායයක්

Scanned with CamScanner
CamScanner

පැවැතීමේ දී එවන් මිත්‍යා මතවාද සඳහා අවකාශ නො ලැබේ. පාලි අට්ඨකථා සම්පාදනය වූයේ ඒ උදෙසා ගනු ලැබූ ප්‍රඥාගෝචර ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක් ලෙසිනි.

**"අත්ථප්පකාසනත්ථං අට්ඨකථා ආදිතො වසීසතෙහි**
**පඤ්චහි යා සඞ්ගීතා, අනුසඞ්ගීතා ච පච්ඡාපි."**

අර්ථ ප්‍රකාශනය හෙවත් තේරුම් කිරීම අරමුණු කරගත් අට්ඨකථාවෝ පළමු සඞ්ගීතියේ දී පන්සියයක් මහරහතන් වහන්සේලා විසින් සඞ්ගායිත ව, යළි දෙවන හා තෙවන සඞ්ගිතීවල දී අනුසඞ්ගීත වූ බැව් සුමඞ්ගලවිලාසිනියේ සඳහන් ය. මේ අනුව අට්ඨකථා හුදෙක් මුල් බුදු සමයට පටහැනි පශ්චාත්තන මූලාශ්‍රය වශයෙන් ඒකාන්ත කොට ගැනීම දුෂ්කර ය. ප්‍රථම සඞ්ගීතියේ දී ම පර්යාප්තිය පිණිස භාණක පරම්පරා ආරම්භ කෙරුණු අතර දීඝාගමාදි තත් නිකායයනට වූ අට්ඨකථා ද භාණක පරම්පරාවන් විසින් ම දරන ලදි. ඔවුහු ඒවා පඨන-පාඨන, උද්ග්‍රහණ-ධාරණ, සජ්ඣායන-වාචන, විවරණ-විභජන ආදි න්‍යාය ක්‍රමයෙන් ගෙන පෙළ දහම රක්ෂිත කළෝයි. තෘතීය සඞ්ගීතියෙන් අනතුරු ව මහාමහින්ද මහාස්ථවිරයන් වහන්සේ විසින් ලක්දිවට වැඩමවනු ලැබුවේ ඒ පෙළ සහිත අට්ඨකථා යි. උන්වහන්සේ ඒවා දීපවාසීන්ගේ ප්‍රයෝජනය පිණිස හෙළ බසින් තැබූහ.

**"සීහළදීපං පන ආභතාථ වසිනා මහාමහින්දෙන,**
**ඨපිතා සීහලභාසාය දීපවාසීනමත්ථාය."**

එහෙත්, **"මගධ බසින් ආ බුදුකැලි අටුවා හෙළදිව් ඇජුරෝ හෙළ බසින් තැබූහ"** යි යන ධම්පියා අටුවා ගැටපද පාඨයට අනුව මගධබසින් ආ බුදුකැලි අටුවා සිංහලට නඟනු ලැබූයේ ලක්දිව් ආචාර්යයන් විසිනි. පසු ව බුද්ධඝෝෂ, ධම්මපාල, මහානාම, උපසේන, බුද්ධදත්ත යන ආචාර්යයන් විසින් දීපාන්තරවාසීන්ගේ ප්‍රයෝජනය පිණිස පාලි අර්ථකථා සම්පාදනයේ දී ද තදාශ්‍රිත මූලාශ්‍රය කොටගැනුණේ මෙසේ දීපවාසීන්ගේ ප්‍රයෝජනය පිණිස තැබූ හෙළටුවා යි. අනුරාධපුරයේ මහාවිහාරවාසීන්ගේ මූලට්ඨකථාව නොහොත් මහාට්ඨකථාව නොහොත් හුදුඅත්ථකථාව, අනුරාධපුරයේ ම උත්තර විහාරවාසිකයන්ගේ අටුවාව, ලංකාවේ කිසියම් තැනෙක දී පහුරකට නැඟී කරන ලද බැවින් මහාපච්චරිය

Scanned with CamScanner

CamScanner

නම් වූ අටුවාව, ලංකාවේ කුරුන්දවේළු විහාරයේ දී ලියන ලද කුරුන්දි අට්ඨකථාව යන හෙළටුවා ග්‍රන්ථ මෙන් ම, දකුණු ඉන්දියාවේ කාඤ්චිපුරම්හි පරම්පරාගත ව ආ අන්ධට්ඨකථාව හා දකුණු ඉන්දියාවේ දී ම සම්පාදිත අට්ඨකථාවකැ'යි සැලකිය හැකි සඞ්ඛේපට්ඨකථාව ද පාලි අටුවා සම්පාදනයේ දී සදාශ්‍රය කර ගැනිණ. අටුවාචාරීන් වහන්සේලා ලක්දිවට පැමිණෙන්නේ ද එවක භාරත දේශයේ ශේෂ ව තිබූ අට්ඨකථා ස්වල්පය සකල බුද්ධවචනය හැදෑරීමට තරම් ප්‍රමාණවත් නො වීම හේතුවෙනි. මහාවංසයට අනුව නම් පාලි අටුවා සම්පාදනය වන කාලය වන විට භාරතයෙන් අටුවා සම්ප්‍රදාය මුළුමනින් ම ගිලිහී ගොස් තිබිණි. මෙසේ පාලි අට්ඨකථා සම්පාදනයෙන් සැලසුණු වැදගත් ම ප්‍රයෝජනය වන්නේ සීහළදීපවාසීන්ට විශේෂයෙන් සීමා වී තිබූ ත්‍රිපිටකයට අදාළ අර්ථවර්ණනාවන් හෙවත් අටුවා සම්ප්‍රදාය දේශාන්තරයෙහි වසන බෞද්ධ පාඨකයනට ද අධ්‍යයනය කිරීමට අවස්ථාව විවර වීම යි. තව ද, පාලි භාෂාවෙහි අභිවර්ධනයක් ද විශේෂයෙන් ඇතිවිය. පාලිය පෙළ හා වාචනාමග්ගය ඇසුරු කොට පැවැති බැවින් බුද්ධවචනයෙහි නිරුක්ත්‍යර්ථය හැඳින ගැනීමට ද එය මනා රුකුලක් විය. **"යස්මා පමාණං ඉධ පණ්ඩිතානං"** යන සමන්තපාසාදිකා පාඨයට අනුව බුද්ධවචනය හැදෑරීමෙහි ලා සප්‍රමාණික මූලාශ්‍රයක් වශයෙන් මේ අට්ඨකථාවන්ගේ වැදගත්කම නිර්දේශ කෙරේ. අටුවාචාරීන් වහන්සේලා ස්වකීය කාර්යභාරය අත්ථසංවණ්ණනා හෙවත් අර්ථසංවර්ණනාවක් වශයෙන් හඳුන්වාදීමට ගත් රුචිකත්වය ද විශේෂ විමර්ශනයට ලක්විය යුතු. මහාවිහාරීය මතය උල්ලඞ්ඝණය නො වන පරිදි ථෙරවාදී සම්ප්‍රදාය ආරක්ෂා කරගනිමින් පාලි අටුවාකරණයේ යෙදීමට අටුවාචාරීන් වහන්සේලා අනුගමනය කළ ප්‍රතිපත්තිසමුදාය විභඞ්ග ට්ඨකථාවේ පැනේ. **"....තස්සා අත්ථ සංවණ්ණනං කරොන්තෙන විභජ්ජවාදී මණ්ඩලං ඔතරිත්වා ආචරියෙ අනබ්භාචික්කන්තෙන, සකසමයං අවොක්කමන්තෙන, පරසමයං ආනුයුහන්තෙන, සත්තං අප්පටිභාහන්තෙන විනයං අනුලොමන්තෙන, මහාපදෙස ඔලොකන්තෙන, ධම්මං දීපෙන්තෙන, අත්ථං සඞ්ගහන්තෙන, තමෙව අත්ථං පුනරාවත්තෙත්වා අපරෙපිහි පරියායෙහි නිද්දිසන්තෙනෙ ච යස්මා අත්ථ සංවණ්ණනා කාතබ්බා හොති."**

Scanned with CamScanner

CamScanner

**සාකච්ඡාවේ ප්‍රතිඵල හා නිගමනය :**

අට්ඨකථා සම්පාදනයේ දී සුත්ත, සුත්තානුලෝම, ආචරියවාද හා අත්තනොමති යන බුදු දහම විමැසීමේ දී භාවිත කළ හැකි මූලාශ්‍රය සාදක උපයුක්ත කොට ගෙන තිබේ. නිදානකථා හා දෘෂ්ටාන්ත, අත්ථුද්ධාර ක්‍රමය, අනුසන්ධි, පඤ්හකම්ම, අර්ථ සූචනය සඳහා උපමා හා උපමාකථාවන්හි භාතවිය, උපදේශාත්මක ප්‍රකාශන, අර්ථය විශද කිරීමට ව්‍යාකරණයෙහි දායකත්වය, වාක්‍යාංශ ආදේශය පාඨසෙස, වචනසෙස සහ සෙස, අර්ථ පෝෂණය, අර්ථ සම්ප්‍රසාරණය, විශේෂණ න්‍යාය, අවස්ථාවෝචිත අර්ථකථන, ක්‍රම කිහිපයකින් ඉදිරිපත් කරන අර්ථකථන ආදිය අට්ඨකථාවන්හි අර්ථ විශ්ලේෂණය සඳහා භාවිත කළ ක්‍රම වේ. පුනරුක්ති අපහරණය සහ සංක්ෂිප්තතාව, ප්‍රමාදලේඛ මඟහැරීම, අපුබ්බපද හා අනුත්තානපද වර්ණනාව, පටිපක්ඛනය හා සඞ්ඛේපවණ්ණනාදිය සංක්ෂේපන ක්‍රම වශයෙන් අනුගමනය කොට තිබේ. ශාස්ත්‍රීය සංස්කරණයක් වශයෙන් පාඨාන්තර තුලනයටත්, මතාන්තර විචාරයටත්, මතාන්තර ප්‍රතිබාහනයටත්, විතණ්ඩවාදී මත නිග්‍රහයටත් අටුවාචාරීන් වහන්සේලා අවධානය යොමු කොට තිබේ. මේ කරුණු අනුව අටුවාවන්හි ඓතිහාසිකත්වය හා ප්‍රාමාණිකත්වය තහවුරු වන අතර, බුද්ධවචනය හැදෑරීමෙහි ලා ප්‍රමාණයක් වශයෙන් අටුවා සම්ප්‍රදාය යොදා ගැනීමේ වැදගත්කම ද තහවුරු වේ.

ප්‍රමුඛ පද : අට්ඨකථා, අනුබෝධ, කඞ්ඛාඨානීයෙසු ධම්මේසු, කථාපාභත, අත්ථසංවණ්ණනා

Scanned with CamScanner
CamScanner

# යොවුන් චිත්තවේගීක ගැටලු පාලනය කිරීම සඳහා උපයෝගී කරගත හැකි බෞද්ධ චිත්තවේග පාලන සංකල්ප පිළිබඳ අධ්‍යයනයක්

එස්. එච්. එල්. අකිල ඖෂධ බණ්ඩාර, ඒ. සචිනි වාසනා මදූශානි[1]

## හැඳින්වීම

යොවුන්විය යනු මානව සංවර්ධනයේ දෙවැනි උපත ලෙස සඳහන් කළ හැකිය. උපතේ සිට මරණය දක්වා ම මිනිසා අඛණ්ඩ වර්ධනයට යොමු වීම ස්වාභාවික කරුණකි. ළමා විය නිම කර වැඩිහිටි වියට පැමිණීම යෞවනෝදය ලෙස හැඳින්වේ. වයස අවුරුදු 10 - 12 ත් අතර කාලය තුළ ගැහැණු පිරිමි දෙපාර්ශවයේ ම ශාරීරික ලක්ෂණ පමණක් නො ව මානසික ලක්ෂණයන්හි ද වෙනස්වීමක් දැක ගත හැකිය. බුද්ධිය, රුචි අරුචිකම්, ආකල්පවල පමණක් නොව ස්වීයත්වය හා ශාරීරික වර්ධනය පිළිබඳව ද මේ වකවානුව තුළ වෙනස් වීමක් සිදු වේ. ළමාවිය, යොවුන්විය, වැඩිහිටිවිය වයස්ගතවිය යන ජීවිතයේ ප්‍රධාන අවධි හතරින් වැඩිම කායික, මානසික පරිවර්තනීය අවධිය සිදුවන්නේ යොවුන් වියේදී බව පැහැදිලිය.

## අරමුණ

යොවුන් වියේ දී යෞවනයා තුළ ඇතිවන චිත්තවේග පාලනය කිරීම සඳහා බෞද්ධ මනෝවිද්‍යාවේ සංකල්ප සාර්ථකව යොදා ගත හැකි ද යන්න අධ්‍යයනය කිරීම.

---

1 ශිෂ්‍ය මනෝ උපදේශක, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

CamScanner

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ විධික්‍රමයට අනුව ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීයික මූලාශ්‍ර හා තෘතීයික මූලාශ්‍ර යොදා ගෙන මෙම පර්යේෂණය සිදු කරනු ලැබේ.

**සාකච්ඡාව**

යොවුන් වියට පා තබන යෞවනයාගේ ශාරීරික වෙනස්වීම සියල්ලන්ටම පොදුවේ සිදු වේ. නමුත් චිත්තවේග වර්ධනය එකිනෙකාට වෙනස් මට්ටමකින් සිදු වේ. ලැජ්ජාව, බිය, සබකෝලය, ප්‍රීතිය, ශෝකය, ආදරය හා කෝපය වැනි චිත්තවේග පහළ වීම මෙම අවධියේ දක්නට ලැබේ. ඇතැම්විට අනම්‍යබවකින් යුතු අහේතුක තාර්කික චිත්තවේග ඇති වීම ද දක්නට ලැබේ. මෙලෙස අධික චිත්තවේගිකබව, චිත්තවේග පාලනය කර ගැනීමට නො හැකි වීම, චිත්තවේග කැළඹීම, චිත්තවේග අස්ථාවර හා අසමතුලිත වීම යනාදී තත්ත්වයන් හේතුවෙන් මානසික අසහනකාරී තත්ත්වයන්ට පත් වේ. මෙවැනි තත්ත්වයන් හේතුවෙන් ඇතැමෙකු මානසික ව්‍යාකූලත්වයට පවා පත් වීම දක ගත හැකිය. මෙම චිත්තවේග පාලනය කිරීම සඳහා බෞද්ධ මනෝ විද්‍යාවේ ඉදිරිපත් වී ඇති සංකල්පයන් පිළිබඳව මෙම අධ්‍යයනය තුළින් සාකච්ඡා කර තිබේ.

බුදු දහම තුළ චිත්තවේග නමින් හැඳින්වෙන මානසික තත්ත්වයන් පිළිබඳ ව ප්‍රාමාණික විවරණ සිදු කර තිබේ. විශේෂයෙන් ම ඇගයුම්ශීලි නැඹුරුතාවකින් යුත්කව ආචාරාත්මක පදනමකින් චිත්තවේග පිළිබඳ ව බෞද්ධ මනෝවිද්‍යාවේ සඳහන් වේ. මෙම අධ්‍යයනය තුළ බෞද්ධ මනෝවිද්‍යාවට අනුව චිත්තවේග හැඳින්වීම, චිත්තවේග වර්ග, චිත්තවේගවල විවිධ මට්ටම්, චිත්තවේග කළමනාකරණය සඳහා ක්‍රමවේදයන් භාවිතය පිළිබඳ ව අධ්‍යයනය කර තිබේ. එහිදී යොවුන් විය තුළ යෞවනයාට ඇති වන චිත්තවේගික ගැටලු සඳහා උක්ත ක්‍රම භාවිත කළ හැකි ආකාරය පිළිබඳව ද සාකච්ඡා කර තිබේ.

**ප්‍රතිඵල**

යොවුන් වියේ දී යෞවනයා තුළ චිත්තවේග ඇති වීම සාමාන්‍ය මානසික තත්ත්වයකි. නමුත් අධික චිත්තවේග ඇති වීම

Scanned with CamScanner

CamScanner

හෝ සෘණ චිත්තවේග ඇති වීම පාලනය කළ යුතුය. ඒ සඳහා බෞද්ධ මනෝවිද්‍යාව තුළ ඇති චිත්තවේග පාලන සංකල්ප සාර්ථක ව යොදා ගැනීම තුළින් යොවුන් වියේදී ඇති වන චිත්තවේග පාලනය කළ හැකි බව ගම්‍ය විය.

**සමාලෝචනය**

යොවුන් වියේදී යෞවනයා තුළ ඇති වන චිත්තවේග පාලනය කිරීම සඳහා බෞද්ධ සංකල්පයන් පිළිබඳව යෞවනයා තුළ දැනුවත්භාවයක් ඇති කළ යුතුය. එමගින් මානසික සමබරතාවකින් යුතු පුද්ගලයෙකු සමාජ ගත කිරීමට අවශ්‍ය අඩිතාලම සැකසිය හැකිය.

**ප්‍රමුඛ පද : යොවුන් විය, චිත්තවේග, චිත්තවේග පාලනය, බෞද්ධ මනෝවිද්‍යාව, යෞවනයා**

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය.**


1. පෙරේරා ඥානදාස, යොවුන් විය හා මනෝවිද්‍යාව, (2001), සහසු ප්‍රකාශකයෝ, කොළඹ 10.
2. පෙරේරා ඥානදාස, ආධ්‍යාත්මික සෞඛ්‍යය, (2005), සහසු ප්‍රකාශකයෝ, කොළඹ 10.
3. අබේපාල රෝලන්ඩ්, නව යෞවනය මනෝවිද්‍යාත්මක විග්‍රහයක්, (2015), සාර ප්‍රකාශන, කොට්ටාව.
4. පඬුවාවල සරත්, යොවුන් වියේ මානසික ගැටලු හා ආබාධ, (2014), සූරිය ප්‍රකාශකයෝ, කොළඹ 10.
5. පේමරතන හිමි සුරක්කුලමේ, බෞද්ධ මනෝවිද්‍යාව, (2008) දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ 10.
6. හෙට්ටිආරච්චි ධර්මසේන, බෞද්ධ මනෝවිද්‍යා ප්‍රවේශය, (2008) දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ 10.
7. අතුකෝරාල දයා රෝහණ, යොවුන් වියේ පෞරුෂය ශක්තිමත් කර ගත හැකි මඟ, (2011), ශික්ෂා මන්දිර ප්‍රකාශන, කොළඹ 08.


Scanned with CamScanner

CamScanner

# වත්මන් පවුල් සංස්ථාවේ ක්‍රියාකාරීත්වයට යුතුකම් හා වගකීම්හි උපයෝගීතාව (සිගාලෝවාද සූත්‍රය ඇසුරින්)

විජේතුංග, ඩබ්ලිව්. ටී. ඩී,[1] සාරංගි, ඊ. එම්. එල්. එන්[2] ශ්‍යාමලී, ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්[3]

පවුල් සංස්ථාව යහපත් අයුරින් පවත්වාගෙන යාමට නම් නිසි පරිදි යුතුකම් සහ වගකීම් ඉටු කළ යුතු බව දීඝ නිකායේ ඇතුළත් සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වේ. මෙහි අධ්‍යයන ගැටලුව වන්නේ බුද්ධ දේශනාවේ සඳහන් යුතුකම් සහ වගකීම් නූතන පවුල් සංස්ථාවෙහි පවතින්නේ ද යන්න අධ්‍යයනය කිරීම යි. මෙහි දී වර්තමානයේ පවුල් සංස්ථාවේ ක්‍රියාකාරීත්වය සඳහා යුතුකම් හා වගකීම්හි උපයෝගීතාව සිගාලෝවාද සූත්‍රය ඇසුරින් අධ්‍යයනය සඳහා විශ්ලේෂණාත්මක හා තුලනාත්මක ක්‍රමවේදය යටතේ සාහිත්‍ය මූලාශ්‍රය භාවිත කරන ලදී. යුතුකම් හා වගකීම් වර්තමාන පවුල් සංස්ථාවේ ක්‍රියාකාරීත්වය සඳහා කරන බලපෑම අධ්‍යයනය මෙහි ප්‍රධාන අරමුණ යි. සුවිශේෂී අරමුණු ලෙස දෙමාපිය - දූදරු සහ අඹු - සැමි වශයෙන් ඔවුනොවුන්ගෙන් ඉටු විය යුතු යුතුකම් පිළිබඳ අධ්‍යයනය, වර්තමාන පවුල් සංස්ථාව මෙම නිවැරැදි පිළිවෙත් අනුගමනය කරන්නේ ද යන්න හඳුනාගැනීම හා නිවැරැදි අයුරින් යුතුකම් ඉටු නො වන්නේ නම් එය මැනවින් කළ යුතු ආකාරය සිගාලෝවාද සූත්‍රය ඇසුරින් හඳුනාගැනීම දැක්විය හැකි ය.

---

1 සමාජවිද්‍යා අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ,

2 එම

3 එම

සිගාලක ගෘහපුත්‍රයා සදිසා නමස්කාරයේ යෙදී සිටියදී බුදුන් වහන්සේ සිගාලෝවාද සූත්‍රය දේශනා කර තිබේ. පවුල් සංස්ථාවක් ගත් කල ප්‍රධාන වශයෙන් ම පුද්ගලයකු ජනිත වන පවුල හා තමා විසින් උත්පාදනය කරගන්නා පවුල වශයෙන් ප්‍රධාන කොටස් දෙකකි (සමරකෝන්,2015,21). මෙහි දී මූලික වශයෙන් මා පිය දූදරු සබඳතාව දැක්විය හැකි ය. පුද්ගලයෙක් දරුවකු වශයෙන් අධ්‍යාපනය හදාරා වැඩිවියට පැමිණ විවාහයට එළඹීමෙන් පවුලක් උත්පාදනය කරයි. චක්‍රාකාර ව පුද්ගල ජීවිතය සමග මෙම යුතුකම් හා වගකීම් බැඳී පවතියි. පවුලක සමගිය සතුට දියුණුව ඇති වීමට අඹු සැමි දෙදෙනා ම ඔවුනොවුන් සම්බන්ධයෙන් තම තමාට අයත් යුතුකම් නො පිරිහෙළා ඉටු කළ යුතු ය. බොහෝ දෙනා තමාගේ යුතුකම් ඉටු නො කොට අන් අයගෙන් තමන්ට ඉටු විය යුතු යුතුකම් පිළිබඳ බලාපොරොත්තු වෙති. බොහෝ පවුල් සංස්ථාවල ගැටලු මතු වීමට මෙය බලපා ඇත. තථාගතයන් වහන්සේ විසින් බස්නාහිර දිශාවෙන් පිදුම් ලබන අඹු සැමි යුතුකම් වෙන් වෙන් වශයෙන් දක්වා තිබේ. සම්මාන කිරීම, අවමන් බස් නොකීමෙන්ද, පරඹුවන් කරා නොයෑමෙන් ද, ගෙහි කටයුතුවල අධිපති බව ඇයට භාර දීමෙන් ද තමන් පොහොසත් පරිදි ඇඳුම් පැළැඳුම් සපයා දීමෙන් ද, බිරියට සංග්‍රහ කළ යුතුය (ආනන්දමෛත්‍රී හිමි,2006,307). පතිනිය පහත අයුරින් පතියාට සංග්‍රහ කරයි. මනා ව සංවිධාන කරන ලද කටයුතු ඇත්තියක් වේ, පිරිවර ජනයාට මනා ව සංග්‍රහ කරන්නියක් වේ, අනාචාරයෙහි නො හැසිරේ, හම්බ කළ දේ (හොඳින්) රකී, සියලු කටයුතුවල දක්ෂ ද අනලස ද වේ (බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථාන අත්පොත,2014,31-32).

වත්මන් සමාජයේ පවුල් සංස්ථාවන්හි යහපත් ජීවිකාවක් ගත කරන පවුල් දැකගත හැකි ය. නාගරීකරණය හමුවේ ආර්ථික ක්ෂේත්‍රය මූලික කරගනිමින් ධනය, බලය සහ තිලය පසුපස හඹා යන සමාජ ක්‍රමයේදී පුරුෂයා පමණක් නො ව ස්ත්‍රිය ද ආර්ථික ඉප-යීම් සඳහා දායක වන බැවින් අවිවේකී වී ඇත. අඹු සැමියන් අතර පවතින සුහදශීලීත්වය, බැඳීම කෙමෙන් ගිලිහෙමින් පවතී. ගෘහ සේවය සඳහා ස්ත්‍රීන් මැදපෙරදිග රටවලට සංක්‍රමණය වීම, ග්‍රාමීය ප්‍රදේශවලින් නාගරික ප්‍රදේශවලට සංක්‍රමණය වීම මෙයට මූලික හේතු ය. ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවෙන් බිහි වන විවාහ සංස්ථාවේ

Scanned with CamScanner
CamScanner

සමාජ කාර්යභාරය විමසීමේ දී දරුවන් හැදීම (ප්‍රජනනය), විධිමත් ලෙස ඇතිදැඩි කිරීම, පෞද්ගලික අවශ්‍යතා තෘප්තිමත් කිරීම (ලිංගික ආශාව), ආදරය හා සහකාරීභාවය වර්ධනය කිරීම, සමාජ තත්ත්වය වෙනස් කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය අතර ශ්‍රම විභජනයට, පරිභෝජනයට, නිෂ්පාදනයට යන කාර්යයන් සියල්ල සඳහා අවිධිමත් ලෙස මෙන්ම අනවබෝධයෙන් සම්බන්ධවීම තුළ ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දී ඇති බව පැහැදිලි ය. (ජයතුංග,2013,37).

මෙම ගැටලුකාරී තත්ත්ව හමුවේ ස්ත්‍රිය මෙන් ම පුරුෂයා ද තම අවශ්‍යතාවන් ඉටු කරගැනීම සඳහා අනියම් සබඳතා පැවැත්වීම, දික්කසාද වීම, මිනීමැරුම් සහ සියදිවි නසාගැනීම දක්වා යොමු වී ඇත. අඹු සැමි දෙදෙනා ම අනාචාරයේ නො හැසිරෙත් නම්, ස්වාමියා ගෘහ කටයුතු, ඇඳුම් පැලඳුම් සහ ආභරණ ආදිය බිරියට ලබාදෙයි නම්, බිරිය ස්වාමියා විසින් ඉපයූ දේ හොඳින් ආරක්ෂා කරමින් සියලු කටයුතුවල දක්ෂ හා අනලස් ව ක්‍රියා කරයි නම් තමා විසින් උත්පාදනය කළ පවුලෙහි යහපත් ක්‍රියාකාරීත්වයක් පවත්වාගෙන යා හැකි ය.

දරුවන් ලත් අඹු සැමියෝ දෙමාපියෝ වෙති. දරුවන් සිටීම ඔවුන්ට සතුටක් මෙන් ම සැපතකි. මනුෂ්‍යයා පළමුවෙන් ම මෙලොව උපදින්නේ දින ගණනක් වත් ස්වශක්තියෙන් ජීවත් විය හැකි ශක්තියක් ඇති ව නො වේ. මාපියන්ගේ උපකාරය නො ලදොත් ඔහුට මෙලොවින් තුරන් වීමට සිදු වේ. දරුවකු ස්වශක්තියෙන් ජීවත් විය හැකි තත්ත්වයකට පැමිණවීමට මාපියනට බොහෝ කලක් වෙහෙසෙන්නට සිදු වේ. දරුවන් යහපත් වනු දැකීම දෙමව්පියන්ගේ එක ම බලාපොරොත්තුව යි. දෙමාපියන් විසින් දරුවන්ට ඉටු කළ යුතු යුතුකම් තථාගතයන් වහන්සේ දේශනා කර ඇත්තේ ''පාපා නිවාරෙන්ති, කල්‍යාණෙ නිවසෙන්ති, සිප්පං සික්ඛාපෙන්ති, පතිරූපෙන දාරෙන සංයොජෙන්ති, සමයෙ දායජ්ජං නීය්‍යාදෙන්ති'' වශයෙනි. පාපයෙන් වළක්වාලීම යහපතේ යෙදවීම, ශිල්ප ඉගැන්වීම, සුදුසු සහකරුවකු තෝරාදීම හා සුදුසු කල්හි දායාද පවරා දීම යනාදිය මා පියන් විසින් ඉටු කළ යුතු යුතුකම් ය (චන්දවිමල හිමි,2009,227).

Scanned with CamScanner
CamScanner

මාපියන් බොහෝ දුක් විඳ දරුවන් පෝෂණය කරනුයේ තමන්ට නො හැකි කල දරුවන්ගේ පිහිට පතා ය. බාල කාලයේ දී තමන් පෝෂණය කළ මාපියන් හට ඔවුන් බලාපොරොත්තු වන කරුණු පහ ඉටු කිරීම දරුවකුගේ පරම යුතුකම වේ. දරුවකු විසින් දෙමාපියන්ට ඉටු කළ යුතු යුතුකම් ලෙස තථාගතයන් වහන්සේ දේශනා කර ඇත්තේ, මව්පියන් පෝෂණය කිරීම, මව්පියන්ට පැමිණි කටයුතු ඔවුන් වෙනුවෙන් කළ යුතුය, කුල පරපුර රැකිය යුතු ය, මව්පියන් සතු වස්තුව හරි හැටි පරිහරණය කළ යුතුය. හා මියපරලොව ගිය පසු ඔවුන් වෙනුවෙන් පින් දහම් කළ යුතු ය (සිගාලෝවාද සූත්‍රය,29) යනුවෙනි. නිරන්තරයෙන් ම දරුවන්ට කරුණාව ඇත්තා වූ මාපියෝ තමනට උපස්ථාන කරන ගුණවත් කීකරු දරුවාට විශේෂයෙන් අනුකම්පා කරති. එබඳු දරුවාගේ යහපත සඳහා කළ හැකි සෑම දෙයක් ම ඉතා ඕනෑකමින් කරති. මාපිය උපස්ථානය කරන සත්පුරුෂයාට අන්‍ය සත්පුරුෂයෝ ද අනුකම්පා කරති. දෙවියෝ ද අනුකම්පා කරති. යම් මිනිසෙක් මව හෝ පියා හෝ දැහැමින් පෝෂණය කෙරේ ද ඔහුට මෙලොව නුවණැත්තෝ පසසති. හේ මරණින් මතු ස්වර්ගයෙහි ඉපිද සතුටු වේ (චන්දවිමල හිමි,2009,234).

බුදුන්ගේ පහස ලද ශ්‍රී ලංකාවේ අතීත සමාජය බුදුදහමින් සුපෝෂිත යහපත් ගුණගරුක සමාජයකි. එහි පවුල් සංස්ථාව ද විස්තාරික ක්‍රමයකට ක්‍රියාත්මක විය. සමාජයේ සංකීර්ණත්වයත් සමග පවුල් සංස්ථාව ද න්‍යෂ්ටික තත්ත්වයට පත් විය. එහි දෙමාපිය දූදරු සබඳතාව ඉතා දුරස් ය. බාලාපචාර, ස්ත්‍රී දූෂණ, අතවර යනාදිය පවුල් සංස්ථාවෙහි ම සිදු වන බවත් දෙමාපියන් විසින් දරුවන් නො සලකන, දරුවන් විසින් දෙමාපියන් නො සලකන තත්ත්වයක් උද්ගත ව ඇත. ප්‍රධාන වශයෙන් දායාද වෙනුවෙන් ගැටුම් ඇති වේ. දරුවන් හැර යාම, විදේශගත වීම, දරුවන්ගේ ආවාහ විවාහ සමග දෙමාපියන් එපා වීම ආදිය ද පවතියි. මෙය වත්මන් පවුල් සංස්ථාවේ ක්‍රියාකාරීත්වයට බෙහෙවින් බලපෑම් කරයි. අවසාන වශයෙන් දෙමාපියන් වැඩිහිටි නිවාසවල, මහමඟ දමා යන තත්ත්වයකට පත් ව ඇත.

**සාරාංශය**

වත්මන් පවුල් සංස්ථාවේ ක්‍රියාකාරීත්වයට යුතුකම් හා වගකීම්හි උපයෝගීතාව කෙලෙසක පවතින්නේ ද යන්න පිළිබඳ

සිගාලෝවාද සූත්‍රය ඇසුරින් සිදු කළ විශ්ලේෂණාත්මක තුලනාත්මක අධ්‍යයනය හරහා අවධාරණය කරගැනීමට හැකි වූ ප්‍රධාන කරුණ නම්, අනෙකා වෙනුවෙන් තම යුතුකම් ඉටු කිරීම අවම බව යි. ගැටලුකාරී තත්ත්ව, පවුල් ආරවුල් ඇති වීමට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ තමන්ගෙන් ඉටු විය යුතු යුතුකම් ඉටු නො කොට අනෙකාගෙන් තමාට ඉටු විය යුතු යුතුකම් පමණක් බලාපොරොත්තු වීම යි. පවුල් සංස්ථාවේ සාමාජිකයන්ගේ දූරස්ථභාවය (අධ්‍යාපන හෝ රැකියා සඳහා ප්‍රදේශයෙන් හෝ රටෙන් බැහැර වීම) මෙම යුතුකම් පිරිහීමට හේතු වී ඇත. ආර්ථිකය පසුපස හඹා යමින් තම සුඛවිහරණය පමණක් සිතා මමායනත්වයෙන් වැඩ කරන මිනිසුන් බිහි වී ඇත. මෙම විෂමාචාරී සමාජයෙහි බුදුදහමට අනුව යමින් තම යුතුකම් නිසි ලෙස ඉටු කරමින් කටයුතු කරන අතලොස්සක පිරිසක් ද සිටීම සතුටට කරුණකි.

## ආශ්‍රිත ග්‍රන්ථ

ආනන්දමෛත්‍රී, බලන්ගොඩ, (2006). සූත්‍රපිටකය, දීඝනිකාය.

චන්ද්‍රවිමල හිමි, ආර්, (2009). බෞද්ධයාගේ අත්පොත, පොකුණුවිට; ශ්‍රී චන්ද්‍රවිමල ධර්මපුස්තක සංරක්ෂණ මණ්ඩලය.

ජයතුංග, එන්, (2013). සමාජීය විද්‍යා ලිපි, කඩවත; නුවණි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථාන අත්පොත, (2014). සිගාලෝවාද සූත්‍රය, දෙහිවල; බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රකාශන.

සමරකෝන්, එම්, (2015). සමාජ සංස්ථා, කර්තෘ ප්‍රකාශන.

Scanned with CamScanner

CamScanner

# මිච්ඡා සතිය සහ මානව ගැටලු ප්‍රභවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කොග්ගල්ලේ විජිත හිමි[1]

මානව අරමුණු සාධනයේ දී මිථ්‍යාදෘෂ්ටි විධික්‍රම බණ්ඩනය කරන විරිය චෛතසිකයෙහි ක්‍රියාකාරී පදනම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

## හැඳින්වීම

මානව සංවර්ධනයට අදාළ විවිධ අරමුණු සාධනය කර ගැනීමේ දී ඒ සඳහා විවිධ විධික්‍රම නූතන සමාජයෙහි පවතී. විවිධ පුදපූජා, ශාන්තිකර්ම, කන්නලව්, යාගහෝම ආදී වශයෙන් බොහෝ පිළිගැනීම් ඒ සම්බන්ධයෙන් පවතී. එහෙත් බුදුදහම ඒ සඳහා නිර්දේශකොට ඇති එක් ප්‍රධාන සංකල්පයක් වශයෙන් විරිය චෛතසිකය හැඳින්විය හැකි ය. එහෙත් වර්තමාන සමාජයෙහි පුද්ගලයා තමාට අවශ්‍ය දේ සිදුකර ගැනීම සඳහා වීර්යය වඩනවා වෙනුවට වෙනත් බොහෝ කාර්යයන් සිදු කරති. මෙසේ තමාගේ සියලු වගකීම් වෙනත් අදෘෂ්‍යමාන බලවේගයකට භාරදී ඒ අනුව ප්‍රතිඵල අපේක්ෂා කරන අවස්ථා අනන්තවත් සමාජයෙන් දැකගත හැකි ය. ඒ අනුව මිත්‍යා දෘෂ්ටිය ව්‍යාප්ත කිරීමටත් හා ඊට අදාළ ප්‍රතිපදා ව්‍යාපාර වශයෙන් ආරම්භ කිරීමටත් පෙළඹී තිබේ. සාමාන්‍ය ජනතාව මෙහි ගොදුරක් බවට පත් වේ. නූතන සන්නිවේදන මාධ්‍ය ද මේ සඳහා ප්‍රධාන කාර්යභාරයක් වාණිජමය වශයෙන් ඉටු කරමින් පවතී. මේ සඳහා බුදුදහමින් ගත හැකි විසඳුම් වීර්යය සංකල්පය අනුව යමින් අධ්‍යයනය කිරීම මෙමගින් සිදු කෙරේ.

---

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර.

Scanned with CamScanner
CamScanner

**අරමුණු**

නූතන සමාජයෙහි මානව අවශ්‍යතා, අරමුණු, අභියෝග සහ ඉලක්ක සාධනය කර ගැනීම සඳහා විවිධ මිථ්‍යා විධික්‍රම වඩාත් සීග්‍රයෙන් වර්ධනය වෙමින් පවතී. මිථ්‍යා දෘෂ්ටිය සමාජගත කොට මානව ශක්තීන් බන්ධනය කරමින් වාණිජමය අපේක්ෂා මුදුන් පමුණුවා ගැනීම ප්‍රධාන ව්‍යාපාරයක් බවට පත් ව තිබේ. මානව සංවර්ධනයෙහි ඵලදායිතාව විරිය චෛතසිකය මත සිදුවන අයුරු පෙන්වා දෙමින් මිථ්‍යා දෘෂ්ටික විවිධ විධික්‍රම බෞද්ධ ඉගැන්වීම් ආශ්‍රයෙන් ඛණ්ඩනය කිරීමට යත්න දැරීම මෙම පර්යේෂණයෙහි අපේක්ෂාව යි.

**පර්යේෂණ ගැටලුව**

පුද්ගල ඉලක්ක, අභියෝග, අවශ්‍යතා සාධනයේ දී වඩාත් නිවරදි හා ඵලදායි ධර්මානුකූල ගමන් මග කවරේ ද යන්න අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව යි.

**පර්යශේෂණ ක්‍රමවේදය**

මෙය ශාස්ත්‍රීය පර්යේෂණයකි. එහෙයින් සූත්‍ර පිටකය සහ අභිධර්ම පිටකය ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් ද අදාළ ප්‍රාමාණික ග්‍රන්ථ ද්විතීයික හා තෘතීයික මූලාශ්‍ර වශයෙන් පරිශීලනය කිරීම සිදුවිය.

**සාකච්ඡාව**

මානවයාගේ ආරම්භයේ සිට ම පුද්ගල අරමුණු, ඉලක්ක, අවශ්‍යතා සාධනය කර ගැනීම සඳහා විවිධ උපාය, විධික්‍රම, පුදපූජා චාරිත්‍ර ආදිය අනුගමනය කොට තිබේ. එම ඇතැම් ඉගැන්වීම් මානව පෞරුෂයට වඩාත් හානිකර බැවින් ද මානව ශක්තීන් දුර්වල කරන බැවින් ද බුදුන් වහන්සේ ප්‍රතික්ෂේප කළ හ. ඒ සඳහා වඩාත් නිවරදි හා ඵලදායී ක්‍රමවේදය ලෙස බුදුදහම වීර්යය චෛතසිකය නිර්දේශ කළ හ. එහෙයින් වීර්යය තරම් වටිනා දෙයක් යමෙකුට නොමැති බව දේශනා කොට තිබේ.

> **"මහණෙනි, යම්සේ සම්‍යක් ප්‍රධාන වීය්‍යය මහත් වූ අර්ථය පිණිස පවතී ද, මහණෙනි, මේ බඳු වූ අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, සම්‍යක් ප්‍රධාන වීය්‍යය මහත්**

Scanned with CamScanner
CamScanner

වූ අර්ථය පිණිස පවතී."(අ. නි, 1, විරියාරම්භ වග්ගය, 5. විරියාරම්භ සූත්‍රය, පි.30)

එසේ ම සම්‍යක් වීර්යය කිරීම හේතුවෙන් යමෙකු තුළ මෙතෙක් නූපන් මානසික, ආධ්‍යාත්මික, කායික ආදී විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ ව කුසල ධර්ම උපදින අතර මෙතෙක් පැවති අකුසල ධර්ම දුරු වේ. නූපන් කුසල ධර්ම උපදවාගැනීමටත් උපන් අකුසල ධර්ම දුරු කර ගැනීමටත් වර්ධනය කළ යුතු එකම ධර්මය සම්‍යක් වීර්යය බව බෞද්ධ ඉගැන්වීම යි.

**"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ විරියාරමෙභා. ආරද්ධවිරියස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති**"(අ. නි, 1, විරියාරම්භ වග්ගය, පි.22)

වීර්යය අඛණ්ඩ ව පවත්වාගෙන යාම පෘථග්ජන පුද්ගලයාට අභියෝගයකි. අරමුණු සාධනය වීර්යයෙන් කළ යුතු වුව ද පෘථග්ජන මනස තුළ ක්‍රියාකාරී බවට පත්වන ථීනමිද්ද චෛතසිකය ඊට බාධා කරයි. ඒ හේතුවෙන් පුද්ගලයා ඉතා පහසුවෙන් අනුග මනය කළ හැකි මිථ්‍යා ක්‍රමවේද අනුගමනය කිරීමට පෙළඹේ. එහෙයින් කායික හා මානසික වශයෙන් පුද්ගලයා අලස බවට පත් කරන ථීනමිද්ද චෛතසිකය බන්ධනය කරමින් වීර්යය පියවර තුනක් ඔස්සේ වර්ධනය කර ගැනීම මානව ඉලක්ක සාධනයෙහි නිවැරදි ගමන් මග බව බෞද්ධ ආකල්පය බව පෙන්වා දී ඇත්තේ මෙසේය.

**"මහණෙනි, යමක් හේතුකොටගෙන නූපන්නා වූ ථීනමිද්දය නූපදනේනම්, උපන්නා වූ ථීනමිද්දය ප්‍රහීන වේ නම්, මහණෙනි, මේ ප්‍රථමාරම්භ වීර්යය සංඛ්‍යාත ආරම්භ ධාතු ද කුසීතභාවයෙන් නික්මුණු බැවින් එයට වඩා බලවත් නික්කමධාතු ද සම්බාධ මැඩ මතුමත්තට යන හෙයින් එයට ද වඩා බලවත් පරක්කමධාතු ද යම්සේ වේද එබඳු අන් එකඳු ධර්මයකුදු මම නුවණැසින්**

Scanned with CamScanner
CamScanner

> නොදක්මි. මහණෙනි, ආරබ්ධ වීර්යය ඇතියහුට නූනප්නා වූ ද ථීනමිද්දය නූපදනේ ය. උපන්නාවූ ද ථීනමිද්දය ප්‍රහීණ වේ." (අ. නි, 1, නීවරණ ප්‍රහාණ වග්ගය, 2, පි.8-9)

මෙහි දී ථීනමිද්දය වීර්යයෙන් දුරු කල යුතු බව පෙන්වා දෙමින් එහි පියවර තුනක් දක්වා තිබේ. එනම්, ආරම්භ ධාතු, නික්ඛම ධාතු සහ පරක්කම ධාතු වශයෙනි. යමෙකු තුළ පවත්නා ථීනමිද්දය යම් ක්‍රියාවක් වීර්යය උපදවා ආරම්භ කිරීමෙන් මර්දනය කළ හැකිය. එය තවදුරටත් වීර්යයෙන් පවත්වාගෙන යාමෙන් අලස කමින් නික්මීම සිදුවන බවත් පෙන්වා දී ඇත. එය නික්කම ධාතු වශයෙන් හඳුන්වා තිබේ. ආරම්භ කළ කටයුත්ත නොනවත්වා පවත්වාගෙන යාම එහි දී සිදුවේ. වීර්යයෙන් බාධක මැඩගෙන ඉදිරියට අඛණ්ඩ ව පවත්වාගෙන යාම පරක්කම ධාතු වශයෙන් දක්වා තිබේ. මෙසේ යමෙකු තුළ පවත්නා ථීනමිද්දය දුරු කිරීම සිදුකළ හැකි බව උගන්වා තිබේ. යමෙකු වඩාත් බලවත් ලෙස වීර්යය කිරීමෙන් ථීනමිද්ධය මර්දනය කළ හැකි ය.

බුදුදහම පෙන්වා දෙන්නේ මිනිස් ජීවිතයේ ඕනෑම අභියෝග යක් වීර්යයෙන් ජයගත හැකි බවයි. නො සැලෙන වීර්යය ඉදිරියේ අන් සියල්ල පරාජයට පත් වන බව බෞද්ධ ආකල්පය යි. එය බුද්ධ චරිතයෙන් ද සනාථ කොට තිබේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ බුද්ධත්වය ලබා ගැනීම ද වීර්යය නිසා සිදුවූවක් බව යි. බුදුන් වහන්සේ නොපසුබස්නා සැහැවි ඇත්තෙමි, ඒකාන්තයෙන් ශරීරයෙහි සම ද, නහර ද, ඇට ද ඉතිරි වේවා. මස් ලේ වියලේවා. යමෙක් පුරුෂ ශක්තියෙන්, පුරුෂ වීර්යයෙන්, පුරුෂ පරාක්‍රමයෙන්, ලැබිය යුතු වේනම්, එය නොලැබ වීර්යයාගේ නැවැත්මෙක් නම් නොවේ යැයි වැර වැඩිමි. බුදුන් වහන්සේ විසින් විසින් සම්බෝධිය අප්‍රමාදයෙන් ලබන ලදු, අනුත්තර වූ අර්හත්ඵල නිර්වාණ සංඛ්‍යාත යෝගක්ෂේමය අප්‍රමාදයෙන් ලබන ලද බව මෙසේ සඳහන් කොට තිබේ.

> "ද්වින්නාහං භික්ඛවෙ ධම්මානං උපඤ්ඤාසිං, යා ච අසන්තුට්ඨිතා කුසලෙසු ධම්මෙසු, යා ච අප්පයීවානිතා පධානස්මිං අප්පයීවානි සුධාහං භික්ඛවෙ පධහාමි, කාමං තචො ච නහාරු ච අට්ඨි ච අවසිස්සතු සරීරෙ, උපසුස්සතු

Scanned with CamScanner
CamScanner

**මංසලොහිත, යං තං පුරුසථාමෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං, න තං අපාපුනිත්වා විරියස්සසන්ඨානං භවිස්සතීති තස්ස මයිහං භික්ඛවෙ අප්පමාධාධිගතා බොධි, අප්පමාධාධිගතො අනුත්තරො යොගක්ඛෙමො**"(අ. නි, 2, 1 කම්මකාරක වග්ගය, 5 උපඤ්ඤාත සූත්‍රය, පි.101)

මේ අනුව බුදුරජාණන් වහන්සේ ම දේශනා කරන්නේ බුද්ධත්වය යනු අදෘෂ්‍යමාන බලවේගයකින් හෝ දෙවියෙකුගෙන් හෝ බ්‍රහ්මයෙකුගෙන් හෝ ලද්දක් නොව පුරිස ශක්තිය, පුරිස වීර්යය, පුරිස බලය සහ පුරිස පරාක්‍රමය හේතුවෙන් ම ලබන ලද්දක් බවයි.

බුදුදහමට අනුව බෞද්ධයෙකුට ලැබිය හැකි උතුම් ම තත්ත්වය බුද්ධත්වය විනා අන් කිසිවක් නොවේ. එකී පරම සත්‍යය සාධනය වීර්යයෙන් ලබා ගත්තේ නම් වීර්යයෙන් ලබා ගත නොහැකි ලොව අන් කිසිවක් නොමැත. එහෙයින් පුද්ගල යහපැවැත්ම, සංවර්ධනය උදෙසා වීර්යය තරම් ශක්තියක්, බලයක් නෙ නොමැති බව මනාව පැහැදිලි වේ. එසේ ම තවදුරටත් එහි ම භික්ෂූන් වහන්සේලා කෙසේ වීර්යය වැඩිය යුතු ද යන්න පිළිබඳ ව ද දේශනාකොට තිබේ.

**"මහණෙනි, තෙපිදු නොපසු බස්නා වැර වඩව. ඒකාන්තයෙන් ශරීරයෙහි සම ද, නහර ද, ඇට ද ඉතිරි වේවා. මස් ලේ වියලේවා. යමෙක් පුරුෂ ශක්තියෙන්, පුරුෂ වීර්යයෙන්, පුරුෂ පරාක්‍රමයෙන්, ලැබිය යුතු වේනම්, එය නොලැබ වීර්යයාගේ නැවැත්මෙක් නම් නොවේය කියායි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයි."** (අ. නි, 2, 1 කම්මකාරක වග්ගය, 5 උපඤ්ඤාත සූත්‍රය, පි.101)

ඉහත දේශනා පාඨයෙන් අනුශාසනා කරන්නේ යම් කාර්යයක් සිදු කිරීමේදී එම කාර්යය සාර්ථක කරගන්නාතෙක් තම ශරීයෙහි මස්, ලේ වියළී ගිය ද සම, නහර, ඇට පමණක් ඉතිරි වුව ද තම එකී කාර්යය සාර්ථක කර ගැනීමේ උත්සාහය, අධිෂ්ඨානය සහ වීර්යය අත්නොහැරිය යුතු බවයි. එය යමක් සාර්ථක කර ගැනීමේ මාර්ගය බව ද මෙමගින් උගන්වා තිබේ.

Scanned with CamScanner
CamScanner

## නිගමනය

මානව සංවර්ධනයට අදාළ අරමුණු සාධනය කර ගැනීම විවිධ පුද පූජා, චාරිත්‍ර, ශාන්තිකර්ම සහ ඇතැම් මිථ්‍යාදෘෂ්ටික ක්‍රමවේද බොහෝ පැවතිය ද බුදුදහමින් උගන්වා ඇති විරිය චෛතසිකය නිවරදි ව වර්ධනය කිරීම ඒ සඳහා වඩාත් නිවරදි හා ඵලදායි ක්‍රමවේදය ලෙස මෙම පර්යේෂණය මගින් නිගමනය කළ හැකි ය. එහෙත් ඇතැම් පුදපූජා හා ශාන්තිකර්ම මානසික යහපැවැත්ම හා වීර්යය උපදවා වර්ධනය කර ගැනීම සඳහා ඵලදායී ලෙස යොදාගත හැකි බව ද අනාවරණය විය. එහෙත් ඇතැම් ක්‍රමවේද මුළුමණින් වාණිජමය අපේක්ෂා මුදුන් පමුණුවා ගැනීම සඳහා සමාජය නොමග යවමින් සිදුකරන ව්‍යාපාර බව ද පැහැදිලි විය.

***Keywords:*** මානව ඉලක්ක, විරිය චෛතසිකය, පුදපූජා චාරිත්‍ර, මිථ්‍යාදෘෂ්ටි මතවාද, මාධ්‍ය භාවිතය

## ආශ්‍රිත ග්‍රන්ථ

1. අංගුත්තර නිකාය, 1-6, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව, (2005), ත්‍රිපිටක පරිවර්තන හා සංස්කාරක මණ්ඩලය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
2. අභිධම්මත්ථ විභාවිනීටීකා, (1938), සංස්කරණය, සුමංගල මහාසාමි, පඤ්ඤාසාර හිමි; දෙහිගස්පේ සහ විමලධම්ම හිමි; පොලොන්නරුවේ, කොළඹ.
3. බෞද්ධ සහ බටහිර මනෝචිකිත්සාව, විජිත හිමි, කොග්ගල්ලේ, සූරිය ප්‍රකාශකයෝ, මරදාන, කොළඹ 10, 2008.
4. බෞද්ධ මනෝ චිකිත්සාව, එච්.එස්.එස්. නිශ්ශංක, ගුණසේන සමාගම, කොළඹ, 2001.
5. මනෝ ප්‍රතිකාර මහාචාර්ය ඥානදාස පෙරේරා, සහරා මුද්‍රණාලය. කොළම 2005.
6. මිනිස් ගැටළු පිළිබඳ බෞද්ධ විග්‍රහය, ටී ඤාණතිලක හිමි, ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ, 1984.
7. රත්නපාල; අමරදාස, (1964), අභිධර්මාර්ථ ප්‍රදීපිකා, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11.
8. Adler, Alfred(1927/1994) Understanding Human Nature, Oxford( One World
9. Chertok, Leon (1981) Sense and Nonsense in Psychotherapy, Oxford Pergamum Press
10. Shepared D.L. Psychology, The science of human Behaviour,USA,1977

Scanned with CamScanner

CamScanner

# බෞද්ධ සංස්කෘතියේ හස්ති භාවිතය සහ නූතන අභියෝග

පී.ඒ.එස්.ඩී ජයවර්ධන[1] විමල් හේවාමානගේ[2]

තිරිසන් සතුන් අතරින් සුවිශේෂී සත්ත්වයකු ලෙස සැලකෙන හස්තියා බුදුදහමේ සහ බෞද්ධ සංස්කෘතියෙහි ප්‍රේමනීය සත්ත්වයකු බවට පත්ව තිබේ. පෙරහැරෙහි විවිධ සංස්කෘතිකාංග අතර සුවිශේෂී අංගයක් ලෙස අලි ඇතුන් යොදා ගැනේ. මේ පිළිබඳව නූතන අවිහිංසාවාදී සංවිධාන විරෝධතා නගමින් සිටිනු දැකිය හැකි ය. පෙරහැර විෂයෙහි අලි ඇතුන් යොදා ගැනීම පිළිබඳ රාජ්‍ය නොවන "අවිහිංසාවාදී" සංවිධාන නගන විරෝධතා ආකල්ප පරීක්ෂාකර බැලීම මෙම පර්යේෂණයේ අරමුණ යි. පාලි ත්‍රිපිටකය, අට්ඨකථා, මහාවංශය, යන ප්‍රාථමික ග්‍රන්ථ අධ්‍යයනය, ද්විතීයික ග්‍රන්ථ අධ්‍යයනය මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ලෙස කලාශිල්ප ද උපයෝගී කරගනිමින් මෙම පර්යේෂණය සිදු කෙරේ.

හස්තීන් පෙරහැරට සම්බන්ධ කිරීම පිළිබඳ වර්තමාන කතිකාව ඉස්මතු වන්නේ අවිහිංසාවාදී සංවිධාන ඒ සම්බන්ධයෙන් දක්වන විරෝධතා හේතු කොට ගෙන බව පෙනේ. සත්ත්ව සංවිධාන බොහෝ දුරට තම අදහස් ඉදිරිපත් කරන්නේ මිනිසුන් ආශ්‍රිතව ජීවත්වන හීලෑ අලි ඇතුන් සම්බන්ධ ව යි. එසේ වුවත් නූතන සංකීර්ණ ජීවන රටාව මත වනගතව ජීවත් වුව ද හස්තීන් විවිධ දුෂ්කරතාවලට හා හිරිහැරවලට ලක් වේ. අධික ලෙස සිදු කරන වන විනාශය හා දළ ලබා ගැනීම සඳහා ඝාතනය කිරීම ඔවුන් මුහුණදෙන ප්‍රධාන හිරිහැර ලෙස දැක්විය හැකි ය. එම නිසා වනගත ව ජීවත් වුව ද මිනිසුන් ආශ්‍රිතව ජීවත් වුව ද තම ජීවිතය

1 ගෞරව ශාස්ත්‍රවේදී, කොළඹ විශ්ව විද්‍යාලය

2 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, බෞද්ධ අධ්‍යන අංශය, කොළඹ විශ්ව විද්‍යාලය

Scanned with CamScanner

CamScanner

පවත්වා ගැනීම පිණිස ඔවුන් අරගලයක යෙදෙන බව දැකගත හැකි ය. ඒ අනුව වඩා වැදගත් ඔවුන්ගේ මූලික අවශ්‍යතා උල්ලංඝනය නොවන පරිදි ජීවත් වීමේ අවකාශය නිර්මාණය කරදීම වේ.

ශ්‍රී ලාංකීය බෞද්ධ පෙරහැර අංග අතර අලි ඇතුන් සම්බන්ධ කිරීම අතීතයේ පටන් ම සිදු වූ බව වංශකතා ඉතිහාසය ඇතුළු සාහිත්‍ය මූලාශ්‍රයන්හි ඇතුළත් තොරතුරු අනාවරණය වේ. හස්තීන් යොදා ගැනීමෙන් ඊට ගරුගාම්භීර බවක් එක් කර ගැනීම අභිලාසය වූ බව පෙනේ. වර්තමානයේ ද ශ්‍රී දළදා පෙරහැර මූලික කර ගනිමින් සෑම පෙරහැරකට ම වාගේ හස්තීන් යොදා ගනු අපට දැකගත හැකිය. ශ්‍රී ලාංකේය ජන සමාජය හා හස්තියා අතර ඇති සුවිශේෂී සම්බන්ධතාව එයට හේතු වූ බව සිතිය හැකි ය. විශේෂයෙන් ම හස්තියාගේ පවතින බාහිර පෙනුම, හැසිරීම පෙරහැරට හස්තීන් සම්බන්ධ කිරීමට හේතු වූවා මෙන් ම බුදුදහම සහ හස්තියා අතර පවතින සුවිශේෂී සම්බන්ධතාව ද හේතු වූ බව සිතිය හැකිය.

බෞද්ධ සංස්කෘතියෙහි හස්තියා මෙලෙස සුවිශේෂී වීමට විවිධ හේතු මුල් වූ බව බුද්ධ දේශනා පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පෙනේ. හස්තියා බොහෝ බෞද්ධ දේශනාවන්හි තේමාව වූ අවස්ථා සූත්‍ර පිටකය පිරික්සීමේ දී පසක් වේ. තව ද බුදුන්වහන්සේ, ශ්‍රාවක ශ්‍රාවිකාවන් හස්තියාට උපමා කළ අවස්ථා බොහොමයක් බෞද්ධ සාහිත්‍යයෙහි හමු වේ. ජාතක කතා පොත, ථෙරගාථා, අපදානපාළි, මහාවග්ගපාළි ආදී පිටක ග්‍රන්ථවල මේ පිළිබඳ තොරතුරු රැසක් හමු වේ. බෞද්ධ සහිත්‍යයෙහි හස්තීන්ගේ තේජස, සෘජු බව, ශක්තිමත් බව, සෞභාග්‍ය, ප්‍රඥාව, වීර්ය, පරිත්‍යාගශීලිත්වය හා මිත්‍රශීලීත්වය වැනි ගුණාංග ඉස්මතු කර ඇත. බුදුන්වහන්සේ හස්තියා උපමා කරගනිමින් ධර්මය දේශනා කරනු ලැබුවේ මෙවැනි ගුණාංග උපයෝගී කර ගනිමිනි. එසේ ම බුදුන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ චරිතය හස්තියාගේ ගාම්භිර බවට, සන්සුන් ස්වභාවය ආදී සුවිශේෂී ගුණාංගවලට උපමා කොට ඇත. ඒසේ ම සංස්කෘතික භාවිතයේ දී හස්ති සංකල්පයට කලා ශිල්පීය වටිනාකමක් ද ලැබී ඇත. ශ්‍රී ලාංකේය බෞද්ධ කලා ශිල්පවල හස්තියා ප්‍රධාන සංකල්පයක් වී ඇත්තේ එබැවිනි.

දැඩි ලෙස සත්ත්ව හිංසනය පවතින සමාජයක හස්තීන් පෙරහැරට සම්බන්ධ කරගැනීමට විරෝධතා පෑම පෞරාණික

Scanned with CamScanner
CamScanner

සංස්තකෘතිකාංග විනාශ කිරීමට අනුබලදීමක් දැයි සොයා බැලීම වැදගත් බව පෙනේ. ඇතැම් අවිහිංසාවාදී සංවිධාන නගන විරෝධතා ආකල්පය එක් අංශයක් පමණක් සැලකිල්ලට ගනිමින් සිදු කරනු ලැබූවක් බව ප්‍රකට වේ. තව ද ආහාර පිණිස සත්ත්ව ඝාතනය වර්තමානයේ ඉතා ඉහළ යන බැවින් ඒ පිළිබඳ අවධානය යොමු නො කිරීම සැකයකට ද හේතු වන බව පෙනේ. පෙරහැරේ අලි ඇතුන් ගෙන යාමේ දී හා ඔවුන් මෙල්ල කිරීමේ දී ඇත් ගොව්වන් අතින් යම් හිංසාවක් සිදුවන්නේ නම් එම තත්ත්වය පිළිබඳ බලධාරීන්ගේ දැඩි අවධානය යොමු විය යුතුය. ලක්දිව දූරාතීතයේ සිට පැවත ආ චිරාගත සම්ප්‍රදායක් වන පෙරහැරෙහි අලි ඇතුන් සම්බන්ධ වීම එක හෙළා ප්‍රතික්ෂේප කළ යුත්තක් නොවන බව පසක් කිරීම වැදගත් වේ.

බුදුසමයෙහි තිරිසන් සත්ත්වයින්ට සුවිශේෂී ස්ථානයක් ලබා දී ඇත. මේ අතර හස්තියා සාමාන්‍ය තිරිසන් සත්ත්වයකු ට වඩා ශ්‍රේෂ්ඨ සත්ත්වයකු ලෙස බුදුදහමින් පිළිබිඹු කර ඇති අයුරු පැහැදිලි වේ. බුදුදහමේ ආභාසය ලබා ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියෙහි හස්තියා පූජනීය සත්ත්වයකු බවටත් රාජකීය සංකේතයක් බවටත් පත්ව ඇති බව විද්‍යමාන වේ. බුදුදහම හස්ති සංකල්පය දාර්ශනික අර්ථ නිරූපණය කිරීමට, සංස්කෘතික අර්ථ නිරූපණය කිරීමට මෙන් ම ශ්‍රේෂ්ඨ සත්ත්වයකු යන වග සමාජයේ ස්ථාපිත කිරීමට යොදා ගෙන ඇති අයුරු මෙකී කරුණු ආශ්‍රයෙන් සනාථ කර ගත හැකිය.

බුදුන්වහන්සේ සමකාලීන සමාජයෙහි පැවති සත්ත්ව ඝාතනය ප්‍රතික්ෂේප කළ ද කෘෂිකර්මාන්තය වැනි ක්‍රියා විෂයෙහි අවිහිංසාවේ නාමයෙන් ඊට විරුද්ධ වූ බවක් නොපෙනේ. බුදුදහම සපුරා හිංසාව ප්‍රතික්ෂේප කරන අවිහිංසාවාදී දහමක් බැවින් හිංසනයට සපුරා විරුද්ධ විය යුතු අතර හිංසනයෙන් තොරව පෙරහැර සඳහා හස්තීන්ගේ දායකත්වය ලබා ගතයුතු බව පෙනේ. එබැවින් ඈත අතීතයේ පටන් ම පෙරහැර විෂයෙහි අවියෝජනීය අංගයක් වූ හස්තීන් සම්බන්ධ වීම හිංසාවකින් තොරව ඉදිරියට පවත්වා ගෙන යෑම ආගමික උරුමයක් පමණක් නො ව ආගමික උරුමයක් ආරක්ෂා කර ගැනීමක් වන්නේය.

Scanned with CamScanner
CamScanner

ප්‍රමුඛපද - පෙරහැර, අවිහිංසාව, හස්තියා, බෞද්ධ සංස්කෘතිය, කලාශිල්ප

## ප්‍රාථමික මූලාශ්‍රය


ජාතකට්ඨකථා (සිංහල පරිවර්තනය) 1,2,5,7 (භාග) (2007). දෙහිවල: බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ධම්මපදට්ඨකථාව (සිංහල පරිවර්තනය) 1, 2 (භාග) (2008). දෙහිවල:බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මහාවංශය (සිංහල සංස්කරණය) (2012). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.


## ද්විතීයික මූලාශ්‍රය


ඒකනායක,කුසුම්.(2014).සෙංකඩගල පුර දළදා අසිරිය සහ පෙරහැර පුරාණය. කොළඹ 10:ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

ජයවර්ධන,ආර්.ජී.ඩී. (2004). දකුණු ආසියානු බෞද්ධ කලාවේ ඉතිහාසය.කොළඹ:ආරිය ප්‍රකාශකයෝ.


Scanned with CamScanner

CamScanner

# Non-Violent Conflict Resolution: As Reflected in the Thoughts of Buddha and Gandhi

Sunny Kumar[1]

## Introduction

The twenty first century era is witnessing a completely new world order. Two world wars in the last hundred years, several wars of conquest, terrorism, wars of people over their political and religious beliefs and other armed conflicts have led to death of millions of people around the world. The mad rush for armaments has led to accumulation of explosive forces that amounts to a capacity that could destroy the earth not once but several times. The catastrophe that the mankind faces is immense and above our imagination.

When it comes to conflict resolution and peace-making, religion has a dual legacy in the history of mankind. The ideas and teachings of the religious leaders, saints, political leaders or social reformers need to be analyzed and understood properly. In order to achieve the goal of a peaceful world several aspects need to be understood like the intra-communal moral values, mixture of religious and pragmatic motivations, political leadership, the socio-political impact of religious leadership, understanding the true teachings of different religions etc.

1 Dept. of Buddhist Studies, University of Delhi',New Delhi- 110007, sunny.singh557@gmail.com

Scanned with CamScanner

CamScanner

The personality of both Buddha and Gandhi epitomize the life and culture of vast number of people. Even though they lived at different times of history their ideas have been the major influencers of the cultures of the time. Both, Gandhi and Buddha did not hold any formal position of power during their period yet they were the ones holding tremendous power and influence over the masses. Both the personalities wanted to free humans from the world of sufferings and considered Non-Violence as the most cardinal virtue that can help society move towards an ideal human situation unscathed by exploitation and violence.

## Methodology

The primary texts written on Buddhism and Gandhism along with the secondary sources like the critiques of both the ideologies and other related books, journal articles, research publications, related literary, cultural and philosophical sources.

## Research Problem

Can the Non-Violent philosophy of Buddhism and Gandhism help in conflict resolution and attaining our idea of a peaceful world?

## Objectives

What are the constituents of a non-violent and peaceful life? How can we achieve a peaceful world?

- What are the similarities and differences in the Buddhist and Gandhian Philosophy of Non-Violence?
- How it can help resolve conflicts and attain our goal of a peaceful world?

## Discussion and Findings

Buddha and Gandhi judged theories and taught to the

Scanned with CamScanner

CamScanner

world on very practical lines. While Buddha protested against the ill-practices like excessive rituals, sacrifices etc. prevalent in the society during his time, Gandhi protested and fought against the apartheid in South Africa and then the tyranny and injustice inflicted upon the Indians by Britishers in India. Gandhi's method of resistance was non-violence. He considered it the weapon of the brave. Both the personalities had one aim i.e. to find out the causes of suffering and eradicate them. While Buddha saw old age, sickness, decay and death as suffering Gandhi sees the tyrannical rule, oppression of the masses as suffering.

While, the whole teachings of the Buddha can be summed upon in the four noble truths of Dukkha, Samudaya, Nirodha and Magga, on similar line the teachings of Gandhi can also be summed into the following four noble truths- Tyranny and Injustice, Causes of Injustice, Removal of Injustice, Way to Remove Injustice.

## Conclusion

Buddha and Gandhi does not only preach Non-Violence for conflict resolution but the greatness of their theory lies in the fact that it also transforms the opponent is such a way that it is a win-win situation for both the conflicting parties. Buddha's Noble Eightfold path, the ten Paramitas followed by the Bodhisattvas, the Brahmaviharas which includes Metta, Karuna, Mudita and Upekkha and Gandhi's Satyagraha have all the contents in itself that teaches and develops positive aspect of love between the opponents.

Since time immemorial Non-Violence has been a key philosophy of the Indian cultural system. While Buddha took it across nations, in modern times Gandhi revived and used it as a tool to fight against the prevalent oppression in the society.

Today when the whole world is filled with violence of all sorts, the practice of Non-Violence as preached by Buddha

CS Scanned with CamScanner

CS CamScanner

and Gandhi cannot only help resolve conflicts but can also transform all humans to develop love and compassion for all. With the propagation of their teachings there might be a more productive interaction between individuals, societies or nations and bring out a conclusive solution to end conflict and achieve our goal of a peaceful world.

**Keywords**
Non-Violent Conflict Resolution, Conflict Resolution, Buddha's Non-Violence, Gandhi's Non-Violence.

## Bibliography

- B. Goswami, Lalitavistara (Asiatic Society, 2001).
- Bhagavad-gita,
- E. Conze, Buddhism. Its Essence and Development (Coronet Books Inc., 1999).
- H. Oldenberg, Buddha: His Life, His Doctrine, His Order (Pilgrims Publishing, 2000).
- K. Morgan, The Path of the Buddha (Motilal Banarsidas Pub, 1997).
- K.T.S. Sarao, Origin and Nature of Ancient Indian Buddhism, (Munshiram Manoharlal Publishers Pvt. Ltd. 2010), 3rd Edition, New Delhi.
- Ray Parchelo, A Mind To Fight: Conflict Resolution And Buddhist Practices (Presented at the Third North American Conference on Spirituality and Social Work June, 2008)
- M. Wijayaratna, Sermons du Bouddha (Le Cerf, 1988).
- P. Lakshmi Narasu, The Essence of Buddhism (Kahinath Meshram, 2002).
- Walpola Rahula, What The Buddha Taught (Grove Press, New York, 1974, Ed. 2nd)
- Theresa Der-lan Yeh, The Way To Peace: A Buddhist Perspective (International Journal of Peace Studies, Volume 11, Number 1, Spring/Summer 2006).
- Chhaya Rai, Gandhi's Role And Relevance In Conflict Resolution, International Seminar on Conflict Resolution (February 15 - 17, 2003).

Scanned with CamScanner

CamScanner

- Dr. Manish Sharma, Non-violence in the 21st Century: Application and Efficacy, (Deep and Deep Publications, 2006).
- D. G. Tendulkar, Mahatma. Life of Mohandas Karamchand Gandhi (The Time of India Press, 1951-1958).
- D. S. Sarma, The Gandhi Sutras (G.S. Press, 1938). Ed. By Dr. J.S. Mathur, Non-Violence and Social Change, Navjivan Publishing House, Ahmedabad
- Gandhian Concept of Conflict Resolution, Shodhganga.
- Karma Yoga
- Meeta Nath, Ahiṁsā: Based on Buddhism and Gandhism
- M.K. Gandhi, Constructive Programme: Its Meaning and Place (Navajivan Publishing House, 2002).
- M.K. Gandhi, Non-Violence in Peace and War (Navajivan Publishing House, 2002).
- M.K. Gandhi, Self-Restraint v. Self-Indulgence (Navajivan Publishing House, 2002).
- Ravindra Varma, An Approach to Conflict Resolution, (Peace, Non-Violence And Conflict Resolution, mkgandhi.org).
- Satyabrata Chowdhury, Conflict, Violence And Education (Peace, Non-Violence And Conflict Resolution, mkgandhi.org).
- Tatsushi Arai, Creativity and Conflict Resolution: Alternative Pathways to Peace,( Routledge, 2009)


Scanned with CamScanner

CamScanner

# "Euthanasia – The Medical Suicide" in Buddhist Perspective

Rev. Pepiliyawala Narada[1], Rev. Thimbiriwewa Sirisumana[2], Rev. Saliya Ashokapura Nanda[3],Miss. H. P. D. I. Pathirana[4]

## Introduction

Euthanasia is a medical concept simply, explained as the medical suicide with the permission of the patient that who suffers from agony or incurable or terminal medical illness. The main purpose of this concept is to give a solution to such patients with endless suffering, but this concept has received many critics over the time since it was first practised. Many statuses in their own context disagree and in the some agree with this medical issue related to ethical and legal concerns. In a Buddhist perspective the above concept is some what controversial as Buddhism is a complete halmless religion to others even self. Therefore this research paper is a critic investigation to analyse wheather the concept of Euthanasia, the medical suicide is agreeable with Buddhist teachings.

---

1 Assistant Lecturer, Department OF Pali and Buddhist studies, University of Kelaniya.
2 Assistant Lecturer, Department OF Sinhala, University of Colombo.
3 Assistant Lecturer, Department OF Pali and Buddhist studies, University of Kelaniya.
4 Assistant Lecturer, Department OF Pali and Buddhist studies, University of Kelaniya.

Scanned with CamScanner

CamScanner

## Research Probem

The one of the major moral values of Buddhists is not to harm to any forms of living beings. Therefore compassion and loving kindness is highly appreciated in Buddhism. Nevertheless, as a prominent religion in the world the question is asked, whether Buddhists can agree with the concept of Euthanasia while accepting the boundless living kindness is a question that remain unsolved. Therefore this is a search for any evidence that can agreed with euthanasia through Buddha's teachings During Buddha's period did the Blessed one faced to this type of situation among his disciples and if the Blessed one faced a situation alike what was the verdict then?

## Methodology

While comparatively the above-mentioned facts with the assistance of Pali canon as a primary source this thematic area will be explored. Also, the viewpoints on modern medical classification of Euthanasia and critical and analytical investigation are the other methodologies of this research.

## Discussion

Fear of death is a result of craving for existence. Life is dear to all. Although the death is an eternal and a definite phenomenon that one should face and experience in due course of time, many tend to disregard it upon face of life. It is obvious that following death, one's all mental and physical process will come to an end and the physical body is nor more than a futile fire-wood without life. Even knowing that the human senses drives away the conscious mind from this simple reality.

Life is not more than a time duration between birth and death. Since it's a time span this self-rejection of the reality

Scanned with CamScanner

CamScanner

of death makes the life interesting to live. It's interesting to see the drive of the ones who go beyond this *interest to live* and commit suicide due to many human problems and life's circumstances that are not uncommon. Many religions consider the suicide as a great sin or as an unwholesome act. Also at some occasions the same act had been interpreted in a contradictory. In Buddhism, taking other's life is a sinful deed as well as incentive for death. But as an atheistic religion Buddhism has always accepted and valued the concept of free-will. Therefore, one's right is respected in implementing his/her own decisions. In this approach it is debatable that whether Buddhism truly accepts or rejects one's decision to take his/her life away.

*Mahāparinibbāna sutta* reports the Buddha relinquishes his will to live. *(āyu sanskāra)* Even during the period of Buddha some monks had come and received the permission for the relinquishment for their own lives and the blessed one accepted it. The request was done by both ordinary and noble monks. In other hand, it is a major offence for a monk *(pārājika)* to encouraging or admiring one's death. Here, the position of relinquishment of the will to live is somewhat seems similar to the modern concept of euthanasia.

The euthanasia is defined as administration of a painless death of a patient suffering from incurable and painful illness which is in the terminal stage. In some parts of the world especially in the East this concept of euthanasia is not welcomed due to government regulations as well as public opinions. When taking euthanasia into consideration from a Buddhist's perspective one can see the similarities in the way some noble monks who had left the free will to continue their lives and requested Buddha the permission to attain the eternal bliss. And one should notice that Buddha himself left his *will to live* (āyu sanskāra) at his last part of life coming in to the

Scanned with CamScanner
CamScanner

conclusion that his mental and physical existence no longer required. Also one should understand at the same time that the Buddhist perspective on murdering or incentive for the death is a highly sinful deed in any circumstances.

This attempt is to make a critical analysis on suicide in regard to Buddhism and the concept of euthanasia in order to get a clear picture whether Buddhism practised it far before the modern era.

**Conclusion**

The concept of Euthanasia - medical suicide had been accepted by several western countries as well as in some parts of Asia. One can say in a Buddhist perspective the concept of Euthanasia seems applicable within its boudaries. According to Buddhism taking one's life or even appreciating the suicide is a major offence for clergy and laity without any doubt. But with the reference to early Buddhist teachings the concept of freewill grants the permission the immunity to act according to one's thoughts and emotions within the identified moral structure.Some monks who simultaneously lived in Buddha's period and suffered from incurable pain were suicided themselves and Buddha was silence during such circumstance. The modern concept Euthanasia - the medical suicide is an action that can get by a patient who suffers from incurable ill or agony under certain criteria's. Therefore through a critical investigation we can get to know though Buddhism rejects any kind of killing beans directly or indirectly, Buddhism follows a positive attitude regarding the concept of Euthanasia.

**Keywords: Buddhism, suicide, euthanasia, relinquishment**

Scanned with CamScanner

CamScanner

## References


මජ්ඣිමනිකාය 3 (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක සංස්කරණ ග්‍රන්ථමාලා, නැදිමාල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සංයුක්තනිකාය 4 (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක සංස්කරණ ග්‍රන්ථමාලා, නැදිමාල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සේනාධීර, ඩෙන්සිල් (2015). මරණය පිළිබඳ බෞද්ධ චින්තනය. නැදිමාල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

Peter, Harry (2000). An Introduction to Buddhist Ethics. Cambridge University Press.

Philipps, Foot (1979). 'Euthanasia.' Ethical issues relating to life and death (edited by John Ladd). Oxford University Press.


Scanned with CamScanner

CamScanner

# Loving Kindness Meditation as a Stress Management Technique towards College Students

Ven. Moragahaulpatha Wimalabuddhi[1]

It is a well-known fact that stress or stressful feelings of students are harmful to their studies and whole lives. Stress or stressful feelings cannot be eradicated by medical treatments, but there are psychological treatments as well as meditation techniques. Generally stressful feelings can be defined as reactions to daily happenings. It appears that most adolescent students are under a great deal with stress due to rapid changes they are going through mentally and physically. When they cannot cope with negative emotions such as anger, anxiety, helplessness and mental insecurity, they may turn towards alcohol, drugs, violent behavior and even suicide in addition to failing in school. As well as students may experience lack of concentration, memory loss, flashes of anger and sleeping disturbances. Therefore early mentioned negative emotions should be eradicated well.

It can be seen there many programs that are related to stress reduction in the school or other places. These programs emphasize involvement of students in various activities so that they will learn how to develop positive feelings towards themselves and others to manage stress. According to this

1 B.A. (USJP) inPhilosophy and Psychology (Special)
Wimalabuddhi13@gmail.com

Scanned with CamScanner

CamScanner

study, these programs are helpful and another technique was founded that is called as Bhāvanā in order to cope with stress. Buddhist meditation is rich with mental training in order to cope with every mental disease and it helps to realize the ultimate truth where there are not any problems. There are many meditation techniques that come under Buddhist meditation mainly tranquility and insight. Hereby the resracher has studied that loving kindness meditation (Mettā bhāvanā) is a major meditation technique to stress management. The pali word Mettā has numerous meanings such as loving kindness, friendliness, benevolence, fraternity, harmony, inoffensiveness and peace. According to Visuddhimagga Mettā is defined as strong thoughts for welfare and happiness of everyone without asking for anything in return.

## Objectives

- To find out the relevancy of loving kindness meditation for stress management in college students.
- To address on the aspects of loving kindness meditation to develop the education of college students.
- To discover the practical usage of loving kindness meditation for the betterment of the children and the whole world.

## Research Problem

The research problem is to study what is the utilization of loving kindness meditation as a stress management technique for college students.

## Hypothesis

The loving kindness meditation as a technique will positively influence on stress management of college students.

Scanned with CamScanner

CamScanner

## Methodology

Primary data were collected from Buddhist Suttas and Pali commentaries. Secondary data were collected from books, journals and articles written by qualified scholars and analysed.

## Discussion

It was found that many college students, especially adolescents are under a great deal of stress and stressful feelings. Some of the reasons that are affecting to their stress were studied such as family background, school environment, competition, getting angry with teachers and mates, jealousy, lack of positive relationship, helplessness, rejection from family or teachers. As the results of these reasons, students get distressed and it is harmful for their studies and whole lives. Therefore my argument is that, mental training is necessary to cope with stressful feelings and events. Though there are some ways to mental training Buddhist meditation is the useful technique to mental training.

Under Buddhist meditation, loving kindness meditation (Mettā bhāvanā) is the major technique that is recommended in this study to achieve early mentioned objectives. When students grow their loving thoughts towards others as may I be well, happy, peaceful and prosperous as well as may others be well, happy…etc like me, stressful events can be reduced. As well as negative emotions such as anger, hatred, jealousy and helplessness can be destroyed well. According to Mettanisamsa Sutta if someone grows loving thoughts 11 benefits can be taken. As well as 10 of them can be taken in this life. These benefits are helpful to students to manage stress that occur in daily life. Therefore by considering findings of this study loving kindness meditation is recommended as a technique to manage stress of college students.

Scanned with CamScanner

CS CamScanner

**Keywords: Students, Stress, Meditation, Loving kindness, Education**

## References:

1. Dhammananda K, (2017), Meditation the only Way, Buddhist cultural center, Dehiwala.
2. Dhammika Mirisse, (2001), stress reduction for youth through mindfulness and loving kindness meditation, Ajith printers, Boralesgamuwa.
3. Kariyawasam, Tilokasundari, (2003), Buddhism And Psychology, Godage International Publishers Pvt.Ltd, Sri Lanka.
4. Kumarasena Kirthi Aryan, (2001), Meditation in Practice, Buddhist cultural center, Dehiwala.
5. McConnell, A John,(2007) Healing Anxiety though Meditation, Buddhist cultural Centre, Dehiwala.

Scanned with CamScanner

CamScanner

# "ටෙලිපති" ක්‍රමය පිළිබඳ බෞද්ධ මනෝවිද්‍යාත්මක විවරණයක්

එම්.එම්. අමිල බණ්ඩාර[1], කේ. හේෂාන් නිර්මල[2]

## හැඳින්වීම

හැඟීම් හා සිතුවිලි ඇස, කන, නාසය, දිව හා ශරීරය යන පසිඳුරන් ගේ සහය මත නිර්මිත වේ. බුදුදහම තුළ මේ හැර හයවන සංකල්පයක් පිළිබඳ අවධානය යොමුකර ඇත. එය මනස නැමැති යාන්ත්‍රණයයි. ඒ අනුව මනස උපයුක්ත කොටගෙන හැඟීම් හා සිතුවිලි ජනිත වීම පිළිබඳ බුදුදහම විශ්වාසනීයව කටයුතු කරයි. මනෝවිද්‍යාත්මක කෝණයකින් මෙය බැලූ විට පාරභෞතික සංකල්පයේ තවත් එක් අංශයකි. එමෙන් ම මෙය "ටෙලිපති" (Telepathy) යන නමින් ද හඳුන්වයි. බුදුදහම තුළ කථනයට ලක්වන දිව්‍ය ලෝකය, නිර්වානය, කර්මය, පුනර්භවය යන ආදිය මෙයට අයත්ය.

"ටෙලිපති" යන අදහස (Notion) මනෝවිද්‍යාත්මක සංකල්ප දෙකකින් වෙනස් වේ. එනම්, මායාත්මක සිතුවිලි ඇතුල්වීම සහ ඉවත් කිරීම (Delusions of Thought Insertion/Removal) යන මනෝවිද්‍යාත්මක සහ සම්බන්ධතාවෙනි. සමහර මිනිසුන් "ටෙලිපති" යන අදහසට නැඹුරුව ඇත්තේ කෙසේ ද කියා මෙම සම්බන්ධතාව පැහැදිළි කරති. අදහස් ඇතුළු වීම හෝ ඉවත්වීම භින්නෝන්මාදය නම් ප්‍රධාන මානසික රෝගයේ ලක්ෂණ වන බව මනෝවිද්‍යා විෂය පථය තුළින් තහවුරු වේ.

---

1 උපාධි අපේක්ෂක, දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

2 උපාධි අපේක්ෂක, දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. amithbandara087@gmail.com

Scanned with CamScanner

CamScanner

"ටෙලිපති" යනු පංචේන්ද්‍රියේ සහාය නොමැතිව හැඟීම් හා සිතුවිලි ඇති වීමයි. මෙවැනි හැඟීම් හා සිතුවිලි සිතකින් සිතකට යැවිය හැකිය. පූර්වඥානය (අනාගත අවස්ථා පිළිබඳ පූර්ව දැනුම) හා අනාගත සංජානනය (පසිඳුරන්ගේ සහය නොමැතිව පුද්ගලයින්ට විවිධ අවස්ථාවන්, වස්තූන්, අනාගත සිදුවීම් පිළිබඳව අවබෝධය ලබා ගැන්මට ඇති හැකියාව) අයත් වන්නේ පාරභෞතික සංකල්ප ගණයට ය. එනම් පංච ඉන්ද්‍රියයන් ඉක්මවා ගිය තත්තවයකි. ඇතැම් විට හයවන සංවේදනය, අසංඥ කෞශල්‍යයක්, සහජ ඥානයක් ලෙස ව්‍යවහාර වෙයි. එනම් විද්‍යාව මගින් පහදා නොදුන් තොරතුරු ලබාගැනීමේ ප්‍රභවයන් වෙයි. ඉන්ද්‍රීය පරිබාහිර සංජානනය ගැන පැතිරුණු විශ්වාසයන් පැවතිය ද විශ්වාසදායී තොරතුරු හා සෛද්ධාන්ත නොමැති වීම නිසා ඒ පිළිබඳව සත්‍ය ලෙස ම ඒත්තු ගැන්වීමට නොහැකි වී තිබේ. විද්‍යාත්මකව පහදා දිය හැකි තොරතුරු තවමත් නොමැති වීම නිසා ඉන්ද්‍රිය පරිබාහිර සංවේදන විවාදාත්මක මාතෘකාවකි. අධිමානසික ශක්තීන් මගින් මෙහි පැවැත්ම ගැන පර්යේෂණ කෙරෙන අතර ගැන්ස්ෆෙල්ඩ් වැනි පර්යේෂණ මගින් ද ඒ සඳහා සාක්ෂි සපයා ඇත. නමුත් විද්‍යාත්මක පසුබිමක් තුළ ඉන්ද්‍රීය පරිබාහිර සංවේදනා අවබෝධය සහමුලින් ම පිළිගෙන නැත. කෙසේ වෙතත්, පංච ඉන්ද්‍රියන් ඉක්මවා ගිය තත්තවයක් වන ටෙලිපති යන්න පහත සඳහන් වචනය අධ්‍යයනය කිරීමෙන් වටහා ගත හැකිය. ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය "ටෙලිපති" යන වචනය මෙසේ අර්ථ දක්වයි.

> " The direct communication of Thoughts or feelings from one Person to another without using speech, writing, or any other normal method"

"ටෙලිපති" යනු කථනය, ලේඛනය හෝ වෙනත් සාමාන්‍ය ක්‍රමයක් භාවිත නොකර එක් පුද්ගලයෙකුගෙන් වෙනකුගෙන් වෙනත් පුද්ගලයකු වෙත සිතිවිලි හෝ හැඟීම්වල සිදුවන සෘජු සන්නිවේදනයයි.

### අරමුණ

බුදුදහමට අනුව මනසින් මනසට සිතිවිලි හා හැඟීම් සන්නිවේදනය වන්නේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම.

Scanned with CamScanner
CamScanner

### ගැටලුව

බුදු දහමේ දැක්වෙන ආකාරයට සිතුවිලි හා හැඟීම් මනසින් මනසට සන්නිවේදනය කළ හැකිද?

### උපන්‍යාසය

බුදු දහමට අනුව සිතුවිලි හා හැඟීම් මනසට සෘජුවම බලපායි.

### පර්යේෂණ ක්‍රමවේදය

අරමුණු ඉටු කිරීම සඳහා පුස්තකාල භාවිතය පර්යේෂණ ක්‍රමවේදය ලෙස භාවිත කළ අතර ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීයික මූලාශ්‍රය හා අන්තර්ජාලය භාවිතය වශයෙන් ගෙන දත්ත රැස් කිරීම මෙම පර්යේෂණයේ දී අනුගමනය කළ විධික්‍රමයයි.

### සාකච්ඡාව

බටහිර මනෝ විද්‍යාඥයින් විසින් "ටෙලිපති" යන සංකල්පය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට පෙර භාරතයේ පහළ වූ බුදුරජාණන් වහන්සේ අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය (Extra Sensory Perception-ESP) ප්‍රත්‍යක්ෂ කොටගත්හ. තම ශ්‍රාවකයන් ද එවැනි තත්ත්වයකට පත්විය හැකි මාර්ගයන්ට යොමු කළහ. එහෙත් උන්වහන්සේ අතින්ද්‍රිය ප්‍රත්‍යක්ෂයන් උපයෝගී කරගෙන යම් යම් ආශ්චර්ය පෙන්වීමට යාම භික්ෂූන්ට අනුමත නොකළහ. අම්බට්ඨ සූත්‍රයේ අෂ්ඨ විද්‍යාවක් වදාරා තිබේ. එය අන් සූත්‍රයක නොදක්නා ලදී. ඒ කරුණු අට සාමඤ්ඤඵල සූත්‍රයෙහි ශ්‍රමණ්‍යඵල වශයෙන් (පැවිද්දෙහි ප්‍රයෝජන වශයෙන්) වදාරා තිබේ. මනෝමයඍධි ඥානය, ඍධිවිධ ඥානය, දිව්‍යශ්‍රෝත්‍ර ඥානය, පුබ්බේනිවාසානුස්සති ඥනය, දිව්‍යචක්ෂුරභිඥාව, වැනි දෑ අයත් වන්නේ අතීන්ද්‍රීය ප්‍රත්‍යක්ෂයටය. මිනිසුන් අතර මිනිසෙක්ව ඉපද උත්තරීතර මනුෂ-්‍යයෙක් බවට පත් බුදුරජාණන් වහන්සේ මේවා ලබා ගත්තේ තමන් වහන්සේ සතු පුද්ගල ශක්තිය උපයෝගීකොටගෙන ය. එසේ නැතහොත් අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය දෙවි කෙනෙකුන් විසින් හෝ ආශ්චර්යයකින් පහළ වූවක් නොවේ. අම්බට්ඨ සූත්‍රයේ සඳහන් අෂ්ට විද්‍යාව අතර පරචිත්තවිජානනඥානය අයත් වන්නේ "ටෙලිපති" යන සංකල්පයෙහි ගම්‍යාර්ථයටය.

Scanned with CamScanner

CamScanner

1. විදර්ශනා ඥානය
2. මනෝමයඍද්ධි ඥානය
3. ඍද්ධිවිධ ඥානය
4. දිව්‍යශ්‍රෝත්‍ර ඥානය,
5. පරචිත්තවිජානන ඥානය
6. පුබ්බේනිවාසානුස්සත ඥනය
7. දිව්‍යචක්ෂුරභිඥාව
8. ආශ්‍රවක්ෂයකර ඥානය

එසේම බුදුසමය තුළ පංචඅභිඥා සඳහන් වේ. අභිඥා යනු විශේෂ බලයකින් යුක්ත වන රූපාවචර පංචම ධ්‍යාන චිත්තයට ම කියන නමකි. ඍද්ධිවිධ අභිඥාව, දිව්‍යශ්‍රෝත අභිඥාව, පරචිත්තවිජානන අභිඥාව, පුබ්බේනිවාසනිවාසානුස්සති අභිඥාව, දිව්‍යචක්ෂුරභිඥාව යනුවෙන් දැක්වෙන මෙම අභිඥාවන් ද අයත් වන්නේ අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයටමය. පංච අභිඥා අතර පරචිත්තවිජානන අභිඥාව නම් අනුන්ගේ සිත් දැකිය හැකි වූ රූපාවචර පංචම ධ්‍යාන චිත්තයයි.

මනසක් තවත් මනසක් සමඟ ගනුදෙණු කිරීම අප හඳුන්වනුයේ "ටෙලිපති" යනුවෙනි. එහි දී අපහසු ම කර්තව්‍යය වන්නේ මනස නිරවුල්ව තබා ගැනීමයි. මේ සඳහා ප්‍රධාන වශයෙන් බුදුදහම තුළ උපයුක්ත කොටගෙන ඇත්තේ භාවනාවයි. භාවනාව මගින් මනස එක් අරමුණක පිහිටුවා ඒ ඔස්සේ ලබාගන්නා දියුණුව ඉවහල් කොට ගෙන තවත් මනසක් සමග තොරතුරු හුවමාරුව එනම් සන්නිවේදනය පහසුවෙන් ම සිදු කිරීමට හැකියාව ලැබී ඇත. දියෙහි මෙන් ම පොළවෙහි ගිළීම මතුවීම, අහසෙහි හා පොළවෙහි විවිධ ඉරියව් දැක්වීම, දුර ශබ්ද ඉතා දුර වූ (දෙව්ලොව, ඔබලොව, පරසක්වල) ශබ්ද ද ලඟසිට අසන්නාක් මෙන් දැනීම ද අනුන් සිතන දේ පුද්ගල සිතට දැනීම ද මනසික දියුණුවත් සමඟ පුද්ගලයාට ලැබෙන්නා වූ හැකියාවන් සමුදායක් වේ.

## නිගමනය

සාමාන්‍ය මිනිසුන් නිරන්තරයෙන් "ටෙලිපතිමය" අත්දැකීම් ලබන අවස්ථා බහුල වශයෙන් දැකිය හැකිය. නමුත් ඒ සම්බන්ධයෙන් එතරම් වැටහීමක් ඔවුන්ට නැත. තමාගෙන් වෙන්ව

CamScanner

අධ්‍යාපනය ලැබීමට, රැකියාවට හෝ පිටරටක පදිංචියට ගොස් සිටින දරුවෙකු දැඩි ලෙස මතක් වන මව්වරුන්ට එකෙනෙහිම දරුවන්ගෙන් දුරකථන ඇමතුමක් ලැබෙයි. නැතහොත් දුර සිටින දරුවන්ට තමන්ගේ මව, පියා හෝ ඉතා සමීපතයෙක් මතක් වෙන විට නොසිතූ පරිදි ඔවුන්ගෙන් දුරකථන ඇමතුමක් ලැබෙයි. එසේ ම, කලකින් හමු නොවුන හිතවතකු හෝ තමා දැඩි ලෙස ආදරය කරන අයකු දැකීමෙන් හෝ හමු වීමෙන් ඉතා හොඳ යැයි සිතෙන විට අහම්බෙන් ඒ තැනැත්තා හෝ තැනැත්තිය හමුවිය හැකිය. එම හමුවීම නිවසට පැමිණීමෙන් හෝ මගතොටේ දී හෝ විය හැකි ය. මෙසේ වන්නේ ටෙලිපතිමය සබඳතාවක් නිසා බව අනුමාන කළ හැකි ය.

ෆෙඩ්රික් ඩබ්ලිව්. එච්. මියර්ස් විසින් 1882 දී පමණ සිතකින් සිතකට පණිවිඩ යැවීම, සිතින් සන්නිවේදනය කිරීම, දුරඥානය අර්ථයෙන් "ටෙලිපති" යන වචනය නිර්මාණය කළත් එය වසර 2562 ක් පමණ ඈත අතීතයේ සිට ම භාවිතයේ පවතින්නක් බව බෞද්ධ දර්ශනාගත අදහස් විමසීමෙන් ද පැහැදිලි විය. එසේ ම "ටෙලිපති" යන්න විද්‍යාත්මකව පිළිගතහැකි පසුබිමක් මත තහවුරු කර නොතිබීම මෙම සංකල්පය ජනවිඥානයෙන් දුරස් වීමට හේතු වී ඇත. එහෙත් එය මුළාවක් නැතහොත් මිථ්‍යාවක් යැයි යම් කෙනෙකුට එකහෙළා කිව නොහැකි ය. එසේ වන්නේ වර්තමාන විද්‍යාත්මක ලොව තුළ දැකිය හැකි යම් යම් දෑ පදනම් කරගෙනය. එනම් වර්තමානයේ බොහෝ මිනිස්සු ජංගම දුරකථන භාවිත කරමින් සන්නිවේදනයේ යෙදෙති. එම ශබ්ද තරංගවල ගමන් කිරීමක් කිසිවිට නොපෙනේ. එසේ ම, කෙටි පණිවිඩ (SMS), ඡායරූප (MMS) ආදිය ද යවයි. එවැනි දෑ ගමන් කරන ආකාරය පියවි ඇසට නොපෙනේ. මෙවැනි දෑ විද්‍යාත්මකව දියුණු තත්තවයක් ය. මෙම විද්‍යාත්මක සොයා ගැනීම් කරන්නේ මිනිසාගේ චින්තනය පදනම් කරගත් මනස මූලික කරගෙන ය. එබැවින් පැහැදිලිව ම සිතකින් සිතකට සන්නිවේදනය කළහැකි "ටෙලිපති" ක්‍රමයෙහි ද සත්‍යතාවක් පවතින බවට නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද - මනස, හැගීම්, සිතුවිලි, ටෙලිපති, සන්නිවේදනය

CS Scanned with CamScanner

CS CamScanner

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1 මලලසේකර, ගුණපාල, 2007, ඉංග්‍රීසි-සිංහල ශබ්දකෝෂය., ඇම්.ඩී. ගුණසේන සහ සමාගම., කොළඹ.

2 රණවක, ඩී. එස්., 2018, අධි මනෝවිද්‍යාව, ලිතෝලයින්ස් පුද්ගලික සමාගම, කොට්ටාව,

3 රත්මල්කැටියේ, අරියනන්ද හිමි, ටෙලිපති ක්‍රමය පිළිබඳ මනෝවිද්‍යාත්මක මතවාද විමර්ශනයක්, චරණ ශාස්ත්‍රීය සංග්‍රහය, 3 කලාපය, භික්ෂු සංගමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.

4 **Oxford Advanced Learner's Dictionary**, 2000, Oxford University Press.

5 http:// skpdic.com/ telepath.html. Retrieved 2018-07-14

6 http:// si. Wikipedia.org/ wiki/.2018-07-14


Scanned with CamScanner

CamScanner

# කාන්තා පෞරුෂ සංවර්ධනයෙහි ලා බෞද්ධ ථෙරිගාථා පාළියෙහි උපයෝගීතාව

D. M. L. බණ්ඩාර[1]

## හැඳින්වීම

මානව සංවර්ධනයට අදාළව දර්ශනය, මනෝවිද්‍යාව, සමාජ විද්‍යාව, බෞද්ධ දර්ශනය ආදි විවිධ විෂය ක්ෂේත්‍රයන් තුළ පුද්ගල පෞරුෂ සංවර්ධනයක අවශ්‍යතාව පිළිගෙන තිබේ. පුද්ගල සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී "පෞරුෂය" යන සාධකය ඉවත හෙළිය නොහැකිය. තවද පෞරුෂ සංකල්පයෙන් තොරව පුද්ගල වර්ධනයක් හෝ ඉන් පරිබාහිර සමාජ සංවර්ධනයක් අපේක්ෂා කළ නොහැකිය.

සෑම පුද්ගලයෙකුට ම කිසියම් පෞරුෂයක් ඇති අතර එය සෑම දෙනාට ම එක සමාන ව නො පිහිටයි. උසස් පෞරුෂයක් හිමි අය සේ ම හීන පෞරුෂයකින් හෙබි අය ද සමාජය තුළ දක්නට ලැබේ. ආරෝහ පරිණාහ දේහයක් ඇති, දුටු පමණින් ප්‍රිය උපදවන, කීමෙහි බිණීමෙහි දක්ෂ, බුද්ධිමත් පුද්ගලයාට මනා පෞරුෂයකින් හෙබි පුද්ගලයෙකැයි අපි කියමු. මෙම සංකල්පය විවිධ මනෝවිද්‍යාඥයන් සහ මානව විද්‍යාඥයන් විසින් නන් අයුරින් නිර්වචනය කර තිබෙනු දැකිය හැකි ය. එකී නිර්වචනයන් විමර්ශනය කිරීමේදී පුද්ගලයාගේ අභ්‍යන්තර - බාහිර අංශද්වය ම පෞරුෂය විෂයයෙහි බලපාන බව ඔවුන් අවධාරණය කොට තිබේ. එසේ ම පෞරුෂය පිළිබඳ ව ඉදිරිපත් ව තිබූ නිර්වචන පුළුල් ව අධ්‍යයනය කළ ජී. ඩබ්. ඕල්පොට් නම් මනෝවිද්‍යාඥයා විසින් ඉදිරිපත් කරන ලද නිර්වචනය අන් සියල්ලට ම වඩා සාර්ථක යැයි පිළිගැනේ. "ඒ

1 හිටපු සහය කථිකාචාර්ය, රුහුණු විශ්වවිද්‍යාලය dmharshika@gmail.com

CamScanner

ඒ පුද්ගලයාට සුවිශේෂ වූ පුද්ගලයාගේ චර්යාව හා චින්තනයන් නියත කරවන ඔහු තුළ ඇති මනෝ භෞතික පද්ධතීන්ගේ ගතික සංවිධානය පෞරුෂත්වය යි." මෙම නිර්වචනයේ දී අවධානය යොමු වී ඇති අංශ කිහිපයකි. ඒ අනුව, 'ඒ ඒ පුද්ගලයාට සුවිශේෂ වූ බව' යන්නෙන් තවත් අයෙකුට සමාන නො වන බවත් 'චර්යා හා චින්තන නියත කරන' යන්නෙන් පෞරුෂ සංකල්පය චර්යාව තුළින් විග්‍රහ වන බවත් 'මනෝ හා භෞතික' යන්නෙන් සිත හා කාය යන අංශද්වයත් අර්ථවත් කරයි. 'ගතික' යන්නෙන් වෙනස් නො වන බව ද 'සංවිධාන' යන්නෙන් පිළිවෙලකට සකස් වූ සහ තනි තනි ව නො වන බව යන්න ද අර්ථවත් කෙරේ. මේ අනුව පුද්ගලයාගේ හැසිරීම යම් තලයකට ගෙන එන, ඔහු තුළ කායික හා ආභ්‍යන්තරික වශයෙන් පවත්නා වෙනස් නො වන්නක් ලෙස පෞරුෂත්වය විග්‍රහ කර ඇත.

මීට අමතරව පෞරුෂ සංවර්ධනය සඳහා පුද්ගලයාගේ සමාජ තලය, උපතින් ලද ආභාසය, වාසය කරන පරිසරය ආදිය ද බලපානු ලැබේ. ඒවායේ විවිධත්වය නිසා එකිනෙකා අතර පෞරුෂත්ව වෙනස්කම් ඉස්මතු කරයි. හොඳින් වැඩුණා වූ පෞරුෂය ඔහුගේ පැවැත්ම සනාථ කරවයි.

බුදුදහමට අනුව පුද්ගල පෞරුෂයේ සංවර්ධිත අති උත්කෘෂ්ට අවස්ථාව නිර්වාණ අවබෝධය යි. ඒ අනුව අප පුද්ගලයෙකුගේ පෞරුෂය ගොඩනැගිය යුත්තේ එම ආවසානික අරමුණ වෙනුවෙනි. කාන්තාව සතු නායකත්වය, එඩිතර බව, ස්ථානෝචිත බව, මාර්ගෝපදේශකත්වය, අකම්පය බව, බුද්ධිමත් බව, අභියෝග ජයගැනීම, විනීත බව හා හික්මීම, ඉදිරිපත් වීමේ හැකියාව, උට්ඨාන වීර්යය හා අධිෂ්ඨානශීලිත්වය ආදී ලක්ෂණ 'කාන්තා පෞරුෂත්වය' ලෙස හඳුන්වන ලද අතර එකී කාන්තා ගුණාංග ථෙරීගාථා පාළියෙහි ප්‍රකට කෙරෙන අයුරු මෙම පර්යේෂණයේ දී විමර්ශනයට ලක් කෙරුණි.

## අරමුණ

නූතන මනෝචින්තකයන් විසින් විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ කාන්තා පෞරුෂ සංකල්පය විග්‍රහයට බඳුන්කොට තිබේ. පෞරුෂත්වයේ උත්කෘෂ්ට ඵලය වන නිර්වාණාවබෝධය පිළිබඳ සාකච්ඡා කරන බුදුදහම තුළ එකී ගමන සාක්ෂාත්කර ගැනීමට

Scanned with CamScanner
CamScanner

කාන්තාවකගේ පෞරුෂය සංවර්ධනය විය යුතු ආකාරය පිළිබඳ ථෙරීගාථා පාළියෙන් ඉස්මතුකරගත හැකි ඉගැන්වීම් හඳුනා ගැනීම මෙහි මූලික අරමුණ යි.

**පර්යේෂණ ගැටලුව**

කාන්තා පෞරුෂයේ පවතින දුර්වලතාවන් නිසා වර්තමානය වනවිට සමාජ ගොදුරක් බවට කාන්තාව පත්වෙමින් පවතී. මෙය බරපතල සමාජ අර්බුද රැසකට හේතුවක් වී ඇත. එවන් වකවානුවක කාන්තාවගේ පෞරුෂය සංවර්ධනයට විධිමත් එළඹුමක් නොමැතිවීම ගැටලුවකි. තව ද පුද්ගල පෞරුෂයේ අග්‍ර ඵලය අවධාරණය කරන බුදුදහම තුළ වර්තමානයටත් අනාගතයටත් ඔබින විශිෂ්ට කාන්තා පෞරුෂයක් සඳහා ථෙරීගාථා පාළියෙහි උපයෝගීතාව පිළිබඳ ප්‍රාමාණික අධ්‍යයනයකට මෙතෙක් යොමු නොවීම ද ගැටලුවකි.

**පර්යේෂණ උපන්‍යාසය**

නූතන කාන්තා පෞරුෂ සංවර්ධනය සඳහා අවශ්‍ය මූලික කරුණු රාශියක් ථෙරීගාථා පාළිය තුළින් හඳුනාගත හැකිය.

**පර්යේෂණ ක්‍රමවේදය**

ත්‍රිපිටකයෙහි ඛුද්දක නිකායට අයත් ථෙරීගාථා පාළිය නම් වූ ප්‍රාථමික මූලාශ්‍රය මත පදනම්ව විවිධ තෙරණිවරුන් විසින් ගයන ලද උදන් ගී 522ක් පමණ වූ ථෙරීගාථාවන් විමර්ශනාත්මකව අධ්‍යයනය කරමින් එකී තෙරණි ගී තුළින් කාන්තා පෞරුෂය පිළිබිඹු කෙරෙන අවස්ථා, සිදුවීම් හා ප්‍රකාශන විශ්ලේෂණාත්මකව ගුණාත්මක ක්‍රමවේදය යටතේ කරුණු ගැඹුරින් අධ්‍යයනය කෙරේ. මීට අමතරව ථෙරීගාථා පාළිය පිළිබඳ ප්‍රකාශිත ද්විතීයක මූලාශ්‍රය ද ආශ්‍රයට ගෙන තිබේ.

**සාකච්ඡාව**

'පර්සෝනා' (Persona) යන ලතින් වචනයෙන් බිඳුණු 'පර්සනැලිටි' :ඡැරිදබ්කසඑහ* යන ඉංග්‍රීසි පදයට දෙන ලද සිංහල අදහස 'පෞරුෂත්වය' හෝ 'ස්වීයත්වය' යි. 'පුරුෂ' යන්නට 'ය' ප්‍රත්‍යය එක්වීමෙන් 'පෞරුෂය' යන පදය නිමැවී ඇත. ඒ

Scanned with CamScanner

CamScanner

පිළිබඳ වචනාර්ථ විග්‍රහයන් දෙස බැලීමේ දී ප්‍රකට වන්නේ එය පුරුෂ පාර්ශ්වය සඳහා පමණක් භාවිතා කෙරෙන පදයක් බව යි. එසේ වුව ද ඉංග්‍රීසි පාලි ශබ්දකෝෂයේ දී 'personality' යන්නට දී ඇති පාලි වචනය වන්නේ 'පුග්ගලිකත්ත' යන්න යි. මෙකී පද විමසීමේ දී ඉංග්‍රීසි, පාලි හා 'ස්වීයත්වය' යන සිංහල පදයෙන් ද ලිංග භේදයක් ගම්‍ය නො වන බව පැහැදිළි ය. 'Personality' යන එක ම ඉංග්‍රීසි වචනය සඳහා දී ඇති සිංහල පද ද්වයෙහි ද අරුත් දෙකක් ගම්‍ය වන බව පෙනේ. කෙසේ නමුත් කාන්තා, පුරුෂ දෙපාර්ශවය විෂයෙහි ම යහපත් පෞරුෂයක් ගොඩනගා ගැනීම වර්තමානය වන විට පිළිගෙන තිබේ. විශේෂයෙන් ම සංකීර්ණ සමාජ ගැටලු හමුවේ කාන්තාවකට වඩාත් ශක්තිමත් පෞරුෂයක උපයෝගීතාව අත්‍යයන්තයෙන් ම පිළිගැනීමට සිදුවී තිබේ. ඒ සඳහා බෞද්ධ ථෙරිගාථා පාළියෙහි උපයෝගීතාව මෙම පර්යේෂණයේ දී ඉස්මතු වූ නව පැතිකඩකි. ඒ අනුව, බාහිර ස්වරූපය, එඩිතර බව හා අකම්පනීය බව, බුද්ධිමත් බව, නායකත්වය හා මාර්ගෙ ෝපදේශකත්වය, උට්ඨාන වීර්යය හා අධිෂ්ඨානශීලිත්වය, අභියෝග ජයගැනීම, නිවැරදි තීරණ ගැනීම, විනීත බව හා හික්මීම, වරදින් මිදීම, ඉදිරිපත් වීමේ හැකියාව ආදී කාන්තාවක් සඳහා අතිශය වැදගත් පෞරුෂ ලක්ෂණයන් ථෙරිගාථා පිළිබඳ කළ පර්යේෂණයේ දී හඳුනාගත හැකිවිය.

## නිගමනය

ථෙරිගාථා පාළිය යනු සමස්ත සමාජයේ ම වසන විවිධ කාන්තාවන්ගේ චරිත ස්වභාවයන් විස්තර කරන්නක් සේ සැළකිය හැකි බව පෙනේ. එකී ථෙරිගාථාවන් සියුම් ව විමසා බැලීමෙන් ක්‍රි. පූ. 06 වන සියවස වන විට භාරතීය කාන්තාවගේ සමාජ තත්ත්වය කෙබඳු වී ද යන්න මැනවින් වටහා ගත හැකිය. ඊට අමතර ව තත්කාලීන සමාජ, ආර්ථික තොරතුරු ද ඒවායෙහි කාන්තා දායකත්වය ද මෙමගින් හඳුනාගත හැකිය. විශේෂයෙන් නූතන කාන්තා චරිත ලක්ෂණ සකස්විය යුතු ආකාරය පිළිබඳ කදිම ඉගැන්වීම් සහිත ප්‍රාමාණික මූලාශ්‍රයක් වශයෙන් ථෙරගාථා පාළිය නිගමනය කළ හැකිය. එමෙන් ම නූතන කාන්තා පෞරුෂ සංවර්ධනය විෂයෙහි නායකත්වය, මාර්ගෝපදේශකත්වය, එඩිතර බව, අභියෝග ජයගැනීම, බුද්ධිමත් බව, අකම්පනීය බව,

Scanned with CamScanner
CamScanner

කාර්යශූරත්වය, වරදින් මිදීම ආදී පෞරුෂත්ව ලක්ෂණ උපයෝගී කොටගත හැකි බව ථෙරිගාථා පාළියෙහි තෙරණි උදන් ගීවලින් මැනවින් තහවුරු වන බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ පෞරුෂය, කාන්තාව, ථෙරිගාථා පාළිය, ඛුද්දක නිකාය, සංවර්ධනය**

## ආශ්‍රිත ග්‍රන්ථ


**1.** ඛු. නි, ථෙරිගාථා පාළි, 2005, බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

**2.** රෙපරමාදු ලීලා (සංස්.)2002, බෞද්ධ සංස්කෘතික ලේඛන, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11.

**3.** වීරමන්, රෙජී, 2002, බුදු දහමේ සර්ව කාලීන අගය, දයාවංශ ජයකොඩි සමාගම, කොළඹ.

**4.** ඤාණිස්සර හිමි, පාතේගම, 2006, බෞද්ධ මනෝවිද්‍යා ආකල්පය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

**5.** Buddhatta, A. P, 1957, English Pali Dictionary, Bynarendra Prakasha Jain for Motilal Banardisass Publisher, Delhi.

**6.** වික්‍රමසිංහ, මාර්ටින්, 1966, ථේරි ගී, රාජගිරිය මවුන්ටන් ප්‍රකාශකයෝ, රාජගිරිය.


Scanned with CamScanner

CamScanner

# මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ ක්‍රියාවලියේ මනෝවිද්‍යාත්මක පසුබිම පිළිබඳ අධ්‍යයනයක්

ඩී. ජී. ඒ. එස්. සමරසිංහ[1] එන්.ඩබ්.ඩබ්.වී.හසිත සාරංග[2]

## හැඳින්වීම

ලොව මුහුණ දී ඇති ප්‍රබල සමාජ ප්‍රශ්න අතරින් සැලකිය යුතු ස්ථානයක් මත්ද්‍රව්‍ය භාවිත කිරීම හා ඒ ආශ්‍රිත ගැටළු සඳහා හිමි වී තිබේ. සංවර්ධිත රටවල් මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල් ද මෙම සමාජ ගැටළුවලට මුහුණ දෙයි. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් ප්‍රමාණය දිනෙන් දින ම ඉහළ යන බවක් දක්නට ලැබේ. මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වූයේ 1987 අන්තරායක ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පාලනය තම යටතට නතු කර ගැනීමත් සමඟ ය. ඒ අනුව ආරම්භ කරන ලද පුනරුත්ථාපන මධ්‍යස්ථාන අතරින් මහනුවර පුනරුත්ථාපන මධ්‍යස්ථානය මත්ද්‍රව්‍ය ලෝලීන් සඳහා ඖෂධ ප්‍රතිකාරවලින් තොරව මානසික හා චර්යාත්මක වැඩසටහන් මගින් මනෝ විද්‍යාත්මකව ප්‍රතිකාර කරනු ලබයි. එලෙස සිදු කරනු ලබන පුනරුත්ථාපය කිරීමේ ක්‍රියාවලිය මනෝ විද්‍යාත්මකව සිදුවේද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර උපයෝගී කර ගන්නා ලදි. තොරතුරු ලබා ගැනීම සඳහා අනුගමනය කරන ලද

1 සහකාර උපදේශන නිලධාරී, අන්තරායක ඖෂධ පාලක ජාතික මණ්ඩලය, anomasamarasinghe92@gmail.com

2 සහකාර කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,hasithasaranga92@gmail.com

CS Scanned with CamScanner

CamScanner

ප්‍රධානතම ක්‍රමවේදය ලෙස ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය හඳුන්වා දිය හැකිය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හන්දෙස්ස ග්‍රාමයේ පිහිටි අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අයත් ප්‍රධාන පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි ප්‍රතිකාර ලබන නේවාසික ලාභීන් 40 දෙනෙකු යොදා ගනිමින් දත්ත රැස් කරන ලදි. දත්ත හා තොරතුරු රැස්කිරීමේ දී ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය ද උපයෝගී කර ගන්නා ලදි. එසේ ලබාගත් තොරතුරු ගුණාත්මක හා සංඛ්‍යාත්මක විවරණයක් යටතේ විශ්ලේෂණය කරන ලදි.

**සාකච්ඡාව හා ප්‍රතිඵල**

මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් ආයතනගත කර පුනරුත්ථාපනය කිරීම එක්තරා ආකාරයක දඬුවම් ක්‍රමයකි. මන්ද එය එක්තරා කාල සීමාවකට යටත්ව සමාජයෙන් වෙන් කර තැබීමක් කරනු ලබන බැවිනි. අනෙක් අතට ආයතනය තුළ පවා නීතිරීති සමුදායකට අනුගතව හැසිරීමට සිදුවීමයි. එමෙන් ම දින චර්යාවත් මෙන ම ඉටු කළ යුතු වගකීම් සමීකරණයක් පවතී. එසේ ම නේවාසිකව සිටිනා කාලය තුළ සිදු කරනු ලබන වැඩසටහන් සමුදායකටතම සක්‍රීය දායකත්වය ලබාදිය යුතු බැවිනි. මෙකී ක්‍රියාදාමයේ සමස්තය මනෝවිද්‍යානුකූලව පුනරුත්ථාපන ආයතන තුළ සිදුවෙනවා ද යන්න අධ්‍යයනය කිරීම මූලික පරමාර්ථය විය.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් පවත්වාගෙන යනු ලබන ''මෙත් සෙවන'' මහනුවර පුනරුත්ථාපන මධ්‍යස්ථානය තුළ නේවාසිකව පුනරුත්ථාපනය වන තරුණයන් 40 දෙනෙකු යොදා ගනිමින් මෙම පර්යේෂණය සිදුකරන ලදි. එහි දී මෙම ආයතනය තුළ පුනරුත්ථාපනය කිරීම සඳහා භාවිත කරනු ලබන ක්‍රමවේදයක් සාමාන්‍ය මත්ද්‍රව්‍ය උපදේශනයෙන් වෙනස් වන්නේ මනෝවිද්‍යාත්මක ප්‍රවේශය ඔස්සේ සිදු කිරීමෙනි. මෙම ආයතනය තුළ අනුගමනය කරන ප්‍රතිකාර වැඩසටහන කොටස් 04 කින් යුක්තය. මෙම අදියරයන්ට අමතරව ප්‍රතිකාරයට භාජන කළ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයාව පසු රැකවරණ කිරීම සුවිශේෂී වූවකි. එහි දි නැවත සමාජගතවීම තුළ සාමාන්‍ය ජීවන

Scanned with CamScanner
CamScanner

රටාවට හුරුවීම පිණිස මෙම මධ්‍යස්ථානය මඟින් පසුවිපරමක් සිදුකිරීම සඳහා මාසික එම තැනැත්තන් කැඳවීමක් සිදුකරනු ලබයි.

මෙම උපදේශනය ක්‍රියාවලිය තුළ දී වෘත්තීය ප්‍රතිකාර, ක්‍රීඩා ප්‍රතිකාර හා සංගීත ප්‍රතිකාරය ද යොදා ගනු ලබයි. ඊට අමතරව දෛනික කාල සටහනකට අනුව කටයුතු කිරීමත් සෑම අඟහරුවාදා දිනකම සාවි පරීක්ෂණ, ශ්‍රමදාන, ආගමික වැඩසටහන් සංගීතමය වැඩසටහන් සංවිධානය කිරීම සිදුකරයි. මෙම වැඩසටහන් සඳහා සේවාලාභීන් සහභාගී කරවීම තුළ ඒකාකාරී ජීවන රටාව යම් තරමක් දුරට වෙනස් කිරීමක් ද චර්යා නවීකරණයක් ද සිදුවේ. සමාජගත වීමෙන් පසුව ඇතැයි පිරිස් නැවත මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ හැකියාවක් පවතින නිසා පසු රැකවරණයේ දී ආයතනය සමඟ පවතින සබඳතාවය හේතු කරගෙන නැවත මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹීමේ අවම ප්‍රවණතාවක් පවතින බව කිව හැකිය.

**නිගමනය :**

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමෙන් පසු සමාජගතවීමේ දී නැවත මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ප්‍රවණතාවය වැඩි බවක් කිව හැකිය. එයට පාරිසරික සාධක හා ජීවන පැවැත්ම හේතු විය හැකිය. මෙම මධ්‍යස්ථානය තුළ දී එසේ පවතින නැවත මත්ද්‍රව්‍ය භාවිත කිරීම අවම කිරීම පිණිස පසු රැකවරණය සිදුකිරීම හේතුවෙන් එම ප්‍රවණතාවය අවම වන බවක් කිව හැකිය. ක්‍රීඩා ප්‍රතිකාරය, සංගීත ප්‍රතිකාරය ආදිය යොදා ගැනීම මනෝවිද්‍යාත්මකව සිදුවන බවක් කිව හැකිය.

**ප්‍රමුඛ පද : මත්ද්‍රව්‍ය, පුනරුත්ථාපනය, සංගීත ප්‍රතිකාරය, උපදේශනය , ජීවන රටාව**

**ආශ්‍රිත ග්‍රන්ථ**

1. මත්ද්‍රව්‍ය දුර්භාවිත පද විවරණය, 1952, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, කොළඹ.
2. රත්නපාල නන්දසේන, 1991, අපරාධ විද්‍යාවේ මූලධර්ම II, ආරිය ප්‍රකාශකයෝ, වරකපොල.
3. රත්නපාල නන්දසේන, 1986, විෂ මත්ද්‍රව්‍ය සමාජය හා ඔබේ දරුවා, සිටි ප්‍රින්ටර්ස්, මොරටුව.
4. විජයනායක රසිකා, 2001, නීති විරෝධී මත්පැන් පවුල සහ සමාජය, ආරිය ප්‍රකාශකයෝ, වරකපොල.

3

CS Scanned with CamScanner

# An Analytical Study of the Psychotherapuetic Values of Vietnames Trúc Lâm Dhyāna School

Rev. Nguyen viet Bao Hung[1]

## Introduction

No one can deny that the ultimate purpose of humans is to seek true happiness which everyone will be able to obtain thanks to a freedom of mind. This is known as an inner path which each of us can feel by our heart, can see by our eyes and can practice by ourselves. To fulfil this aim, cultivators must have deep insight into every method leading to an everlasting ending of sufferings and body-and-mind-concerned problems. All Buddhist Schools in the world, generally speaking, share the aims of leading human beings to true happiness, a peaceful life and an eternal extermination of sufferings. Vietnamese Buddhists are said to be not an exception despite the fact that it can be depicted in a different way. One of the most influential Buddhist schools in Vietnam is well-known as The Truc Lam Dhyāna School which was founded for the same purposes of stopping both physical and mental pains of human beings.

## Research Problem

In general, this study takes turns to focus on two main issues concerned. First, the writer will critically introduce the overview of Vietnamese Buddhism throughout its prime, which started as a decisive thought of this stage when the

1

Scanned with CamScanner

CamScanner

Kings were also pious Buddhists. Hence, the essence of Vietnamese Buddhism at that period is valued as the greatest achievements both in doctrine and in practice, which has been able to meet the requirements for the development of the society throughout Vietnam's history. Another purpose of this study is to answer the question: "How are the psychotherapeutic values of Vietnamese Truc Lam Dhyāna School evaluated?"

## Methodology

The whole research will be carried out on the basis of the literature survey. Data from will be collected from primary and secondary sources and then presented with a critical approach. Based on the works on Dhyāna School, the writer will analyse and draw out values relating to psychotherapy.

## Objectives

This study focuses on the thoughts of Vietnamese Truc Lam Dhyāna School mentioned in such works as "A Worldly Life with Joy in The Way" of King Tran Nhan Tong, who founded this School. In addition, the teachings as roots of mental illnesses, concepts of peace - tranquility of mind, and 'no-mind' together with cultivating loving-kindness will be investigated in this paper.

## Discussion and Findings

The psychotherapeutic values of this school can be applied in today's society. Each individual can also employ this psychotherapy-based method for their own life anytime and anywhere. Originally, the founders of this Dhyāna School merely preached and conveyed these thoughts to their disciples, who are expected to comprehend, practice and get benefits from them. However, after psychology appeared, there were obviously plenty of similarities in terms of psychotherapy, which the writer would like to present in detail.

Scanned with CamScanner

CamScanner

## Conclusion

All things considered, the paper will end with the conclusion that the teachings of the founders of this Dhyāna School are regarded as psychotherapies which each of us should practice to obtain true liberty in this life.

**Keywords: Vietnamese Dhyāna school, psychotherapeutic value, tranquility of mind**

## Bibliography

Lê Mạnh Thát, *Trần Nhân Tông A Biographical Study*, Ho Chi Minh City Publication, Vietnam, 2006.
Trần Thuận, *Vietnamese Thought in Trần Dynasty*, Ho Chi Minh City Publication, Vietnam, 2014.
Thích Phước Đạt, *The Literature's Value in works of Trúc Lâm Dhyāna school Lý – Trần literature*, Hong Duc publication, 2016.
*The complete History of* Đại *Việt*, The Cultural Publication, 2017.
Ven. Thich Thanh Tu, *Tam tổ Trúc Lâm giảng giải [A commentary on three progenitors of Truc Lam Thien]*, Ho Chi Minh City PublicationViet Nam, 1997.
Ven. Thich Thanh Tu, *Thiền sư việt nam [Vietnamese Buddhist Masters]*, Vietnamese Buddhist Sangha in Ho Chi Minh city Publisher, 1999.
Ven. Thich Thanh Tu, *Thiền học* đời *Trần [ Thien under Tran dynasty]*, Vietnamese Buddhist Sangha in Ho Chi Minh city Publisher, 1999.

CS Scanned with CamScanner

CS CamScanner

# රූපලාවන්‍ය හා කාන්තා මානසික ආතතිය (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුවියන් ඇසුරින්)

නිරෝමි ගුණරත්න[1]

## හැඳින්වීම

රූපලාවන්‍ය යන්න ඉංග්‍රීසි භාෂාවේ "Beauty Culture" යන පදය හා සම්බන්ධ වේ. මෙය සෞන්දර්යාත්මක පදනමක් මත භෞතික ගුණාංගවල වර්ධනයක් ලෙස ද ඇතැම් විචාරකයෝ හඳුන්වති. රූපලාවන්‍ය යන්න මෑත කාලීනව වඩාත් ජනප්‍රිය ක්ෂේත්‍රයක් වශයෙන් සැළකුවත් මෙහි ඉතිහාසය ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිවයයි. බුදුන් වහන්සේ ජීවමානව වැඩසිටි කාලවකවානුවටත් පෙර යුගවල ජීවත් වූ කාන්තාවන් මෙන් ම පසුකාලීනව ලොවපුරා ව්‍යාප්ත වූ විවිධ ශිෂ්ටාචාරවල සිට වර්තමානය දක්වා ම ජීවත් වූ කාන්තාවන් විවිධ රූපලාවන්‍ය කටයුතු සිදුකළ බව ජාතක කතා සහ සන්දේශ කාව්‍ය වැනි සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වේ. සංස්කෘතික වටිනාකම් සහ සුන්දරත්වයේ ප්‍රමිතීන් මත කාලයත් සමඟ රූපලාවන්‍ය යන සංකල්පය පිළිබඳව කරනු ලබන අර්ථකතන ද වෙනස් වෙමින් පවතී. කෙසේ නමුත් රූපලාවන්‍ය යනු පුද්ගලයා හා සම්බන්ධ බාහිර සාධකයනට වඩා පුද්ගල මානසිකත්වය හා බැඳි සංකල්පයක් වන බව මනෝවිද්‍යාඥයින්ගේ මතයයි.

මුල් කාලීනව රූපලාවන්‍ය කටයුතු සඳහා ස්වභාවික ශාකසාර පමණක් යොදාගත් අතර වර්තමානයේ දී රූපලාවන්‍ය වානිජ කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත වීමත් සමඟ ම ස්වභාවික රූපලාවන්‍ය කටයුතු වෙනුවට විවිධ රසායනික සංයෝග භාවිත කිරීම දැකගත

1 දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

Scanned with CamScanner
CamScanner

හැකිය. අතීත සමාජයට සාපේක්ෂව වර්තමානයේ කාන්තාවන් පමණක් නොව පුරුෂ පාර්ශ්වය මෙන් ම වයස් භේදයකින් තොරව සෑම පුද්ගලයෙකු ම රූපලාවන්‍ය හා සම්බන්ධ කුමන හෝ ක්‍රියාවක් සිදුකරන තරමට ම ලෝක රූපලාවන්‍ය කර්මාන්තය වැඩිදියුණු වී ඇත. රූපලාවන්‍ය තුළට මූලිකව ම අන්තර්ගත වන සාධක අතර හිස කෙස් අලංකරණය, පාවහන් විලාසිතා, ඇඳුම් විලාසිතා, කොණ්ඩා කැපීම, ආභරණ විලාසිතා, සුවඳ විලවුන් වර්ග, විවිධ ආලේපන වර්ග, පච්චා කෙටීම, රූපලාවන්‍ය සැත්කම්, ආදිය මූලික වේ. ඒ අනුව කාන්තාවන් විසින් කරනු ලබන මෙවැනි රූපලාවන්‍ය කටයුතු හා කාන්තා ආතතිය අතර පවතින සබඳතාව මනෝවිද්‍යාත්මකව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ වසර හතර ම නියෝජනය වන පරිදි ගැහැණු ළමුන් 40 දෙනෙකුගෙන් සමන්විත නියැදියක් තෝරාගැණින. ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේද ඔස්සේ ලබාගත් දත්ත විශ්ලේෂණය මඟින් නිගමනවලට එළඹිණි.

**සාකච්ඡාව**

මෙම පර්යේෂණයට අනුව නියැදිය සඳහා තෝරාගත් විශ්වවිද්‍යාල ශිෂ්‍යාවන් සියලු දෙනා ම රූපලාවන්‍ය කටයුතු සඳහා ප්‍රියතාවක් දක්වන අතර ම ඒ අතරින් ද වැඩිම පිරිස මුහුණ හා සම සම්බන්ධ රූපලාවන්‍ය කටයුතුවල නිරත වූ බව හඳුනා ගැණින. රූපලාවන්‍ය නිෂ්පාදන මිල දී ගැනීමේ දී ආයුර්වේද නිෂ්පාදන වැඩි වශයෙන් තෝරාගැනීමට බොහෝදෙනා කැමැත්ත පළකර තිබුණි. එමෙන් ම සියලු ම දත්ත දායකයින් විසින් සෑම මසක ම සැළකිය යුතු මුදලක් සිය රූපලාවන්‍ය කටයුතු වෙනුවෙන් වැයකර තිබුණ අතර වැඩිවශයෙන් රූපලාවන්‍ය නිෂ්පාදන මිල දී ගැනීමේ දී කාන්තාවන් විසින් සැළකිලිමත් වී තිබුණේ අන්‍යයන් ඊට දක්වන ප්‍රතිචාර හා අනිකුත් කාන්තාවන් විසින් කරනු ලබන රූපලාවන්‍ය කටයුතු පිළිබඳවයි. එමෙන් ම බොහෝ ගැහැණු ළමුන් තමන්ගේ පෞරුෂය විදහා දක්වන ප්‍රබල සාධයක් ලෙස

Scanned with CamScanner
CamScanner

රූපලාවන්‍ය කටයුතු හඳුනාගෙන තිබුණි. ඒ අතර අන්‍යන් අතරින් කැපීපෙනීම, තමාවෙත වැඩි ආකර්ශනයක් දිනාගැනීම, වර්ණනාවට ලක්වීම, තමාගේ රුව පිළිබඳව සතුටු වීම, වැනි අවශ්‍යතා ඉටුකර ගැනීම තුළින් කිසියම් මානසික තෘප්තියක් ලබාගැනීමේ අරමුණින් රූපලාවන්‍ය කටයුතු වල නිරත වන බවයි. එමෙන් ම වැඩි වශයෙන් රූපලාවන්‍ය කටයුතුවලට යොමු වූ කාන්තාවන් තමාගේ ස්වභාවික රූපය පිළිබඳව කිසියම් ආතතියකින් පසුවන බව මෙන් ම නිරන්තරයෙන් අන්‍යන් හා තමාගේ රුව සැසඳීමට උත්සාහ කරන චර්යා ලක්ෂණ පෙන්නුම් කෙරිණ. එසේ ම තවත් කාන්තාවන් පිරිසක් රූපලාවන්‍ය කටයුතුවලට කැමැත්තක් දැක්වූවත් ඒවා-යේ අතුරු ප්‍රතිඵල පිළිබඳව සඳහන් කරමින් එම කටයුතුවලින් ඈත් වී සිටීම මත ආතතියට පත්ව ඇති බව හඳුනාගැණින. දත්ත දායකයින්ගෙන් ඉතා ම සුළු පිරිසක් ස්වභාවිකව ම රූපලාවන්‍ය කටයුතුවලට කැමැත්තක් නොදැක් වූ අයවිය.

## නිගමනය

සමස්ත කාන්තාවන්ගෙන් වැඩි පිරිසක් රූපලාවන්‍ය කටයුතු සිදුකළ ද ඉන් බහුතරයක් කාන්තාවන් තමාගේ රූපලාවන්‍ය කටයුතු පිළිබඳව සෑහීමකට පත්වන බව දක්වා නොතිබිණි. තමා ප්‍රිය කරන රූපලාවන්‍ය කටයුතු සඳහා ප්‍රමාණවත් මූල්‍ය ශක්තිය නොමැතිකම, සුදුසු රූපලාවන්‍ය නිෂ්පාදන නොමැතිකම, රූපලාවන්‍ය කටයුතු පිළිබඳව දැනුම නොමැති කම, රූපලාවන්‍ය නිෂ්පාදනවල ගුණාත්මක බව පිළිබඳ ගැටලු, සමාජ සංස්කෘතික සීමාවන්, ආදී සාධක හේතුවෙන් රූපලාවන්‍ය කටයුතු සිදුකළත් තවදුරටත් කාන්තාවන් ආතතියට පත්වන බව මෙමඟින් ගම්‍ය විය.

**ප්‍රමුඛ පද : රූපලාවන්‍ය, කාන්තාව, මානසික, කටයුතු**

## ආශ්‍රිත ග්‍රන්ථ

01. භූෂන්, ඒ. එම්. (2012). අයුර්වේද රූපලාවන්‍ය හා පංච කල්‍යාණය. කර්තෘ ප්‍රකාශන.
02. පෙරේරා, පී. (2005). පෞරුෂය හා පෞරුෂ සංවර්ධනය. කොඃ සහස්‍ර ප්‍රකාශකයෝ.
03. කුසුම්, පී. ජේ. (1993). කාන්තා ප්‍රතිරූපය සහ සමාජ මුහුණුවර. කර්තෘ ප්‍රකාශන.
04. https://en.wikipedia.org/wiki/Beauty
05. බක්මීවැව, ඒ. (2011). මානව පෞරුෂත්ව සංවර්ධනය. දංකොටුව, වාසනා පොත් ප්‍රකාශ.

Scanned with CamScanner

CamScanner

# Tathāgatassa Parinibbānaṃ Paṭicca Vividhā Mati: Vīmansanaṃ

Gonadeniye Paññārathanābhidhānena bhikkunā[1]

## Uddeso

So bhagavā pañcacattālīsāni vassāni sambuddhakiccaṃ niṭṭhāpetvā devamanussānaṃ saggamaggaṃ ca mokkhamaggaṃ ca vivaritvā asīti vasse parinibbānaṃ pattabhāvaṃ atīva pākaṭakāranaṃ bhavati. Tathāgato turita caricāya ca aturita caricāya ca Jumpudīpe ca nā nā raṭṭhesu ca devabhrahmādi lokesu ca veneya janānaṃ hitānukampayā caritvā tesaṃ amata pānaṃ pāyetvā saṃsāradukkhato mocetuṃ dhammaṃ desetvā nibbānamaggaṃ sodhāpetvā vesakhamāse puṇṇamiye Mallānaṃ Kusinārānagare sālavane parinibbāyi. Tassa bhagavato parinibbānaṃ ārabbha vidunaṃ antare nā nā vidhayo matayo santi. Nā nā panditā ca, vividhāyo vihāravāsino ca etaṃ kāranaṃ paṭicca attano matayo gahetvā vivadanti, potthakāni ca likhanti.

## Pariyesana Pañhaṃ

Sabbesaṃ manussanaṃ maranaṃ vivaretum koci na samattho hoti. Tathāgatopi manusso. Tathāpi so pana acchariya manusso. So sabbaññuta ñanena sabbāni kilesani vināsetavā saṃsarato vimucchi. Manussānaṃ āyu pana ekasata-vīsativassāyuke kāle kiṃ kāranaṃ nissāya

1 PhD Candidate, University of the West, USA, Siri Laṅkā Sogata Pāli Vissavijjālaye Pali Ajjhayanāṃsaye kathikācariyo

Scanned with CamScanner
CamScanner

tathāgato asīti vassāyuke parinibbāyi? Cundasssa dānena, Mārassa āyācanena, lohitapakkhandikā rogena atha vā so āyu parihānena vā attano matiyāya vāti Mama yojanaṃ pana buddho so bhagavā attano buddhakiccaṃ niṭṭhāpetvā pure sarīrassa vikāraṃ so parinibbāyīti.

## Pariyesana Payogo

Tepiṭacañka aṭṭhakathā ganthāni ca vimaVsetvā tesu ganthesu āgatakāranā nayena tathāgatassa parinibbānaṃ ārabbha panditānaṃ matayo vīmaṃsetvā mama matiṃ dassetuṃ ahamettha vāyamāmi.

## Sākacchā

So bhagava buddhattham patvā bodhi samīpe vasanakale pāpimā māro tassa balena tathāgatassa buddhatthaā nivāretuṃ vāyamitvā vāyamitvā osāne asamattho hutvā palāyitvā paccā attano Taṇhā, Rati, Ragā nāmitā tayo dhītaro ca pesetvā Buddhassa cittaṃ abhivijituṃ vā buddhattaṃ nivāretuṃ vā asamattho hutavā athāparabhāge punapi tathāgatassa santikaṃ āgantvā idāni pana buddhathaṃ laddhattā parinibbātuti āyāci. Tadā so bhagavā māraṃ āmantetvā attano sāvakā bhikku, bhikkuṇī, upāsaka, upasikāyo yadi viyattā vinītā visāradā bahaussutā dhammadharā dhammānudhamma paṭipannā parappavāde samatthā aññāesaṃ tathāgatassa dhammaṃ bodhetuṃ na sakkuneyya, tāva tassa parinibbānaṃ na bhavissatīti nivedesi. Tato paṭṭhāya tathagatassa pade pade sattavassāni gantvā pi ca kiñci kātuṃ asmattho puna nāgaccatiti thira vacanaṃ datvāpi kāle kāle buddhassa santike vividhāyo dukkatāni katvā āsīti vassakāle Cāpāla cetiyaṭṭhāne nisīditvā yadā tathāgato, yadi yo canda citta viriya vimasādi cattāro iddhipādā bhāvitā bahulīkathā yānikathā vatthukathā anuṭṭhitā paricitā susamāraddhā so ākaṅkhamāno kappaṃ vā tiṭṭheyya kappāvasesaṃ vāti vatvā tathāgato pi ca cattāro iddhipāpā tathā bhāvitāti nimittokāsaṃ kayramāne āyasmato

Scanned with CamScanner
CamScanner

Ānandatherassa mārabalam nissāya taṃ kāranaṃ bodhituṃ asamattho tathāgatassa kappaṃ vā kappavassaṃ vā vasituṃ anāyacitvā tuṇhībhāvena ṭhite, Ānandatthero aññataraṃ rukkhamūlaṃ gate puna pāpimā maro bhagavantaṃ upasankamitvā buddhattam laddha kāle vacanampi āvajjetvā tathāgatassa parinibbātuṃ āyaci. Tathāgato pāpimā mārassa vacanaṃ asallakkhetvā ito tiṇṇaṃ māsānaṃ accayena attano parinibbānaṃ bhavissatīti sato sampajāno āyusaṅkhāraṃ ossaji. Tadā mahā bhūmicālaṃ ahosi. Devadundubhiyo ca phaliṃsu. Etaṃ kāraṇaṃ Milinda pañhe pi ca āgatameva. Milindo nāma rājā tathāgatassa parinibbānaṃ Cundassa dānaṃ nissāya ahosi vā no vāti pucchite Nāgaseno mahāthero Cundassa dānaṃ nissāya so bhagavā na parinibbāyīti sammā vittharito ahoti. Anehi kāranehi tathāgatassa parinibbānaṃ kira Cundassa dānena vā, Lohitapakkhandikāya vā, āyu parihānena vā, satthāhārena vā, aññena kāranena vā abhavīti patiganhituṃ na sakkoti. Taṃ pana tathāgatassa āyusaṅkhāra ossajjanaṃ nissāya ahosīti patiganhituṃ yuttaṃ.

**Samodhānaṃ**

Imehi ākārehi imehi padehi imehi vyañjanehi tathāgatassa parinibbānassa visesatāyo daṭṭhabbaṃ. Ayaṃ pana Dīghanikāya mahāparinibbāna sutte vitthārena āgataṃ. Buddhaghosattheropi etaṃ kāranaṃ attano Sumangalavilāsinī nāma aṭṭhakathāya sammā supākaṭaṃ kāritamatthi.

**Pamukha Padāni - Parinibbānaṃ, Cundassa dānaṃ, Lohitapakkhandikā, Pāpimā āro, Ānandatthero,**

Scanned with CamScanner
CamScanner

**Āsevita Ganthāvalī**


i. Dīghanikāya Mahāparinibbāna suttaṃ CSCD.
ii Sumaṅgalavilāsinī nāma Dīghanikāya aṭṭhakathā Hevāvitāraṇa muddanaṃ, 1920.
iii. Khuddakanikāye Udānapāli Cunda sutta CSCD.
iv. Paramatthadīpanī nāma udānaṭṭhakathā, Hevāvitāraṇa muddanaṃ, 1920.
v. Visuddhimaggo, Hevāvitāraṇa muddanaṃ, 1919.
vi. Milindapañhapāli, Piṅdapātamahapphala panho.


Scanned with CamScanner

CamScanner

# Kiṃ Akārādayo paṭipāṭiyā vā uppaṭipāṭiyā vuttā: Kaccāyanamoggallāyanesu Akkharasapadānaṃ paṭiccekaṃ vīmaṃsanaṃ

Sāliya Asokapura Nanda nāma bhikkhu[1]

**Uddesavāro:**

Magadhasakkatadamilasūrasenaaddhamāgadhādisu vohāresu hi akārādīnamanukkamato akkharāni saṅgahaṃ āropayiṃsu sabbe te veyyākaraṇikā viditatthā saddasatthānusāsakā. Pubboditamagadhasakkatabyākaraṇesu sarabyañjanavagganiggahītādayo ca tathā ṭhānuppattivasena ca akkharāni visuṃ visuṃ katvā sakasamayaṃ paridīpentāva busaṃ vivadanti. Tehi imāni pabhedhakaraṇāni pakāsitāpi kenacideva hetunā akkharasapadānassa mūlakāraṇaṃ athavā nidānaṃ na pakāsitaṃ napparidīpitaṃ. Nikhilasaddalakkhaṇavibhajanavibhāgādīnaṃ sakkatasampadā atha vā samayaṃ eva ādi. Apitu, ettāvatā sakkatasamaye ekamekampi pāṭantaraṃ natthi akkharasapadānassa hetuyuttīni samupadassitaṃ. Evaṃ sati māgadhabyākaraṇassa atha vā pāli sampadāya matajjhāsayaṃ nāma kiṃ akkharasapadāne? Kaccāyanamoggallāyanasaddanītīti vissutāsu byākaraṇakulesu nānāvidhā ganthānuganthaparamparā santi. Tesantare pubboditobhayasampadā akkharasapadānaṃ paṭicca

1 Temporary Lecturer, Dept. of Pali and Buddhist Studies, Faculty of Humanities, University of Kelaniya, rev.nanda.s@gmail.com

Scanned with CamScanner
CamScanner

hetunidānāni byākatā paridīpitā samupadassitā. Ettāvatā, tāni pana āvīkaraṇāni padarūpasiidhitīkāya ca tathā pañcikāpadīpanāma moggallāyanabyākaraṇavitthārakathā yampi ca daṭṭhuṃ sakkā. Etasmiṃ nidāne ubhayasampadā bhiyyosomattāya sādisāpi appakā vesammatāpi paridīpenti. Tamatthaṃ upadhāretvāva pubbanidassitobhayamūlāsayāni āsevitvā māgadhī vohārassa akkharasapadānaṃ athavā paṭipāṭi parivīmaṃsitumicchāmi. Ayametasmiṃ upaparikkhaṇe kiccaṃ. Indu-ariyabhāsāyo pana ekarūpā samānarūpā sahavattikā sahagacchatāpi lesamattā kiñcimattā vesammatāpi santi. Akkharamāraddhampi taṃ tatheva hoti. Kenaṭhena akāraṃ ādimhi vuttaṃ? athavā vaggabyañjanesu kakārassādibhūtabhāvassa kiṃ hetu? ādīni sabbāni kāraṇāni sallakkhetvāva upparikkhaṇamimaṃ pavakkhāmi.

**Pañhavāro:**

Magadhasakkatabhāsāsu akkharāni pana akārato paṭṭhāya paṭipāṭiyā vā uppaṭipāṭiyā vā vuttāni. Sabbesupi ṭhānesu akāroyevādi. Aññānipi saññādayo ca ayamevanayaṃ nissitā. Evaṃ sati akkharasapadānassa ko hetu? Kenaṭṭhena kimatthāya tāni īdisākārena paṭipāṭiyā vuttā? Ayametassa ko hetu Ko paccayo Kiṃ nidānanti pañhavāro.

**Nayavāro:**

Imasmiṃ pariyesane paṭhamatarameva rūpasiddhiṭīkā ca pañcikāpadīpañca āsevanto yuttaṭṭhānesu aññānipi byākaraṇaganthāni ca subuddhikavicārakānaṃ matayo ca āsevitvā tulanavibhajanavivaraṇavīmaṃsanavibhā gādīhi nayavārehi sa sabbamatajjhāsayo anusandetvā pariyesanamimaṃ pavakkhāmi.

**Sākacchāvāro:**

Imasmiṃ pariyesanapatthikāyaṃ sākacchāvāre pana saṅkhitteneva pubboditāni hetuyuttīni ekekehi saddhiṃ

Scanned with CamScanner
CamScanner

sanusandetvā anuyojetvā vattabbayuttasabbāniyeva kāraṇāni sātthappabhedehi saha pavakkhāmi. Akkharappamānena visamopi Indu-Ariyabhāsāyo pana akkharasapadānena sadisattatā tulitattatā sāmaññatāyeva padassenti. Pālisakkata magadhakaroṭṭhiaddhamāgadhī ādayo akāraṃ ādimhi paṭhanti vācenti udīriyanti samupadassenti. Taṃ kiss hetu? Ayametaṃ pañhaṃ pana pubbanidassitabhāsāsu neva vissajjitaṃ na vivaritaṃ neva vibhajitaṃ vinā pāli sampadā. Etasmiṃ pakaraṇe pāli veyyākaraṇikā pana hetuyuttīni āvīkaronti.

Padapāṭhādīhi samuppajjitaṃ byākaraṇasampadā pana sappabhedehi paṭipāṭiyāyeva virūḷhavepullattamagamāsi. Akkharāni paṭicca taṃ vīmaṃsane pātisākhiyasikkhādayo ubhinnapaṭipadā *samānakkhara sandhyakkhara sara dīgha pluta anussāra byañjaṇādayo* bedhe paridīpenti. Vibhajanametaṃ pana bhiyyosomattāya Indu-Ariya bhāsāntaresu ajjatanepi daṭṭhuṃ sakkā. Akkharamāraddha evamādinayenevāgataṃ aññampi vīmaṃsanaṃ Āpisalī saikkhā nāma potthake santi.[2] Tato paraṃ nigaṇḍuniruttikārakā ca ato indacandapisilapāṇinī ādayo veyyākaraṇikā akkharasikkhāpane pubbanidassitavibhaṅgakaraṇāni samupayuttāni honti. Apitu Pāṇinī ādayo saddalakkhaṇakovidā byākaraṇānurūpena *"pratyahara"* iti nayamanugantvāva sabbāni akkharāni saṅkhitteneva pakāsitā honti.[3] Sārassatabyākaraṇānurūpena hakāreneva byañjanāni ārabhanti.[4] Sivasuttantarepi evarūpaṃ vibhajanaṃ santīti eke vadani.[5]

Yathāparidīpitanayena nayaññūhi sakkatādī puraṇabhāsāsu dvemeva akkharāvalī, seyyathidaṃ? Akkharasikkhāvaṇṇāvalī ca "Pratyahara akkharāvalī ca. Apitu kātantra nāma sakkata byākaraṇe pana ekameva akkharāvalī yadidaṃ akkharasikkhā nāma vaṇṇāvalīmeva.[6] Teneva hetunā kaccāyanādayo veyyākaraṇikā ekameva akkharāvalī āvīkarimsūti gaṇhituñca paṭipajjituñca sakkati. Yathā kātantra nama ganthe āgacchati tatheva nayena

Scanned with CamScanner
CamScanner

kaccāyanācariyo akkharasikkhāpanavaṇṇamālāyeva yojayati. Sabbabyākaraṇesu pana sarabyañjanarassadīghavaggāvagga ghosāghosādayo eteneva paṭipāṭiyā kathitā honti.

Evaṃ sati yathā vuttappakārena akkharasaṅgahapanakicce sapadānaṃ vā paṭipāṭi vīmaṃsetabbā. Te sabbe veyyākaraṇikā imamevapaṭipāṭiṃ anullaṃgetvāva akkharāni āvīkaronti tesānaṃ vyyākaraṇaganthesu. Akkharasapadānassa hetuyuttīni sakkatabhāsāya na dissanti. Apitu māgadhīsaddasatthaniruttikovidā buddhappiyanāma padarūpasiddhiṭīkākārako[7] ca tatheva pañcikāpadīpācariyo[8] ca akkharasapadānassa hetuyuttinimittāni samudāharanti. Sakāraṇehi sahapaccayehi nidassenti vivaranti vibhajanti uttānikaronti. Etaṃ nidānaṃ paṭicca rūpasiddhipayogasiddhināmobhayasampadā ekarūpaṃ samānarūpaṃ gāthā paṭhanti.

Nissayādo sarā vuttā nissitā byañjanā tato
- vaggekajā bahuttādo tato ṭhānalahukkamo[9]

Imasmiṃ gāthāya nissitanissayāti ubhayapadehi akkharasapadānaṃ āvīkarīyatīti ṭīkākārakā vadanti. Te tāni ubhayapadāni āraddha akkharapaṭipāṭi pana vividhehi nayehi saha anusandhetvāva pakāsenti. Ayaṃ nissayanissitapadānukkamo "byañjanehi nissīyantīti nissayā. Sarāti nayena" ca "anukkamehi ādonissayā sarā vuttā tato nissitā byañjanāti" vaseneva padasambandhaṃ ñātabbaṃ. Tāni ubhayapadāni vivarantā vibhajantā paridīpayantā te ācariyavarā akkharānukkamaṃ vā akkharasapadānaṃ vuttā.

Nissayanissitesu sarāyeva paṭhamaṃ vattabbattā sarāva paṭhamaṃ vuttāti ubhayasampadā kathenti. Sarānaṃ paccā nissayabyañjanāyeva vuttā. Paṭhamatarameva etasmiṃ visaye sarānamāraddha hetuyuttīni vīmaṃsetabbaṃ. Sarānamantare

Scanned with CamScanner
CamScanner

aādayo ādimhi dassanāya ko hetu? Saresu ekaṭṭhānajā bahukattā a ā I ī u ūti sarā paṭhamāva vuttā. Tatho pacchā dvijā ekārokārā.

Appabahukattā pana etasmiṃ vibhaṅgakaraṇe ekaṃ nidānaṃ. Saresu rassāva paṭhamaṃ vuttā tato ekekaṃ pati dīghā. Taṃ pana garukalahukabhedaṃ paṭicca ca vibhajitaṃ. Thānānukkamaṃ sallakkhetvā aādayo kaṇṭhatālumuddhajādinayeneva vuttā. Rūpasiiddhiṭīkā pana etaṃ kāraṇaṃ atīva vīmaṃseti vitthāreti. Apitu pañcikāpadīpācariyo hi taṃ saṅkhitteneva katheti. Saṅkhittavitthāratā pana ubhayasampadāsu ekā vesammatā. Eko pana bahūhi nidānehi saddhiṃ ekaṃ kāraṇaṃ atīva vitthāreti. Añño saṅkkhittheneva pakāseti.

Byañjanavisayesupi appakabahukabhedañca tathā vaggāvaggāṭhānanukkamaghosāghosādīni ca tatheva ekadvujabhedañca tathā aññānipi kathipayāni hetuyuttīni ca nidasseti so padarūpasiddhiṭīkākārako. Pañcikāpadīpācariyo hi padarūpasiddhiṭīkāyeva āsevayanto tāni kāraṇāni saṅkhittheneva aññehi padehi āvīkaroti. Rūpasiddhiṭīkāparivīmaṃsane byañjanesu vaggāva bahukattā paṭhamatarameva kaṇṭhalālumuddhajādīni paṭipāṭiyayeva vuttā. Vaggakkharānamapare bahukattā ca avaggattā ca ekajaṭṭhānīyā ca yaralavā vuttā. Tatoparaṃ sakārahakāraḷakārādayo ca niggahītañca vuttā. Kakārato makārantā ekūṇatiṃsabyañjanā samānadhammehi tehi ācariyehi vuttā. Tenahi ādimhi tāni viassajjāpetabbāni. Vaggesu aghosabhūtā lahukāyeva paṭhamaṃ vuttā. Tato ghosabhūtā garukā. Imasmiṃ pakarane appakabahukatā te ācariyā asallakkhentāva lahukagarukatāyeva gahetvā etaṃ vissajjenti. Ettha ekadasabyañjanā aghosā ca ekavīsati byañjanā ghosā ca. Appakabahukavasena gayhamāne aghosāva pamukhaṃ padhānaṃ. Apitu saramāraddha sallakkhayamāne appakabahukatāyeva tehi sallakkhitā. Yadi

Scanned with CamScanner

CamScanner

pubboditanayena etaṃ pañhaṃ vissajjeti byañjanapaṭipāṭi evarūpaṃ bhavati.

ga gha ṅa ka kha

ja jha ña ca cha

ḍa ḍha ṇa ṭa ṭha

Iccādi. Yadi evaṃ bhavati sithiladhanitādi bhedassāpi neva hāni. Tenahi ubhayācariyānaṃ etaṃ vibhāgakaraṇe kimapi kaṃkhā samuppajjayati. Yathā tehi akkhātanayena sithiladhanitabhedhaṃ ca akkharuppattiṭhānāni ca nisevitvāva udīritāni honti. Ghosabhūtā yaralavā tato paraṃ vuttā. Akkharānaṃ bahukattā ca ṭhānānukkamañca tattha hetu.

Sakārahakāraḷakārānaṃ visaye tehi gahitaḍiṭṭhiṃ pana kenaci kenaci kāraṇehi vesammatāyeva paridīpenti. Sakāramāraddha pañcikāpadīpācariyo dhanitabhāvaṃ eva pakāseti. Nāññāni. Apitu rūpasiddhiṭīkā pana aghosattā ca appakattā ca taṃ sabbapacchā hakāraḷakārādīnaṃ pubbeyeva udīritabbanti vadanti. Hakāro pana tato pacchā vutto. Taṃ pana orasattā dvijattā ca tasmiṃ ṭhāne bhavatīti pañcikāpadīpācariyo katheti. Hakāro pana kaṇṭhajattā paṭhamaṃ netabbopi akkharuppattisambhavadassanattaṃ uppaṭipāṭiyā pacchā vuttāti rūpasiddhiṭīka katheti. Apitu akkharuppattiṭhānānukkamena āvīkate ādimhi bhavitabbaṃ.

Ḷakāratthāya bhahūni vevacanāni vivaraṇāni te samupadassanti. Rūpasiddhiṭīkāya pana ḷakāraṃ keci ṭhāne ḍakāramiva paṭhatīti vuccate. Tathha vemattatā dassetuṃ sabbapacchā vuttabhāvaṃ kathyate. Etaṃ hetuṃ pana tasmiṃ visaye nevappamāṇaṃ. Kissa hetu? Na sabbesupi ṭhānesu ḷakāraḍakārādayo tathā bhavanti. Akkharavipariṇāmesu keci vacanāni ḍaḷattaṃ pāpuṇanti. Tenahi taṃ hetuṃ punapi vīmaṃsetabbaṃ. Pañcikāpadīpācariyo pana lipibhedaṭhānabhedādīni nissāya

CS Scanned with CamScanner

CS CamScanner

ḷakāraṃ pacchā vuttāti vuccati. Niggahītaṃ pana assarattā avaggattā ghosāghosavinimmuttattā ca sabbapacchā vuttāti rūpasiddhiṭīkā katheti. Ṭhānanukkamaṃ pana etamatthāya neva sallakkhitaṃ.

**Uttānikaraṇavāraṃ:**

Pubboditāni sabbānipi hetuyuttīni sallkkhayamāne akkharapaṭipāṭi paṭicca katipayakāraṇāni āvīkātuṃ uttānikātuṃ sakkā. Akkharasapadānaṃ paṭicca sakkatasampadā kimapi na vitthāreti. Apitu ādimhi rūpasiddhiṭīkā ca pacchā pañcikāpadīpo ca nidānahetunimittāni dassenti. Tesu appakabahkatā ca ṭhānānukkamañca pamukhāni. Keci ṭhāne te pubbanidassitaniyāni ullaṅgetvāva akkharasapadānaṃ kathitaṃ.

**Pamukhapadāni**: Akkharasapadāna, Māgadhavohāra, Rūpasiddhiṭīkā, Pañcikāpadīpa, Indu-ariyabhāsā, Sakkata.

**Mūlāsayāni**

Āpisali PDF online version. https://archive.org/search.phpquery=apishali20shiksha

Ashtadhyayi of panini book, (ed) vasu, srisa Chandra, 1891, Printed ByIndian Press.

Sārasvata grammar, https://archive.org/stream/SarasvataVyakaranaWithBalabodhin,

Balagalle, Wimala.G, The articles on Sinhala Language Studies (Sinhala) 2004, Godage Book Publishers, Colombo.

Pañcikāpadīpa, Chaṭṭhasaṅgāyanā.

Payogasiddhi, (ed) Ven. Kodagoda Ñānāloka, 1964, Sri Lanka Cultural Board, Colombo.

Rūpasiddhai ṭīkasametā, (ed) Kalukodnayave Siripaññāsekarābhidhānena saṃsoditā, 1964, M.D. Gunasena nāma sasīma samitiyā muddāpitā.

Rūpasiddhaiya, (ed) Ven. Baddegama Dhammaratana, 1936, Satmina Printers, Veligama.

The Katantra, (ed) Eggling Julius, 1947, Printed by Stephen Austin sons, Calcutta.

Scanned with CamScanner

CamScanner

## Endnotes


2 Āpisali PDF online version. https://archive.org/search.phpquery=apishali20shiksha
3 ashtadhyayi of panini book, (ed) vasu, srisa Chandra, 1891, Printed ByIndian Press, p.p 01-02
4 Sārasvata grammar, https://archive.org/stream/SarasvataVyakaranaWithBalabodhin,
5 Balagalle, Wimala.G, The articles on Sinhala Language Studies, 2004, Godage Book Publishers, Colombo, P 69
6 The Katantra, (ed) Eggling Julius, 1947, Printed by Stephen Austin sons, Calcutta, pp. 01-02.
7 Rūpasiddhai ṭīkasametā, (ed) Kalukodnayave Siripaññāsekarābhidhānena saṃsoditā, 1964, M.D. Gunasena nāma sasīma samitiyā muddāpitā, pp 318-319.
8 Pañcikāpadīpa, Chaṭṭhasaṅgāyanā.
9 Rūpasiddhaiya, (ed) Ven. Baddegama Dhammaratana, 1936, Satmina Printers, Veligama, P 20/
Payogasiddhi, (ed) Ven. Kodagoda Ñānāloka, 1964, Sri Lanka Cultural Board, Colombo, P 02.


Scanned with CamScanner

CamScanner

# මිලින්ද ප්‍රශ්නයේ අචේතන වෘක්ෂ ප්‍රශ්නය තුළින් පැන නැගෙන භාෂා භාවිතය පිළිබඳ දාර්ශනික ගැටලුව

සී .කේ. අත්තනායක[1]

## හැඳින්වීම

සම්බුද්ධ පරිනිර්වාණයෙන් සිව්වන සහ පස්වන සියවස් අතර කාල පරිච්ඡේදයේ පමණ ඇති වූයේ යැයි පිළිගැනෙන මිළිඳු නාගසේන සංවාදය ඇතුළත් මිලින්ද ප්‍රශ්නයේ අන්තර්ගත අචේතන වෘක්ෂ ප්‍රශ්නය තුළින් සමකාලීන භාෂාමය දර්ශනයේ සාකච්ඡා වන ප්‍රධානතම දාර්ශනික සංකල්පනාවක් වන භාෂා භාවිතය පිළිබඳ දාර්ශනික ගැටලුව සාකච්ඡා වී ඇති අතර, එය දාර්ශනික අතින් ඉහළ වැදගත්කමක් ප්‍රකට කරනු ලබයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ප්‍රාථමික සහ ද්විතියික ග්‍රන්ථ පරිශීලනයක් මගින් සිදු කෙරෙන අධ්‍යයනයකි.

## සාකච්ඡාව

මිලින්ද ප්‍රශ්නයේ සඳහන් වන ආකාරයට මිළිඳු රජු විසින් විමසන්නට යෙදුනු පැනය වන්නේ, බුදුන්වහන්සේ විසින් පලාස ජාතකයේ දී වෘක්ෂයකට (පලාස වෘක්ෂයට) සිතක් නොමැති බවත්, කිසිවක් නොදැනෙන බවත් වදාළ බව සත්‍යයක් නම් එන්දන ජාතකයෙහි කෝන් වෘක්ෂය කැපීමට පැමිණි භාරද්වාජයාට කෝන් වෘක්ෂය කථා කළා යැයි කියන කියමන සත්‍යයක් වශයෙන් පිළිගත

1 බාහිර කථිකාචාර්ය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
chaturikaattanayake@yahoo.com

Scanned with CamScanner
CamScanner

නොහැකි බවයි. එසේම එන්දන ජාතකයෙහි කෝන් වෘක්ෂය කථා කළ බව සත්‍ය නම් පලාස ජාතකයෙහි වෘක්ෂයකට සිතක් නොමැති බවත්, කිසිවක් නොදැනෙන බවත් කී ප්‍රකාශය අසත්‍යයක් වන බවයි. නාගසේන හිමියන් විසින් මීට පිළිතුරු ලෙස ඉදිරිපත් කරනු ලැබුවේ මෙවැනි අදහසකි. එනම්, 'මහරජාණෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් 'රුක්ඛො අචෙතනො' කියා වදාරණ ලද්දේය. එසේම එන්දන වෘක්ෂය භාරද්වාජ බ්‍රාහ්මණයා හා සමඟ කථා කරන ලදැයි කියාත් වදාරණ ලද්දේය. එහෙත් එම වචනය වනාහි ලෝක ව්‍යවහාරයක් පමණක් බවත් සැබැවින්ම අචෙතන වෘක්ෂය කථා නොකළ බවත්ය. මේ පිළිබඳ අදහස තවදුරටත් විග්‍රහ කළ නාගසේන හිමියන් විසින් පෙන්වා දෙනු ලැබුවේ ධාන්‍ය පුරවනු ලැබූ ගැලට ධාන්‍ය ගැල යනුවෙන් ලෝක ව්‍යවහාරයක් පැවතියත් එය සැබැවින්ම ධාන්‍ය ගැලක් නොව වෘක්ෂමය ගැලක් (ලී වලින් තනන ලද්දක්) වන්නේ යම් සේද එසේම කෝන් වෘක්ෂය කථා කළා යනුවෙන් ව්‍යවහාරයක් පැවතියත් ඉන් අදහස් වන්නේ වෘ-ක්ෂය කතා කළ බවක් නොව ඊට අධිගෘහිත දේවතාවා කථා කළ බවක් ඉන් අදහස් වන බවයි. තවද, කෝන් වෘක්ෂය යනු කෝන් වෘක්ෂයට අධිපති දේවතාවාට පර්යාය නාමයක් බවත් නාගසේන හිමියන් තවදුරටත් පැහැදිලි කර තිබේ. මෙහිදී නාගසේන හිමියන් මිළිඳු රජු වෙත සැළ කර සිටින්නේ බුදුන්වහන්සේ විසින් ලෝක ව්‍යවහාරයෙන්ම සත්ත්වයන්ට ධර්මය දේශනා කළ බවයි.

භාෂා භාවිතය පිළිබඳ මෙම විග්‍රහය සඳහා නාගසේන හිමියන්ට බෞද්ධ විශ්ලේෂණ ක්‍රමයේ ආභාසය ලැබී ඇතැයි ද සිතිය හැකිය. බුදුන්වහන්සේගේ දේශනා තුළින් පැහැදිලි වන්නේ උන්වහන්සේ තුළ භාෂා භාවිත පිළිබඳ අවබෝධයක් තිබූ බවයි. 'ගින්න නිවුනු පසු එය ගමන්කරන්නේ කුමන ස්ථානයකට දැ'යි අග්ගිවච්ඡගොත්ත සූත්‍රයේ දී වච්ඡගොත්ත විසින් අසනු ලැබූ පැනයකට බුදුන්වහන්සේ පිළිතුරු දී ඇත්තේ පළමුව ගින්න නමැති වචනය විශ්ලේෂණය කර එහි අර්ථය අවබෝධ කරගත යුතු බවයි. තවද බුදුන්වහන්සේ විසින් "ජනපද නිරුත්තිං නාභිනිවෙසෙය්‍යය - සාමඤ්ඤං නාතිධාවෙය්‍යය" යනුවෙන් සඳහන් කර ඇත්තේ භාෂා ව්‍යවහාරයන් වැරදි ලෙස යොදා නොගත යුතු බවයි. මජ්ඣිම නිකායේ අරණවිභංග සුත්තයෙහිත් පදයක පරම

Scanned with CamScanner
CamScanner

අර්ථය තේරුම් ගැනීම වෙනුවට එය යෙදෙන එක් එක් විෂයයෙහි අරමුණ අනුව ඒවා තේරුම් ගත යුතු බව දේශනා කළ සේක. විට්ගන්ස්ටෙයින් වැනි දාර්ශනිකයින් විසින් පෙන්වා දී ඇත්තේත් වචනයක අර්ථය යනු එහි භාවිතය බවයි. මොහු තමාගේ 'මෙවලම් උපමාව' නමැති සංකල්පය තුළින් පැහැදිලි කර දැක්වීමට උත්සාහ දරන්නේ ද ඉහත අදහසමය. එනම්, අප ව්‍යවහාර කරනු ලබන භාෂාවේ ඇති වචන වනාහි මෙවලම් පෙට්ටියක ඇති මෙවලම් හා සමානය. එකම කාර්යයක් කරන මෙවලම් එහි නොමැත. යම් මෙවලමකින් එක කාර්යයකට අමතරව විවිධ කාර්යයන් කළ හැකිවාක් මෙන්ම භාෂාවේ යෙදෙන පදයක් විවිධ භාවිත සඳහා යොදා ගත හැකිය. ප්‍රායෝගික භාෂාව මෙම වචන හරඹවලින් යුක්ත වූවකි. මෙහිදී අවධානය යොමු කළ යුතු වැදගත් කරුණක් වන්නේ එම වචනවල අනිසි භාවිත පිළිබඳව විමසිලිමත් වීමත්, නිසි භාවිත පිළිබඳව පැහැදිලි අවබෝධයකින් යුතුව කටයුතු කිරීමත් ය. භාෂා භාවිතය පිළිබඳ නිවැරදි අවබෝධයක් නොතිබීම හේතු කොට ගෙන සන්දර්භ පටලවා ගැනීමෙන් දාර්ශනික දෝෂ හටගන්නා බව භාෂාවාදී දාර්ශනිකයන්ගේ මතයයි. විට්ගන්ස්ටෙයින් මෙය හඳුන්වනු ලැබුවේ, 'භාෂාව නිවාඩුවකට හැරීමක්' ලෙසයි. විට්ගන්ස්ටෙයින් අවධාරණය කරනු ලැබූ සුවිශේෂී මතයක් වන්නේ භාෂා භාවිතවලට සීමා පැනවීම නොකළ යුතු බවත්, ඒවා භාවිතයේ පවත්නා ආකාරය අනුව තේරුම් ගත යුතු බවත්ය. මෙම මතය නාගසේන හිමියන් ද දරනු ලැබූ බව අචේතන වෘක්ෂ ප්‍රශ්නය තුළින් පැහැදිලි වේ. අචේතන වෘක්ෂ ප්‍රශ්නය තුළත් ලෝක 'ව්‍යවහාරය සංඥාවක් බව' සඳහන් වී තිබේ. බුදුන්වහන්සේ විසින් ද පෙන්වා දී ඇත්තේ ව්‍යවහාර අර්ථයෙන් ගත් විට භාෂාවේ පවත්නා වචන අර්ථ සම්පන්න සහ අර්ථ ශූන්‍ය යනුවෙන් වර්ග දෙකකට වෙන් කර දැක්විය හැකි නමුත් පරමාර්ථ අර්ථයෙන් සලකා බලන විට සෑම වචනයක්ම අර්ථ ශූන්‍ය වන බවයි.

**නිගමනය**

මෙම අධ්‍යයනය තුළින් පැහැදිලි වන්නේ නාගසේන හිමියන්ගේ ප්‍රශ්න විසර්ජනයේ දී බෞද්ධ විශ්ලේෂණ ක්‍රමයේ ආභාසය ලබා ගෙන ඇති බවත්, විට්ගන්ස්ටෙයින් ප්‍රමුඛ භාෂාවාදී දාර්ශනිකයන් විසින් භාෂා භාවිත පිළිබඳව මෑත කාලීනයේ ඉදිරිපත්

Scanned with CamScanner

CamScanner

කරනු ලැබූ අදහස් ක්‍රි. පූ. 1 වන සියවස වැනි ඈත යුගයකදී පවා භාවිත වූ සංකල්පයන් වන බවත්ය. තවද භාෂා භාවිතයන් අනිසි ලෙස යොදා ගැනීම තුළින් දාර්ශනික ගැටලු පැන නගින බව මෑත කාලීන දාර්ශනිකයන් විසින් අවධාරණය කරනු ලැබූ කරුණක් වුවත් එය ඔවුන්ගේ ස්ව සංකල්පයක් නොවන බවත් මින් ගම්‍ය වේ.

**ප්‍රමුඛ පදඃ මිළින්ද ප්‍රශ්නය, අචෙතන වෘක්ෂ ප්‍රශ්නය, දාර්ශනික ගැටලු, භාෂා භාවිතය**

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. මිළින්ද ප්‍රශ්නය (සංස්ඃ රාහුල හිමි අත්තුඩාවේ) 2008, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
2. කලන්සූරිය ඒ.ඩී.පී, බටහිර විශ්ලේෂී දර්ශනය, 2008, ආරිය ප්‍රකාශකයෝ, වරකපොල
3. කලන්සූරිය ඒ.ඩී.පී, විට්ගන්ස්ටෛන් සහ දාර්ශනික ගැටලු,1986,ලේකහවුස් ඉන්වෙස්ට්මන්ට්ස්,කොළඹ02
4. ධර්මසිරි ගුණපාල, දාර්ශනික ප්‍රශ්න, 2007, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල


Scanned with CamScanner

CamScanner

# පොළොන්නරු යුගයේ පැවති හින්දුදේවවාදයට එරෙහිව බෞද්ධ සාහිත්‍යයකෘති සිදුකළ කාර්යභාරය: (අමාවතුර ආශ්‍රයෙන් කෙරෙන අධ්‍යයනයක්)

පූජ්‍ය ඉඳුනිල්පුර ඉන්දානන්ද හිමි[1]

## හැඳින්වීම

මහින්දාගමනයේ ආශිර්වාදය උදක් ම ලබමින් ප්‍රභවය වූ සාහිත්‍ය කලාව ආදී සර්වාංගයන් බුදුදහම ලාංකේය සංන්දර්භයෙහි රෝපණය කිරීමට අකලංක මෙහෙයක් සිදුකළේය. පුරාතන සාහිත්‍යයට මූලාශ්‍ර සපයනුයේ බුදුදහමයි. දම්පියා අටුවා ගැටපදයෙන්, සීගිරි කැටපත් පවුරෙන්, සිඛවළඳ හා සිඛවළඳ විනිසෙන් එනම් අනුරපුරයෙන් ඇරඹුණු සාහිත්‍යය පොළොන්නරු යුගය වනවිට දැවැන්ත දියුණුවක් ලබා සිටියේය. පොළොන්නරු යුගය ආගමික, සාමාජික හා සාහිත්‍යයික වශයෙන් පෙරළියක් සිදුවුණු කාල වකවානුවකි. සොළීන් රට ආක්‍රමණය කිරීම හා හින්දු ආගම පැතිරවීම ඒ හරහා සංස්කෘත මිශ්‍ර භාෂාවක් ලෙස සිංහලය සැකසීම හෙළ බොදුනුවන් වෙනුවට දේවවාදී නිර්මාණවාදී සංකල්ප කරපින්නාගත් දේව භක්තිකයන් සිංහල බෞද්ධයාගෙන් ඉස්මතු වේ. මේ නිසා සිංහල දේශය, භාෂා සාහිත්‍යය පමණක් නොව බුදුදහම ද රැක ගැනීම එකල සිටි රජවරුන්ට, උගතුන්ට සිදු වුණි. එහි දී ආක්‍රමණශීලී හින්දු ආගමෙන් බෞද්ධයා රැකගනු වස් සිදුකළ මෙහෙයන් අතර සාහිත්‍ය විප්ලවය ද වැදගත් තැනැක් ගනී. එහි දී දේවවාදයට අභියෝග කරමින් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ජනයාට අවබෝධ කිරීමට සාහිත්‍ය කෘති විශාල

1 සහය කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.indanandaindunilpura@gmail.com)

Scanned with CamScanner
CamScanner

සේවාවක් සිදු කළේය. එය කෙසේ සිදුවූයේ ද යන්න අධ්‍යයනයට ප්‍රබලම සාධකය වනුයේ ගුරුළුගෝමීන් විසින් ප්‍රණීත අමාවතුරයි.

**පර්යේෂණ ගැටලුව**

පොළොන්නරු යුගයේ ඇති වූ හින්දු දේවවාදය මැඬලීමට අමාවතුර සාහිත්‍ය කෘතියෙන් සිදු වූ කාර්යභාරය කෙබඳු වීද?

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය බෞද්ධ සාහිත්‍ය කෘති අතර එන අමාවතුර මූලාශ්‍රය කොට සිදු කෙරේ. ඒ සඳහා පුස්තකාලය, පුවත්පත් හා සඟරා පරිශීලනය, අන්තර්ජාලය භාවිතය ඔස්සේ දත්ත එක්රැස් කිරීම සිදුවන අතර ගුණාත්මක ක්‍රමවේදය යටතේ දත්ත විශ්ලේෂණ සිදු කෙරේ.

**අරමුණ**

අනුරාධපුරයට වඩා බොහෝ බෞද්ධ සාහිත්‍යය කෘති පොළොන්නරුවේ දී බිහිවෙයි. ඒ අතර අමාවතුර රචනා විය. එය බුදුගුණ ගයන්නට ලියන්නට බිහිවූවකි. එමඟින් හින්දු දේවවාදයට දැඩි අභියෝගයක් එල්ල කිරීමට සමත් විය. බෞද්ධයන් දේවවාදී ප්‍රවාහයේ ගසාගෙන යන විට ඊට පිළියම් වශයෙන් බුදුගුණ පොදු ජනයන් තුළ ඇති කරලීම අළලා ලියැවුණකි, අමාවතුර. එම නිසා අමාවතුරෙන් තත් කාලීන අවශ්‍යතාව සිදු වූ අයුරු අධ්‍යයනය කිරීම මෙම ශාස්ත්‍රීය පර්යේෂණයේ අරමුණයි.

**සාකච්ඡාව හා ප්‍රතිඵල**

අනුරාධපුර කාලයේ මැද භාගයේ දී පටන් ම ලංකාවත් දකුණු ඉන්දියාවත් අතර සබඳතා වර්ධනය වෙමින් පැවතිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් දකුණු ඉන්දීය ජනයා වරින්වර විවිධ කරුණු කාරණා සඳහා ලක්දිවට සංක්‍රමණය වූහ. චෝළයන් උතුරු ලංකාවේ සිය බලය තහවුරු කරගැනීමෙන් පසුව තව තවත් ඉන්දීය ජනයා මෙරටට ආවේය. මීට අමතරව ආගම් කිහිපයක් ද පැවති බව දක්නට ලැබේ. හින්දු ආගම මේ අවධියේ ප්‍රචලිතව පැවතිණි.

Scanned with CamScanner
CamScanner

ජෛන, ශෛව, වෛෂ්ණව ඇදහිලි පැවති බව ශේෂව පවතින දේවාලවලින් මෙන් ම ශිව ලිංග, ශිව පාර්වතී, ගණේෂ, කාලි, ලක්ෂ්මී යනාදී ප්‍රතිමා හා මූර්ති කැටයම් පොළොන්නරුවේ තිබී හමුවීමෙන් පැහැදිලි වේ. පොළොන්නරුවේත් තදාසන්න ප්‍රදේශවලත් ඔවුන් විසින් දේවාල රාශියක් ඉදිකරන ලදී. නිශ්ශංකමල්ල රාජ්‍ය සමයේ බුදුදහමට මෙන් හින්දු ආගමටත් ජන ජීවිතයේ වැදගත් තැනක් ලැබුණු හෙයින් හින්දු සිරිත් විරිත් හා ආකල්ප බෞද්ධ සිත් සතන් තුළ තිරසාරව තැන්පත් විය. මෙම පසුබිම ක්‍රමයෙන් හින්දු ආගමේ දැඩි ව්‍යාප්තියක් දක්වා වර්ධනය විය. බෞද්ධ ජනයා බුදුදහමෙන් ඈත්ව හින්දු ආගම කෙරෙහි නැඹුරුවක් දක්වන්නට පෙළඹිණි.

පශ්චාත් අනුරාධපුර යුගයේ ඉහළින් නැඟී ආ හින්දු සමයානුගත සර්ව ව්‍යාපී වූ සර්ව බලධාරී වූ ඊශ්වර නිර්මාණවාදී සංකල්ප හා බෝධි සත්ත්ව චරිතයේ උත්තමාංග හුවා දක්වන මහායාන දර්ශනයේ සංකල්ප එතෙක් පැවති ලාංකේය බොදු සංස්කෘතිකාංග ක්‍රියාදාමය විශාල පෙරළියකට නතු විය. මේ හේතුව නිසා බෞද්ධයන් ගැඹුරු දහමින් ඉවත්ව භක්තිය කරපින්නා ගත් දේවවාදී ප්‍රවාහයට නතු විය. යථාර්ථවාදී දෘෂ්ටියෙන් මිදී නිර්මාණවාදී දර්ශනයක මුළා වූ තත් බෞද්ධයන් එමඟින් මුදවා ගැනීම එවක ජීවත් වූ උගත් බහුශ්‍රැතයන්ගේ කාර්යභාරය විය. බුදුන් වහන්සේ දේවාති දේව බ්‍රහ්මාති බ්‍රහ්ම උත්තම ගුණාංග යන්ගෙන් යුත් අසමසම ශාස්තෘවරයා බව ලොවට කියන්නට එකල ලේඛකයෝ සිය පන්හිඳ මෙහෙය වූහ. ගුරුළුගෝමීන් ද ඒ යුග පුරුෂයන් අතරේ දැවැන්තයෙකි. නිර්මාණවාදී දේව සංකල්ප භක්තියෙන් හිස දරාගත් සකු පාලි නොදත් හුදී සිංහල බෞද්ධ ජනයන් පිළිබඳ කාරුණික භක්තියක් ඇති කරමින් එම දේවවාදී ප්‍රවාහයෙන් සිංහල බෞද්ධයා මුදවාලීමේ යුගාත්මක අවශ්‍යතාව ගුරුළුගෝමීන් සිය අමාවතුරින් මුදා හරී. හින්දු දෙවිවරුන්ගේ අසීමිත බලය පිළිබඳ අසන ජනයා ඒ කෙරෙහි අසීමිත බිය මුසු ගෞරවයක් ද ඇති කර ගත්හ. මෙලෙස ක්‍රමයෙන් ලාංකේය බෞද්ධ ජනයා බුදුදහමෙන් ඈත්ව හින්දු ආගමේ සංකල්ප වෙත සංක්‍රමණය වෙන විට එය වළක්වා ගැනීමට විවිධ ක්‍රියාමාර්ග ගැනීමට ගිහි පැවිදි වියත්හු ක්‍රියාකළහ. එයට සාහිත්‍ය කෘතිවලින් විශාල සේවයක් සිදුවිය. මේ අතරින් අප පර්යේෂණයේ මූලාශ්‍රය වන අමාවතුර තත්

Scanned with CamScanner

CamScanner

කාර්ය සාඵල්‍යතාවට මහඟු මෙහෙයක් සිදු කළේය. අමාවතුරෙහි පාඨකයන් වනාහි ඉහළින් නැඟ ආ නිර්මාණවාදී සංකල්ප පිළිගත් හා පිළිගැනීමට පෙළඹුණු බොදුනුවන්ය. හින්දු දහමේ බමුණු මතවාද හිසින් පිළිගන්නට වූ යුගයක ගුරුළුගෝමීන් ඒ ප්‍රවාහයට ලක් වූ බොදුනුවන්ට බුදුරදුන්ගේ ඒ අතුල්‍ය වූ අවචනිය වූ ගුණ කදම්බයන් පහදා දෙන්නට දැරූ තැත අමාවතුරෙන් පැහැදිලි වේ. කූටදන්ත බමුණා බුදුරදුන් වර්ණනා කරන ආකාරයෙන් කවර ආගමක අයෙක් වුව ද උන්වහන්සේ කෙරෙහි නැඹුරු වෙයි.

"මව්පියන් කැමති සේ කඳුළු මුසු මුහුණ ඇති නෑයන් ලවා වලප්වා පැවිජි වූයේ යැ. අභිරූපයැ. දර්ශනීයයැ. ප්‍රසාද ජනකයැ. පැහැසපුයෙන් උපෙතයැ...ඔහුගේ එකකි ධම්දෙස්නෙන් සුවසුදහස් අපමණ දෙව්මිනිස්හු ද මගඵල අමා වළඳති. "(අමාවතුර (සංස්.), 2004: 58)

දේව දමන සහ බ්‍රහ්ම දමන පරිච්ඡේදවල දී දිව්‍ය සහ බ්‍රහ්ම ලෝකවල ඇති ආඪ්‍ය බව අත්‍යෝත්කර්ෂයෙන් වර්ණනා කරන අතර එවන් බල ශක්තියෙන් සපිරුණු දෙවියන් බඹුන් පවා බුදුන් ඉදිරියේ දන නමන ආකාරය ගුරුළුගෝමීන් අලංකාරවත් ලෙස වර්ණනා කරයි. චෝළ ආක්‍රමණ හින්දු ආගමේ බලපෑම් නිසා හුදු සිංහලය, සකු මිශ්‍රව මිශ්‍ර සිංහලයක් බවට පත් වී තිබිණි. නමුත් ගුරුළුගෝමීන් අමාවතුර රචනා කරනුයේ සකු මිශ්‍ර පොළොන්නරු යුගයේ භාෂාවෙන් නොව අනුරාධපුර සමයෙහි පැවති සේ පාලියට නැඹුරු වූ හුදු හෙළ වහරෙනි. එය ද අමාවතුරෙහි දැකිය හැකි යුගාත්මක වටිනාකමකි. අමාවතුරෙහි භාෂාව සුලලිත කෝමල ශිථිල බසකි. දේශීයත්වයත්, ඍජු සරල රීතියත්, වාග් සරණියත් නිසා මෙහි බස අගනේය. එය අනුරාධපුරයේ නිමැවුණු සීගිරි පැදිවල දේශජ, අව්‍යාජ, කාව්‍යමය බවෙත් පාලි භාෂාව ඇසුරෙන් හැඩවුණු සිබවළඳ විනිසේත් දැකගත හැකි ගීතවත් භාෂාවෙත් සංකලනයේත් දියුණුවකි.

**නිගමනය**

අමාවතුර කතුවරයා බුදුරදුන්ගේ නව ගුණ අතුරින් පුරිසදම්ම සාරථී ගුණයම පැහැදිලි කරන්නට අරමුණ කරගත්තේ බුදුන්ගේ

CamScanner

ශක්තියේ හමුවේ දේව බලය නිශ්ප්‍රභ වන බව කීමටය. දෙවියන් කෙරෙහි බැතිමත්ව සිටි බෞද්ධ ජනයා බුදුන්වහන්සේ සතු දේවාතිදේව බ්‍රහ්මාතිබ්‍රහ්ම බව දැන ගනියි. ඔවුන් බුදුන් කෙරෙහි ම බැතිමත් වෙයි. සිත් පහන් කරගනියි. බෞද්ධයන්ගේ සිත්හි අරක්ගෙන සිටි හින්දු ආගමික මතවාද මකා දමා බුදුදහමෙහි ශ්‍රේෂ්ඨත්වය බොදුනුවන් තුළ ඇතිකරලීම ගුරුළුගෝමින්ගේ අරමුණයි. එහෙයින් අමාවතුර වනාහි තත් යුග අවශ්‍යතාවක් සපුරාලන්නට කරන ලද ග්‍රන්ථයක් ලෙස සමර්චනය කළ හැකිය. සොළී ආක්‍රමණ නිසාත්, මහායාන බලපෑම නිසාත්, හින්දු ආගමේ බලපෑමත් නිසා දූෂිත වූ අපේකම රකින්නට එකල විරුවන් දැරූ තැත අගය කළ හැකිය. ඔවුන් අතර සාහිත්‍යකරුවන් ද සිටී. කාලීන අවශ්‍යතාවන් වෙනුවෙන් පත්හිඳ මෙහෙය වූ ලේඛකයන් අතර ගුරුළුගෝමි ප්‍රධාන වේ. ඔහු තම බුද්ධිමය ප්‍රවාහය, කිවිකම, බහුශ්‍රැත භාවය යොදා ගන්නේ ඒ යුග අවශ්‍යතාව ඉටුකරලනු වස්ය. එම නිසා ගුරුළුගෝමී යුග පුරුෂයෙකි. අමාවතුරෙන් ඔහු තම කාර්යභාරය ඉටුකළ ආකාරය මින් දත හැකිය.

ප්‍රමුඛපද: පොළොන්නරු යුගය, බෞද්ධ සංස්කෘතිය, හින්දු ආක්‍රමණය, නිර්මාණවාදය, අමාවතුර කාර්යභාරය

## පරිශීලිත ග්‍රන්ථ නාමාවලිය

අමරවංශ හිමි, කොත්මලේ. සිංහල සාහිත්‍යලතා. කොළඹ: සමයවර්ධන පොත්හල, 2000.

ඤාණාලෝක ස්ථවිර, කෝදාගොඩ. අමාවතුර. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2004.

ලගමුව, ඒ. මධ්‍යකාලීන රාජධානිය පොළොන්නරුව (ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්). නුගේගොඩ: සරසවි ප්‍රකාශන, 1999.

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර . සිංහල සාහිත්‍ය වංශය. කොළඹ: සමයවර්ධන පොත්හල, 1994.

Scanned with CamScanner

CamScanner

# Samadhi In Early Buddhism

**Mrs Sangmitra**[1]

Meditation is the heart beat of Buddhism. It lives through the meditation taught by the Buddha who followed this path, was enlightened and attained *Nibbāna*. Buddhist meditation is a mental calmness and concentration which leads one to enlightenment, free from the cycle of *saṃsāra*. Meditation has characteristic variations in different forms of Buddhist traditions but the main and center form is *sammā samādhi* (Right concentration), the second path and third division of his Noble Eight Fold Path. After the practice and perfection of śīla, one enters the path of *samādhi* which also comprises *sammā vāyāma* and *sammā sati*. The practice of *samādhi* leads one to the realization of right understanding *(paññā)* which culminates in attaining *Nibbāna*.

*Sam+ a+ √dha , sam* meaning 'to subdue' or 'to become peaceful', and the fixing of mind on a single object. It is defined as *'cittassa'ekaggatā'* (one pointedness of mind) in the eight meditative attainments. These attainments are calm as they are now with the one pointedness of mind, the wavering and fickleness of mind is subdued and has been put to an end and therefore it is defined as *'kusala cittassa ekagatta' ti sam*ādhi (the one-pointedness of the wholesome consciousness is samādhi)'. Samādhi is the sixth factor of

1 Research Scholar, Sanchi University Buddhist –Indic Studies, Madhya Pradesh-464551, INDIA, sangmitrapushkar@yahoo.com

Scanned with CamScanner

CamScanner

enlightenment , the calm and the concentrated mind can only see the things as they really are in deepest Samādhi, absorption is so complete that all senses of 'self' disappears and the subject and the object are completely absorbed into each other. It is one of the super power :*Samatha bala:* power of tranquility ; it is the one pointedness and non-distraction of the mind due to freedom from desire and ill-will leading to the perception of light *(āloka-saññā )*. Through this meditative achievement one enters the stage of knowledge, gladness and wisdom.

Samādhi is calmness, serenity, concentration, quietude and tranquility of mind. It is an unperturbed, peaceful and lucid state of mind attained by a strong mental concentration. It is an effective way of training the mind to develop inner strength leading one to clarity and understanding. It is the meditative quiescence, the development and refinement of attention. It aims at the attainment of meditative absorptions, frees the mind from impurities and inner obstacles and gives it greater penetrative strength. It is achieved by a sustained attention on one object, process or perception. It is unifying, unconditionally accepting and non-discriminating. As this meditative consciousness deepens the mind becomes calm and centered, less reactive and comes into higher level of refinements of his thoughts leading one to the path of Nibbāna.

In samādhi three kinds of practices are traditionally comprised; they are the eight dhyānas, the four unlimited (apramāna) and the occult powers. In the *Abhidhammatthasaṅgaha samādhi* is divided into three stages of development as *'parikammabhāvanā, upacārabhāvanā, appanābhāvanā* cā ti *tisso bhāvanā'(* the three stages of mental developments are preliminary development, access development and absorption development). In the commentaries, *Aṭṭhasālinī* defines it referring its function of tranquil-

Scanned with CamScanner

CamScanner

izing: *'Paccanīkadhamme sametī' ti samatho'* (It suppresses the opposite state of mind,the calm abiding samatha). In the *Visuddhi-magga* it is defined as '*citta visuddhi nāma sa upcrā aṭṭha-samāpattiyo'*. (The eight attainments together with access concentration is named as purification of mind). In the *Gaṇakamoggalāna Sutta* the moral requirements of *samatha* for the gradual method of mental training is explained. In *Cūlavedalla Sutta, Mahāmalunkya Sutta, Anupada sutta samādhi* has been defined and explained in various ways. The research paper will present the various definitions and classification and stages of *samādhi* from *various Pali* texts and will deal with the different views of scholars on *samādhi* . This research paper will also highlight the importance of Samadhi in ones day to day life and how it is the basic pillar to attain perfection and an epitome of a moral and ethical life of every human being.

Scanned with CamScanner

CamScanner

# ආයති පුනර්භව නිර්වෘත්තිය විෂයෙහි කබලිංකාර ආහාරය ප්‍රත්‍යය වන ආකාරය පිළිබඳ මුල් බුදුසමයාගත ඉගැන්වීම් ඇසුරින් කෙරෙන අධ්‍යයනයක්

හොරවඩුන්නගම සුමනසිරි හිමි[1]

## හැඳින්වීම සහ පර්යේෂණ ගැටලුව

ආහාරය සියලු සත්වයාට පොදු වූ සාධකයකි. එහිලා සියලු සත්ත්වයන් යනුවෙන් දැක්වෙන්නේ මනුෂ්‍ය, තිරිසන් මෙන්ම අනෙකුත් කුඩා අනුකුඩා ඇසට පෙනෙන නොපෙනෙන භව 31 ක උපදින ජීවීන්ය. මේ සියලුම ජීවීහු ජීවත්වීම සඳහා කිසියම් වූ ආහාරයක් ගනු ලබති. එම සත්ත්වයන් අතර මනුෂ්‍ය සහ තිරිසන් සතුන් සියල්ලම ගනු ලබන ප්‍රධාන ආහාරයක් වනුයේ කබලිංකාර ආහාරයයි. එම වචනයෙන් ඝන සහ ද්‍රව යන දෙවර්ග යම නිරූපණය වේ. කබලිංකාර ආහාරය ප්‍රමාණය ඉක්මවා ගැනීමෙන් ශරීරයට ඍජු බලපෑමක් සිදු වේ. එසේම ආහාරය හේතුවෙන් හටගන්නා වූ රසය පිළිබඳ දැඩි ආශාව නැවත නැවත එම ආහාරය අනුභවයට පොළඹවයි. දැඩි ආශාව තෘෂ්ණාව සේ දැක්වෙන අතර එය පුනර්භවය ඇති කිරීමෙහිලා මූලික සාධකයකි. මේ පිළිබඳ විමර්ශනය කිරීම මෙම පර්යේෂණයෙන් අභිප්‍රේරිතය. සත්ත්වයාගේ මතු පුනර්භවය පිණිස කබලිංකාර ආහාරය ප්‍රත්‍යය වන්නේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි.

## පර්යේෂණ ක්‍රමවේදය

කබලිංකාර ආහාරය මතු භවයට ප්‍රත්‍යය වන ආකාරය පිළිබඳ කෙරෙන මෙම අධ්‍යයනය මුල් බුදුසමයාගත ඉගැන්වීම් පාදක

1 සහකාර කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, hsumana11@gmail.com

Scanned with CamScanner

CamScanner

කරගනිමින් සිදු කරනු ලබන්නකි. ඒ සඳහා ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය භාවිත කරමින් දත්ත ලබාගෙන ඒවා විශ්ලේෂණය කරමින් ඒවා සාධනීය ලෙස පර්යේෂණ කාර්යයට භාවිත කරනු ලැබේ. ඒ අනුව ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සූත්‍ර හා අභිධර්ම පිටකාගත ඉගැන්වීම් මෙන්ම අටුවාව ද පරිශීලනය කරනු ලැබේ. වචනාර්ථ සෙවීමේ දී ශබ්දකෝෂ භාවිත කරනු ලැබේ. ඒ අනුව සාහිත්‍යය මූලාශ්‍රය පරිශීලනය කිරීම මගින් මෙහි පර්යේෂණ ක්‍රමය සැකසේ.

## සාකච්ඡාව හා ප්‍රතිඵල

සියලු සත්ත්වයෝ ආහාරය මත යැපෙති (සබ්බේ සත්තා ආහාරට්ඨිතිකා). "සබ්බේ සත්තා" යනුවෙන් දැක්වෙන්නේ කාම, රූප, අරූප භවත්‍රයෙහි වෙසෙන සියලුම සත්ත්වයෝය. සසරින් මිදී විමුක්ති සුව විඳින රහතන් වහන්සේලා ද මෙහිලා ඇතුළත් වේ. සංයුත්ත නිකායේ අභිසමය සංයුත්තයේ ආහාර සූත්‍රයට අනුව ආහාර සතරකි. ඉන් පළමුවැන්න කබලිංකාර ආහාරයයි. එම සූත්‍රයේ දෙවැනිව ස්පර්ශයත්, තෙවැනිව මනෝසඤ්චේතනාවත්, සිවුවැනිව විඤ්ඤාණයත් ආහාර සේ දක්වා ඇත. මේ සතර ආහාරය උපන් සත්ත්වයාගේ පැවැත්ම පිණිසත් උපදින්නාවූ සත්ත්වයන්ට අනුග්‍රහය පිණිසත් වෙයි. කබලිංකාර ආහාර යනු මුඛයෙන් ගනු ලබන ඝන ආහාර හා දියරමය ආහාරයෝය. පේතවත්ථු අටුවාවට අනුව එහි, අනුභව කරන දෑ (අසිත), බොන දෑ (පීත), උරන දෑ (ඛායිත), රස විඳින දෑ (සායිත) සියල්ලම මෙයට ඇතුළත් වේ. අභිධර්ම විග්‍රහයට අනුව ආහාර යන නාමය වහරනු ලබන්නේ යම්කිසි ඵලයක් ඇති කරන හේතුවකටය. ලෝකයෙහි යම් කිසිවකට හේතු නොවන කිසිවක් නොමැති නමුත් සියලුම හේතු සඳහා මෙම වචනය භාවිත නොවේ. එය විශේෂ හේතු හතරකට යොදා තිබෙන අතර එයින් පළමුවැන්න ද කබලිංකාර ආහාරයයි. අභිධර්ම විග්‍රහයට අනුව ආහාර රූප යනු ද කබලිංකාර ආහාරයයි. අග්ගඤ්ඤ සූත්‍රයට අනුව මුලාවස්ථික සත්ත්වයාට මහා පෘතුවියෙහි යොදය ඇඟිල්ලෙන් ගෙන දිව ගෑමෙන් රස තෘෂ්ණාව හටගෙන තිබේ. ක්‍රමයෙන් ඔවුන්ගේ ශරීර රළු බවට පත්වන්නේ ආහාර හේතුවෙනි. ආහාර ගන්නා ආකාරය හා ප්‍රමාණය අනුව පුද්ගලයන් වර්ග කිරීමක් සංයුත්ත නිකායේ දී දැකගත හැක. ආහාර හත්ථක, කාක මාසක, තත්‍ර වට්ටක, අලං සාටක, භුත්ත වමිතක යන ඒ පුද්ගලයන් අතුරෙන් පළමු වැන්නා හැර අන්‍යයෝ

Scanned with CamScanner
CamScanner

ආහාරය වැරදි ලෙස භුක්ති විඳින්නෝ වෙති. ආහාර පරිභෝජනය පිළිබඳව බුදුදහමේ ඉතා පැහැදිලි විවරණයක් දක්නා ලැබේ. විකාල භෝජන ශික්ෂා පදය පනවනු ලබන්නේ ප්‍රතිලාභ දෙකක් හේතු කොට ගෙනය. එනම් පහසු විහරණය හා අල්පාබාධ වීමය. පමණ දැන ආහාර අනුභව කළ යුතුය යන්න බෞද්ධ ඉගැන්වීමකි. ආහාර ගැනීමේ දී සතර පිඩක් පමණ ඉඩ තබා ජලය පානය කිරීමෙන් ශරීරයට පහසුවක් ගෙන දෙයි. විසම ආහාර පරිභෝජනය රෝගාබාධවලට හේතු වේ. ආහාරය තුළ මාංශ යනු එක කොටසක් වන අතර එහිදී ත්‍රිකෝටි පාරිශුද්ධ මාංශය අනුමත කොට තිබේ. සැලකිය යුතු වැදගත් කරුණක් වන්නේ මාංශයක් ආහාරය සඳහා පිළියෙළ කර ගැනීමේදී පළමුව ප්‍රාණඝාත අකුසල කර්මය සිදු වීමයි. ප්‍රාණඝාතය සත්ත්වයා භවයට රැගෙන යන අතර අල්පායුෂ්කව භවයන්හි උපද්දවයි. ආහාරයෙන් ආයුෂය, වර්ණය, සැපය, බලය, හා ප්‍රඥාව වැඩේ. සුත්ත නිපාතයට අනුව ආහාරය පිළිබඳ තෘෂ්ණාව පාලනය කරගනිමින් මනා සිහියෙන් යුතුව ආහාර වැළඳීම නිර්වාණ ප්‍රතිපදාව සාධනය කරගැනීමට උපයුක්ත වේ. සංයුත්ත නිකායේ ආහාර සූත්‍රයට අනුව ආහාරය තණ්හාව නිදාන කොට, තණ්හාව හේතු කොට, තණ්හාව ජාති කොට, තණ්හාව ප්‍රභවය කොට ඇති බව දැක්වේ. තණ්හාව, වේදනාව හේතු කොටගෙනත්, වේදනාව ස්පර්ශය හේතු කොටගෙනත් පවතින්නේ යැයි පිළිවෙළින් අවිද්‍යාව දක්වා සම්බන්ධ කොට තිබේ.

ආහාරය ගනු ලබන්නේ මුඛයෙනි. එය දිව මගින් රස වශයෙන් හඳුනා ගනියි. රසය හඳුනා ගැනීමට ස්පර්ශය උපකාර වේ. ඒ අනුව සිතිවිලි ජනිත වේ. දිවත් රසයත් නිසා ජිව්හා විඥ්ඥාණය ඇති වේ. මෙසේ ඇතිවන්නා වූ විඥ්ඥාණය සත්ත්වයා භවයට රැගෙන යනු ලබයි. මෝලියඵග්ගුණ සූත්‍රයට අනුව පුනර්භවය සඳහා සත්වයාගේ ප්‍රතිසන්ධි විඥ්ඥාණය ආහාරයක් වේ. මධුපිණ්ඩික සූත්‍රයට අනුව ද ඉන්ද්‍රිය ඥාණ ක්‍රියාවලියේදී සිදුවන ස්පර්ශ, වේදනා, සංජානන හා තණ්හා උපාදාන ක්‍රියාවලිය සත්ත්වයාගේ සංසාර භවගාමීත්වය සඳහා හේතු වේ. මාතික මාතාවගේ කතාවට අනුව පෝෂ්‍යදායි ආහාරය පධන් වීර්ය වැඩීමට හේතු වේ. එම කථාවෙන් පෙනෙනුයේ නිවන සාක්ෂාත් කිරීම උදෙසා ආහාරය හේතුවන බවකි. තව දුරටත් සැලකිය යුතු කරුණක් ලෙස පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂාව මෙහිලා දැක්විය හැකිය. එහි දී තමා ගන්නා ආහාරය විනෝදය පිණිස නොව, මදය පිණිස නොව, මණ්ඩනය හෝ ශරීරාලංකාරය පිණිස ද නොව පැවිදි බ්‍රහ්ම චර්යාවට අනුග්‍රහය

Scanned with CamScanner

CamScanner

පිණිස හා කුසගිනි වේදනා දුරු වීම පිණිස වන අතර එය සතියෙන් යුක්තව සිදු කරනු ලබන කෘත්‍යයකි. සතිපට්ඨාන සූත්‍රයට අනුව සිහියෙන් යුතුව ආහාර ගැනීම කායානුපස්සනාවේ කොටසකි. එය නිර්වාණයට ඒකායන මාර්ගය ද වේ.

**ප්‍රමුඛ පද: පුනර්භව නිර්වෘත්තිය, ආහාර, කබලිංකාර, ප්‍රත්‍යය, තෘෂ්ණාව**

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍ර

අංගුත්තර නිකාය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2005.
ඛුද්දක නිකාය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2005.
දීඝ නිකාය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2005.
මජ්ඣිම නිකාය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2005.
සංයුත්ත නිකාය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2005.
සාරත්ථප්පකාසිනී නම් සංයුත්ත නිකාය අට්ඨකථාව **II.** (පරි.) හත්තොටුවේ ඉන්දරතන හිමි. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2007.
ලීනත්ථප්පකාසිනී නම් වූ මජ්ඣිම නිකාය මූල පණ්ණාසක ටීකාව **I.** (පරි.) ජී.එල්.කේ. පෙරේරා. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2010.
පපඤ්චසූදනී නම් වූ මජ්ඣිම නිකායට්ඨකථාව **I.** (පරි.) ආඳාවල දේවසිරි හිමි. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2008.

### ද්විතීයික මූලාශ්‍ර

අරියදේව හිමි, විලේගොඩ. බෞද්ධ දර්ශනයේ භාවිතය හා විචාරය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2009.
ආනන්ද හිමි, කෝන්ගස්තැන්නේ. අභිධර්මාර්ථ සංග්‍රහ සන්නය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1999.

<u>සඟරා</u>

ඤාණෝපායිනී. (සංස්.) තල්දෙන අරියවිමල හිමි හා රළුවේ පද්මසිරි හිමි. ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 2014.
නිවන් මඟ. (පුනුරුත්පත්ති විශේෂ අංකය) (සංස්.) ටෙනිසන් පෙරේරා. රජයේ මුද්‍රණාලීය බෞද්ධ සංගමය, බු.ව. 2520.

<u>විශ්වකෝෂ</u>

කරුණාරත්න, ඩබ්. එස්. සිංහල විශ්වකෝෂය. කොළඹ: සංස්කෘතික සබඳතා දෙපාර්තමේන්තුව, 1998.

Scanned with CamScanner
CamScanner

# යථාර්ථවාදී නිරූපණයන් සඳහා නාට්‍ය අධ්‍යක්ෂණ කාර්යයේ දී භාවිත කළහැකි භාවනාමය විධික්‍රම පිළිබඳව විමර්ෂණයක්

ආර්.එම්. උෂාන් පෙරේරා[1]

## හැඳින්වීම

නාට්‍ය අධ්‍යක්ෂණය කාර්යයේ දී වේදිකාව මත නිර්මාණය වන සියලු ම චරිතයන් සඳහා ඊට ම ආවේණික වූ ඓතිහාසික පෙළ ගැස්මක් පවතී. ඖපපාතික චරිත නිරූපණයකට වඩා යථාර්ථවාදී නාට්‍යයන්හී චරිත නිරූපණයන්ගේ මානසික ස්වරූපයන්ගේ පෙළගැස්ම සහ ඉතිහාසය වටහා ගැනීම එම චරිත නිරූපණය සඳහා උපකාරී වේ. වේදිකාව මත මැවෙන්නේ රංගයක් ම නොව යථාලොකයේ මිනිස් හැසිරීම්හී එක්තරා විශ්වසනීය පැතිකඩක් යැයි ප්‍රේක්ෂකයාට වටහා ගැනීමට ඉන් අවකාශය ලැබේ . මෙකී චරිත සංවර්ධනය සඳහා ලෝකයේ විවිධ නාට්‍යාචාර්යවරුන් විවිධ ප්‍රායෝගික අභ්‍යාසයන් ඉදිරිපත් කර තිබෙන අතර එහි දී භාවනාමය (**Meditation**) ක්‍රියාකාරකම් මඟින් යථාර්ථවාදී නාට්‍යයක චරිත සංවර්ධයනය කිරීමට ඇති ප්‍රායෝගික අවකාශය මෙම පර්යේෂණයේ දී හඳුනා ගැනේ.

## පර්යේෂණයේ අරමුණ

නාට්‍ය අධ්‍යක්ෂණයේ දී යථාර්ථවාදී භූමිකා නිර්මාණය සඳහා රංගන ශිල්පියා තුළ පවතින භාවමය ස්මෘතීන් (**Emotional Memories**) භාවිත කිරීමට සහ යම් චරිතයක සමස්තාර්ථය (**Ruling Idea**) හෙවත් අධි-අරමුණ ( **Super-Object**) වටහා ගැනීමට භාවනාමය විධික්‍රම (**Meditation Methods**) භාවිත කිරීම.

1 ප්‍රාසංගික කලාවේදී (විශේෂ), සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.

Scanned with CamScanner

CamScanner

### ප්‍රතිඵලය

යථාර්ථවාදී නාට්‍ය අධ්‍යක්ෂණයේ දී චරිත සංවර්ධනය **(Character Developin)** සඳහා භාවනාමය විධික්‍රම භාවිත කිරීමේ ප්‍රායෝගික ගුණාත්මකභාවය තහවුරු කර ගැනීම.

### නිගමනය

චරිතයක මානසික ස්වභාවයේ ඓතිහාසික ආරම්භයේ සිට එම චරිතයේ යම් හැසිරීමක වර්තමාන ස්වභාවය වටහා ගනිමින් යථාර්ථවාදී චරිත නිරූපණයක චරිත සංවර්ධනය සඳහා නාට්‍ය අධ්‍යක්ෂණ කාර්යයේ දී භාවනාමය විධික්‍රම ප්‍රායෝගිකව භාවිත කිරීමට ශක්‍යතාවක් පවතින බව තහවුරු කිරීම.

### ක්‍රමවේදය

රූපණය සහ නාට්‍ය අධ්‍යක්ෂණය පිළිබඳව පෙර අපර දෙදිග පවතින න්‍යායාත්මක සංකල්ප සහ භාවනාමය විධික්‍රම පිළිබඳව පෙර අපර දෙදිග පවතින න්‍යායාත්මක මෙන් ම ප්‍රායෝගික ක්‍රමවේදයන් හඳුනා ගනිමින් ප්‍රායෝගිකව එම විධික්‍රම නාට්‍ය අධ්‍යක්ෂණ කාර්යය සඳහා භාවිත කරමින් ඉහත පර්යේෂණය තහවුරු කෙරේ.

### පර්යේෂණ සංක්ෂිප්තය

කාලීනව සංවර්ධනය වූ නාට්‍ය නිර්මාණකරණයේ මූලික අභිප්‍රාය වූයේ එම නාට්‍යයන් තුළ සිටින රංගන ශිල්පීන්ගේ ප්‍රකාශනය හැකිතාක් ප්‍රේක්ෂකයාට සමීප කරවීම යි. ඒ සඳහා ස්ටැනිස්ට් ලාවුස්කි , බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්, මෙයර් හෝල්ඩ්, යූජින් අයනෙස්කෝ වැනි නිර්මාණකරුවන්ගේ ප්‍රායෝගික එළඹීම් විවිධාකාරයෙන් උපයුක්ත භාවිතයන් නිර්මාණය කළහ.නමුත් යථාර්ථවාදී නිරූපණයන් සඳහා වූ ප්‍රායෝගික විධික්‍රමයක් හඳුන්වා දීමට ස්ටැනිස්ට් ලාවුස්කි විසින් රචිත රංගන විධික්‍රමය (**Method of Acting** ) නම් වූ ග්‍රන්ථය සමත් වූ බව පෙනේ. එහි දී යම් චරිතයක හැසිරීමට බලපාන හැඟීම් හෙවත් සිතිවිලිහී ඓතිහාසික ගමන් මග මෙනෙහි කිරීම යථාර්ථවාදී චරිතයක් ගොඩ නැඟීමට ප්‍රබල සාධකයක් බවට පත් කරගත හැකි බව පෙන්වා දෙයි.

Scanned with CamScanner

CamScanner

යථාර්ථවාදී නාට්‍ය අධ්‍යක්ෂණයේ දී රංගන ශිල්පීන් ව මෙහෙයවනු ලබන්නේ ඔවුනොවුන් නිරූපණය කරනු ලබන චරිතයන්ගේ නිවැරදි ම වූ චිත්ත ආවේගයන්ගේ ක්‍රියාකිරීම වටහා ගැනීමට ය . ඒ ඒ චරිතය තමාට මුහුණ දීමට සිදු වුණු ඓතිහාසික අත්දැකීම්වලට අනුරූපව ක්‍රියාවන්ගේ ශක්තිය උත්පාදනය කරනු ලබයි. සෑම චරිතයකට ම ආශාවන් ඇත. අරමුණු ඇත. අභිමි වීම් ඇත. මෙවැනි සියයක් හේතු සඳහා ප්‍රත්‍යුත්තර සොයමින් එම චරිතයේ සිතුවිලි ප්‍රවාහය ක්‍රියා කරනු ලබයි. ඊට අනුකූලව ක්‍රියාවන් සිදු කරයි. මෙම ස්වභාවය වටහා ගැනීමට එම චරිතය නිරූපණය කිරීමට අපේක්ෂිත රංගන ශිල්පියාට සිදු වෙයි. රංගන ශිල්පියාට ස්වකීය මානසික ආවේගයන්ගෙන් මිදී එම චරිතයේ ආවේගයන්ගේ ඓතිහාසික ගමන් මග සෙවීමට ක්‍රියා පිළිවෙතක් භාවිත කිරීම ට සිදු වෙයි.

චරිතයක ක්‍රියාව යනු එම චරිතයේ අභ්‍යන්තරය තුළ පවතින චිත්ත අවේගයන්ගේ ප්‍රකාශනයකි. එම ප්‍රකාශනය සිදු කරනු ලබන චරිතයේ අභ්‍යන්තරිකව පවතින මානසික ස්වභාවයට අනුව එම චරිතය ක්‍රියා කරයි. ඒ මඟින් තමන්ගේ ආශාවන්. අභිප්‍රායන්, චේතනාවෙන් ක්‍රියාත්මක වෙයි. නාට්‍යයක රංගන ශිල්පීන් මෙයාකාරයෙන් වූ චරිතයක අභ්‍යන්තරික අවබෝධයට ලක් කිරීමට නාට්‍ය අධ්‍යක්ෂකවරයාට උපයෝගී කර ගත හැකි ක්‍රමවේදයක් ලෙස රංගන විධික්‍රමය (**Method of Acting**) කෘතිය නිර්මාණාත්මක කව (**Creative Circles**) සංකල්පය හඳුන්වා දෙයි. චරිතයක ඒ මොහොතේ පවතින ස්වභාවයට හේතු වන සිතිවිලීහී ඓතිහාසික කාරණා වටහා ගැනීමට ක්‍රමවේදයක් ඉන් සපයයි.

භාවනාව (**Meditation**) යනු අපගේ මනස හසුරවනු ලබන ක්‍රියා පිළිවෙලකි. මනසේ ඇතිවන සිතිවිලි දහරාව සවිඥානිකව හඳුනා ගනිමින් සවිඥාණිකව හැසිර වීම ඉන් සිදු වෙයි. චිත්තානු පස්සනාව භාවනාව තුළ පවතින ක්‍රමවේදය තුළ ආවේගයක් ඇති වූ බව වටහා ගැනීම , එම ආවේගය ඇති වීමට හේතුව විශ්ලේෂණය කර ගනියි. එහි දී මානසික ආවේගයක ඓතිහාසික ගමන් මග ස්මරණය කර ගනියි. ඊට අනුව තමාගේ ක්‍රියාව සිදු වන බව වටහා ගනියි. එය මනස තුළ ඇතිකර ගනු ලබන සවිඥානික වූ උත්තර ප්‍රත්‍යුත්තර වශයෙන් ඇතිකර ගනු ලබන අවබෝධයකි.

Scanned with CamScanner
CamScanner

භාවනාව තුළ පවතින පුද්ගලයාගේ මනස අවබෝධ කර ගැනීමේ ක්‍රමවේදය නාට්‍ය අධ්‍යක්ෂණයේ දී යම් චරිතයක මානසික ස්වභාවය නිරූපණය ශිල්පීන්ට අවබෝධ කරවීමට භාවිත කිරීමට පුළුවන.භාවනාමය විධික්‍රම මඟින් යම් නිරූපණ ශිල්පියකු නිරූපණය කිරීමට අපේක්ෂිත චරිතයේ හැසිරීමට හේතු වූ චිත්ත අවේගයන්ගේ ඓතිහාසික ගමන්මග මෙනෙහි කරලීමට පුළුවන. භාවනාමය ක්‍රමවේද මඟින් තමාගේ නොව චරිතයේ ආශාවන්ට, බැඳීම්වලට , ඉලක්ක සඳහා වූ උත්තර සොයමින් එම චරිතයේ ආභ්‍යන්තරික භාවයන් හඳුනා ගැනීමට පුළුවන. එහි දී එම චරිතයේ හැසිරීම විශ්වසනීය වූවක් ලෙස නිරූපණය කිරීමට නිරූපණ ශිල්පියාට හැකි වන අතර නිරූපණ ශිල්පියාට සවිඥානිකව ස්වකීය මානසික ස්වභාවයන්ගෙන් මිදී චරිතයේ සමස්තාර්ථය (**Ruling Idea**) හෙවත් අධි-අරමුණ (**Super-Object**) වටහා ගැනීමට ප්‍රබල සධකයක් බවට භාවනාමය විධික්‍රමයන් භාවිත කිරීමට නාට්‍ය අධ්‍යක්ෂණයේ දී පුළුවන.

Scanned with CamScanner

CamScanner

# විදර්ශන භාවනා ක්‍රමය බෞද්ධ භාවනා ක්‍රමයක් ද? විමර්ශනාත්මක අධ්‍යයනයක්

M. W. නිමේෂ් සත්සර[1]

## හැඳින්වීම

බුදුරජාණන් වහනසේ ලොව පහළ වන විට ද භාරතය තුළ විවිධ භාවනාවන් දක්නට විය ,ඒ බව අර්ය පර්යේෂණ අදී සුත්‍ර හරහා ද තහවුරු වෙයි. මෙකල පැවති සියලු ම භාවනා ක්‍රම වේදයන් අයත් වන්නේ සමථ භාවනා ප්‍රභේදයටය,එය නිවන පසක් කර ගැනීමට හේතු නොවන අතර නීවරණ ධර්ම යටපත් කිරීමට පමණක් හේතු වී ඇත. විදර්ශන භාවනා ක්‍රමය යනු සුවිශේෂිත භාවනා ක්‍රමයකි. බුදුදහමේ දැක්වෙන ආකාරයට මෙය නිවන් මාර්ගය පසක් කර ගැනීමට යොදාගන්නා භාවනා විශේෂයක් ලෙසට දැක්විය හැකිය. මෙය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන සංකල්පනාවන් පදනම් වු භාවනා ක්‍රමයක් ලෙසට දැක්විය හැකිය.

## අරමුණ

මෙම අවධිය වනවිට කතෝලික සභාවේ නියෝජිත චාල්ස් තෝමස් පාදලි තුමා (කඳුල වැඩසටහන) ඇතුලු පිරිස ආනාපාන සතිය බෞද්ධ භාවනාවක් නොවන බවට තහවුරු කිරීමට විවිධ ප්‍රයත්න දරමින් පවතී. ආනාපාන සතිය යනු බෞද්ධ භාවනාවකි.එය විදර්ශනා භවනා යටතට අයත් වෙයි.මේ අනුව විදර්ශනා භාවනාව බෞද්ධ භාවනාවක් බව තහවරු කිරීම මෙහි ප්‍රධාන අරමුණය.

## ක්‍රමවේදය

පාඨ ග්‍රන්ථ පරිශීලනය හා සම්මුඛ සාකච්ඡා (සම්මුඛ සාකච්ඡාව යටතේදී ගල්දුව ආරණ්‍ය සේනාසනයේ ස්වාමීන්

1

Scanned with CamScanner
CamScanner

වහන්සේලා 10 නමක් සමඟ සාකච්ඡා කළෙමි.)

**පර්යේෂණ ගැටලුව**

විදර්ශනා භාවනා ක්‍රමය බෞද්ධ භාවනා ක්‍රමයක් ද?

මෙම කාලවකවානුව වන විට අන්‍ය ආගමිකයන් ආනාපාන සතිය වැනි බෞද්ධ භාවනා ක්‍රමයන් බෞද්ධ භාවනාවන් නොවන බවට සමාජය තුළ විවිධ කතිකාවත් ඔස්සේ විස්තර කිරීමට ලක්ව ඇත. එම නිසා මෙම ප්‍රස්තුතය සාකච්ඡාවට බඳුන් කිරීමට මෙම පර්යේෂණය සිදුකරන ලදි.

**සාකච්ඡාව**

CamScanner

# සාවද්‍ය චේතනාව පිළිබඳ ආගමික සංකල්පනයක්, බුදුසමය, අපරාධ නීතිය සහ අපරාධ විද්‍යාව ඇසුරින්

තලගස්පේ සුමංගල හිමි[1]රත්නායක,ඩී.එම්.ඩී.ඒ.[2]

## හැඳින්වීම

පොදු නීතිය මඟින් සකස් වී ඇති සෑම වරදක ම ශාරීරික මෙන් ම මානසික ධාතුව ද අඩංගු වන නිසා සාවද්‍ය චේතනාව පොදු නීතිය යටතේ එන සෑම වරදක ම අවශ්‍යාංගයක් බවට පත් වී තිබේ. මහාචාර්ය නන්දසේන රත්නපාලයන් දක්වන පරිදි සාවද්‍ය චේතනාව පිළිබඳ සිද්ධාන්තය රඳා පවතිනුයේ ආචාර ධර්මානුකූල පදනමක් මත ය. විවිධ දැනුම් පද්ධතීන් අධ්‍යයනය කිරීමෙන් සෛද්ධාන්තිකව හා ව්‍යවහාරිකව එහි සමවිෂමතා දැක්වීම කාලීනව යුක්ති යුක්ත ය.

## අරමුණ

බුදුසමය, අපරාධ නීතිය සහ අපරාධ විද්‍යාව ඇසුරින් සාවද්‍ය චේතනාව පිළිබඳ තුලනාත්මකව අධ්‍යයනය කිරීම මගින් සමවිෂමතා හඳුනාගැනීම

## ගැටලුව

බුදුසමය, අපරාධ නීතිය සහ අපරාධ විද්‍යාව තුළ සාවද්‍ය චේතනාව පිළිබඳ දක්නට ලැබෙන සමවිෂමතා කවරේ ද?

---

1 සහාය කථිකාචාර්ය, අපරාධ හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
2 පර්යේෂණ සහායක, අපරාධ හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

Scanned with CamScanner
CamScanner

**ක්‍රමවේදය**

පුස්තකාල පරිහරණය

**සාකච්ඡාව**

යම් කිසි අපරාධයක් සිදු වී යැයි තීරණය කිරීමට එක්තරා අංග ලක්ෂණ කීපයක් විද්‍යමාන විය යුතු ය. එක් එක් අධිකරණ ක්‍රම අනුව මේ අංග ලක්ෂණ වෙනස් වෙතත් ඒවායේ පොදු ගුණාංග උකහාගැනීම දුෂ්කර නැත. අපරාධයක් සම්පූර්ණ වීම සඳහා අපරාධ නීතිය යටතේ පොදුවේ පිළිගැනෙන කරුණු 02 ක් වේ. එනම්,

1. සාවද්‍ය මනස
2. සාවද්‍ය ක්‍රියාව, යනුවෙනි.

මෙහි දී සාවද්‍ය මනස හැරුණු විට අන් සියල්ල සාවද්‍ය ක්‍රියාවට අයත් වන බව නූතන අපරාධ නීතිය තුළ පිළිගන්නා අතර අධිකරණ විනිශ්චය විෂයයෙහි ද මෙම කාරණා තහවුරු කිරීම සාපරාධී වගකීම පැවරීමට හා දඬුවමකට යටත් කිරීමට උපස්තම්භක වේ. මෙහි දී අපරාධයක් සංයුක්ත වීමේ අංග වශයෙන් අපරාධ චේතනාව සහ ක්‍රියාව ඉදිරිපත් වන අතර ම වරදකරු පුනරුත්ථාපනය කිරීමේ දෘෂ්ටිය මඟින් අපරාධයක් සිදු වීමෙන් අනතුරු ව අපරාධකරු විෂයයෙහි නීතිය විසින් ගනු ලබන යුක්තිය පසිඳලීමේ ක්‍රියාමාර්ගය ද මුඛ්‍ය කරුණක් ලෙස සලකා ඇත. ඒ අනුව අපරාධයක් සම්බන්ධ සමස්ත ක්‍රියාවලිය අපරාධයක අංග වශයෙන් හඳුනාගත හැකි වේ.

ශ්‍රී ලංකා නීතිය අනුව ඇතැම් විට වරදකරුගේ චේතනාව සලකා නො බලා බාහිර සාක්ෂි අනුව දඬුවම් දෙන අවස්ථා පැවතිය ද බුදුසමයේ එබඳු ක්‍රියා පිළිවෙතක් නොමැත. වරදකට එරෙහි ව කටයුතු කිරීමට ප්‍රථම වරදකරුට ඔහු විසින් කරනු ලැබූ වරද දැනුම් දිය යුතු ය. දඬුවම් ලැබීමට ප්‍රථම තමා කළ වරද පිළිගැනීමේ අයිතියක් වරදකරුට දී තිබේ. සාවද්‍ය චේතනාවෙන් තොර ව ක්‍රියාවක් පමණක් සිදු වන ලිංගික අපරාධවල දී එය අපරාධයක් වශයෙන් බුදුසමයේ දක්වා නැත. මේ අනුව චේතනා පූර්වාංගම ස්වභාවය අපරාධය කෙරේ, පමණක් නො ව විනිශ්චය හා දණ්ඩනය විෂයයෙහි ද අදාළ වන බව බුදුසමය අනුදනී. කර්මයක්

Scanned with CamScanner
CamScanner

ඇති වන්නේ චේතනාව පෙරදැරි කරගෙන ය. අධිකරණ විනිශ්චයේ දී බුදුසමය මේ පිළිබඳ ව සුවිශේෂී අවධානයක් යොමු කරයි.

ඒ අනුව සාවද්‍ය චේතනාව ඍජු ව ම අපරාධයක් විෂයයෙහි පැවතිය යුතු ය. එය මුඛ්‍ය සාධකය වශයෙන් බුදුසමය පෙන්වා දෙයි. බෞද්ධ විනය නීතිය අනවරතයෙන් ම චේතනාව හා බැඳී පවතී. ඒ බැවි බුදුදහමේ එන කර්මය පිළිබඳ ඉගැන්වීම සහ මනස පිළිබඳ දේශනාවලින් පෘථුල වශයෙන් විවරණය කොට තිබේ. බෞද්ධ නීතිය චේතනාව මත පදනම් වී ඇති අතර සාපරාධී වගකීම පැවරීමේ දී සාවද්‍ය චේතනාව පිරිසිඳ දැනගැනීමට සෑම අවස්ථාවක දී ම ක්‍රියා කර තිබීමෙන් ඒ බව ප්‍රත්‍යක්ෂ වේ.

**සමාලෝචනය**

බුදුසමය සහ අපරාධ විද්‍යාව මඟින් සාවද්‍ය චේතනාව පිළිබඳ තාර්කික විවරණයක් සිදු කොට ඇත. එය සමානතා ලක්ෂණයක් වශයෙන් සැලකිය හැකි අතර අපරාධ පිළිබඳ දැනුම් පද්ධතියෙහි සාධනීය ලක්ෂණයක් වශයෙන් ද හඳුනාගත හැකි ය. මෙය අධ්‍යයනයට පමණක් නො ව භාවිතයට ද ගත යුත්තකි. මේ අනුව අපරාධ යුක්ති ක්‍රමය යටතේ අපරාධ නීතිය දැක්වීමේ දී හා බුදුසමය මඟින් විනය නීතිය පැනවීමේ දී සාවද්‍ය මනස කෙරේ සුවිශේෂී අවධානයක් යොමු කර ඇති අයුරු අඩු වැඩි වශයෙන් දක්නට ලැබේ. අපරාධ නීතිය ක්‍රියාත්මක කිරීමේ දී ඵලරූපී විපාකය මුල් කොට ගැනීම ඇතැම්විටක දී සිදු වන අතර සාවද්‍ය චේතනාවෙන් ව්‍යුක්ත වූ කිසිදු ක්‍රියාවක් බුදුසමය අපරාධයක් යනුවෙන් නො දක්වයි.

**ප්‍රමුඛ පද - බුදුසමය, අපරාධ නීතිය, අපරාධ විද්‍යාව, අපරාධයක සම්පාදක ධාතු, සාවද්‍ය චේතනාව, ඵලරූපී විපාකය**

**ආශ්‍රිත ග්‍රන්ථ**

01. රත්නපාල, නන්දසේන., 2006, අපරාධය හා දඬුවම; බෞද්ධ අධිකරණ සම්ප්‍රදාය, ආරිය ප්‍රකාශකයෝ.

02. රත්නපාල, නන්දසේන., 2013, අපරාධ විද්‍යාවේ මූලධර්ම 2,සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

03. පීරිස්,ජී.එල්.,දෙ.මු. 1998, ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය(අපරාධයක සම්පාදක ධාතු), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

Scanned with CamScanner

CamScanner

04. ඤාණිස්සර හිමි., පාතේගම, 2015, බුදුසමය සහ අපරාධ විද්‍යාව, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
05. ඤාණසුමන හිමි., දෙල්දූවේ,දෙ.මු. 2006, ආදි බෞද්ධ දර්ශනයේ මූලධර්ම, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

CS Scanned with CamScanner
CS CamScanner

# බෝසත් චරිතයේ එන ආරවුල් සමථකරණයෙහි ලා විද්‍යාත්මක පරීක්ෂණයේ සුභාවිතය (උම්මග්ග ජාතකය ඇසුරින්)

එච්. පී. කේ. එන්. හේවාවසම්[1] එච්. ඒ. එන්. ප්‍රියදර්ශනී[2]
එච්. ඩී. නදීශානි[3]

## හැඳින්වීම

පූර්ව බෝසත් ආත්ම භාවයන්ගේ මූලික තේමාවන් රැගත් උපදේශ ජනනයේ මූලික ප්‍රතිබිම්බයක් ලෙස ජාතක කථාවට ලැබෙනුයේ ඉතා ඉහළ වැදගත්කමකි. ජාතක කථා යන්න විවරණය කරන අටුවා ගැටපදකරුවන්ගේ අදහසට අනුව එය "ජාතත්තා ජාතක....." නොඑසේ නම් පෙර වූ ඒ ඒ ජාතියෙහි චරිත ලෙස හඳුන්වා දී ඇත.

සිංහල ජාතක පොතෙහි එක් ප්‍රබල සුවිශේෂතාවක් වනුයේ එහි යථාර්ථය විද්‍යමාන වනුයේ මුළාව, පසුබට ගතිය, නොඉවසීම වැනි දුබලතා ඉවතලමින් විචාර බුද්ධියෙහි ස්ථානෝචිත ප්‍රඥාවේ හා අප්‍රතිහත ධෛර්යයෙහි ක්‍රියාත්මක වීම පුද්ගල ජීවිතයේ සාර්ථකත්වයට පදනම වන බව ප්‍රකට කිරීමයි. එකී සදුපදේශ ඉස්මතු කිරිමෙහි ලා දුගී දුප්පතාගේ සිට ම රාජභවනේ රාජකීයන් දක්වා චරිත විකසනය නිසි ආකාරයෙන් දැකගත හැකි අපූර්වතම කථා පුවතක් ලෙස පන්සිය පනස් ජාතක පොත හඳුන්වා දිය හැකිය. සිංහල ජාතක පොත කුරුණෑගල යුගයේ vi වන පැරකුම්බා රජු කාලයේ ලියැවුණු කෘතියක් වශයෙන් සැලකෙන අතර එහි කථා 547 ක් ඇතුළත් වන මුත් 550 ජාතක පොත වශයෙන් සලකනු ලබයි. ඉන් කථා 10 ක් දීර්ඝව ඉදිරිපත් කොට ඇති අතර එයින් උම්මග්ග

1 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, kaushi@sjp.ac.lk1
2 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, nilupriyadarshani@sjp,ac.lk
3 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, wasanadeshi93@gmail.com

Scanned with CamScanner
CamScanner

ජාතකය දීර්ඝතම කථා වස්තුව වේ. උම්මග්ග ජාතකය උමගේ කථාව ඇතුළත් ජාතකය ලෙස නම් කෙරෙන අතර, ඉන් ඉදිරිපත් කෙරෙනුයේ බෝ සතුන් මහෞෂධ නම් අමාත්‍ය පණ්ඩිතයෙකුව උපන් ජාතියෙහි ගෙවූ ජීවිතය පිළිබඳ කථා පුවතයි.

ඒ වූ කලී බලවත් සතුරු ආපදාවකට ගොදුරු වූ තම රජු වූ මියුලු නුවර වේදේහ රජුත් තම රාජ්‍යයත් අසිරිමත් නුවණේ මහිමයෙන් බේරා ගෙන නිරුපද්‍රිතව කළ අසහාය නායකයෙකුගේ කථාවයි. මහෞෂධ පඬිතුමා මේ සියලු ම වීරත්වය ප්‍රකට කළේත් අටළොස් අක්ෂෞහිණියක් මහා සේනාවක් පරදවා ජයගත්තේත් එකදු ලේ බිඳක්වත් නොසෙල්වාය. උම්මග්ග ජාතකය තුළින් මහෞෂධ පඬිතුමාගේ ප්‍රඥාව හෙළි කරන ඉතා වැදගත් අංශයක් වනුයේ ප්‍රශ්න විසඳීමේ විග්‍රහයයි. උම්මග්ග ජාතකයෙහි මුල් භාගයේ ආරවුල් සමථකරණයේ දී ප්‍රශ්න විසඳීමේ කොටස මෙහි දී වැදගත් ප්‍රස්තුතයක් සපයනු ඇත. ගැටුම හා ආරවුල් විසඳීම හැඳින්වීමේ දී පුද්ගලයන් දෙදෙනෙක් හෝ කණ්ඩායම් දෙකක් අතර හෝ ඊට වැඩි පිරිසක් අතර ඇතිවන නොඑකඟතාවක් මතවාදීමය සට්ටනයක් ඇතිවන්නා වූ සංසිද්ධියක් වශයෙන් පෙන්වා දිය හැකිය. මෙකී ආරවුල්වල පවත්නා ප්‍රචණ්ඩකාරීත්වය පාලනය කොට අදාළ පාර්ශ්ව දෙපසට කිරිම මෙම ආරවුල් සමථකරණය කිරීම වේ. කෙසේ වෙතත් ආරවුල් විසඳීමෙහි ලා මෙම ජාතක කථා පුවතෙන් විග්‍රහ වන කාරණා නූතනයට ද වැදගත් වන බව පැහැදිලි වන කරුණකි.

**පර්යේෂණ ගැටලුව**

ඉහත කාරණාවලට අනුව මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වශයෙන් බෝධි සත්ත්ව චරිතයෙහි එන ආරවුල් සමථකරණයෙහි ලා නූතන උපයෝගීතාව මොනවාද? යන්න පිළිබඳ විමසා බැලීම සිදුකිරීම වේ.

**ක්‍රමවේදය**

නියැදිය තෝරා ගැනීමේ දී විනිශ්චයාත්මක නියැදීම යටතේ උම්මග්ග ජාතකයේ ප්‍රශ්න විසඳීමේ කොටසෙහි එන ප්‍රශ්න විසඳීම් 05 ක් තෝරා ගන්නා ලදි. තවදුරටත් පර්යේෂණය සඳහා දත්ත එක්රැස් කිරීමේ දී ද්විතීයික දත්ත මූලාශ්‍ර භාවිත කරන ලද අතර එහි දී ප්‍රධාන මූලාශ්‍රය ලෙසට උම්මග්ග ජාතකය පාදක කරගන්නා

CS Scanned with CamScanner

CS CamScanner

ලදී. එමෙන් ම ග්‍රන්ථ, අන්තර්ජාල ලිපි, පුවත්පත්, සඟරා භාවිත කරන ලදී.

**පර්යේෂණ අරමුණු**

**ප්‍රධාන අරමුණ**

- බෝධි සත්ත්ව චරිතයෙහි ආරවුල් සමථකරණ ක්‍රමවේදය අධ්‍යයනය කිරීම

**උප අරමුණු**

- නූතන හා සාම්ප්‍රදායික ආරවුල් විසඳීමේ ක්‍රමවේදයන්ගේ සම්බන්ධතාව පරීක්ෂා කිරීම
- එම සාම්ප්‍රදායික ක්‍රමවේදයන්හී නූතන භාවිතය අධ්‍යයනය කිරීම

**සාකච්ඡාව හා සොයා ගැනීම්**

ආරවුල් සමථකරණය නූතනයේ දී විවිධ ක්‍රමවේදයන් යටතේ සිදුවන අතර, එහි ලා සමථකරණයට ද ලැබෙන වැදගත්කම ඉතා ඉහළ වේ. සමථකරණයේ දි බෝධි සත්ත්ව චරිතයේ දී තෙවන පාර්ශ්විය මැදහත්කරණය තුළින් සුළු ආරවුල් විසඳීම සිදු වේ. ඒ අනුව ඉහත ආ පරිදි ගැටලු අවස්ථාවන්හී දි බෝසතාණන් භාවිත කරන ලද ප්‍රධාන ක්‍රමවේද 03 ක් භාවිත කොට ඇත.

1. ප්‍රශ්න විසඳීමේ දී අදාළ පාර්ශ්වයන්ට සම අවස්ථා ලබාදීම
2. අනන්‍යතාව තහවුරු කිරිමේ දී ඒ සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයන් භාවිත කිරීම
3. භාරකාරත්වය ඔප්පු කිරිමට පර්යේෂණ ක්‍රමවේද භාවිතය

මේ අනුව ප්‍රශ්න විසඳීමේ සම අවස්ථා ලබාදීම ප්‍රධාන කොට ම හඳුනාගත හැකි අවස්ථාවක් ලෙස කාලගෝල ප්‍රශ්නය විමසා බැලිය හැකිය. මෙහි දි සත් අවුරුද්දක් නිවසක බැලමෙහෙවර කළ පුද්ගලයෙකුට ගෙවිය යුතු මිල වශයෙන් එම නිවසේ රූමත් දියණිය ආවාහ කොට දීමට නිවසේ දෙමව්පියන් තීරණය කළ අතර, ඉන් පසු නවයුවල පුරුෂයාගේ නිවසට යන අතරමැද තුන්වන පුරුෂයෙක් විසින් එම කාන්තාව සොරාගෙන යාමේ දී මෙම ආරවුල ඇති වේ.

Scanned with CamScanner
CS CamScanner

එහි දී මහෞෂධ පඬිතුමා වෙතට එන මෙම තිදෙනාගේ ආරවුල විසඳීමට නූතනයේ භාවිත කරන ප්‍රශ්න ඇසීම සිදුකරනු ලබයි. තව ද එක් එක් පුද්ගලයින් ගෙන්වා වෙන වෙන ම ප්‍රශ්න ඇසීම ද නූතනයේ අධිකරණය තුළ පවත්නා විද්‍යාත්මකභාවය තවදුරටත් ඉස්මතු කරමින්ය. සුළු ආරවුල විසඳීමේ දී මෙම ක්‍රමවේදය තුළින් වඩාත් නිවැරදි හා සත්‍ය තොරතුර ම ලබා ගැනීම තුළින් සාධාරණ විනිශ්චයක් ලබාදීමට කටයුතු සිදුකොට ඇත.

එසේ ම ආරවුල් විනිශ්චයේ දී අයිතිය ප්‍රකාශ කිරීමේ දී අනන්‍යතාව තහවුරු කිරීම නූතනයේ විවිධ නවීන තාක්ෂණික ක්‍රමවේද භාවිත වන්නා සේ ම අතීතයේ විවිධ පර්යේෂණ තුළින් ද එම කාර්යය වඩ වඩාත් විද්‍යානුකූලව සිදුකොට ඇති ආකාරය ගොන් ප්‍රශ්නය, සූත්‍ර ප්‍රශ්නය, ග්‍රන්ථි ප්‍රශ්නය තුළින් ඉස්මතු වනු ඇත. ඒ අනුව ගොන් ප්‍රශ්නයේ දී සොරකම් කරන ලද ගොනෙකුගේ අයිතිය විමසීමට ආරවුලට මැදි වූ දෙදෙනාගෙන් ගොනාව පෝෂණය කළේ මොනවායින් දැයි විමසා පසුව ගොනාට පුවඟු කොළ කොටා යුෂ ගෙන ගොනාට පොවා පිරික්සීමෙන් පර්යේෂණාත්මකව කරුණු කාරණා විමසීම වැදගත් වන්නකි. එසේ ම ග්‍රන්ථි ප්‍රශ්නයේ දී ද කරමාලයකට ආරවුල් ඇතිකොට ගත් ස්ත්‍රීන් දෙදෙනා ගෙන්වා එම කරමාලයට යොදන සුවඳ එකිනෙකාගෙන් විමසා එම කරමාලය පැන්තලියක දමා නියම සුවඳ විමසීම තුළින් විද්‍යාත්මක පරීක්ෂණ ක්‍රමවේදය හඳුනාගත හැකිය.

මෙහි එන සූත්‍ර ප්‍රශ්නයේ දී කටිනා ලද කපුනූල වට කොට බැඳි හූ වැටිය කුමක්දැයි විමසීම තුළ හුවැටියේ නියම අයිතිකරුවා කවුරුන්ද යන්න හඳුනාගැනීම සිදුවේ. ආරවුල් විමසීමෙහි ලා පුත්‍ර ප්‍රශ්නය ද මෙහි දී වැදගත් වේ. මව්පිය උරුමය සෙවීම සඳහා නූතනයේ බොහෝ විට ඡාන ඩී. එන්. ඒ. තුළින් විමසා බැලීම සිදුවන අතර අතීතයේ එවන් තාක්ෂණික ක්‍රමවේද නොතිබුණ ද මානුෂීය හා භාවාත්මක ගුණාංග ඉස්මතු කරමින් මව් පුත්‍ර සබඳතාව විමසීම හඳුනාගත හැකිය. ඒ අනුව කාන්තාවන් දෙදෙනාට දෙපස සිට දරුවා තමා වෙත ඇදීමට යෝජනා කරන අතර එයින් පුත්‍ර සෙනෙහස නිසා දරුවාට වේදනාවක් ඒ යැයි සැකයෙන් දරුවා අත්හරින තැනැත්තිය දරුවාගේ සැබෑ මව ලෙස තීරණය කරනුයේ ද සාක්ෂ්‍ය පිරික්සීම තුළිනි.

Scanned with CamScanner
CamScanner

## සමාලෝචනය

ඉහත දැක්වෙන ආකාරයට බෝධිසත්ත්ව චරිතයේ එන ප්‍රඥාවන්තභාවය හා විචාර බුද්ධිය පිළිබඳව පැහැදිලි අදහස් කිහිපයක් ම අධ්‍යයනය කළ හැකිය. විද්‍යාත්මක ක්‍රමවේදයන්ගේ ශිල්පීය ක්‍රමෝපායයන්වල උසස් දියුණුවක් නොතිබුණ ද විවිධ විද්‍යාත්මක සම්පරීක්ෂණ ක්‍රමවේදයන් තුළින් සත්‍යය හා නිරවද්‍යතාව පෙන්වීමට මෙමගින් සාර්ථකව සිදුකොට ඇත. මේ අනුව බෝධිසත්ත්ව චරිතයේ ආරවුල් විසඳීමට ගන්නා ලද විවිධ ක්‍රම නූතනයේ ආරවුල් සමථකරණයේ දී සමථ මණ්ඩල ක්‍රමවේදයන් තුළ මෙන් ම අධිකරණ ක්‍රියා පද්ධතීන් තුළ යොදා ගන්නා ලද ශිල්පීය ක්‍රමෝපායයන් අතර සමානකම් පවත්නා බව පැහැදිලි වන කරුණකි. තවදුරටත් ආරවුල් විසඳීමට සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කිරීමේ භාරය සිදුකොට ඇති සෙයක් ද පැහැදිලි වේ.

**මුඛ්‍ය පද - සමථකරණය, ජාතක පොත, උම්මග්ග ජාතකය, ආරවුල්, බෝධි සත්ත්ව චරිතය**

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. අභයරත්න, ඩී. එස්. එච්. (2009). සිතියම් සහිත උම්මග්ග ජාතකය, මරදාන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ ප්‍රකාශන.
2. *Sternberg, Robert J.; Dobson, Diane M. (1987). "Resolving interpersonal conflicts: An analysis of stylistic consistency". Journal of Personality and Social Psychology. American Psychological Association.*


CS Scanned with CamScanner

CS CamScanner

# Buddhist Attitude towards Moral Reasoning

Ven. Teldeniye Kusalagnana[1]

## Introduction and Research Problem

Ethics or morality is a prime concept in the scope of religious ideologies. It is also one of the main branches of the philosophy that focuses on determining right and wrong of human actions. Ethical reasoning or moral reasoning is supportive to determine right and wrong of individual actions. Ethics or morality in philosophy has introduced different philosophical theories such as deontology, pragmatism etc. to determine right and wrong of individual actions. However, in this context, Buddhist approaches are more practical than theoretical. It guides to determine right and wrong of individual actions depending on the **consequences**, the actions produce for one self and others. Buddhist moral reasoning is quite similar with the concept of **utilitarianism** and **Golden Rule of Ethics**. This study attempts to discuss how Buddhist practical approaches are relevant to this context.

## Methodology

The study used qualitative data analysis and both deductive and inductive reasoning. This is primarily a textual study. The *Sutta Piṭaka* and commentaries used as primary

1 Bachelor of Arts (Buddhist Leadership), Sri Lanka International Buddhist Academy, Pallekele, (tkusalagnana@gmail.com)

Scanned with CamScanner

CamScanner

sources. Besides, relevant secondary literature written in both media Sinhala and English used with care and concern.

**Results and Discussion**

Buddhist moral reasoning guides to determine right and wrong of individual actions comparing others with oneself. So, it is self centred but it does not mean that Buddhism says to determine right and wrong of actions only considering the benefit for oneself. Here, Buddhism guides to determine right and wrong of actions considering how one-self experiences the good and bad results of good and bad actions doing by other for one-self. So, it is somewhat similar with the theory of *utilitarianism*. We can understand clearly this concept from the descriptions of the *Kālāma Sutta* of the ***Ang****uttara Nikāya,* the *Sāmaññaphala Sutta* of *Dīgha Nikāya*, the *Ambalaṭṭika Rahulovāda Sutta,* the *Canki Sutta* and the *Bāhitika Sutta* of the *Majjhima Nikāya*, etc. Buddhist teaching is also relevant with the concept of *Golden Rule of ethics*; "The Golden Rule or law of reciprocity is the principle of treating others as one would wish to be treated and not treat others as one would wish not like to be treated". The expositions of *Veḷudvāreyya Sutta* of the *Samyutta Nikāya* and the *Dhammapadaya* are relevant with this concept.

The *Kālāma Sutta* emphasizes the value of critical investigation without being bias to traditional belief or inference. This *sutta* rejects 10 points; six are related to authority and four are related to inference as unsatisfactory means of knowledge. "Do not go on what has been acquired by repeated hearing, Nor on tradition, Nor on rumor, Nor on what is in a scripture, Nor on the consideration, 'the monk is our teacher and Nor on another's seeming ability are relevant to authority while Nor on specious reasoning, Nor on an axiom, Nor on surmise and Nor on a bias towards a notion that has been pondered over are relevant to inference.

Scanned with CamScanner

CamScanner

By rejecting these ten points the Buddha let one to determine the right and wrong in his actions on the criteria of one's own experience. When you yourselves know: 'These things are good; not blamable; praised by the wise; undertaken and observed, these things lead to benefit and happiness,' enter on and abide in them.[2] The *Bāhitika Sutta* of the *Majjhima Nikāya* also emphasizes the utility of considering the consequences of one's actions; " Any bodily conduct, Maharaja, which leads to one's own harm, or others' harm, to both, and resulting unwholesome states increase and wholesome states decrease: such bodily conduct, is censured by wise ascetics and brahmans." ... "Any bodily conduct which leads neither to one's own harm, nor to others' harm, nor to both, and due to which unwholesome states decrease and wholesome states increase: such bodily conduct, Maharaja, is uncensured by wise ascetics and brahmans."[3]

In this context, the Buddha admonishes to contemplate the consequences of one's physical, verbal and mental activities and then determine what is right and wrong on the basis of results, they produce for oneself and others and for both. The *Veḷudvāreyya Sutta* of the *Samyutta Nikāya* guides to determine right and wrong of actions with the criteria of golden rule of ethics.

"A noble disciple reflects thus: 'I am one who wishes to live, who does not wish to die: I desire happiness and am averse to suffering. Hence, if someone were to take my life, that would not be pleasing and agreeable to me. Now if I were to take the life of another who wishes to live, who does not wish to die, who desires happiness and is averse to suffering that would not be pleasing and agreeable to the other either. What is displeasing and disagreeable to me is displeasing and disagreeable to the other too. How can I inflict upon another what is displeasing and disagreeable to me?' Having

Scanned with CamScanner

CamScanner

reflected thus, he himself abstains from the destruction of life, exhorts others to abstain from the destruction of life, and speaks in praise of abstinence from the destruction of life.[4] In that way, the same description is linked with verbal and mental activities.

Thus, the Buddha admonishes them to avoid unwholesome deeds by comparing others with oneself how those unwholesome and wholesome deeds are effected for oneself if someone does them to him. Here the Buddha clearly emphasizes the Golden theory in determining right and wrong of actions.

## Conclusion

In this way, Buddhism focuses on utilitarian and golden rule concepts in determining right and wrong of individual activities. However, when it comes to philosophical standpoint with regard to moral reasoning, it has introduced different philosophical theories in order to determine right and wrong of individual activities. However, some of them are bias towards either individualistic or socialistic side. But, Buddhism follows utilitarian and golden rule concepts in determining the right and wrong of moral dilemmas, the individual faces in personal situation.

**Keywords: golden rule, moral reasoning, utilitarianism.**

## Bibliogrphy

### Primary Sources

Anguttara-nikāya. (**Trans**) by Bhikkhu Bodhi, The Numerical Discourses of the Buddha. (2012). Boston: Wisdom Publication.
Majjhima-nikāya**.** (**Trans)** by Bhikkhu Ñāṇamoli and Bhikkhu Bodhi,

Scanned with CamScanner

CamScanner

The Middle Length Discourses of the Buddha. (1995). Kandy: Buddhist Publication Society.
Saṃyutta-nikāya.(**Trans**) by Bhikkhu Bodhi. The Connected Discourse of the Buddha. (2000). Kandy: Buddhist Publication Society.

## Secondary sources

Kalupahana. J. David. Ed. (1987). Buddhist Philosophy And Culture Essays in honour of N. A. Jayawickrema. , Sri Lanka : N. A. Jayawickrema Felicitation Volume Committee.
Dhammajoti. Kuala Lumpur. Ed. (1997). Recent Researches in Buddhist Studies. Essays in Honour of Professor Y. Karunadasa. Hong Kong: Y. Karunadasa Felicitation Committee.

Scanned with CamScanner
CamScanner

# Oral, Textual and Visual Worlds of Early Indian Buddhism

Ms Amrita Singh[1]

This paper attempts to explore how modes and mediums of communication are an essential part in the study of a religion (Buddhism in this context). Buddhalogists in the past and in recent times have largely focussed around the ambit of doctrinal teachings. The medium of communication is also essentially central to the study of the development of a religion as is associated with its rise, spread, teachings, diversification, split, rediscovery and historical reconstruction of religion. It is also essential to highlight the implications of change in the medium of communication to consider interfaces between the oral, written and visual worlds of the Buddhists. Also does it affect the organisation of a religious society and also it's worldly encounters. This shall be primarily linked to the role of "stories" in a religious realm (The Stories of Buddha's anterior birth or the **Jatakas**). How and why do everyday narratives find way into religious teachings and texts? Do we then look for interplay of creativity and tradition particularly when orality is textualised or further visualised. Buddhist sacred narratives woven around the life story of the Buddha himself have been a part of historical

1 Asst. Professor (Dept of History), Shyama Prasad Mukherji College, Delhi University, New Delhi.
amritachauhan1981@gmail.com

Scanned with CamScanner

CamScanner

scholarship. There have been attempts to clearly separate the complex intermingling of the mythic and historical strands of the Buddha's life. Tendencies such as these stemmed from a variety of reasons. But new works on Buddhism have gone beyond conventions to look at historical data in a nuanced way to highlight new trends. Also with new set of questions being raised we shall throw open greater pluralism rather than emphasising on universal meta narratives.

Attempt has been made to explore the role of "stories" in a religious realm. For what reason are stories so central to religious instructions ? Why are they used for a "moralising mission "? Hence highlighting the power and the multifaceted use of stories. Why and how do everyday narratives find way into religious teachings and texts? What happens to them with change in context or mode of communication? It would be noteworthy to see the interplay of creativity and tradition particularly when orality is textualised and further visualised. Aspects of both universal and local articulations is stories are vital to map salient aspects into diverse contexts.

Tales and stories are told in different contexts and function in a variety of ways. Tales or stories when told and listened form a part of the oral whereas when scripted or textualised form a part of a written tradition. Further, when sculpted they make way for a visual tradition. This may be a simple way of looking into it. The attempts should be made to look into its complexities. What is an oral tradition? Does its character change or remain the same when textualised? What happens to the inner structure or its innate characteristics? What happens to the inner structure when they are carved on stone? Tales or stories represent a multifaceted image of culture of a society at large. This paper through interdisciplinary approach and methodological variance attempts to provide a reconstruction of the Buddhist society

Scanned with CamScanner

CS CamScanner

from within and also from its worldly spheres. The **Jatakas** ( birth stories of Buddha's anterior birth) are the main source used in this work to endeavour such an enterprise. This paper also attempts to place the Jatakas as a vital interpretive genre for historical reconstruction.

How are folk narratives a major vehicle for instruction by religious groups. This certainly was not the devise of Buddhism alone nor is it a typical cultural phenomena per say. Also how tenor of of the tales were altered by the monks to suit local folk traditions. The use of stories as vehicles of religious teaching and forming a specific strategy for building a grand religious narrative are both central to this paper. The power of the story from within and the forces that play around it both crucial. Stories that make for a narrative tradition and in my emphasis for a historical source demand attention from multiple disciplines. They have an oral, textual, performatory and visual worlds. This paper investigates into the the medium of communication as highlighted by the **Jatakas** (stories of Buddha's anterior birth)

**Keywords**: **Medium of instruction, Jatakas, power of Stories, universal , local**

CS Scanned with CamScanner

CS CamScanner

# සිංහල දූත කාව්‍යයෙන් නිරූපිත බුදු දහමේ හර පද්ධතිය

කිරිමැටියාවේ සුගුණධම්ම හිමි[1]

## හැඳින්වීම

ඉන්දියානු ආභාසයක් සහිත දූත කාව්‍ය සම්ප්‍රදාය සිංහලයෙහි මුල් අදිනුයේ සන්දේශ කාව්‍ය නාමයෙනි. අනෙකුත් සාහිත්‍ය ග්‍රන්ථවලට සාපේක්ෂව සන්දේශ කාව්‍ය සම්ප්‍රදායට ඉතා දීර්ඝ ඉතිහාසයක් නොමැති බව හඳුනාගත හැකිය. සිංහල ගද්‍ය සාහිත්‍ය හා පද්‍ය සාහිත්‍යය බුද්ධදහම ප්‍රධානත්වයෙහිලා සැලකෙන යුගවල දී ආරම්භ වී ඇති බව හඳුනාගත හැකි වුවත් සන්දේශ කාව්‍ය ලාංකේය සන්දර්භයෙහි මුල් අදිනුයේ හින්දු දේවවාදය හිස ඔසවන ලද දේශපාලන අවධියකය. සන්දේශ කාව්‍යයක අන්තර්ගතය සමීප කියවීමකට ලක් කළ හොත් පෙනී යන ප්‍රධානම කාරණය වන්නේ එය බුදු දහමට වඩා හින්දු ආගම ප්‍රවර්ධනය කරණා ස්වරූපයකි. හින්දු ආගම හා තදීය සංකල්ප ප්‍රවර්ධනය කරන සාහිත්‍ය සම්ප්‍රදායයකින් බුද්ධදහමේ හර පද්ධතිය හෙවත් ගැඹුරු ධර්ම සංකල්ප නිරූපණය කිරීම සොයා ගැනීම සුකර කාර්යයක් නොවේ. කරුණු එසේ හෙයින් සිංහල දූත කාව්‍යයෙන් බුද්ධදහමේ හර පද්ධතිය නිරූපණය වී ඇත්තේ කවරාකාරයෙන් ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වන්නේය.

## අරමුණ

හින්දු ආගමික බලපෑමක් සහිතව උත්පාදනය වූ සිංහල දූත කාව්‍යය ඔස්සේ දෙවියන් උත්කර්ෂයට නැංවෙන අවස්ථා

1 සහකාර කථිකාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, sinhalasuguna@gmail.com

Scanned with CamScanner
CamScanner

බොහෝය. එහි බෞද්ධ වෙහෙරවිහාර, තදීය පරිසරය සහ නායක හිමිවරු අභිවර්ණනයට ලක් කරන තැන් නැත්තේම නොවේ. එසේ වුවත් බුදු දහමේ උගන්වන හර පද්ධතිය සන්දේශ කවියා හසු කරගන්නේ ඉතා විරල වශයෙනි. සංසාරික මනුෂ්‍ය ජීවිතය, අෂ්ට ලෝක ධර්මය, ත්‍රිලක්‍ෂණය ඇතුළු බුදුදහමේ උගන්වන හර පද්ධතිය සන්දේශ කවියා නිරූපණය කරන්නේ කෙසේද යන වග විමසා බැලීම මෙහි අරමුණයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ප්‍රධාන වශයෙන් ම සිංහල දූත කාව්‍ය කිහිපයක් මත පදනම්ව සිදු කරනු ලැබේ. පුස්තකාල පරිශීලනයෙන් දත්ත රැස් කිරීම සිදු කරන අතර ගුණාත්මක ක්‍රමවේදය යටතේ දත්ත විශ්ලේෂණය සිදු කෙරේ.

## සාකච්ඡාව සහ නිගමනය

කිසියම් උත්තමයෙකුට කිසියම් දෙයක් කරදෙන මෙන් ඉල්ලා සිටිමින් යැවෙන පණිවිඩයක ස්වරූපයෙන් ලියැවෙන කාව්‍යමය භාවිතය සන්දේශ කාව්‍ය හෝ දූත කාව්‍ය වශයෙන් හඳුනා ගැනේ. ඉන්දියාවේ දූත කව්‍ය සම්ප්‍රදායට පැහැදිලිවම දීර්ඝ ඉතිහාසයක් ඇතත් ලාංකේය සන්දේශ කාව්‍ය සම්ප්‍රදායයට එතරම් දීර්ඝ ඉතිහාසයක් නොමැති බව පෙනේ. සන්දේශ ආකෘතික කාව්‍ය සම්ප්‍රදායයක් ලංකාවේ දී මුලින් ම හමු වන්නේ ගම්පොළ රාජ්‍යයෙහිය. (ක්‍රි.ව. 13). එනම් සිවුවන බුවනෙකබා රාජ්‍ය සමයෙහිය. ඒ මයුර සන්දේශය හා තිසර සන්දේශය ලියැවීමෙනි. දේව භක්තිය තදින් ම දියුණුව පැවති අවධියක් වශයෙන් මේ කාලය හඳුනාගත හැකිය. දෙවියන්ගේ පිහිට පතා සන්දේශ ලිවීම හෝ යැවීම ආරම්භ වීමෙන්ම එය සනාථ වේ. එසේ ම ඒ කාව්‍ය තුළ දේවාල විස්තර හා වර්ණනා දෙස පරීක්‍ෂාවෙන් බැලූ විට පෙනී යන්නේ ද උක්ත කාරණයමය. සන්දේශකරණය යනු සියබස්ලකරින් ගෙනා 'පෙදෙන් බුදු සිරිතැ න්‍යාය' උල්ලංඝනය වන්නක්මය. සන්දේශ කාව්‍යයෙහි උපයෝගීතාව වන්නේ ද ලෞකික සුබයයි. ලෞකික ප්‍රීතිය අරමුණු කරගෙන රචනා කරන නිර්මාණයකින් අලෞකික අර්ථ උද්දීපනය කිරීම කාව්‍යයේ අරමුණ හා ගැටෙන හේතුයෙන් සන්දේශ කවියා බුදු දහමේ හර පද්ධතිය නිරූපණය

Scanned with CamScanner
CamScanner

කිරීමෙන් වැළකී සිටින්නට ඇතැයි යනුවෙන් යම් සාධාරණ උපකල්පනයකට එළැඹිය හැකිය.

පෙරව සඳ කිරණ පිපි කුමුදු මල් වටින්
පරව තඹර පෙති ගිලි දිය තලා පිටින්
තරව සිහි ඇතිව පර තෙරට යන අටින්
කරව පියාසර සකි කොන්ත ගං තොටින්

තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් රචනා කරන ලද සැලළිහිණි සන්දේශයේ එන ඉහත කවිය කොන්ත ගං තොට පිළිබඳ වර්ණනාවකි. සිය ගමනට අවසර පැතීමෙන් අනතුරුව සැලළිහිණියාට හමුවන ප්‍රධාන ම ස්ථානය කොන්තගංතොටයි. සඳ රැස් පොරව ගෙන හාත්පසින් කුමුදුමල් පිපුණාවූ ද, නෙළුම්මල් පර වී පෙති ගිලිහී වැටුණා වූ ද ජලතල මතින් එතෙරට යන්නට ස්ථිර වූ අදහසින් කොන්ත ගං තොටින් පියාසර කරන්න යනුවෙන් කවියා කියයි. මෙම කවියෙහි වාච්‍යාර්ථය විමසීමේ දී එහි ගැඹුරු ධර්ම සංකල්පයක් සංජානනය කරන ආකාරයක් නො පෙනේ. එහෙත් කවිය තරමක් සමීපව නිරීක්ෂණය කරන විට "තරව සිහි ඇතිව පරතෙරට යන අටින්" යන පද්‍ය කාණ්ඩයත් එහි සැඟව ඇති බුදුදහම ආශ්‍රිත ගැඹුරු ධර්ම සංකල්පත් ඇති ආකාරය දැකිය හැකිය. වෛවර්ණික සංසාරික ජීවිතය කෙළවර කිරීමට උට්ඨාන වීර්යය වැඩිය යුතුයි යන්න එහි ධ්වනිතාර්ථයයි. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයත්, ආර්ය අෂ්ටාංගික සම්මා වායාමයත්, සම්මා සතියත් සහ සංසාරය නැති කිරීමත් යන බුදුදහමේ ගැඹුරු ධර්ම කරුණු සන්දේශ කවියා ව්‍යංගයෙන් සංජානනය කරන ආකාරය දැකගත හැකිය.

**ප්‍රමුඛ පදඃ දූත කාව්‍යය, බුදුදහම, හර පද්ධතිය**

## ආශ්‍රිත ග්‍රන්ථ

1 කුමාරතුංග මුනිදාස, සැලළිහිණි විවරණය, මරදානඃ අනුල මුද්‍රණාලය, 2502.
2 දර්ශන රත්නායක, දූත ගීතය, කර්තෘ ප්‍රකාශන, 2004.

CamScanner

# බුදුරජාණන් වහන්සේ කුසලාකුසල විනිශ්චයෙහි ලා යොදාගත් ප්‍රමාණ පිළිබඳ අධ්‍යයනයක්

පදියතලාවේ ඤාණවිමල හිමි[1]

## හැඳින්වීම

බෞද්ධ දර්ශනයේ කුසලාකුසල විග්‍රහයට හිමි වන්නේ ප්‍රමුඛ ස්ථානයකි. කුසල අකුසල යනු මිනිසා විසින් සිදු කරන, චේතනාව මූලික කරගත් ක්‍රියා රාශියයි. එසේ කරන්නා වූ ක්‍රියාවලින් ලැබෙන විපාක තමාටත්, පොදුවේ සමාජීය ජීවිත කෙරෙහිත් අත්‍යන්තයෙන් බලපෑමක් කරයි. මේ සඳහා යොදන පර්යාය පදද්වයක් ලෙස හොඳ-නරක යන්න දැක්විය හැකිය. මෙලොව උපන් සැම සත්ත්වයෙක් ම දැන හෝ නොදැන බොහෝ ක්‍රියා සිදු කරයි. ක්‍රියාව පමණක් නොව ඒ හා සමගාමීව පවතින චින්තනය ද අදාළ කරුණ සම්බන්ධයෙන් මහත් බලපෑමක් කරන්නේ ය. මෙසේ සිතින්, කයින්, වචනයෙන් යනාදි ලෙස ත්‍රයාකාරයෙන් අපි කුසලාකුසල රැස් කරගනිමු. එසේ රැස් කරගන්නා වූ කුසලාකුසල පිළිබඳ වූ ප්‍රමාණ රාශියක් බුද්ධ දේශනාවේ එයි. මේ පිළිබඳ විමර්ශනය කිරීම මෙම පර්යේෂණයෙන් අභිප්‍රේරිත ය.

## පර්යේෂණ ගැටලුව

බුදුරජාණන් වහන්සේ කුසලාකුසල විග්‍රහයේ දී යොදාගත් ප්‍රමාණ මොනවාද යන්න මෙහි පර්යේෂණ ගැටලුව යි.

---

1 සහාය කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය gnanawimala123@gmail.com)

Scanned with CamScanner

CamScanner

## පර්යේෂණ ක්‍රමවේදය

බුදුරජාණන් වහන්සේ කුසලාකුසල විනිශ්චයෙහි ලා යොදාගත් ප්‍රමාණ පිළිබඳව කෙරෙන මෙම අධ්‍යයනය සඳහා මූලික වශයෙන් යොදා ගන්නේ බුදුසමයාගත ඉගැන්වීම් ය. ඒ සඳහා ප්‍රාථමික හා ද්වෛතීයික මූලාශ්‍රය භාවිත කරමින් දත්ත ලබාගෙන ඒවා විශ්ලේෂණය කරමින් පර්යේෂණය සිදු කෙරේ. ඒ අනුව ප්‍රාථමික මූලාශ්‍රය ප්‍රධාන වශයෙන් මෙහි භාවිත කෙරෙන අතර, වචනාර්ථ විමර්ශනයේ දී ශබ්දකෝෂ භාවිත කරනු ලැබේ. දත්ත විශ්ලේෂණාත්මක ක්‍රමවේදය මෙහි පර්යේෂණ ක්‍රමය යි.

## සාකච්ඡාව හා නිගමනය

බෞද්ධ දර්ශනයෙහි කුසලාකුසල පක්ෂයට හිමිවන්නේ ප්‍රධාන ස්ථානයකි. එය සසර ගමන දීර්ඝ වීම කෙරෙහිත් කෙටි වීම කෙරෙහිත් අතිශයින් බලපෑමක් කරයි. කුසල් අකුසල් යනු මිනිසා විසින් සිදු කරනු ලබන දෛනික ක්‍රියා සමුදායකි. එකී ක්‍රියාවෙහි උත්තුංග භාවය හෝ නිහීන භාවය තීරණය වන්නේ එමගින් ලැබෙන විපාකය මත ය. කුසලාකුසල සිද්ධාන්තයේ ඇති වැදගත්කම ඉන් හඳුනාගත හැකි වන්නේ ය. හොඳ-නරක යන පර්යාය නාමයෙන් ද හඳුන්වන්නේ මෙය ම ය. මෙකී කුසලාකුසල ප්‍රභේදගත කිරීමේ දී බුදුරජාණන් වහන්සේ පදනම් කරගත් විවිධ ප්‍රමාණයන් බෞද්ධ දේශනාවල අන්තර්ගත වේ. මනුෂ්‍යයා විසින් කරනු ලබන ක්‍රියා බුදුසමයේ දී හඳුන්වන්නේ 'කර්ම' යන නාමයෙනි. එහි ලා කර්ම ගණයට වැටෙනුයේ චේතනා සම්ප්‍රයුක්තව සිදු කරන දෑ ය. (චේතනා'හං භික්ඛවෙ කම්මං වදාමි. චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා...) ඒ අනුව බුදුදහමට අනුව කුසල් හෝ අකුසල් රැස් කිරීම සඳහා චේතනාව අතිශයින් බලපෑමක් කරයි. චේතනාවකින් තොරව සිදු කරන ක්‍රියා කර්ම ගණයට නොවැටේ. චේතනාව සහිත කර්මයක ප්‍රකට වන ප්‍රධාන ලක්ෂණයක් නම් ඵලාසක්ත භාවය යි. එනම් කළ කර්මයෙන් යම් ඵලයක් අපේක්ෂා කිරීමයි. ඒ අනුව සැම ක්‍රියාවකට ම සාධාරණ වූ අවස්ථා ත්‍රයක් හඳුනාගත හැකිය. ඒ චේතනාව, ක්‍රියාව සහ විපාකය යි. කිසියම් ක්‍රියාවක් කිරීමට චේතනාව මූලික විය යුතු අතර, චේතනාව සමෘද්ධ වීමෙන් ක්‍රියාව සිදු වේ. ක්‍රියාව සිදු කිරීමෙන් පසු අදාළ

Scanned with CamScanner

CamScanner

ක්‍රියාවට අනුකූල විපාකය අත් විඳීමට සිදු වේ. එමගින් පැහැදිලි වන්නේ චේතනාව පූර්වගාමී වන අතර විපාකය පශ්චාත්ගාමී වන බවයි. සිදු කරන ක්‍රියාව අන්තර්ගාමී වේ. මේ අනුව කුසලාකුසල ක්‍රියාවක ගුණය සෙවීමේ දී චේතනාව එක් ප්‍රමාණයක් වශයෙන් හැඳින්විය හැකිය. මෙයින් ප්‍රකට වන්නේ බෞද්ධ ආචාර විද්‍යාව මනෝවිද්‍යාත්මක පදනමක් මත ගොඩනැගී ඇති බවයි (මනො පුබ්බංගමා ධම්මා). කුසලාකුසල කර්මයන්ගේ ඉපැත්ම කෙරෙහි නිධාන ත්‍රයක් හේතුවන බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. මෙසේ දක්වා ඇත්තේ මානව චිත්ත සන්තානයේ ප්‍රාදුර්භූත වන චේතනා ත්‍රයකි.

යම් ක්‍රියාවක් ප්‍රමාණ කිරීමෙහි ලා එය අදාළ කරගත හැකි මනා ය. ඒ අනුව අකුසල පක්ෂය සඳහා ලෝභ, දෝස, මෝහ යනුවෙනුත් කුසල පක්ෂයෙහි ලා අලෝභ, අදෝස, අමෝහ වශයෙනුත් අදාළ කරගත හැකිය (යං භික්ඛවෙ ලොභපකතං කම්මං, ලොභජං ලොභනිදානං ලොභ සමුදයං තං කම්මං අකුසලං...). මේ අනුව ලෝභ, දෝස, මෝහාදි චේතනා අකුසල පක්ෂය නියෝජනය කරන අතර අලෝභ, අදෝස, අමෝහාදි චේතනා කුසල පක්ෂය නියෝජනය කරයි. ජෛන දර්ශනයේ දී මනසට තැනක් නොලැබෙන නමුදු බෞද්ධ දර්ශනයේ දී චේතනාවට ලැබෙනුයේ අද්විතීය ස්ථානයකි. කෙසේ නමුත් චේතනාවේ සාවද්‍ය බව, නිරවද්‍ය බව තීරණය වන්නේ කර්මයෙන් ලැබෙන විපාකය අනුව ය. ඒ අනුව විපාකය ද ප්‍රමාණයක් ලෙස සැලකිය හැකිය. හොඳ ක්‍රියාවක හෙවත් කුසල ක්‍රියාවක විපාකය සුඛ සහගත වන අතර නරක හෙවත් අකුසල ක්‍රියාවක විපාකය දුක්ඛ සහගත වෙයි. කුසලාකුසල විනිශ්චයේ දී බුදුරජාණන් වහන්සේ යොදාගත් තවත් ප්‍රමාණයක් ලෙස ප්‍රත්‍යවේක්ෂණය නම් කළ හැකි ය. යමෙකු ක්‍රියාවක් සිදු කිරීමට ප්‍රථමයෙන් ඒ පිළිබඳ යෝනිසෝමනසිකාරය පෙරදැරිව විග්‍රහ කරන්නේ නම් එම ක්‍රියාව කුසලයක් ද අකුසලයක් ද මැනවින් හඳුනා ගැනීමට හැකිය. මෙකී න්‍යාය බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත්තේ රාහුල සාමණේර හිමියන්ට ය. එහි දී බුදුරජාණන් වහන්සේ වදාරා ඇත්තේ තමා කරන ක්‍රියාව තමන්ට පමණක් නොව අන්‍යයන්ට ද බලපාන බව යි. යමෙක් කාය කර්ම, වචී කර්ම, මනෝ කර්ම කිරීමේ දී එමගින් ලැබෙන විපාකය නිසි

CS Scanned with CamScanner

CS CamScanner

හෝ අනිසි විය හැකි ය. ඒ පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය කළ යුත්තේ අදාළ කර්මය සිදු කිරීමට පූර්වයෙනි. සංයුක්ත නිකායෙහි ඇති අත්තූපනායික ධර්ම පර්යාය මගින් ද මේ බව හඳුනාගත හැකිය. එහි දී ද විස්තර කෙරෙන්නේ තමා උපමා කොට ගෙන, තමාට යම් කර්මයකින් ලැබෙන විපාකය බලපාන්නේ ද ඒ අයුරින් ම අනෙකාටත් බලපාන බව අවබෝධ කොටගෙන ක්‍රියා කළ යුතු බවයි. ඒ අනුව අත්තූපනායික ධර්ම පර්යාය ද කුසලාකුසල විනිශ්චයෙහි ලා ප්‍රමාණයක් ලෙස ගත හැකිය.

මෙලොවෙහි වෙසෙන සියල්ලෝ ම දීර්ඝ කාලයක් ජීවත් වීමට කැමැත්තෝ ය. එසේ ම දුක් පිළිකුල් කරති. සැප විඳීමට කැමති, දුක් පිළිකුල් කරන තමන් සේ ම අනෙකා ද එපරිදි ම අදහසින් යුක්ත බව සිතා කටයුතු කළ යුතු බව එහි දී පෙන්වා දෙයි. මීට අමතරව කුසලාකුසල විනිශ්චයෙහි ලා යොදාගත හැකි තවත් ප්‍රමාණයක් ලෙස ලක්ඛණ, රස, පච්චුපට්ඨාන හා පදට්ඨාන යනුවෙන් සිව් ආකාරයෙන් යුක්ත මූලධර්මය ගත හැකිය. එහි දී සඳහන් කරන්නේ කුසලයෙහි හොඳ වූ විපාකයක් ඇති අතර කුසලයෙහි කෘත්‍ය වනුයේ අකුසල් නැසීම බවයි. පවිත්‍රත්වය එයින් මූර්තිමත් කරයි. සතර සම්‍යග් ප්‍රධාන ද මෙහිලා සමීප කරගත හැකිය. මේ අනුව බුදුරජාණන් වහන්සේ කුසලාකුසල විනිශ්චයේ දී යොදාගත් ප්‍රමාණ බෙහෙවින් ප්‍රශස්ත බව හඳුනාගත හැකිය. තත්කාලීන භාරතයේ විසූ ෂඩ් ශාස්තෘවරුන් හා අන්‍ය සාමයිකයන් සමාජගත කළ ප්‍රමාණ පරයා, තර්කානුකූල ලෙසත් බුද්ධිගෝචර ලෙසත් සාර්වභෞමික ලෙසත් නැගී සිටි බව හඳුනාගැනීම අසීරු නොවේ. ලෝකයෙහි ඕනෑ ම සංස්කෘතියකට අයත් ජනතාවකගේ ක්‍රියාවන් පවා මේ න්‍යායයට අනුගත කොට විග්‍රහ කළ හැකි බව සඳහන් කිරීම සාවද්‍යයක් නොවේ.

**ප්‍රමුඛ පද : චේතනාව, කර්මය, කුසලාකුසල, ප්‍රමාණ**

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය:

මජ්ඣිම නිකාය, අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය, දෙහිවල: බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2004.
මජ්ඣිම නිකාය, අභයරාජ සූත්‍රය, දෙහිවල: බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2004.

Scanned with CamScanner
CamScanner

මජ්ඣිම නිකාය, චුල්ලකම්ම විභංග සූත්‍රය, දෙහිවල: බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2004.
මජ්ඣිම නිකාය, බාලපණ්ඩිත සූත්‍රය, දෙහිවල: බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2004.
සංයුක්ත නිකාය, වේළුද්වාර සූත්‍රය, දෙහිවල: බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2004.

## ද්වෛතීයික මූලාශ්‍රය:

ජේ. තෝමස්, එඩ්වර්ඩ්. බෞද්ධ චින්තාවේ ඉතිහාසය, කොළඹ: ගුණසේන සහ සමාගම, 1962.
ධම්මජෝති හිමි, බෙලිගල්ලේ සහ දම්පහල ධම්මාරාම හිමි, බෞද්ධ සංස්කෘතික සංග්‍රහය, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ, 1999.
බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. ථේරවාද බෞද්ධ දර්ශනය, කොළඹ: අනුල පොත් සමාගම, 1960.
සුවණ්ණජෝති හිමි, රුවන්වැල්ලේ. බෞද්ධ සංස්කෘතිය ලිපි, පොතුහැර: රත්වල. ඇම්. පොඩිනිලමේ, 1965.
වෙත්තිමුනි, ආර්. ජී. ද ඇස්. බුදුදහම සහ එය ආගමටත් විද්‍යාවටත් සම-විසම වන අයුරු. කොළඹ: ගුණසේන සහ සමාගම, 1967.

Scanned with CamScanner
CamScanner

# ජාතක පොතෙන් නිරූපිත සමාජ සාරධර්ම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක
## (දස පාරමිතාවන්ට අදාළ ජාතක කතා 10 ක් ඇසුරෙන්)

ඔ වී පී වයි කුලරත්න[1]

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි සභ්‍යත්වය කෙරෙහි ජාතක පොතෙන් ලැබී ඇති පිටුබලය ඉමහත් ය. "පන්සිය පනස් ජාතක පොත්වහන්සේ" යන අභිධානයෙන් හඳුන්වයි. සිංහල සාහිත්‍යයේ ලෝක සාහිත්‍යයට එක් විය යුතු එක ම ග්‍රන්ථය වන්නේ මෙම ජාතක පොත ය යන්න මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහයන්ගේ අදහස යි.

".....ලෝක සාහිත්‍යයෙහි ඇතුළු විය යුතු සිංහල පොතක් වෙතොත් එය ජාතක පොත හැර අනිකක් නොවේ......"[1]

එසේ පැවසීමට හේතු වී ඇත්තේ විවේක බුද්ධියෙන් යුක්තව ජාතක කතා කියවන්නෙකුට දුර්ලභ ජීවිත පරිඥානයක් ලද හැකි වීම යි.[2] රීස් ඩේවිස්, වින්ටර්නීට්ස් වැනි බටහිර විද්‍යාර්ථීන් පවා ජාතක පොත උසස් සාහිත්‍යාංගයක් සේ සලකා ඇති අතර, මෙසේ සිංහල ජාතක පොත දෙස්-විදෙස් සම්භාවනාවට පාත්‍රව ඇත්තේ එහි පවත්නා සාහිත්‍යමය අගය පමණක් ම සැලකීමෙන් නොවේ. ඉන් සමාජ සදාචාර වර්ධනයට ලැබෙන ඉමහත් දායකත්වය ද සැලකීමෙනි.

ජාතක පොතෙහි එන 550 කට ආසන්න වූ ජාතක කතාවන් අතරින් සමහරක් දස පාරමිතා විස්තර කිරීමට භාවිත කොට තිබේ. දස පාරමිතා ප්‍රකට කිරීමේ අරමුණ ම මුල් කොට ගෙන

1

රචිත එවන් කතා 58 ක් පමණ වේ.[3] දස පාරමිතා එනම් දානය, සීලය, නෙක්ඛම්මය, ප්‍රඥාව, වීර්යය, ඉවසීම, සත්‍යවාදීත්වය, අධිෂ්ඨානශීලීත්වය, මෛත්‍රී සහගත බව සහ උපේක්ෂාව යන යහපත් සදාචාර ධර්ම ඔප්නංවා ඒවා සමාජ සාරධර්මයන් හා මුසු කිරීමට ජාතක කතාකරුවා උත්සාහ ගෙන තිබේ. එසේ ම කළ ගුණ සැලකීම, ප්‍රිය වචන කතා කිරීම, ගුරු ගෞරවය, වැඩිහිටියන්ට සැලකීම, පතිව්‍රතාව, පංචශීල ප්‍රතිපදාව ආදී අන්‍යතර සාරධර්මීය ගුණ දහම් ද ජාතක කතාවන්ගෙන් විශද කොට ඇත්තේය.

| පාරමිතාව | ජාතක කතාව | ජාතක කතා අංකය |
|---|---|---|
| දාන පාරමිතාව | වෙස්සන්තර ජාතකය | 539 |
| සීල පාරමිතාව | භූරිදත්ත ජාතකය | 535 |
| නෙක්ඛම්ම පාරමිතාව | මූගපක්ඛ ජාතකය | 530 |
| ප්‍රඥා පාරමිතාව | මහා උම්මග්ග ජාතකය | 538 |
| වීර්ය පාරමිතාව | මහා කපි ජාතකය | 401 |
| ක්ෂාන්ති පාරමිතාව | ක්ෂාන්තිවාදි ජාතකය | 310 |
| සත්‍ය පාරමිතාව | කුරු ධර්ම ජාතකය | 275 |
| අධිෂ්ඨාන පාරමිතාව | තේලපත්ත ජාතකය | 95 |
| මෛත්‍රී පාරමිතාව | සංඛපාල ජාතකය | 516 |
| උපේක්ෂා පාරමිතාව | ඡද්දන්ත ජාතකය | 506 |

මෙම ජාතක කතා ඇසුරෙන් සිංහල සමාජගත සාරධර්ම වර්ධනයට ජාතක පොතෙහි ආභාසය කෙසේ වී ද යන්න විමසා බැලේ.

**ක්‍රමවේදය**

මෙහි දී අප මෙම පර්යේෂණය සඳහා යොදා ගනු ලබන්නා වූ දත්ත වශයෙන් (Primary sources, Secondary source, Dictionaries, Academic articles, Journals etc). කුරුණෑගල යුගයේ ලියැවී ඇති ජාතක පොත තුළින් ජාතක කතා 10 ක් මෙම අධ්‍යයනයේ දී තෝරා ගැනුණු අතර එහි දී සලකා බැලුණු නිර්ණායක වූයේ එම කතා දස පාරමිතාවන්ට අදාළ වීම සහ

Scanned with CamScanner

සමාජ සාරධර්ම නිරූපණය කෙරෙනුයේ කෙසේ ද යන්නයි. එම නිර්ණායක මත පහත සඳහන් ජාතක කතා මෙම අධ්‍යයනය සඳහා තෝරා ගෙන තිබේ. ඒවා තුළින් ස්වයං අවබෝධයෙන් ලබා ගන්නා නිරීක්ෂණය නිගමනයන් බවට පත්වේ.

**සාකච්ඡාව**

ජාතක පොතෙහි එන ජාතක කතාවන් සමාජ සාරධර්ම නිරූපණය තුළින් සමාජ සදාචාර වර්ධනය උදෙසා දායකත්වයක් සපයන්නේ ද? යන්න පර්යේෂණ ගැටලුවයි. ජාතක පොත ලිවීමේ දී එහි කතුවරුන්ගේ පරමාර්ථ වූයේ කුමක්දැයි විමසීමේ දී පාඨකයා තුළ බුද්ධ ගෞරවය හා ශ්‍රද්ධා භක්තිය ජනිත කරවීම ප්‍රධාන අරමුණ වන්නට ඇත. එසේ ම එමගින් සමාජ සාරධර්ම ඔප් නංවා සදාචාරවත් වටපිටාවක් ඇති කරලීම ද අරමුණු කර ගන්නට ඇත. එසේ නම් නිසැකව ම ජාතක පොතෙහි ඇතුළත් කතාවන් සාරධර්ම වර්ධනයට අවැසි මඟ පෙන්වා දෙන ඒවා විය යුතු ය. ජාතක පොත විමසුම් ඇසින් කියවන්නෙකුට ඒ බව පහ-සුවෙන් වටහා ගත හැකි වේ. මෙම පරීක්ෂණයේ ප්‍රධාන අරමුණ ලෙස ජාතක පොතෙන් දක්වා ඇති සමාජ සාරධර්ම ශ්‍රී ලාංකේය ජන විඥානය හැඩ ගැස්වීමෙහි ලා කෙසේ බල පා ඇත්දැයි අධ්‍යයනය කිරීම දැක්විය හැකිය.උප අරමුණු වනුයේ ජාතක කතාවන්හි සාරධර්ම වර්ධනයට අවැසි උපදෙස් පවතින්නේදැ යි විමසීම, ජාතක පොත ලිවීමේ පරමාර්ථ සඵල වී ඇත්දැ යි පරීක්ෂා කිරීම, ඉන්දීය පරිසරයක් මවා පාන ජාතක කතාවන් හි එන සමාජ සාරධර්ම ශ්‍රී ලාංකික අපට ගැළපෙන්නේදැ යි සොයා බැලීම ආදියයි.

**ප්‍රතිඵල**

නූතන සමාජයේ මෙන් නොව අතීත සමාජයේ නොපිරිහී පැවති සාරධර්මයන්ට ප්‍රධාන වශයෙන් මඟ පෙන්වා දුන්නේ ජාතක පොතෙන් ජන ජීවිතයට එක් කර ගත් ඉහත සඳහන් කළ හා සඳහන් කර නැති සදාචාර මඟ පෙන්වීම් ය. එබැවින් නූතන සමාජයේ සදාචාරාත්මක වර්ධනය උදෙසා එකී ඉගැන්වීම් ඉවහල් කර ගැනීම අතිශය වැදගත් වන්නකි. ජීවිතයේ මතු වන ගැටලු මඟ හරවා ගැනීමටත්, සමාජීය වශයෙන් අර්බුද මතුවන අවස්ථාවන්

Scanned with CamScanner
CamScanner

හි ඒවා දුරින් දුරු කර දැමීමටත් ජාතක පොත උපයෝගී කර ගත හැකිය යන්න මින් විශද වේ.

### නිගමනය

ජාතක පොතෙහි එන ජාතක කතාවන් සමාජ සාරධර්ම නිරූපණය තුළින් සමාජ සදාචාර වර්ධනය උදෙසා දායකත්වයක් සපයන්නේ දැයි ඇතැමුන්ට ඇති ගැටලුවකි. ජාතක පොතෙහි එන ඇතැම් කතා තුළින් පුද්ගලයින්ගේ මනසට වැරදි ආකල්ප එක් වන්නේය යන පුහුදුන් බටහිර ගැති මතය මෙම පර්යේෂණයෙන් මර්ථනය කළ හැක. මේ ආකාරයට සමස්ත පර්යේෂණයෙන් ජාතක පොතෙන් නිරූපිත සමාජ සාරධර්ම පිළිබඳ පුලුල් විග්‍රහයක් සිදුවේ.

ප්‍රමුඛ පද - දස පාරමී, සාරධර්ම, ජාතක, සමාජය

### ආශ්‍රිත ග්‍රන්ථ

1 මාර්ටින් වික්‍රමසිංහ, ජාතක කතා විමසුම (මාර්ටින් වික්‍රමසිංහ කෘති එකතුව-11 වැනි වෙළුම), දෙහිවල, සීමාසහිත තිසර ප්‍රකාශකයෝ, 1992, පි. 113.

2 -එම-

3 පන්සිය පනස් ජාතක පොත් වහන්සේ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2013.

4 පන්සිය පනස් ජාතක පොත් වහන්සේ (සරල සංක්ෂිප්ත). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2010.

CS Scanned with CamScanner

CS CamScanner

# බෞද්ධ සුඛ සංකල්පය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

ගලගම කරුණාකර හිමි[1]
මැදවෙල ධම්මධාරණී මෙහෙණින් වහන්සේ[2]

## හැඳින්වීම

සත්ත්වයා ස්වභාවයෙන් ම සැප ප්‍රිය කරයි. දුක පිළිකෙව් කරයි. මරණය ප්‍රතික්ෂේප කරමින් බොහෝ කාලයක් සැපයෙන් ජීවත් වීමට යත්න දරයි. එම සැපවත් ජීවිතයෙහි අවශ්‍යතාවය දකින සත්ත්වයා සෑම විට ම කුමන හෝ මාධ්‍යයකින් සැපය උදාකර ගැනීමට උත්සුක වේ. එම අත්‍යෞත්තිකරත්වය ම පුද්ගලයා අසීමිත දුකකට පත්කරන බව බුදුසමය පෙන්වා දෙයි. (සුඛකාමානි මනුස්සා දුක්ඛපටික්කූලා) ස්වභාවයෙන් ලොව කිසිවෙක් කායික හෝ මානසික පීඩාවකට ලක් වීමට කිසිදු අභිරුචියක් නොදක්වයි. එය සබ්බෙ තසන්ති දණ්ඩස්ස ආදි භාවිතයන් තුළින් බුදුසමය තවදුරටත් පෙන්වා දෙයි. ඒ අයුරින් අවධාරණය වන සුඛය බුදුසමය තුළ සංකල්පමය වශයෙන් විග්‍රහ වේ. මෙහි දී අපගේ අවධානය යොමු වනුයේ තත් බෞද්ධ සුඛ සංකල්පය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් සඳහා ය.

## අරමුණ

සුඛ කාමීත්වය සත්ත්ව ස්වභාවයක් ලෙස පිළිගන්නා බුදුසමය සත්ත්වයාගේ සැපය පිළිබඳ සහ සැපවත් දිවියක්

---

1 සහාය කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, galagamathero@gmail.com

2 සහාය කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය madawela.dhammadarni@gmail.com

Scanned with CamScanner

CamScanner

ලබාගැනීම උදෙසා කටයුතු කළ යුතු අයුරු දාර්ශනික හා ප්‍රායෝගික භාවිතාවන් තුළින් විස්තර කරයි. ඒ පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

**පර්යේෂණ ගැටලුව**

මුල් බුදුසමය තුළ සත්ත්වයාගේ සුඛය පිළිබඳව සකාච්ඡා වී ඇත. එහෙත් පසුකාලීන යම් යම් විචාරකයින් විසින් බුදුදහමෙහි පවත්නා ත්‍රිලක්ෂණ ආදි සියුම් සංකල්පයන් පිළිබඳ අල්ප අවබෝධයෙන් හා මතුපිට අර්ථය විමසා බුදුසමය සර්ව අශුභවාදයක් ලෙස හුවා දක්වයි. ඒ අයුරින් ගොඩ නඟන මතවාදයන්ට අනුව පුද්ගල සැපත ප්‍රතික්ෂේප වේ ද යන්න අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුවයි.

**පර්යේෂණ උපන්‍යාසය**

ථෙරවාද සම්ප්‍රදායට කාලානුරූපිව ඇති වූ විවිධ බලපෑම් හේතුවෙන් මෙම දර්ශනය විචාරයට ලක් විය. නූතනය වන විට එය නව ප්‍රවණතාවන් ඔස්සේ ක්‍රියාත්මක වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනයේ දී අධ්‍යයන ක්‍රමවේදය ලෙස මූලාශ්‍ර අධ්‍යයනය භාවිත කෙරේ. එහි දී ප්‍රාථමික, ද්විතියික හා තෘතීයික මූලාශ්‍රය අධ්‍යයනය මඟින් පාඨ විශ්ලේෂණය හා සන්ධාර විශ්ලේෂණය යන ක්‍රමවේදයන් ද භාවිතයට අපේක්ෂිත ය.

**සාකච්ඡාව**

ඉන්ද්‍රියානුභූතීන් මත පිහිටා වින්දනාත්මක රසාස්වාදය ලැබීමට කායික සුඛය හා මානසික සුඛය වශයෙන් සාමාන්‍ය ජනතාව හුවා දක්වුව ද බුදුසමය මීට වඩා ගැඹුරු පදනමක පිහිටා එය විවරණය කරයි. බෞද්ධ විග්‍රහයට අනුව කායික හෝ මානසික හෝ සැපයක් ලෙස සැලකීමට එය දුකට හේතුවන, දුකක් බවට පෙරළෙන ස්වභාවයෙන් මිදුණක් විය යුතුය. වරක් සැපයක් ලෙස සලකන දෙය තවත් මොහොතක දුකක් නොවිය යුතුය. එහෙත් බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම වූයේ පුද්ගලයා ජීවත්වන කාලයේ දී සතුටින් ජීවත් විය යුතු බවය. ඒ බව පහත පාඨයෙන් පැහැදිලි වේ.

Scanned with CamScanner
CamScanner

"අත්තම්හි ජාතම්හි සුඛා සහායා- තුට්ඨී සුඛා යා ඉතරීතරේන
පුඤ්ඤං සුඛං ජීවිත සංඛයම්හි -සබ්බස්ස දුක්ඛස්ස සුඛං පහානං"

ධර්මයට අනුව ක්‍රියා කිරීම පුද්ගලයාට සැපත ගෙන දෙන්නකි. එමෙන්ම පුද්ගලයාට ජීවිතයේ අවසානය දක්වා ම ධර්මය සැපය පිණිස හේතු වේ. ඒ බව නාග වග්ගයේ මෙසේ සඳහන් වේ.

"සුඛං යාව ජරා සීලං - සුඛා සද්ධා පතිට්ඨිතා
සුඛෝ පඤ්ඤාය පටිලභෝ - පාපානං අකරණං සුඛං"

සීලය පුද්ගලයාගේ මහළු අවධිය දක්වා ම සැපය පිණිස හේතු වේ. එමෙන්ම ශ්‍රද්ධාව, ප්‍රඥාව පුද්ගලයාට සැපය පිණිස හේතුවන කරුණු වේ. පාපී බවින් තොර වීම තුළින් ද පුද්ගල සිත තුළ සුඛ සංකල්පය ගොඩනැගේ. අංගුත්තර නිකායේ සැපය විසිහය ආකාරයකින් විස්තර කෙරේ. ඒවා නම්

1. උපධි සුඛ
2. පබ්බජ්ජා සුඛ
3. සාසව සුඛ
4. අනාසව සුඛ
5. සාමිස සුඛ
6. නිරාමිස සුඛ
7. අරිය සුඛ
8. අනරිය සුඛ
9. සප්පීතික සුඛ
10. නිප්පීතික සුඛ
11. ඝාන සුඛ
12. උපෙක්ඛා සුඛ
13. සමාධි සුඛ
14. අසමාධි සුඛ
15. සප්පීතිකාරම්මණ සුඛ
16. නිප්පීතිකාරම්මණ සුඛ
17. සාතාරම්මණ සුඛ
18. උපෙක්ඛාරම්මණ සුඛ
19. රූපාරම්මණ සුඛ
20. අරූපාරම්මණ සුඛ
21. ගිහි සුඛ
22. පැවිදි සුඛ
23. කාම සුඛ
24. නෙක්ඛම්ම සුඛ

Scanned with CamScanner
CamScanner

25. කායික සුඛ 26. චෙතසික සුඛ

මිනිස් ජීවිතය දුක් සහිතය බව බුදුදහමින් පෙන්වා දෙන කරුණක් වුව ද සැපයෙන් මුළුමනින් තොර යයි නූගන්වයි. ඒ අනුව ගිහියාට භෞතික හා ආධ්‍යාත්මික වශයෙන් නොයෙක් සැප ඇති බව බුදුදහම පෙන්වා දෙයි. නමුදු සෑම විටෙක ම තාවකාලිකව ලබන සැපය දුකක් ලෙසින් බුදුසමය අවධාරණය කරයි. විටෙක උසස් ධ්‍යානවල දී ලබන ප්‍රීතිය වුව ද තාවකාලික වන බැවින් එය ද දුකක් ලෙසින් හඳුන්වා දී ඇත. බෞද්ධ දර්ශනය සුඛය බැහැර කරන ඉගැන්වීමක් ලෙස විචාරයට ලක් වුව ද ඒ පිළිබඳ අධ්‍යනයේ දී සියලු සුඛ අතර පරම සුඛයක් වෙත පුද්ගලයා යොමු කිරීම බුදු දහමේ ප්‍රධාන අභිලාසය වේ. එම පරම සුවය හෙවත් නිවන පුද්ගල ආනුභවික මෙන් ම නැවත දුකට පත් නොවීමත් බෞද්ධ සුඛ සංකල්පයේ ප්‍රතිලාභය යි.

ප්‍රමුඛ පද ඃ- සත්ත්වයා, සුඛය, අනිත්‍ය, ලෞකික සැපය, ලෝකෝත්තර සැපය.

## ආශ්‍රිත ග්‍රන්ථ

01 අඟුත්තර නිකාය, I, 2005, බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, නැදිමාල. දෙහිවල.
02 අංගුත්තරනිකායට්ඨකථා II 1931, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ,
03 නිවන් මග, බෞද්ධ ආර්ථික චින්තනය, 31 වන කලාපය, .
04 පියරතන හිමි වෑගම, 2000, සන්න සහිත සුත්තනිපාතය (අට්ඨක වර්ගය) කාම සූත්‍රය,
05 රාහුල හිමි, අත්තුඩාවේ, 1994, ධම්මපදය - සුඛ වග්ගය,

Scanned with CamScanner
CamScanner

# Is Buddhist ethics Deontological or Teleological? : A Review on the Interpretations of the Modern Scholars

**Ven. Dapane Chandaratana**[1]

## Abstract

The word 'Teleology' derived from the Greek word '*telos*', which means '*end*', '*goal*', or '*purpose*'. Therefore, according to the teleological theory the individual behave ethically with the purpose of achieving a specific goal. The word '*deontology*' derives from the Greek word *deon*, which means '*obligation*', '*necessity*' and '*duty*'. As it bases on the duty and the obligation, deontological theories emphasize what your moral duties are. Deontological systems hold that the moral value of an action measures as good when it done as duty or obligation, opposed to considering the consequences of an action. This article focuses to investigate whether Buddhist ethics is teleological or deontological with reference to the interpretation of the modern scholars.

When we considered interpretations and argument made by both foreign and local scholars it is very easily can be understood that they have made different arguments and interpretations on Buddhist ethical theories parallel to western ethics. Many scholars have made the endeavour to

1 Lecturer , Bhiksu University of Sri Lanka,
dapanechandima@gmail.com

Scanned with CamScanner

CamScanner

compare Buddhist ethics with western ethical theories, such as theories like Teleology (consequentialism, Utilitarianism, altruism, hedonism etc.) deontology virtue ethics etc. But their comparisons and arguments are not wholly correct as Buddhism has unique features on its own ethics. *Prima face* Buddhist ethics appeared as teleology or deontology. Because *Nibbana* is the *summun bonum* of Buddhist ethics that based on the Morality (*Sila*) concentration (*Samadhi*) and wisdom ( *Paññā*). It is seems to be that one should be morally behaved with the expectation of attaining *Nibbana* or ultimate goal. This teaching of Buddhism appeared as teleology when it compare with western ethics. On the other hand Buddhist ethics explains duties and obligation (for an example, *Sigalōvada sutta*) that should be fulfilled towards the family and society without expecting any gains. Through this teaching of Buddhism, one can be argued Buddhism as a type of deontology. This appearance of Buddhist ethics does not represent the real nature of Buddhist ethics because in Buddhist ethics there are its own unique features.

## Introduction

Goodman argued Buddhist ethics as a type of consequentialism in his book, *Consequences of compassion: An interpretation and defense of Buddhist ethics*. Goodman argument is that Buddhist ethics is universal consequentialism. Paul Dahlke, an early German pioneer of Buddhist philosophy interpreted Buddhist ethics as an Utilitarianism. Rhys Davids interpreted a Buddhist as 'a hedonist' and he is on the opinion that 'his morality was dependent or, in the phrase of British ethics, utilitarian, and not intuitionist. Har Dayal Described Buddhist ethics as pure hedonism while referring the Buddhist concept of *Puñña*. Mark Siderits seems to be recognized both teleological and deontological aspects of Buddhist ethics. Damien Keown in his value book, The *Nature of Buddhist*

Scanned with CamScanner

CamScanner

*Ethics* described Buddhist ethics parallel to the Aristotelian and Kantian ethics and he recognised both teleological and deontological aspect of Buddhist ethics. Georges Dreyfus is another scholar who brought teleological approach to the Buddhism. David Bastow paid the attention on doctrinal factors of *Sāmaññaphala Sutta* and suggested Buddhist ethics as a teleological system.

J.Kalupahana explained the Buddhist notion of happiness but contrary to the happiness of Western Utilitarianism. For Gunapala Dharmasiri in Buddhist ethics contains both teleological and deontological aspects but on the other hand somewhat it transcends both these Western concepts. K.N Jayathilake's opinion is, Buddhist ethics is related with the teleology than deontology but he agreed that there are some deontological theories also in Buddhist ethics

**Discussions**

The research opens for discuss the unique features of Buddhist ethics. It must further discuss on the matter 'is Buddhist ethics Deontological or Teleological?'

**Objectives**

Objective of this research is to disclose the unique features of Buddhist ethical theories in relation western ethical theories. And the research aim to identify some new ethical theories which are beyond the western ethical theories.

**Research problems**

Is Buddhist ethics deontological or Teleological?

Whether there are any unique features of Buddhist ethics in relation to Western ethical theories?

**Methodology**

Data was collected referring library and E- library. The data from the primary and secondary sources related to

Scanned with CamScanner

CamScanner

the field collected through the libraries and discussed with scholars in the field. The data analysis method of the research is comparative method.

**Conclusion**

To understand the nature of Buddhist ethics Buddhism should be studied without comparing it with the western ethical theories. Because according to Buddhist ethics in the absolute state (*Paramatta*) everything is empty (*sūnyata*). There is no any deontological or teleological appearance in Buddhist ethics in the state of *Paramatta*.

**Key Words- Deontology, Teleology, Buddhist Ethics,**

**Bibliography**

1. *Aṅguttara Nikāya*, VI. (1981).Hunt, M. & Rhys Davids, C.A.F. London, Pali Text Society.
2. *Suttanipāta, 790*. (1990). (Ed.). Dines Andersen and Helmer Smith, London, Pali Text Society.
3. *Saṁyutta Nikāya*, I. (2006). (Ed.). Feer, L. London, Pali Text Society.
4. Aitken, D.T. (2016). *Experience and Morality: Buddhist Ethics as Moral Phenomenology* School of Philosophy, University of Tasmania.
5. David, D. (1969). *Buddhist Ethics*. Religious Studies.
6. Dharmasiri, G. (1986) *Fundamentals of Buddhist ethics*, Singapore, Buddhist Research Society.
7. Dahlke, P. (1908). *Buddhist Essays*. (Bhikkhu Sīlācāra,Trans.).London: Macmillan,
8. Goodman, C. (2009). *Consequences of compassion: An interpretation and defense of Buddhist ethics*. New York: Oxford University Press.
9. George, D. (1995). *Meditation as Ethical Activity*. Journal of Buddhist Ethics.
10. Horner, I. B. (1950).*The Basic Position of Sila*. London, Williams & Northgate.
11. Jayatilleke, K. N. (2008). *Ethics in Buddhist Perspective*, BPS Online Edition.
12. Keown, D. (1992). *The Nature of Buddhist Ethics*. London, Palgrave.

Scanned with CamScanner

CamScanner

13. Kalupahana, D. J. (1995).*Ethics in Early Buddhism*. Honolulu, HI: University of Hawai'i Press.
14. Pratt, J.B. (1928).*The Pilgrimage of Buddhism*. New York, Macmillan.
15. Ronald F. White, *Moral Inquiry*, http: //docplayer.net/1642068-Moral-inquiry-ronald-f-white-ph-d-professor-of-philosophy-college-of-mount-st-joseph.html
16. Siderits, M. (2007).*Buddhism as Philosophy*. Indianapolis: Hackett Publishing Company.
17. Whitaker, J. S. (2017) *Ethics as a Path: Kantian Dimensions of Early Buddhist Ethics*, University of London, Goldsmiths.

Scanned with CamScanner

CamScanner

# ලාංකීය බුදුදහම කෙරෙහි එල්ල වූ මහායාන බලපෑම් පිළිබඳ මූලාශ්‍රයගත අධ්‍යයනයක්

දැල්තර ඤාණානන්ද හිමි[1], **D. M. L. H.** බංඩාර[2], **V.S.K.** කුමාර[3]

## හැඳින්වීම

දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස ඒකීයව පැවති භික්ෂු සාසනය ක්‍රමයෙන් දෙකඩ විය. තෙවන ධර්ම සංගීති සමය වනවිට එම භේදීම නිකාය 18ක් දක්වා වර්ධනය විය. මෙසේ වර්ධනය වූ නිකායන්, සම්ප්‍රදායන් දෙකක් අනුගමනය කළහ. එනම් ථෙරවාදී සම්ප්‍රදාය සහ මහායාන සම්ප්‍රදාය යි. මෙම සම්ප්‍රදායන් දෙකෙහි ම බලපෑම් බෞද්ධ රාජ්‍යයන් කරා ව්‍යාප්ත වූ බව හඳුනාගත හැකි ය. ලාංකීය බෞද්ධ ඉතිහාසය පිළිබඳ අධ්‍යයනයේදී ලක්දිව බුදුදහමට ද මහායාන බුදුදහමෙහි අභාෂය සිදු වූ බව මූලාශ්‍රය සාධක ඇසුරින් හඳුනාගත හැකි ය. ඒ අනුව මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කිරීමෙන් අනතුරුව ශතවර්ෂ ගණනාවක් නිරුපද්‍රිතව ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදාය ලංකාව තුළ පැවතුණි. පසුව සිදුවූ වෛතුල්‍යවාදයේ ආගමනයත් සමග තත්ත්වය ක්‍රමයෙන් වෙනස් විය. විශේෂයෙන් ම වලගම්බා රජතුමා විසින් කුපික්කල තිස්ස හිමියන්ට කරන ලද ආරාම පූජාවත් සමග මහායාන බෞද්ධ

---

1 Assistant Lecturer, University of Sri Jayewardenepura

2 B.A. (Buddhist Coulter), Dip. in Counseling, (University of Ruhuna), M.A, (University of Buddhist & Pali), M.phil, (University of Kelaniya), Ph. D, Reading (University of Kelaniya) Dip. in HRM

3 Research Assistant, Department of Pali and Buddhist Studies , University of Sri Jayewardenepura.

සම්ප්‍රදායට නිශ්චිත නිල මධ්‍යස්ථානයක් ලංකාව තුළ නිර්මාණය විය. ඒ අනුව අභයගිරිය ලංකාව තුළ මහායාන බෞද්ධ සම්ප්‍රදාය ව්‍යාප්ත කිරීමේ මූලස්ථානය බවට පසුකාලීනව පත්වූ බව ඉතිහාස මූලාශ්‍රය පිරික්සීමේදී තහවුරු වේ. මෙම සාධකයන් පාදක කොට ගනිමින් ඉතිහාසයේ ලක්දිව බුදුදහමට මහායාන බලපෑම් සිදු වූ ආකාරය පිළිබඳ වූ විමර්ශනාත්මක අධ්‍යයනයක් මහාවංශය, නිකාය සංග්‍රහය, ශිලා ලිපි, සාහිත්‍ය මූලාශ්‍රය ආදී ඉතිහාස මූලාශ්‍රය විමර්ශනය කිරීමෙන් මෙම පර්යේෂණයේදී සනාථ කිරීමට නියමිත ය. එමෙන් ම ලක්දිව මහායාන බලපෑම් පිළිබඳ විමර්ශනය කිරීමේදී ප්‍රධාන අංග කිහිපයක් පමණක් ආවරණය කිරීම මෙම පර්යේෂණයේදී සිදුවේ. එසේ අවධානය යොමු කළ ප්‍රධාන අංග වශයෙන් පුදපූජා ආශ්‍රයෙන් සනාථ වන ලක්දිව මහායාන බලපෑම්, පුරාවිද්‍යාත්මක සාධක ආශ්‍රයෙන් සනාථ වන මහායාන බලපෑම්, ලාංකීය සාහිත්‍ය සාධක ආශ්‍රයෙන් සනාථ වන මහායාන බලපෑම්, ශිලා ලිපි ආශ්‍රයෙන් සනාථ වන ලාංකීය මහායාන බලපෑම් ආදී වශයෙන් ගෙන විමර්ශනයක් මෙම පර්යේෂනයේදී සිදුකොට තිබේ. එහිදී අනාවරණය කරගත් කරුණු තුළින් එළඹිය හැකි නිගමන ඉදිරිපත් කිරීමට නියමිත ය.

**අරමුණ**

සියවස් ගණනාවක් ථේරවාදී බෞද්ධ සම්ප්‍රදාය නිරුපද්‍රතව පැවතිය ද මහායාන බුදුදහමෙහි ආගමනයත් සමග ලාංකීය බුදුදහමෙහි යම් යම් පැතිකඩයන් වෙනස් විය. මෙය සනාථ කළ හැක්කේ ලාංකීය බෞද්ධ ආගමික ඉතිහාසය ගැඹුරින් පරීක්‍ෂා කිරීමෙනි. එබැවින් ඉතිහාස මූලාශ්‍රය ආශ්‍රයකර ගනිමින් ඉතිහාසයත් සමග වියැකී යන බෞද්ධ ඉතිහාසය නැවත කරුණු සහිත ව ඉස්මතුකර දැක්වීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ යි. විශේෂයෙන් ම මෙම පර්යේෂණයේදී බෞද්ධ මූලාශ්‍රය සාධක ඇසුරින් බුදුදහමේ විවිධ අංග කෙරෙහි මහායාන බලපෑම සිදු වූ ආකාරය හා ඒවා වර්ථමාන බුදුදහම කෙරෙහි සම්මිශ්‍ර වූ ආකාරය පර්යේෂණයට ලක්කිරීම ද මෙහි අරමුණකි.

**පර්යේෂණ ගැටලුව**

ලාංකීය ඉතිහාසය පිළිබඳ විවිධ අංග තුළින් පර්යේෂණ සිදුවී ඇත. එමෙන් ම මහායාන බුදුදහම පිළිබඳ ව ද සාකච්ඡා

Scanned with CamScanner
CamScanner

වී ඇත. නමුත් ඉතිහාසයේ ලාංකීය ථෙරවාදී බුදුදහමට මහායාන බලපෑම්හි උපයෝගීතාවය පිළිබඳ හෝ එසේ බලපෑම් එල්ල වූයේ කුමණ ක්ෂේත්‍රයන් පිළිබඳ ව ද යන්න මූලාශ්‍රය සාධක ඇසුරින් ප්‍රමාණාත්මක පර්යේෂණයක් සිදුවී නො මැත. එම ගැටලුව මෙම පර්යේෂණයේදී පර්යේෂණ ගැටලුව වශයෙන් තෝරාගන්නා ලදි.

**පර්යේෂණ ක්‍රමවේදය**

උක්ත කරුණ යටතේ සිදුකෙරෙන මෙම පර්යේෂණය විශේෂයෙන් ම ත්‍රිපිටකය, අටුවා ආදී ප්‍රථමික මූලාශ්‍රය ද මහාවංශය, නිකාය සංග්‍රහය, ශිලා ලිපි, සාහිත්‍ය මූලාශ්‍රය ආදී ඉතිහාස මූලාශ්‍රය ද ඇසුරු කරගනිමින් දත්ත එක්රැස් කරමින් ඒවා විශ්ලේෂණය කරමින් අදාළ නිගමනයන්ට එළඹීමට නියමිත ය.

**අපේක්ෂිත ප්‍රතිඵල**

මහායාන බෞද්ධ සම්ප්‍රදායට පමණක් අනන්‍ය වූ යම් යම් සංකල්ප වර්තමානය වන විට ලාංකීය බුදුදහමට සම්මිශ්‍ර වී ඇති ආකාරය හඳුනා ගැනීම, ථේරවාදී බෞද්ධ සම්ප්‍රධායට මහායාන පුදපූජා, මහායාන සහිත්‍යාංග, විවිධ වත් පිළිවෙත් ආදී වශයෙන් වූ මහායානික බලපෑම් හඳුනාගැනීමට හැකි වීම.

**නිගමනය**

පුදපූජා ආශ්‍රයෙන් සනාථ වන ලක්දිව මහායාන බලපෑම්, පුරාවිද්‍යාත්මක සාධක ආශ්‍රයෙන් සනාථ වන මහායාන බලපෑම්, ලාංකීය සාහිත්‍ය සාධක ආශ්‍රයෙන් සනාථ වන මහායාන බලපෑම්, ශිලා ලිපි ආශ්‍රයෙන් සනාථ වන ලාංකීය මහායාන බලපෑම් ආදී වශයෙන් ලාංකීය ථේරවාද බෞද්ධ සම්ප්‍රධායට මහායාන බෞද්ධ සම්ප්‍රධාය බලපෑම් කළ බව මෙම පර්යේෂණයේදී නිගමන වශයෙන් ඉදිරිපත් කිරීමට නියමිත ය.

**ප්‍රමුඛ පද: මහායාන බුදුදහම/ ලාංකීය ඉතිහාසය/ මහාවංශය/ නිකාය සංග්‍රහය/ ශිලාලිපි**

Scanned with CamScanner
CamScanner

## ආශ්‍රිත ග්‍රන්ථ


1. තෙන්නකෝන්, සිංහල වංශය, 2009, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.
2. වංසත්ථප්පකාසිනී (වහාවංස ටීකාව සිංහල අනුවාදය, 2001, අමරවංස නාහිමි, අකුරුපිටියේ සහ දිසානායක, හේමචන්ද්‍ර, ගොඩගේ සහ සහො-දරයෝ, කොළඹ 10.
3. කරුණාරත්න, ඩේවිඩ්, එදා හෙළදිව(රොබට් නොක්ස්ගේ), 2010, ගුණසේන සහ සමාගම, කොළඹ 10.
4. විජේතුංග, සිරිසමන්, ශ්‍රී ලංකාවේ ශීලා ලිපි සන්නිවේදනය, 2007, ආරිය ප්‍රකාශකයෝ, වරකපොල.
5. ජයවීර, ඒ. එම්. එස්., ලංකාවේ රාජ්‍ය සහ ආගම, 2000, ජාතික අධ්‍යාපන ආයතන, මහරගම.
6. ලංකාවතාර විස්තරය, 2008,ගොඩගේ පැරණි ග්‍රන්ථ ව්‍යාපෘතිය, ගුණසේන සහ සමාගම, කොළඹ 10.
7. මහාවංසො, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම, සමයවර්ධන පොත්හල, කොළඹ 10.
8. Geiger, Wilhelm, The Mahāvamsa or Great Chronicle of Ceylon, 2003, Asian Educational Services, New Delhi, Chennai.


CS Scanned with CamScanner

CS CamScanner

# සිගාලෝවාද සූත්‍රයෙන් හෙළිවන නූතන පවුල් උපදේශන න්‍යායන් පිළිබඳ අධ්‍යයනයක්

ඒ. සචිනි වාසනා මධුශානි[1] එස්. එච්. එල්. අකිල ඖෂධ බණ්ඩාර[2]

## හැඳින්වීම

පුද්ගල සමාජානුයෝජන ක්‍රියාවලියේ වැදගත්ම සංස්ථාව ලෙස හඳුන්වනු ලබන්නේ පවුලයි. එයට හේතුව පවුල තුළින් පුද්ගලයාගේ අනන්‍යතාව, පැවැත්ම ආදියේ සිට සියලු ම අංශයන් සංවර්ධනය කිරීමයි. එම නිසා වර්තමානය වන විට මනෝ විද්‍යාත්මක උපදේශන ක්‍රියාවලිය තුළ ද පවුල් උපදේශනය නමින් වැදගත් අංශයක් ක්‍රියාත්මක වේ. මෙහි දී පවුල් උපදේශනය අංශ දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. එනම් පුද්ගල උපදේශනය හා සමූහ උපදේශනයයි.

බෞද්ධ සූත්‍ර දේශනාවන් තුළ ද නූතන පවුල් උපදේශනයෙහි සැලකිලිමත් වන බොහෝ කරුණු පිළිබඳව සාකච්ඡා කර තිබේ. ඒ අතරින් දීඝ නිකායේ පාථෙය්‍ය වග්ගයෙහි අට වන සූත්‍රය වන සිගාලෝවාද සූත්‍රය ඉතා වැදගත් සූත්‍රයකි. එහි පුද්ගලයකු වශයෙන් ගොඩනැඟෙන්නේ කෙසේ ද, එම ගොඩනඟා ගනු ලබන අනන්‍යතාව පවුල නමැති සාධකයට බලපාන්නේ කෙසේ ද යන කරුණු පිළිබඳව අවධානය යොමු කොට තිබේ.

## අරමුණ

සිගලෝවාද සූත්‍රයේ සඳහන් කරුණු නූතන පවුල් උපදේශන ක්‍රියාවලිය සඳහා යොදා ගත හැකි ආකාරය පිළිබඳව අධ්‍යයනය

---

1 ශිෂ්‍ය මනෝ උපදේශක, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

2 ශිෂ්‍ය මනෝ උපදේශක, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

Scanned with CamScanner

CamScanner

කිරීම.

## පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණ විධික්‍රමයට අනුව ප්‍රාථමික මූලාශ්‍ර, ද්වීයිතීක මූලාශ්‍රය හා තෘතීයික මූලාශ්‍රය යොදා ගෙන මෙම පර්යේෂණය සිදු කර තිබේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

වර්තමාන සමාජ සංස්ථාව තුළ ඇති වී තිබෙන කැපී පෙනෙන පරිවර්තනයන් තුළ පවුල් සංස්ථාවේ විවිධ ගැටළු නිර්මාණය වී තිබේ. සිගාලෝවාද සූත්‍රය තුළ ද එම සමාජ ගැටළු ඒ ආකාරයෙන් ම විවරණය කර ඇති අතර පුද්ගලයකු පවුල නමති ප්‍රාථමික සංස්ථාව තුළ කෙසේ හැසිරිය යුතු ද, තමන්ගේ මනස සහ චර්යාවන් ඒ සඳහා කෙසේ පවත්වා ගත යුතුද යනාදිය පිළිබඳව සාකච්ඡා කොට තිබේ. මෙහි දී විමසා බලන්නේ එම කාරණාවන් නූතන පවුල් උපදේශන සඳහා කොතරම් දුරට යොදා ගත හැකිද යන්නයි.

පවුලේ සැබෑ හරය බිඳ වැටී ඇති පවුල් ඒකකය බිඳුන පවුල වශයෙන් හඳුන්වයි. සදර්ලන්ඩ් නමැති අපරාධ විද්‍යාඥයා පෙන්වා දෙන පරිදි බිඳුන පවුල් පරිසරයක දක්නට ලැබෙන මූලික ලක්ෂණ අතර පවුලේ සාමාජිකයන් සාපරාධීන්, සුරා සොඬුන්, දුරාචාරීන් වීම, දික්කසාදය හෝ දරුවාට මව්පියන්ගෙන් කෙනෙකු ළඟ නොවීම, නූගත්කම, කලබලකාරී ස්වභාවය, නොසලකා හැරීම ආදීය දක්වා තිබේ.[1] සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වන කතමානි ඡ හොගානං අපායමුඛානි න සෙවති සුරාමෙරය මජ්ජපමාදට්ඨානානුයොගො............[2] යන්නෙන් භෝග විනාශමුඛ සයෙහි දක්වා ඇත්තේ යම් පුද්ගලයෙකුගේ ආර්ථිකය විනාශයට පත් වන ආකාර හයකි. මෙය ඍජුව ම පවුල් පරිසරයට බලපායි.

පවුලක ප්‍රධාන වනනේ ස්වාමි පුරුෂයා සහ භාර්යාවයි. ඔවුන් අතර අන්‍යෝන්‍ය වශයෙන් ඉටු විය යුතු යුතුකම් හා වගකීම් පිළිබඳව සිගාලෝවාද සූත්‍රයේ සදිසා නමස්කාරයෙන් දක්වේ. එහි ඉමෙහි බො පඤ්චහිඨානෙහි සාමිකෙන පච්චුපට්ඨිතා පච්ඡිම දිසා හරියා පඤ්චහි ඨානෙහි සාමිකං අනුකම්පති.......[3] භාර්යාව පශ්චිම දිසාව සේ සලකා ස්වාමියාගෙන් ඉටු විය යුතු යුතුකම් මෙන් ම පෙරලා බිරිඳගෙන් ඉටු විය යුතු යුතුකම් ද පෙන්වා දී ඇත. මෙය නූතන උපදේශනයේ අඹු සැමි උපදේශනය තුළ ජීවන ශෛලිය

CS Scanned with CamScanner

CS CamScanner

පිළිබඳව ඇඩ්ලේරියානු උපදේශන සංකල්ප තුළින් පිළිඹිබු වේ. මීට අමතරව පවුල තුළ දෙමාපියන් හා දරුවන් අතර අන්‍යොන්‍ය වශයෙන් ඉටු විය යුතු යුතුකම් ද දක්වා ඇත. ඒ තුළින් ද පවුල් උපදේශනය සඳහා අවශ්‍ය පසුබිම සකසා ගත හැකිය.

පවුල් උපදේශය සිදු කිරීම සඳහා නූතන මනෝ උපදේශනය තුළ මාස්ලෝගේ ආත්ම සාක්ෂාත්කරණය පිළිබඳ අදහස් ද උපකාරී වේ. සිගාලෝවාද සූත්‍රය පුරා දක්නට ලැබෙන්නේ ද එම න්‍යායෙන් දක්වා ඇති කරුණු ය. එහි දී මාස්ලෝ දැක් වූ භෞතික අවශ්‍යතාවන්, ආරක්ෂණය, ආදරය හා සෙනෙහස, ආත්ම සාක්ෂාත්කරණය ආදිය සිගාලෝවාද සූත්‍රයෙහි එන ෂට් දිශා ප්‍රතිච්ඡාදනය, චතුස්සංග්‍රහ වස්තුව යටතේ දක්වා තිබේ.

## සමාලෝචනය

නූතන මනෝවිද්‍යා ක්ෂේත්‍රය තුළ පවුල් උපදේශනය සිදු කිරීමේ දී බෞද්ධ ඉගැන්වීම්වල එන සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වන කරුණු පවුල් සංස්ථාව තුළ ඇති වන විවිධ සංඝටනයන් නිරාකරණයෙහි ලා සාර්ථකව භාවිත කළ හැකිය.

ප්‍රමුඛ පද : සිගාලෝවාද සූත්‍රය, පවුල් උපදේශනය, පවුල

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

01. අබේපාල රෝලන්ඩ්, ඇල්ප්‍රඩ් ඇඩ්ලර්ගේ පුද්ගල මනෝවිද්‍යාව, (2014), සාර ප්‍රකාශන, කොට්ටාව
02. පෙරේරා ඥානදාස, පවුල් උපදේශනය, (2005), සහසු ප්‍රකාශකයෝ, කොළඹ
03. පෙරේරා ඥානදාස, සෞඛ්‍ය මනෝවිද්‍යා ප්‍රවේශය, (2010), සහසු ප්‍රකාශකයෝ, කොළඹ 10
04. වනරත්න රන්ජිත්, බෞද්ධ සූත්‍ර සංග්‍රහය හෙවත් ගිහි විනය, (2015), සමයවර්ධන මුද්‍රණ ශිල්පීයෝ, කොළඹ 10.
05. අරිය විමල හිමි කොස්වත්තේ, ඔබ පවුල හා සමාජය, (1669), කතෘ ප්‍රකාශන
06. https://en.wikipedia.org/wiki/Sigalovada_Sutta
07. http://www.buddhazero.com/buddha-marriage/

Scanned with CamScanner

CS CamScanner

# බුදුදහම හා බැඳුණු ධාර්මික විනෝදය පුද්ගල සමාජයේ ආධ්‍යාත්මික මෙන් ම භෞතික සංවර්ධනය සඳහා යොදා ගත හැකි ආකාරය පිළිබඳව අධ්‍යයනයක්

කේ. ජී. ඒ. යූ. විජේරත්න[1] ඩබ්ලිව්. ජී. ටී. යූ. වික්‍රමසිංහ[2]
ආර්. එම්. ටී. ඒ. රත්නායක[3]

## හැඳින්වීම

බුදුදහමෙහි ධාර්මික විනෝදය ලෙස හඳුන්වනු ලබන්නේ දුකින් මිදීමයි. චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීම හරහා පුද්ගලයා දුකින් මිදුණු සත්ත්වයෙකු බවට පත්වේ. මේ නිසා ම බුදුන් වහන්සේ නිතර ම සිනාමුසු මුහුනින් සිටින ලද බව සමකාලීනයන් පවසනු ලබයි. බුදුදහම තුළින් මිනිස් සන්තානයේ හට ගන්නා වූ හැඟීම් ලෞකික මට්ටමෙන් මුදවා ආධ්‍යාත්මික මට්ටමට රැගෙන එන්නට බෞද්ධාගමික දර්ශනය තුළ මහත් වූ දායකත්වයක් හිමි විය. පංචශීලය වැනි බෞද්ධ ආචාර ධර්ම හා චතුරාර්ය සත්‍ය වැනි බෞද්ධ තාර්කික ඉගැන්වීම් පුද්ගල සමාජ අභිවෘද්ධියට නිතැතින් ම හේතු විය. පුද්ගල ජීවිතයේ යහපැවැත්මට ඉවහල් වන අල්පේච්ඡතාවයෙන් යුතු මහිච්චතාවයෙන් තොර ජීවන පැවැත්මක්මක් බෞද්ධ දර්ශනය තුළ අදයතන සමාජයට ලබා දුණි. නූතනයේ වූව ද පූද්ගලයා ලබන සංතුෂ්ටිය ධාර්මිකව සමාජගත අන් පුද්ගලයාට හානි දායක නොවන අයුරින් සොයා ගැනීමට අවශ්‍ය මාර්ගය බුදුහම තුළින් විවෘත කර දී ඇත. මෙවැනි පසුබිමක් තුළ බුදුදහමෙහි එන ධාර්මික විනෝදය පිළිබඳ ඉගැන්වීම්

1 උපාධි අපේක්ෂක, රුහුණු විශ්වවිද්‍යාලය
2 උපාධි අපේක්ෂක, රුහුණු විශ්වවිද්‍යාලය
3 උපාධි අපේක්ෂක, රුහුණු විශ්වවිද්‍යාලය

Scanned with CamScanner
CamScanner

පුද්ගල සමාජයේ ආධ්‍යාත්මික මෙන් ම භෞතික සංවර්ධනයට යොදා ගත හැකි ආකාරය පිළිබඳව අධ්‍යනය කරනු ලබයි.

**පර්යේෂණ ගැටළුව**

පුද්ගල සමාජයෙහි ආධ්‍යාත්මික මෙන් ම භෞතික සංවර්ධනය සඳහා ධාර්මිකව ලබන සංතුෂ්ටිය කොතරම් දුරට වැදගත් ද යන්න අධ්‍යයනය කිරීමයි. පර්යේෂණ අරමුණ වන්නේ චතුරාර්ය සත්‍ය මෙනෙහි කිරීම හරහා ලබන ධාර්මික විනෝදය තුළ සදාචාරාත්මක හා සංවර්ධිත සමාජයක් නිර්මාණය කිරීම හා ඒ තුළ රටේ තිරසාර සංවර්ධනය සුරක්ෂිත කිරීමත් වේ. මෙහි අධ්‍යයන ක්‍රමවේදය වන්නේ පුද්ලයා තම දුක නැති කර ගැනීම සඳහා යොදාගනු ලබන අයථා මාර්ගයන්ගෙන් මිදී යහපත් මාවත් ඔස්සේ ගමන් කරමින් තමා තුළ ධාර්මික විනෝදය ඇති කරගන්නේ කෙසේ ද යන්න අධ්‍යනය කිරීමයි. මෙහි දී ප්‍රාථමික හා ද්විතීක සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කරමින් එහි එන ධර්ම කරුණු පුද්ලයාගේ ආධ්‍යාත්මික චින්තනය නිර්මාණය කිරීමට යොදා ගන්නා ආකාරය අධ්‍යයනය කරනු ලබයි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

පුද්ගල ජීවිතයේ යහපැවැත්මට ඉවහල් වන වැදගත් ලක්ෂණයක් වන්නේ සංතුෂ්ටියයි. බුදුදහමට අනුව සංතුෂ්ඨිය නම් දුකින් මිදීමයි. වත්මන් සමාජය තුළ මිනිසා සතුට ලබා ගැනීම සඳහා සුදුසු මෙන් ම අයථා මාර්ගයන් යොදා ගනු ලබයි. මිනිස් සිතෙහි ස්භාවය වන්නේ කොපමණ ලැබුණත් තෘප්තියට පත් නොවීමයි. ධනය, බලය හමුවේ මෙම තත්ත්වය ඉස්මතු වේ. ලෞකික පුද්ගලයා මේ සඳහා ඕනෑම ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙළඹෙයි. බුදුදහම තුළ ලද පමණින් සතුටු වීම පුද්ගල සංවර්ධනයට හේතු වන බව පෙන්වා දෙයි. පුද්ගලයකු ආධ්‍යාත්මික මානසික මට්ටමකට පැමිනි විට ධාර්මිකව තම සංතුෂ්ටිය සොයා යයි. සදාචාරාත්මක සමාජයක් නිර්මාණය වීම සඳහා ධාර්මික විනෝදය සුදුසු වේ. එනම් සිඟාලෝවාද සූත්‍රයෙහි එන මව්පියන්ට උපස්ථාන කිරීම, ගිලනුන්ට උපස්ථාන කිරීම ආදිය තුළ පුද්ගල මනස සංතෘප්තියට පත්වේ. ඒ තුළ ඔහු විසින් මෙලොව ජීවිතය මෙන්ම පරලොව ජීවිතය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය වන කුසල් රැස් කර ගනී. මව්පිය

Scanned with CamScanner
CamScanner

උපස්ථානය තුළ දරුවන් හා දෙමාපියන් අතර පවත්නා යහපත් සබඳතාව තුළින් සාමකාමී සමාජ වාතාවරණයක් නිර්මාණය වේ . දරුවන් කුඩා කල සිට ම තම පවුල් පසුබිම තුළින් සමාජයෙහි ජීවත් වීමේදී අවශ්‍ය වන්නා වූ යුතුකම් හා වගකීම් පිළිබඳ අවබෝධයක් ලබා ගනී. එනම් ආධ්‍යාත්මික සමාජ ව්‍යූහයක් තුළ පුද්ගලයාගේ සංතුෂ්ටිය නිර්මාණය වීම සඳහා විවිධ වූ ආගමික උත්සව රැසක් පවතී. දළඳා පූජෝත්සවය, වෙසක් හා පොසොන් උත්සවය, ඇසළ පෙරහැර, පිරිත් පංකම් ආදිය අනාදිමත් කාලයක සිට සිංහල බෞද්ධයාගේ ධාර්මික විනෝදය ඇති කළ සද්කාර්යයන් කීපයකි. අතීතයෙහි දුටුගැමුණු රජු (ක්‍රි.පූ.161-137) වෙසක් උත්සව රාජ්‍ය අනුග්‍රහය මත පවත්වා ඇත. මේ තුළින් විෂද වන්නේ රාජ්‍ය පාලකයාගේ දේශපාලන චින්තනය තුළ සමාජයෙහි පැවති ආධ්‍යාත්මික චින්තනය සංවර්ධනය වූ ආකාරයයි. නූතන සමාජය විසින් තම සංතුෂ්ටිය ළඟා කර ගැනීම සඳහා පුදුගලයින් මත්පැන් පානය සඳහා යොමු වී ඇත. සදාචාරාත්මක සමාජයක් පිරිහීම සඳහා මෙම තත්වය බලපා ඇත. ඒ තුළින් ඇතිවන ව්‍යාකූලතාව ඝට්ඨනකාරී සමාජ පසුබිමක් නිර්මාණය කරයි. මත් පැන් පානයට ඇබ්බැහි වූ පුද්ගලයා සියලු අංශයන් තුළ පරිහානියට පත්වෙයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස පැනනඟින ආර්ථික අර්බුදය බාහිර සමාජයේ වංචාව හා සොරකම වැනි අපරාධ ක්‍රියා දක්වාම මතු වී එයි. මේ තුළින් සමාජ දර්ශනය තුළ පවතින පුද්ගල ආධ්‍යාත්මය පහව ගොස් අව්‍යාජත්වය මතු වේ. පුද්ගලයාගේ උසස් මානසික මට්ටම පවත්වා ගැනීම සඳහා ධාර්මික විනෝදය බලපානු ලබයි. අජන්තා සිතුවම්, මහමෙව්නාවේ සමාධි බුදුපිළිමය හා අභයගිරියේ සමාධි බුදුපිළිමය වැනි කලා කෘතී නැරඹීමෙන් හා නිර්මාණය කිරීමෙන් පුද්ගල මනස සංතුෂ්ටියට පත් වේ. පුද්ගල ආධ්‍යාත්මය සමාජයේ සියලු අංශයන් ධාර්මිකව මෙහෙයවනු ලබයි. ආනාපානසති භාවනාව තුළින් ද පුද්ගලයා තුළ උසස් මනසක් ඇති කරමින් ධාර්මික විනෝදය ලබා දෙයි. මේ තුළ සමාජ දර්ශනය නිර්මාණය වන්නේ අව්‍යාජත්වය මතය. ඒ තුළ දියුණු සමාජයක් නිර්මාණය වේ. නූතන සමාජයේ ධාර්මික විනෝදයට වඩා බල තණ්හාව මත තම සංතුෂ්ටිය නිර්මාණය කරගන්නා පාලන සංවිධානයක් නිර්මාණය වී ඇත. ඒ තුළ ප්‍රජාතන්ත්‍රවාදයට හා සමාජ වාදයට ඉඩ ප්‍රස්තාවක් නොමැත. මේ නිසා විය යුත්තේ

Scanned with CamScanner
CS CamScanner

දසරාජ ධර්මයන්ට අනුගත වන්නා වූ පාලන සංවිධානයන් ගොඩනඟා ගැනීමයි. ඉතිහාසයේ පළමුවන විජයබාහු (ක්‍රි.ව.1070-1110),නිශ්ශංක මල්ල (ක්‍රි.ව.1187-1196) වැනි රජවරු එවැනි පාලන සංවිධානයක් ගෙන යාම නිසා තිරසාර සංවර්ධනයක් සහිත සමාජ ව්‍යුහයක් නිර්මාණය වී තිබුණි. මේ අනුව සදාචාරාත්මක සමාජයක් නිර්මාණය වීම සඳහා ධාර්මික විනෝදය අත්‍යවශ්‍ය අංගයක් වන අතර ඒ තුළ පුද්ගලයාගේ ආධ්‍යාත්මය මෙන් ම භෞතික සංවර්ධනය ද සිදුවන බව පැහැදිලිය.

**ප්‍රමුඛ පද - අභිවෘද්ධිය, ආධ්‍යාත්මික, ධාර්මික විනෝදය, බුදුදහම, සමාජය.**

## ආශ්‍රිත ග්‍රන්ථ

1 අමරසේකර, දයා, 2005. බුදුදහම හා සමාජය, වරකාපොළ : ආරිය ප්‍රකාශකයෝ.

2 මනුරත්න, එම්. ඒ. 1998. බුදු සමයේ අචාර ධර්ම හා සමාජ ප්‍රගතිය, කැළණිය: ශීලා ප්‍රින්ටින්.

3 රාහුල, වල්පොල, 1946. භික්ෂුවගේ උරුමය, වැල්ලම්පිටිය : ඕප්සෙට්.

Scanned with CamScanner

CamScanner

# වෙසක් උත්සවයේ ආරම්භය හා විකාශනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්

ඒ .එම් .එන් .කේ .අබේසිංහ[1], එන්.ටී.එන්.සඳමාලි[2],
එච්.එම්.පී.එන්.යූ.ගුණදා[3]

## හැඳින්වීම

ශ්‍රී ලංකේය ජන සමාජය තුළ තදින්ම මුල් බැසගත් ආගමික, දාර්ශනික හා සංස්කෘතික උත්සවයක් ලෙස වෙසක් උත්සවය පෙන්වා දිය හැකිය. එහි පවතින වටිනාකම් නිසා මෙන්ම පාරම්පරික රාජ්‍ය චාරිත්‍රයක් වන නිසා මෙම උත්සවය බෞද්ධයන්ට අන් හැම උත්සවයකටම වඩා වැදගත්ය. ධර්මාශෝක රජ දවස ප්‍රදේශ කරා යැවූ දූත පිරිස් මාර්ගයෙන් බුදුදහම ලංකාවට රැගෙන ආ අතර ඉන් පසුව ඒ බුදුදහම ජාත්‍යන්තර ආගමක් බවට පත් විය.පසුව ඒ ඒ රාජ්‍යවල රාජ්‍යාගම වශයෙන් බුදුදහම ගරු බුහුමන් ලැබීය. සංස්කෘත භාෂාවෙන් ''වෛශාඛ'' යනුවෙනුත්, පාලි භාෂාවෙන් ''වෙසාඛ'' යනුවෙනුත්, සිංහල භාෂාවෙන් ''වෙසක්'' යනුවෙනුත් හඳුන්වනු ලබන මෙය සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය, බුද්ධෝත්පත්තිය හා බුදුරදුන්ගේ මහා පරිණිර්වානය සිහිකරණු වස් මැයි මාසයේදී මෙම උත්සවය පාරම්පරිකව පැවත එන චාරිත්‍රයක් බව මූලාශ්‍රයවල සඳහන් වේ.

## පර්යේෂණ ගැටළු

වෙසක් උත්සවයේ ආරම්භය හා විකාශනණය කෙබඳු ද යන්න විමර්ශනය කර වර්තමානයේ ඒ පිළිබව දක්වන ආකල්ප අධ්‍යයනය කිරීම

---

1 ඉතිහාසය (විශේෂවේදී) ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

2 ඉතිහාසය (විශේෂවේදී) ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

3 සිංහල (විශේෂවේදී)[3] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

CamScanner

### අධ්‍යයන ක්‍රමවේද

පර්යේෂණ ගැටළුවට අදාළව දත්ත එක්රැස් කිරීමේදී සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යනය කිරීම (ප්‍රාථමික හා ද්විතීයික) තුළින් මෙම පර්යේෂණයට අදාළ දත්ත එක්රැස් කරන ලදී.

### අරමුණු

වෙසක් උත්සවයේ ආරම්භය හා විකාශනය පිළිබඳ අධ්‍යයනය කර එය වර්තමානය දක්වා පවත්වාගෙන ඒම සඳහා බල පෑ සාධක පිළිබව අධ්‍යනයට යොමු කිරීම.

### ප්‍රතිඵල හා සාකච්ඡාව

බුදු තෙමලගුල සිහිකරණු වස් පවත්වනු ලබන වෙසක් උත්සවය සෑම වර්ෂයකම මැයි මාසයේ පැවැත්වේ. දේවානම්පියතිස්ස රජ දවස මහින්දාගමනයෙන් පසුව ලක්දිවට ලැබුණු බුදුදහම පාදක කරගෙන පාරම්පරිකව පැවත එන මෙම වෙසක් උත්සවය රාජ්‍ය චාරිත්‍රයක් වූ බව මහාවංශයේ, දීපවංශයේ සඳහන් වේ. බුද්ධකාලීන භාරතයේ වෙසක් උත්සවය ගැන සඳහනක් නොවුනත් බුද්ධ පරිණිර්වානයෙන් ශතවර්ෂ දෙකක් ඉක්මගිය පසුව ධර්මාශෝක රජු විසින් වෙසක් දිනය නිමිති කර ගෙන මහත් උත්සවයක් සිදු කළ බව අශෝක සෙල්ලිපිවල (4 වන සෙල්ලිපියේ) සඳහන් වේ.එසේම පාහියන් හිමිගේ දේශටන වාර්තාවල භාරතයේ අවුරුද්දක් පාසා වර්ෂයේ දෙවන මස අටවනදා පිළිම පෙරහැරක් ඇති බවත්, එහි දී රෝද හතරක රියක් සාදා උණදඬු එක පිට එක බඳිමින් ඒ මත පස් මහල් මණ්ඩපයක් තනා රන්, රිදී, දේව ප්‍රතිමා අඹා මණ්ඩපයේ සතර පැත්තේ තබා මැද බුදුපිළිමයක් හා බුදුන්ගේ ආරක්ෂාවට බෝධිසත්ව පිළිමයක් ද තබා පෙරහැරක් කර ඇති බවයි. වර්ෂයේ දෙවැනි මස සඳහන් වන්නේ ඉන්දියානු ලිත් ක්‍රමයට අනුව වෙසක් මාසයයි. ඒ නිසා නමක් නොදක්වා ඇතත් පාහියන් හිමි සඳහන් කරන්නේ, වෙසක් උළෙලක් විය හැකිය.

ලංකාවේ වෙසක් උත්සවය ආරම්භය පිළිබදව විමර්ශනය කිරීමේදී ප්‍රථම වරට හමුවන්නේ දුටුගැමුණු (ක්‍රි.පූ.101-77)රජුගේ කාලයේදීය. නමුත් මීට පෙර ද බුදුදහම ලක්දිවට රැගෙන ආ අවස්ථාවේ සිටම වෙසක් උත්සවය පවත්වන්නට ඇතැයි සිතිය හැකිය. ඇතැම් විට එළාර රජ දවස නැතිවී ගිය වෙසක් උත්සවය

Scanned with CamScanner
CamScanner

නැවත වරක් දුටුගැමුණු රජු විසින් ආරම්භ කරන්නට ඇතැයි සිතිය හැකිය. පසුව රාජ්‍යත්වයට පත්වන සෑම රජෙකුම පාහේ තම රාජ්‍ය කාලය තුළ වෙසක් උත්සවය නොකඩවා පවත්වා ඇත. වෝහාරිකතිස්ස රජු දවස (ක්‍රි.ව.269 -291) පැවති වෛතුල්‍යවාදය මර්දනය කොට පැවති දඬුවම් ක්‍රම නැති කොට වෙසක් උත්සවයක් පැවැත් වූ බව ද සඳහන් වේ. වෛතුල්‍යවාදය නැවතත් ලක්දිව ආරම්භ වූ නිසා සිරිසඟබෝ රජුගෙන් පසු අවුරුදු 40ක් පමණ කාලය දුර්භාග්‍ය කාලයක් විය. ජේට්ඨතිස්ස රජුගේ කාලයේ (ක්‍රි.ව.323 -333) නැවතත් මහා පරිමාණයේ වෙසක් මංගල්‍යක් පවත්වා ඇත. භික්ෂූන් 30000 පමණ සිවුරු, පිරිකර, විහාර ප්‍රසාද කරවා ඇත. ඉන් පසුව බොහෝ රජවරුන්ගේ කාලයන් වලදී වෙසක් උත්සවය උත්කර්ෂවත් අයුරින් පවත්වා ඇත. පසුකාලීනව වෙසක් පොහොය දිනය නිල වශයෙන් පිළිගනිමින් 1885 මැයි 25 වන දින වෙසක් පොහොය දිනය නිවාඩු දිනයක් වශයෙන් ප්‍රසිද්ධියට පත් කිරීමෙන් අනතුරුව හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ප්‍රමුඛ දස දෙනෙකුගේ කමිටුවකින් බෞද්ධ කොඩිය මුල් වරට භාවිතා කරන්නේ 1885 වෙසක් පොහොය දිනයේදීය. මින් පසුව පැවැත් වූ වෙසක් උත්සව සාඩම්භරයෙන් පවත්වන්නට ලක්දිව ජනතාව උත්සුක විය. එසේ ම 2000 වර්ෂයේ වෙසක් පොහොය දිනයේ සිට එම දිනය ජාත්‍යන්තර නිවාඩු දිනයක් ලෙස සමරණු ලබයි .

## නිගමන

බුදු තෙමගුල සිහි කිරීම උදෙසා සෑම වර්ෂයක් පාසා ම වෙසක් උත්සව පවත්වාගෙන යාමට විවිධ පාර්ශවයන්ගේ දායකත්වය නො අඩුව ලැබුණු බව පැහැදිලි වේ.

**ප්‍රමුඛ පද - වෙසක් උත්සවය, පොහොය, බුදු තෙමගුල**

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

රාහුල හිමි, වල්පොල, ලක්දිව බුදුසමයේ ඉතිහාසය, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, 1993
සන්නස්ගල. පී.බී, සිංහල සාහිත්‍ය වංශය, සංස්කෘතික දෙපාර්තමේන්තුව, 1994
මලලසේකර. ජී.පී, ලංකා පාලි සාහිත්‍ය, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, 1993

Scanned with CamScanner
CamScanner

# ගබ්සාවේ ප්‍රායෝගිකත්වය: බෞද්ධ ආචාර විද්‍යාත්මක ප්‍රවේශයක්

එම්. අමරවංස හිමි[1]

## හැඳින්වීම

අනපේක්ෂිත ගැබ් ගැනීම් නිසා නීති විරෝධීව වන ගබ්සාව, විවිධ සමාජ ගැටලු ඇතිකරයි. සාධනීය කරුණු යටතේ එය නීතිගත කිරීමට උත්සාහ දැරුව ද ආගමික විරෝධතාව ඊට ප්‍රබල බලපෑමක් එල්ලකරයි. එහෙත් නූතනයෙහි 'ගබ්සාව' සමාජ අවශ්‍යතාවක් දක්වා වර්ධනය වී ඇත. දේවවාදී ආගම් ප්‍රබල ලෙස විරුද්ධ වුව ද සදාචාරය විෂයෙහි ප්‍රායෝගික ඉගැන්වීමක් ඉදිරිපත් කරන මානවවාදී දහමක් වන බුදුසමය, ඊට දක්වන ප්‍රතිචාරය සම්බන්ධව සාකච්ඡා කිරීම මෙහි අපේක්ෂාවයි.

## පර්යේෂණ ගැටලුව

නූතනයෙහි ප්‍රබල සමාජ ගැටලුවක් හා සමාජ කතිකාවක් වන "ගබ්සාව" බෞද්ධ දෘෂ්ටිකෝණයට අනුව සදාචාර විරෝධී නොවන අයුරින් කළ හැකි ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි.

## පර්යේෂණ ක්‍රමවේදය

ප්‍රාථමික හා ද්විතියික සාහිත්‍යය මූලාශ්‍ර පදනම් කරගෙන මෙම පර්යේෂණය සිදුකෙරේ. දත්ත රැස්කිරීමත්, විශ්ලේෂණයත්, නිගමනයට එළඹීමත් ක්‍රමානුකූලව සිදුකෙරේ.

## පර්යේෂණ අරමුණ

1 කථිකාචාර්ය, බෞද්ධ අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය
Email: m.amarawansa@gmail.com

Scanned with CamScanner
CamScanner

ගබ්සාව පිළිබඳ බෞද්ධ ආකල්පය විමසීමත්, එසේම උක්ත ගැටලුව විෂයෙහි අන්තවාදීව විරුද්ධ නො වී බෞද්ධ ආචාරවිද්‍යාවට අනුව සදාචාරාත්මක විසඳුමක් ඉදිරිපත් කළ හැකිද යන්න සාකච්ඡා කිරීමත් මෙහි අරමුණයි.

**සාකච්ඡාව**

පූර්ව අපේක්ෂාවකින් තොරව වන ලෝක ජනගහණ වර්ධනය පාලනය කිරීමටත්, අනවශ්‍ය දරු උපත් වළක්වා ගැනීමටත්, විවිධ උපත් පාලන ක්‍රමවේද සිදුකෙරෙයි. එහිදී ගබ්සාවට හිමිවන්නේ ප්‍රමුඛ හා විවාදිත ස්ථානයකි. කායික හා මානසික සංකූලතා නිසා ස්වභාවිකව සිදුවන ගබ්සා හා මානව ක්‍රියාකාරකම් මත සිදුවන ගබ්සා වශයෙන් ගබ්සාව දෙපරිදි වෙයි. මෙහි සාකච්ඡාවට බඳුන් වන්නේ ස්වභාවිකව සිදුවන ගබ්සාවන් පිළිබඳව නොව, නෛතිකව හෝ අනෛතිකව මානව මැදිහත් වීම් මත සිදුවන "ගබ්සා" පිළිබඳවය. නීති විරෝධීව සිදුවන ගබ්සා ආශ්‍රිතව ඇතිවන සෞඛ්‍යය ගැටළු ප්‍රමාණය අතිවිශාලය. එමනිසා නෛතික "ගබ්සාව" නූතන සමාජයෙහි ප්‍රබල අවශ්‍යතාවක් බව සඳහන් කළ හැකිය.

ලෝක සෞඛ්‍ය සංවිධාන වාර්තා අනුව සියයට විසිපහක් (25%) ගැබිනි මව්වරුන් ගබ්සා කරගනී. සෞඛ්‍ය අමාත්‍යංශ වාර්තා අනුව දිනකට ලංකාවේ අනීතික ගබ්සා හයසියයකට (600) ආසන්නව සිදුවෙයි. නීති විරෝධී ගබ්සා නිසා වසරකට ශ්‍රී ලංකාවෙහි සිදුවන මාතෘ මරණ සංඛ්‍යාව 10-15 අතර වෙයි. ඒ ආශ්‍රිතව ඇතිවන සෞඛ්‍ය ගැටලු ප්‍රමාණය අතිවිශාලය. ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයෙහි අංක 303-307 දරණ වගන්ති ප්‍රකාරව මවගේ ජීවිතය සුරක්ෂිත කිරීම හැර වෙනත් කරුණු සඳහා සිදුකෙරෙන ගබ්සාව අපරාධයකි. එම සාධකයෙන් බැහැරව ගබ්සාව නීතිගත කිරීමේදී ප්‍රබල සමාජ කතිකාවක්, විරෝධයක් ගොඩනැගෙයි. විශේෂයෙන් නූතන ලෝක ආගම් ඒ විෂයයෙහි ප්‍රබල අභියෝගයක් එල්ලකරයි. මානව පැවැත්ම, දේව කැමැත්ත මත තීරණය වන්නක් මිස, ඒ සඳහා මානව මැදිහත්වීම නො යෙදවිය යුතු බවට කතෝලික, ඉස්ලාම්, හින්දු ආදී දේවවාදී ඉගැන්වීම්හි මඟ පෙන්වීමයි. එමනිසා මවගේ ජීවිතය සුරක්ෂිත කිරීම හැර වෙනත් කරුණු සඳහා ගබ්සාව නීතිගත කිරීම ද ප්‍රබල අභියෝගයක් වෙයි.

Scanned with CamScanner

CamScanner

ආගමික විරෝධතා පැවතිය ද, මවගේ පැවැත්ම හා අභිලාශ විෂයෙහි අවධානය යොමු කරමින්, ඇමරිකාව, එංගලන්තය, ඉන්දියාව, චීනය, ජපානය, ආදී සංවර්ධිත හා සංවර්ධනය වන රටවල යම් නිශ්චිත කාල සීමාවකදී, ගබ්සා කරගැනීම නීතිගත කොට තිබේ. එහි පවතින ප්‍රධාන සදාචාරාත්මක ගැටලුව වන්නේ ගැබෙහි සිටින ජීවියා පිළිබඳව සැලකිලිමත් නො වීමයි.

බොහෝදුරට ගබ්සා සිදුකිරීමට අවශ්‍ය වන්නේ අනපේක්ෂිත ගැබ් ගැනීම් සඳහාය. එබඳු ගැබ් ගැනීම් සිදුවන්නේ සැලසුම් නො කරන ලද ලිංගික හැසිරීම් පදනම් කරගෙනයි. ලිංගික චර්යාව සම්බන්ධව බුදුසමයෙහි විග්‍රහය දෙපරිදි වෙයි. පැවිදි ප්‍රජාව හා බ්‍රහ්මචාරී පිරිස් ඉන් වියුක්ත වීම අනිවාර්ය වන අතර ගිහි ප්‍රජාව සඳහා විවාහ දිවිය තුළ සම්පූර්ණ වන ලිංගික හැසිරීම අනුමත කරයි. ඒ අනුව කටයුතු කරන ගිහි ප්‍රජාවකට ගබ්සා සිදුකිරීම අවශ්‍ය වන්නේ නැත. සැලසුම් කරන ලද ලිංගික හැසිරීමක නිරත වන නිසාවෙනි. බෞද්ධ විග්‍රහයට අනුව ගබ්සාව නිවාරණයට ඇති මඟ එයයි.

එහෙත් අනපේක්ෂිතව අකමැත්තෙන් සිදුවන ලිංගික හැසිරීම් ද නිරන්තර සමාජය තුළ සිදුවෙයි. එමඟින් වන ගැබ් ගැනීම් පාලනය කිරීමට අපහසු වෙයි. සැලසුම් නො කරන ලද නිසාවෙනි. එබඳු ගැබ් ගැනීම් නිසා බිහිවන දරුවා ද බිහි කරන මව ද සමාජ ගත වීමේ දී විවිධ අපහසුතාවන්ට මුහුණ දෙයි. ඒ ඔවුන් නො කළ වරදක් නිසාවෙනි. එසේම සමාජ අවමානය තුළ ගොඩනැගෙන එබඳු දරුවන් සමාජ විරෝධී ක්‍රියාකාරකම්වලට පෙළඹීමේ ප්‍රතිශතය ද බහුල වෙයි. එබඳු අවස්ථාවන්හි ගබ්සාව ප්‍රායෝගික විසඳුමක් ලෙස සඳහන් කළ හැකිය.

මජ්ඣිමනිකායේ මහාතණ්හාසංඛය සූත්‍රයට අනුව ජීවියාගේ හටගැනීම කරුණු තුනක් සම්පූර්ණ වීමෙන් සිදුවෙයි. එනම් මවුපිය සංයෝගය, මව ඍතුවීම හා ගන්ධබ්බයෙකුගේ පැමිණීම (ප්‍රතිසන්ධි චිත්තය හටගැනීම), වශයෙනි. මෙයින් එකක හෝ අසම්පූර්ණත්වය ගැබක් ඇති නොවීමට හේතුවෙයි. ප්‍රතිසන්ධි චිත්තයෙහි හටගැනීම පිළිබඳ විස්තරයක් සංයුත්ත නිකායෙහි ඉන්දක සූත්‍ර අටුවාවෙහි සඳහන් වෙයි. එයට අනුව කලලයෙහි

Scanned with CamScanner

CamScanner

ජීවයක් හටගනුයේ (ප්‍රතිසන්ධි චිත්තය) කලලයට දින විසි එකක් සම්පූර්ණ වීමෙන් අනතුරුවයි.

බෞද්ධ විග්‍රහයට අනුව ප්‍රාණඝාතය සාවද්‍ය ක්‍රියාවකි. සදාචාර විරෝධී ක්‍රියාවකි. සදාචාරය පිළිබඳ බෞද්ධ ආකල්පය වන්නේ තමන් උපමාවට ගෙන අන් අයගේ කැමැත්ත අකමැත්ත පිළිබඳ තීරණය කළ යුතු බවත්, එසේම තමා හා අන් අයගේ යහපතට හේතුවන ක්‍රියාකාරකම් පමණක් යහපත් වන බවත්ය. ඒ අනුව ගබ්සාව සාවද්‍යය ක්‍රියාවකි. ගැබෙහි සිටින ජීවියා ද, ප්‍රතිසන්ධි චිත්තය ඇතිවන මොහොතේ සිට පූර්ණ ජීවියෙකි. ඉන්පසුව සිදුවන ගබ්සාව ද ප්‍රාණ ඝාතනයකි. ජීවියාගේ හටගැනීම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුව ප්‍රතිසන්ධි චිත්තයට පෙර කළල අවස්ථාව, පූර්ණ ජීවයක් වශයෙන් සැළකිය නො හැකිය. එමනිසා එවැනි අවස්ථාවක වන ජීවියාගේ විනාශය (දින විසි එකකට ප්‍රථමව සිදුවන) අටුවාවේ විග්‍රහයට අනුව ඝාතනයක් වශයෙන් අර්ථ ගැන්විය නො හැකි බවට එමගින් පැහැදිලි වේ.

එසේම බෞද්ධ විග්‍රහයට අනුව ප්‍රාණඝාතය පූර්ණ වීමට කරුණු පහක් (05) සම්පූර්ණ විය යුතුය. එනම් පණ ඇති සතකු වීම, පණ ඇති බව දැනීම, මරණු කැමති චේතනාව, ඒ සඳහා සැලසුම් කිරීම හා ඉන් ම මරණයට පත්වීම වශයෙනි. මින් එකක් හෝ අසම්පූර්ණ වේ නම් එය ප්‍රාණඝාතයක් වශයෙන් සැලකිය නො හැකිය. ඒ අනුව ගත්තද ප්‍රතිසන්ධි චිත්තයට පෙර කලල අවස්ථාව ජීවයක් වශයෙන් නො සැලකෙන නිසා එය ඝාතනයක් වශයෙන් දැක්විය නො හැකිය.

**නිගමනය**

ඒ අනුව ජීවියාගේ හට ගැනීමට ප්‍රථම ගබ්සා සිදුකිරීමේ යම් අවකාශයක් පවතින බව දැකගත හැකිය. ඝාතනයක් සිදු නො වන නිසා එහි සදාචාර විරෝධී බවක් ද දැකිය නො හැක. මේ අනුව, නූතන ජනගහණ වර්ධන හා විවිධ සෞඛ්‍යය ගැටලු විෂයෙහි අචාරවිද්‍යාත්මකව බෞද්ධ දර්ශනය මඟින් ප්‍රායෝගික විසඳුම් යෝජනා කළ හැකි බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද - ගබ්සාව, නීතිය, දේවවාදී ආගම්, බුදුදහම, සදාචාරය

Scanned with CamScanner

CamScanner

## මූලාශ්‍රය


- පාරාජිකා පාළි I, බුද්ධ ජයන්ති මුද්‍රණය, 2004. 162 පිට
- පපඤ්චසූදනී II, හේවාවිතාරණ මුද්‍රණය, 258 පිට
- මජ්ඣිම නිකාය I,මහා තණ්හා සංඛය සූත්‍රය, බුද්ධ ජයන්ති මුද්‍රණය, 2004. 622 පිට
- සංයුත්ත නිකාය I, ඉන්දක සූත්‍රය, බුද්ධ ජයන්ති මුද්‍රණය, 2004. 366 පිට
- සමන්තපාසාදිකා I, හේවාවිතාරණ මුද්‍රණය, 312 පිට
- සාරත්ථප්පකාසිනී I, හේවාවිතාරණ මුද්‍රණය, 230 පිට
- චන්ද්‍රා වික්‍රමගමගේ, ''බෞද්ධ කලල විද්‍යාව, " ස්වර්ණාඤ්ජලී, සංස්. කුඩාකත්නෝරුවේ විනීත හිමි හා තවත් අය (ඉන්ද්‍රා ටේඩර්ස් අධිපති වයි. එස්. ඉන්ද්‍ර කුමාර, 2007) 35-40
- https:// www.newsfirst.lk
- https:// www.womenonwaves.org


Scanned with CamScanner

CamScanner

# බෞද්ධ හා නූතන පුනරුත්ථාපන ක්‍රමවේදයන් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

දූල්තර ඥානානන්ද හිමි[1], ආර්. ඉසංකා දමයන්ති වික්‍රමසිංහ[2]

## හැඳින්වීම

සමාජ විරෝධී ක්‍රියාවකට හෝ යම් කායික හා මානසික දුර්වලතාවකට ලක්ව ඇති පුද්ගලයා එයින් සම්පූර්ණයෙන් හෝ යම්තාක්දුරට මඟහරවා ගෙන ඵලදායී වැඩපිළිවෙලකට යොමුකර ගැනීමේ ක්‍රියාවලිය පුනරුත්ථාපනය ලෙස සරලව විග්‍රහ කළ හැකි ය. නූතන සමාජය තුළ වරදකරුවන් පුනරුත්ථාපනය කිරීමේ විවිධ ක්‍රමවේදයන් ක්‍රියාත්මක වේ. නමුත් රට තුළ සිදුවන අපරාධ හා අපචාර ක්‍රියාවන්හි අඩුවීමක් දක්නා නො ලැබේ. එක් වරක් වරදකරුවෙකු වූ අයෙකු යළිත් වරක් වරදකරුවෙකු වීමෙන් පැහැදිලි වන්නේ නූතනයේ ක්‍රියාත්මක වන පුනරුත්ථාපන ක්‍රමවේදයන්හි ගැටලුකාරී තත්ත්වයන් පවත්නා බව ය. වැරදිකරුවන් මැනවින් පුනරුත්ථාපනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ ශාස්තෘවරයෙකු වශයෙන් බුදුරජාණන් වහන්සේ හඳුන්වාදිය හැකි ය. බුද්ධකාලීන භික්ෂු සංස්ථාව තුළ ද විවිධ වූ, විෂම වූ අපරාධකාරී හා අපචාරමය ක්‍රියාවන් සිදු වී ඇති බව පෙළ දහම අධ්‍යයනය කිරීමෙන් අවබෝධ වේ. බුදුන් වහන්සේ වැරදි ක්‍රියාවන් සිදු කරන භික්ෂූන් වහන්සේලා විෂයයෙහි විවිධ දඬුවම් ක්‍රම ක්‍රියාත්මක කළ ද ඒවා හුදෙක් මානසික දඬුවම් ක්‍රම පමණක් ම විය. කායික වශයෙන් හිංසා පීඩා කර වරදකරුවෙකු පුනරුත්ථාපනය

1 සහය කථිකාචාර්ය පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, gdelthara1@gmail.com

2 සහය කථිකාචාර්ය පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, isanka.dw@gmail.com

Scanned with CamScanner

CamScanner

කිරීම බුදු දහමින් ප්‍රතික්ෂේප කර ඇත. බෞද්ධ පුනරුත්ථාපන ක්‍රමවේදයන්ට අනුව පුනරුත්ථාපනය වන වරදකරුවෙකු යළි කිසි දිනක වරදකරුවෙකු වී ඇති බවට පෙළ දහමෙහි සාධක හමු වී නොමැත. එමගින් පැහැදිලි වන්නේ නූතන පුනරුත්ථාපන සංකල්පයන්ට වඩා බෞද්ධ පුනරුත්ථාපන සංකල්පය ඵලදායී ක්‍රමවේදයක් වන බව ය. බෞද්ධ හා නූතන පුනරුත්ථාපන ක්‍රමවේදයන් අතර විවිධ වෙනස්කම් දක්නට ලැබේ. පුනරුත්ථාපන සංකල්පය පිළිබඳ විවිධ උගතුන් විවිධ පර්යේෂණ සිදු කර තිබුන ද බුදුදහමේ ඉගැන්වෙන පුනරුත්ථාපන සංකල්පයන් පිළිබඳ හා ඒවායේ නූතන උපයෝගීතාව පිළිබඳ කර ඇති පර්යේෂණ අවම හෙයින් මෙහි දී නූතන හා බෞද්ධ පුනරුත්ථාපන සංකල්පය තුලනාත්මක ව අධ්‍යයනය කිරීමක් සිදු වේ.

**පර්යේෂණ අරමුණ**

බෞද්ධ හා නූතන පුනරුත්ථාපන ක්‍රමවේදයන් පිළිබඳ අධ්‍යයනය කිරීම.

නූතන පුනරුත්ථාපන ක්‍රමවේදයන්හි පවත්නා දුර්වලතාවන් අවම කිරීම විෂයයෙහි බෞද්ධ පුනරුත්ථාපන ක්‍රමවේදයන් උපයෝගී කරගත හැකි ආකාරය අධ්‍යයනය කිරීම.

**පර්යේෂණ ගැටළුව**

නූතන පුනරුත්ථාපන ක්‍රමවේදයන් විෂයයෙහි බෞද්ධ පුනරුත්ථාපන ක්‍රමවේදයන් උපයෝගී කර ගත හැකි ද යන්න විමර්ශනය කිරීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

බෞද්ධ පුනරුත්ථාපන සංකල්පය පිළිබඳ තොරතුරු ලබාගැනීමේ දී පුස්තකාල සමීක්ෂණය මගින් ප්‍රාථමික මූලාශ්‍ර හා ද්විතීයික මූලාශ්‍ර පරිශීලනය කිරීම සිදු කළ අතර නූතන පුනරුත්ථාපන ක්‍රමවේදයන් පිළිබඳ තොරතුරු ගවේෂණය කිරීමේ දී පුනරුත්ථාපන ආයතන කිහිපයක තොරතුරු විමර්ශනය කරමින් ක්ෂේත්‍ර අධ්‍යයනය සිදු කරමින් මෙම පර්යේෂණය සිදු කිරීමට බලාපොරොත්තු වෙමි.

Scanned with CamScanner
CamScanner

## සාකච්ඡාව

පුනරුත්ථාපනය සමාජය සමඟ සම්බන්ධ වෙමින් ඉතාමත් සංකීර්ණ ලෙස ගොඩනැගුණා වූ වැඩපිළිවෙලක් ලෙස හැඳින්විය හැකිය. එසේ ම එය පුනරුත්ථාපනයට ලක්වන තැනැත්තාගේ අවශ්‍යතා මත ගොඩනැගිය යුතු ඔහුගේ හෝ ඇයගේ සමාජ ජීවිතයට අවශ්‍ය ආකල්ප අගනාකම් සහ හැකියාවන් වර්ධනය කරන්නා වූ වැඩපිළිවෙලක් විය යුතුය. පුනරුත්ථාපනය කායික මානසික වෘත්තියමය ලෙස වර්ග කළ හැකි ය. වෘත්තීයමය පුනරුත්ථාපනය යනු දණ්ඩනවේදය පරිවාස හා සමාජ වැඩ, චරිත ශෝධනාගාරවල දැකිය හැකි පුනරුත්ථාපනය යි. මේ තුළින් යමෙකුගේ වැරදි හැසිරීම් රටාවන් පිළිබඳ ව අවබෝධයක් ලබා දී ඔහුට ම ඔහුගේ ජීවිතය නිවැරදි මාර්ගයකට ගොනුකර ගැනීමකට ඉඩකඩ සැලැස්වීමක් සිදු වේ. පුද්ගලයාගේ සමාජ ජීවිතයේ අඩුපාඩු හඳුනා ගනිමින් එයට පිළියම් යෙදීමත් පුනරුත්ථාපනයෙන් සිදු වේ.

ඕනෑම සමාජ සංස්ථාවක් ක්‍රියාත්මක වන්නේ මිනිසා මූලික කර ගනිමිනි. මිනිසාගේ මෙහෙය වීමෙනි. සමාජ සංස්ථාව යහපත් හෝ අයහපත් වන්නේ මිනිසාගේ යහපත් බව හෝ අයහපත් බව කරණකොටගෙන ය. නීතිරීති, ශික්ෂණ ක්‍රම අවශ්‍ය වන්නේ කෙලෙසුන්ගෙන් කිළිටි වීමේ ඉඩකඩ ඇති මිනිසුන්ගෙන් සැදුණු සමාජයකට ය. රටක දණ්ඩ නීතියක් සකස් වන්නේ එරටෙහි පවත්නා සංස්කෘතිය කඩ කරන්නන් උදෙසා ය. මරණීය දණ්ඩනය, දඩ ගැසීම, රටින් පිටුවහල් කිරීම, කස පහර දීම යනාදී දඬුවම් ක්‍රම රාශියක් නූතනයේ වරදකරුවන් විෂයයෙහි ක්‍රියාත්මක කරනු ලබයි. හුදු දඬුවම් ක්‍රම ක්‍රියාත්මක කිරීමෙන් පමණක් ම වරදකරුවන් නිවැරදිකරුවන් බවට පත්වන්නේ ද යන්න ගැටලුවකි. නූතන සමාජයේ ක්‍රියාත්මක වන නීතියට අනුව යම් වරදකට දඬුවම් විඳ අවසන් ව යළි සමාජයට පැමිණෙන පුද්ගලයා නැවත නැවතත් වැරදි සිදු කර නීතියෙන් වරදකරුවෙකු වන අවස්ථා දැකිය හැකි ය. එයින් පැහැදිලි වන්නේ දඬුවම් ක්‍රම ක්‍රියාත්මක කිරීමෙන් පමණක් වරදකරුවන් නිවැරදි මාර්ගයට ගත නො හැකි බව යි. ඒ සඳහා විධිමත් පුනරුත්ථාපන ක්‍රමවේදයක් අනුගමනය කිරීම අවශ්‍ය වේ. චරිත ශෝධනයක් මඟින් පුද්ගලයා නිවැරදි පුද්ගලයෙකු වශයෙන් සමාජයට අනුගත කිරීමට උත්සාහ කිරීම පුනරුත්ථාපනයේ අරමුණ වෙයි.

නූතන පුනරුත්ථාපන ආයතන ලෙස බන්ධනාගාර හා සමගාමීව පිහිටුවා ඇති විවෘත කඳවුරු හැඳින්විය හැකි ය. වර්තමානයේ එවැනි කඳවුරු එකොළහක් පමණ ඇති අතර වසර තුනක කාලයක් සඳහා බන්ධනාගාරගතවන, පළමුවරට වරදකරුවන් වන සහ නැවත වරක් වරදකරුවන් වන කෙටිකාලීන සහ මධ්‍යකාලීන වරදකරුවන් සඳහා විවෘත වැඩ කඳවුරු අටක් තිබේ. එමෙන් ම විවෘත සිර කඳවුරු තුනක් පවතී. වරදකරුගේ යහපත් හැසිරීම පදනම් කොට ගෙන මෙම සිර කඳවුරුවලට යොමු කරනු ලැබේ. නූතන පුනරුත්ථාපන ආයතනවල වරදකරුවන් පුනරුත්ථාපනය කිරීම විෂයයෙහි විවිධ වෘත්තීය පුහුණු පාඨමාලාවන් දියත් කර ඇත. ඇඳුම් මැසීම, පෙදරේරු, පෑස්සුම් ශිල්පය, මෝටර් සයිකල් අලුත් වැඩියාව යනාදී පුහුණු පාඨමාලාවන් ඒ අතර වේ. නූතනයේ කුමනාකාරයේ පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක වුව ද යලි යලිත් බන්ධනාගාරගත වන සංඛ්‍යාවේ ද සැලකිය යුතු වර්ධනයක් දැකිය හැකි ය.

පුනරුත්ථාපනය පිළිබඳ පෙර අපර දෙදිග විද්වතුන් විවිධ මත ඉදිරිපත් කර ඇත. පුනරුත්ථාපන සංකල්පය පිළිබඳ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය තුළින් ද කරුණු අනාවරණය වේ. බුදුන්වහන්සේ ගිහි පැවිදි දෙපිරිස ම පුනරුත්ථාපනය කර ඇති අවස්ථා පෙළ දහමින් පැහැදිලි වේ. බුදු දහමේ සඳහන් වන වරදකරුවන් පුනරුත්ථාපනය කිරීමේ ක්‍රමවේදය ඉතා ක්‍රමානුකූලව හා විධිමත්ව සිදු වන්නකි. බෞද්ධ භික්ෂූන් විසින් ලබන පරිවාසය සංඝාදිසේස ඇවැත්වලින් පිරිසිදුවීම සඳහා දඬුවම් වශයෙන් පූර්ණය කළ යුත්තකි. චුල්ලවග්ග පාලියට අනුව එහි ප්‍රභේද තුනකි. එනම් පටිච්ඡන්න පරිවාසය, මානත්තදාන හා අබ්භාන කර්මය යනුවෙනි. මීට අමතරව දාන පාත්‍රය නොපිට හැරවීම, සමාදාන වීම, අත්හිට වූ දඬුවම් නියම කිරීම, මග හැරීම, නෙරපීම, ප්‍රතික්ෂේප කිරීම, දෝෂාරෝපණය කිරීම යනාදී ක්‍රමයන් ද ඒ අතර වේ. බෞද්ධ පුනරුත්ථාපන ක්‍රමවේදයට අනුව කුමන හෝ සඟවෙසෙස් ඇවතකට පත්වූවහු විසින් ඒ වෙනුවෙන් දඬුවම් විඳිය යුතු වේ. එහි දී පරිවාස හා මානත්ත සමාදන්ව පිළිවෙත් පිරිය යුතු අතර සියල්ල කෙළවර අබ්භාන විනය කර්මයට යටත් විය යුතු වේ. මෙම විනය කර්ම තුනෙහි එකිනෙකට අන්තර් සම්බන්ධයක්

Scanned with CamScanner

CamScanner

පවතී. ඇවැත් පටිච්ඡන්න වී ඇති විට පරිවාස හා මානත අතර සම්බන්ධයක් ඇති අතර අපටිච්ඡන්න ඇවැත්වල දී පරිවාසයෙන් තොරව ම මානත සමාදන් විය හැකි ය. මානත් සමාදානයෙන් තොර අබ්භාන කර්මයක් සිදු නො කෙරේ.

බුදුන් වහන්සේ විසින් ගිහි සමාජයේ සාමාජිකයන් ද පුනරුත්ථාපනය කළ අවස්ථාවන් දැකිය හැකි ය. අංගුලිමාල, කිසාගෝතමී, චිංචිමානවිකාව, මාගන්දි හා ඛේමා ආදීන්ගේ චරිත කතා නිදසුන් ලෙස දැක්විය හැකි ය. බෞද්ධ සම්ප්‍රදාය තුළ පැවති මෙම පුනරුත්ථාපනයන් ආධ්‍යාත්මික වටිනාකමට මුල් තැනක් දෙමින් සිදු කොට ඇති බවට මෙම චරිත කතා තුළින් ගම්‍යමාන වේ. වරදකරු යළි වරදකරුවෙකු බවට පත් නොවන අයුරින් වරදකරු කායික හා මානසික යන දෙඅංශයෙන් ම නිවැරදි චරිත ශෝධනයක් මගින් ආයති සංවරයේ පිහිටුවමින් නැවත සමාජගත කිරීම බෞද්ධ පුනරුත්ථාපන ක්‍රියාවලියෙන් සිදු වේ.

**නිගමනය**

නූතනයේ රජය මගින් වරදකරුවන් පුනරුත්ථපනය කිරීම විෂයයෙහි විවිධ පුනරුත්ථාපන ක්‍රමවේදයන් භාවිත කරනු ලැබූව ද බුදුන්වහන්සේ ඉදිරිපත් කරන ලද පුනරුත්ථාපන ක්‍රමවේදයන් තරම් සාර්ථක නොවන බව මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ අතර නූතන පුනරුත්ථාපන ක්‍රමවේදයන් වඩා සාධනීය අන්දමින් සිදු කිරීම විෂයයෙහි බෞද්ධ පුනරුත්ථාපන ක්‍රමවේදයන් උපයෝගී කොට ගත හැකි බව යෝජනා කළ හැකි ය.

**Keywords - Offender, Buddhist, Present, Rehabilitation, Im prisonment**

**මූලාශ්‍රය**

1 චුල්ලවග්ග පාළි, 1977, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, කොළඹ, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

2 නන්දසේන රත්නපාල, අපරාධ විද්‍යාවේ මූලධර්ම 2, බොරලැස්ගමුව, සීමා සහිත ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ, 1991,

3 නිරංජී විජේවර්ධන, මූලික අපරාධ විද්‍යාව, තලවතුගොඩ, ලීඩ් ග්‍රැෆික් පුද්ගලික සමාගම, 2009,

Scanned with CamScanner

CamScanner

4 දණ්ඩ නීති සංග්‍රහය, 15 වන අධිකාරය, (1970) 2003, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

5 රත්නපාල නන්දසේන, 2006, අපරාධය සහ දඬුවම - බෞද්ධ අධිකරණ සම්ප්‍රදාය, වරකාපොල, අරිය ප්‍රකාශකයෝ.

6 විජිතධම්ම හිමි, මැදගම්පිටියේ, 2006, බෞද්ධ විනය කර්ම, බත්තරමුල්ල, සදීපා ප්‍රින්ටර්ස්.

Scanned with CamScanner

CamScanner

# Applicable of the seven conditions of welfare to present context to reduce modern Social problems

Ven. Delthara Gnanananda[1]. R.I.D. Wickramasinghe[2]

## Introduction

***Saptha aparihānīya dharma*** is the most significant one to the wellbeing of the world, in the contemporary of the Buddha is quite valued it for the protection of the '***vajjins***' who rule that reign. On one occasion the Buddha addressed to the Great minister who approached to Him, as the promulgation of the Great king *Ajathasattu*, who ready to go for the war against the *vajji*. At that time the Buddha explained to him that the king *ajathasattu* is unable to defeat them because of these seven monarchic rules. Then the great minister left from there and said it to king and postponed the war and formed the trickles for the defeat. Here, I am pointed out to how these facts can be applied as welfare of the modern world.

## Objectives

This research aim is to show the value for interrelationship among the people, nations, races, and religion in Sri Lanka. And what are the racial and social problems and the

1 Assistant Lecturer, Department of Pali and Buddhist studies, University of Sri Jayewardenepura

2 Assistant Lecturer, Department of Pali and Buddhist studies, University of Sri Jayewardenepura

Scanned with CamScanner

CamScanner

applicable of the seven condition of welfare.

## Methodology

To this task, I am used the findings from the Primary sources, secondary sources, dictionaries and mostly by E linked. Some time I used the interview also with elders to clarify the some conflicted point which I got while my research.

## Discussion

These ***sapta aparihāniya dhamma*** is one of the great teaching, the Buddha has used to preach the Dhamma to mankind for the wellbeing of them. Those dhammas are;

1. They hold full and frequent public assembly.[3]
2. They meet together with concord; arise in concord and undertaking in concord.[4]
3. They not enacted already established, abrogate nothing that has already being enacted and act according to former rules.[5]
4. They honor, revere and support the ***vajjins*** elders and listen to their words.[6]
5. They do not take away by force or abduct women or girls belongs to their clans.[7]
6. They honor and exceed to shrines where the existed town or country.[8]
7. The give protection for the Arahanths, and if they very far from the city or realm in peace.[9]

According to that matter here, 1st one of them is mostly important to the modern context, because of the modern people are mostly do not agree with others and there not concord as a result of that there are huge number of the problems among them and also the strangeness of the nations are lack. When

Scanned with CamScanner

CamScanner

there are frequent assembly is may cause to the reducing of the conflict also. Next is to be lead for the wellbeing of the people, why is it the people who live in present are gather in concord but they are unable to share theirs idea in concord and finally they left with polluted mind. Third one also help to the modern world, that is how, they never try to promulgate new rules and not brake enacted ones, as a result of that the ruling system is going on without troubling. In present context we can see, the youngest do not pay their respect to the elders but it not did by *vajjins*. Thus that theory also much important to the present context. Another thing is that they try to respect and protect to the women, in present most of the people do not pay respect to the women or girls, and they abused mostly.

Sixth one is exceed to their shrines and protect them and granted to them, but at present mostly destroyed those places by governors. Therefore, that rule also can be used as a great point to present context. Finally they invite to *Arahanths* or great monks who lived in India and they are advised by them for great ruling and wellbeing of the people.

## Conclusion

According to above given fact clearly shows the necessity of those dhamma to the greatest society as well. As my point of view, the ***Saptaaparihāniya dhamma*** is the great influencing fact to the present context to deduction of the modern problems, socio-economic and political conflicts among the man and clans. Not only that, the Sri Lankan 'Sinhalese' also minimized as a race because they have no these kind of facts in lives, and somewhere, at least one of them.

**Keywords - Seven conditions, United, Buddhism, Vajjins, Rules**

Scanned with CamScanner

CamScanner

## References


Anguttaranikāya, (2008). BJT, BCC, Ajith printers.

Dīghanikāya,BJT, (2008)BCC, Ajith printers.

Mahāparinibbānasuttaṁ (DN 16)


## Endnotes

3 "Kin-ti te Ānanda sutaṁ: 'Vajjī abhiṇhasannipātā sannipātabahulā?' " ti "Sutaṁ metaṁ Bhante: 'Vajjī abhiṇhasannipātā sannipātabahulā.' " ti "Yāvakīvañ-ca Ānanda Vajjī abhiṇhasannipātā sannipātabahulā bhavissanti vuḍḍhi yeva Ānanda Vajjīnaṁ pāṭikaṅkhā no parihāni.

4 Yāvakīvañ-ca Ānanda Vajjī samaggā sannipatissanti samaggā vuṭṭhahissanti, samaggā Vajjīkaraṇīyāni karissanti, vuḍḍhi yeva Ānanda Vajjīnaṁ pāṭikaṅkhā no parihāni

5 Sutaṁ metaṁ Bhante: 'Vajjī apaññattaṁ na paññāpenti, paññattaṁ na samucchindanti, yathāpaññatte porāṇe Vajjidhamme samādāya vattantī.' " ti

6 Vajjī ye te Vajjīnaṁ Vajjimahallakā te sakkaronti garukaronti mānenti pūjenti tesañ-ca sotabbaṁ maññantī.

7 'Vajjī yā tā kulitthiyo kulakumāriyo tā na okkassa pasayha vāsentī.

8 Vajjī yāni tāni Vajjīnaṁ Vajjicetiyāni, abbhantarāni ceva bāhirāni ca tāni sakkaronti, garukaronti mānenti pūjenti, tesañ-ca dinnapubbaṁ katapubbaṁ dhammikaṁ baliṁ no parihāpentī." ti

9 Yāvakīvañ-ca Ānanda, Vajjīnaṁ Arahantesu dhammikā rakkhāvaraṇagutti susaṁvihitā bhavissati, kin-ti anāgatā ca Arahanto vijitaṁ āgaccheyyuṁ, āgatā ca Arahanto vijite phāsuṁ vihareyyuṁ, 11 vuḍḍhi yeva Ānanda Vajjīnaṁ pāṭikaṅkhā no parihānī." Ti

Scanned with CamScanner

CamScanner

# ප්‍රථම ධර්මසංගායනාව හා ශාස්ත්‍රීය බෞද්ධ අධ්‍යයනය

ඒ.ඒ දිනේෂ් අසේල[1]

## හැදින්වීම

බුදුරජාණන්වහන්සේ දේශනා කළ ශ්‍රී සද්ධර්මය බුද්ධ පරිනිර්වාණයෙන්

මාස තුනක් ඇවෑමෙන් සංගායනා කළ බව මූලාශ්‍රයන්හි සඳහන් වෙයි. ශාසනයෙහි ආභ්‍යන්තරිකව පැනනැගුණු හා බාහිරව පැමිණි මෙන් ම, පැමිණිය හැකි උවදුරු සමනය කිරීමේ අරමුණින් මහාකාශ්‍යප තෙරුන් ප්‍රමුඛ මහතෙරවරුන් ධර්ම සංගායනා කළ බව පෙන්වාදිය හැකිය.

අප මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කරනු ලබන්නේ ප්‍රථම ධර්ම සංගායනාව ශාස්ත්‍රීය බෞද්ධ අධ්‍යයනයේ ප්‍රධාන සන්ධිස්ථානයක් ලෙස හැඳින්විය හැකි ද යන්නයි. මෙහි දී ප්‍රථම ධර්ම සංගායනාවට පෙර අවදියේ සිට ශාස්ත්‍රීය බෞද්ධ අධ්‍යයනය සඳහා යම් නැඹුරුවක් පැවතියේ ද යන්න පළමුව අධ්‍යයනය කරනු ලබන අතර ඉන් අනතුරුව ප්‍රස්තුත කාරණාව කෙරෙහි අවධානය යොමු කොට පළමු ධර්ම සංගායනාව ශාස්ත්‍රීය බෞද්ධඅධ්‍යයනයට බලපෑ ආකාරය අධ්‍යයනය කොට ඇත. එහි දී ප්‍රධාන වශයෙන් ප්‍රස්තුත දෙකක් යටතේ ඒ පිළිබඳව අවධානය යොමු කරන ලදි. එනම් මූලික මූලාශ්‍රය වන චුල්ලවග්ග වාර්තාව හා විස්තෘත මූලාශ්‍රය වන අට්ඨකථා වාර්තා යන උභයාංශය වෙන වෙන ම ගෙන උක්ත ප්‍රස්තුතය පිළිබඳව විමසා බලන ලදි. මෙම පර්යේෂණයේ දී ප්‍රස්තකාල ග්‍රන්ථ පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය

1 කොළඹ විශ්වවිද්‍යාලය aseladinesh5@gmail.com

Scanned with CamScanner

CamScanner

කළ අතර ප්‍රාථමික මූලාශ්‍රය ලෙස පාලි ත්‍රිපිටකාගත ග්‍රන්ථ මෙන් ම අට්ඨකථා හා ටීකා ග්‍රන්ථ ද උපයෝගී කොට ගන්නා ලදි. ද්විතීයික මූලාශ්‍රය ලෙස පෙර අපර දෙදිගම රචනා කරන ලද පොත්පත් හා ලිපි ලේඛනාදිය යොදා ගන්නා ලදි.

**අරමුණ**

මෙම පර්යේෂණයේ දි බෞද්ධ ශාස්ත්‍රීය අධ්‍යයනයේ ආරම්භක අවස්ථා බුද්ධ කාලයේ සිට ගොඩනැගුණු බවත්, ප්‍රථම ධර්ම සංගායනාව එහි සන්ධිස්ථානයක් ලෙසහඳුනාගත හැකිය.මෙහි දි එම ශාස්ත්‍රීය බෞද්ධ අධ්‍යයනය කුමන ප්‍රස්තුතයක සිට කළ යුතු ද යන්න හඳුනා ගන්නා ලදි. එම ක්‍රමවේද නූතන බෞද්ධ අධ්‍යයනයට වැදගත් වන ආකාරය පෙන්වා දීම මෙහි අරමුණ වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

සන්ධාර විශ්ලේෂණය හා පාඨ විශ්ලේෂණය මෙම අධ්‍යයනයේ දී භාවිත ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේද වේ. එහි ලා පඤ්චසතිකක්ඛන්ධක වාර්තාව හා අට්ඨකථා මූලාශ්‍රයන් ප්‍රධාන තේමා දෙකක් යටතේ වෙන් කරන ලදී. ඒ ඒ තේමාවට අදාළ කරුණු වෙන් කරන ලද්දේ එම මූලාශයන්හි පාඨ විශ්ලේෂණය කිරීමෙනි.

**පර්යේෂණ ගැටලුව**

බුදුදහමශාස්ත්‍රීය විෂයයක් වශයෙන් වර්ධනය වූයේබටහිර විශ්වවිද්‍යාල අධ්‍යාපනයට බුදුදහම විෂයක් වශයෙන් හඳුන්වා දීමෙන් පසුව බව බොහෝ විද්වතුන් දක්වන නමුත්,බුදුදහම ශාස්ත්‍රීය විෂයක් වශයෙන් ගොඩනැගුණේනූතන විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් දයන්න විමසීමමෙහි පර්යේෂණයේ ගැටලුවයි.

**සාකච්ඡාව**

ප්‍රථම ධර්මසංගායනාවේ ශාස්ත්‍රීය ලක්ෂණ පිළිබඳව සාකච්ඡා කිරීමේදී ප්‍රධාන ප්‍රස්තුත දෙකක් යටතේ තොරතුරු ගොනු කරන ලදි. ප්‍රධාන වශයෙන් ප්‍රථම ධර්මසංගායනාව පිළිබඳ තොරතුරු අනාවරණය වන පැරණිතම හා මූලිකම මූලාශ්‍රය ලෙස සැලකෙන චුල්ලවග්ගපාළියේ පඤ්චසතිකක්ඛන්ධකය හා පාලි පිටකත්‍රයේ ප්‍රධාන අට්ඨකථා ත්‍රිත්වය වන සමන්තපාසාදිකාව,

Scanned with CamScanner
CamScanner

සුමංගලවිලාසිනිය හා අත්ථසාලිනිය යන මූලාශ්‍රයන්හි සඳහන් ප්‍රථම සංගායනාව පිළිබඳ වාර්තාවන්ද ඇතුළු මහාවංස, දීපවංස ආදී පාලි වංසකථා මූලාශ්‍රය ආදියයි.

### මූලික මූලාශ්‍රය ඇසුරෙන්

චුල්ලවග්ගයේ පඤ්චසතිකක්ඛන්ධක වාර්තාවට අනුව මහා-කාශ්‍යප තෙරුන් ප්‍රථම ධර්ම සංගායනාවේ මූලිකත්වය ගත්තා ලදි.සංගීති වාර්තාව නිරීක්ෂණයේදී පැහැදිලි වන්නේ විසිරී පැතිරී පැවති සම්බුද්ධ දේශනාව ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් යටතේ සංග්‍රහ වූ බවයි. එහිදී ධර්මය හා විනය වශයෙන් ප්‍රධාන ලෙස සමස්ත බුද්ධ වචනය වර්ගීකරණය විය.

ධර්මය හා විනය අතරින් පළමු කොටම විනය ශික්ෂාවන්ගේ වැදගත්කම සලකා විනය සංගායනා කළ බව වාර්තාවෙයි. විනය සංග්‍රහ කරන ක්‍රමවේදය මෙහි දී ඉතා වැදගත් වෙයි. සෑම විනය ශික්ෂාවක් ම ප්‍රධාන වශයෙන් වත්‍ථු, නිදාන. පුග්ගල, පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති, ආපත්ති හා අනාපත්ති යන ක්‍රමවේද සත යටතේ සංග්‍රහ වන පරිදි සංගායනා කරනු ලැබේ. මෙම ක්‍රමවේද සත අනුගමනය මගින් පැහැදිලි වන්නේ විනය සංගායනාව යම් ශාස්ත්‍රීය ප්‍රස්තුතයක සිට ක්‍රමානුකූල ක්‍රමවේදයක් යටතේ සිදු වූ බවයි. මෙම ක්‍රමවේද සත යටතේ සතර පාරාජිකාවන් සංග්‍රහ වූ ආකාරය චුල්ලවග්ගයේ දක්වා ඇත. මෙම ක්‍රමයට අනුව උභතො විභංගය සංග්‍රහ වූ බව තවදුරටත් එහි සඳහන් වෙයි.

විනය සංගායනා කිරීමෙන් අනතුරුව ආනන්ද තෙරුන්ගේ මැදිහත් වීමෙන් ධර්මය සංගායනා කරන ලදි. එහි දී සෑම ධර්ම පර්යායක්ම නිදාන, පුග්ගල ආදී ක්‍රමවේද දෙක යටතේ සංගායනා කරන ලද අතර, එම ක්‍රමවේදයට අනුව පඤ්ච නිකායම විමසූ බව සඳහන්වේ. ප්‍රථම සංගීති අවස්ථාවේදී ධර්ම පරියායන් සංග්‍රහ කිරීමේ විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ බව පැහැදිලිය. ඒ අනුව සූත්‍රයන්හි ඓතිහාසිකත්වය හා අනන්‍යතාවය තහවුරු කර ගැනීමට හැකි විය. සංගීති වාර්තාවේ දැක්වෙන පරිදි බ්‍රහ්මජාල හා සාමඤ්ඤඵල යන සූත්‍ර ද්වය ඉහත ක්‍රමවේදයට අනුව සංග්‍රහ වූ ආකාරය නිදර්ශන ලෙස දක්වා ඇත.

Scanned with CamScanner
CamScanner

**විස්තාරිත මූලාශ්‍රය ඇසුරෙන්**

ප්‍රථම ධර්මසංගායනාව පිළිබඳ විස්තාරිකව තොරතුරු ඇතුළත් වූ මූලාශ්‍රයන් ලෙස පාලි අට්ඨකථා දැක්විය හැකිය. ප්‍රධාන නිකායත්‍රයේ අට්ඨකථා ත්‍රිත්වයේම නිදාන කථාවන්හි ධර්මසංග ායනාව පිළිබඳව ද දීර්ඝ විස්තර හමු වේ. මෙම අට්ඨකථා ත්‍රිත්වයේ ම සමාන ලෙස තොරතුරු සංග්‍රහ වී ඇත. එහෙත් වාර්තා තුනෙහි විෂමතා ද සුළු වශයෙන් හඳුනාගත හැකිය. මෙම අට්ඨකථා ත්‍රිත්වයටම භදන්ත බුද්ධඝෝෂාචාර්යන් විසින් සංග්‍රහ කරන ලදි. ධර්ම සංගායනාව පිළිබඳ තොරතුරු සංග්‍රහ කිරීමේ දී බුද්ධඝෝෂ හිමි ප්‍රධාන වශයෙන් චුල්ලවග්ග වාර්තාව උපයුක්ත කොට ගත් බව පැහැදිලිය. එම චුල්ලවග්ග වාර්තාව විස්තීරණ ලෙස විග්‍රහ කරමින් ථෙරවාද මතවාදය ඉස්මතු වන පරිදි බුද්ධඝෝෂ හිමි සංගීතිය වාර්තා කරන ලද බව හඳුනාගත හැකිය.

**නිගමනය**

මෙම පර්යේෂණයෙන් පැහැදිලි වන පරිදි ප්‍රථම ධර්ම සංගායනාවට පෙර අවදියේ සිටම ශාස්ත්‍රීය වශයෙන් ධර්මය විනය අධ්‍යයනය කිරීමේ සම්ප්‍රදායක් වර්ධනය විය.ශාස්ත්‍රීය බෞද්ධ අධ්‍යයන සම්ප්‍රදායේ ප්‍රධාන හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස ප්‍රථම ධර්ම සංගායනාව දැක්විය හැකිය. ප්‍රථම ධර්ම සංගායනාව පිළිබඳව වාර්තාවන පැරණිතම මූලාශ්‍රය වන චුල්ලවග්ග වාර්තාව හා අට්ඨකථා වාර්තාවල තොරතුරු අතර විශාල වෙනස්කම් රැසක් හඳුනාගත හැකිය. මෙම මූලාශ්‍රයන් දෙකම අධ්‍යයනය මගින් පැහැදිලි වන්නේ ප්‍රථම ධර්ම සංගායනාව බෞද්ධ ශාස්ත්‍රීය අධ්‍යයනයේ වැදගත් සන්ධිස්ථානයක් වන බවයි.

**ප්‍රමුඛ පද :- ප්‍රථම ධර්මසංගායනාව, පඤ්චසතිකක්ඛන්ධක, අට්ඨකථා, ශාස්ත්‍රීය අධ්‍යයනය, ත්‍රිපිටකය.**

CS Scanned with CamScanner

CamScanner

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය

අත්ථසාලිනී නාම ධම්මසඞගණිප්පකරණට්ඨකථා. කොළඹ : ත්‍රිපිටක මුද්‍රණාලය. 1940.
චූල්ලවග්ගපාළි. ලැන්කැස්ටර් : පාලිපොත් සමාගම. 2005.
පරමත්ථදීපනි ටිකා. (දේවනාගරී සංස්කරණය) ඉගතපූරි : විපස්සනා පර්යේෂණ ආයතනය. 1995.
සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා. කොළඹ : ත්‍රිපිටක මුද්‍රණාලය, 1948.
සුමඞගලවිලාසිනි නාම දීඝනිකායට්ඨකථා. කොළඹ : ත්‍රිපිටක මුද්‍රණාලය, 1948.
අබේනායක, ඔලිවර්. ත්‍රිපිටක සාහිත්‍ය ඉතිහාසය : විනය පිටකය. දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2017.
විජිතධම්ම හිමි, මැදගම්පිටියේ. ''නවංග බුද්ධවචනය''ප්‍රඥෝදය ශාස්ත්‍රීය සංග්‍රහය. සංස්කරණය - මඩිහේ සුගතසිරි හිමි, පානහඩුවේ යසස්සී හිමි, 80 - 95. නුගේගොඩ : කොලිටි ප්‍රින්ටර්ස්, 2008.

Scanned with CamScanner

CamScanner